
You are the only releaving shower on my parched soul
ඔයා මගේ දැවී ඉරිතැලුණු ආත්මයට වට එකම අනෝරා වර්ෂාවයි...
Warsha
වර්ෂා
6
A loving gift from
Sujeewa
Prasanna Arachchi
Hemantha007
For free distribution
සුජීව ප්‍රසන්න ආරච්චි
MADHARA BOOKS

සුජීව ප්‍රසන්න ආරච්චි

# වර්ෂා 7

You are the only releaving shower on my parched soul

ඔබ මගේ දැවී ඉරිතැලුණු ආත්මයට වට එකම අනෝරා වර්ෂාවයි...

SUJEEWA PRASANNA ARACHCHI

***එක දුප්පත් කෙල්ලෙක්***
***පුංචි කුමාරයෙක්ට ආදරය කළා...***
***ඊට පස්සේ ඒ ආදරේ ඒ කෙල්ලගේ ජීවිතයම වුණා...***
***මේ ඒ ජිවිත කතාවයි...***





# 01

ප්‍රියංවදාට කොළඹ යන්නට අවශ්‍ය වූයේ කොළඹ පෞද්ගලික ආයතනයකට බාර දී තිබූ ඇගේ සහතික හා වෙනත් ලියකියවිලි යළි ලබා ගැනීම සඳහාය. රැකියාවක් අපේක්‍ෂාවෙන් ඒ ලියකියවිලි ආයතනයකට බාර දුන්නේ වර්ෂා කොළඹ ඉඳිද්දීය. එහෙත් දෛවය මේ කෙල්ලන් දෙදෙනාගේම ජීවිත කනපිට පෙරළීය.

ප්‍රියංවද සිතුවේ හෙට ගොස් ඒ ලියකියවිලි ටික රැගෙන එන්නටය. වර්ෂාව කොළඹ එක්කාගෙන යන්නට ඇයට බයය. එකක් ඇය ඉන්නා තත්වයයි. අනෙක මේ දිනවල මොරගොඩ නිවසේ මොනවා වෙනවාදැයි නිශ්චිතව කිව නොහැකි නිසාය.

˝අ..නේ.. උඹ තනියම යන්නද...˝

˝අනේ රත්තරන් ගැස්සි ගැස්සි බස්වල යන්න බැනේ උඹට... දරුවට හොඳ නැනේ...˝

˝කමක් නෑ... මං එන්නම්... ම..ටත් පොඩි වැඩ වගයක් තියෙනවා කොළඹ... අර මගේ පාස් පොත මෙහේ බැංකුවට හරවගන්න ඕන...˝

කෙල්ල කොළඹ යන්නට එන්න හදන්නේ ඒ සියල්ලට වඩා හොරෙන් සැඟවී සිට හෝ විමුක්තිගේ මුහුණ ටිකක් බලාගන්නට බව ප්‍රියංවද දනී.

'මේ පාරත් උඹ ගිහින් හැංගිලා බලන්නද යන්නේ...'

වර්ෂා කිසිවක් නොකියා සිනාසුණාය. දෛවය ජීවිතයකට සතුට දෙන්නේ කන් හැන්දෙනි.

'එ..හෙ..ම..ව..ත් බලන්න ආසයි... ආ..යේ ය..න්..න..ත් බැනේ බ..ඩ උ..ස්..ස..ගෙ..න...'

වර්ෂාගේ ඇස්වල කඳුළුය. ප්‍රියංවද කෙල්ලගේ හිස පිරිමැද්දය.

'හොඳ ඉන්ටර්සිටි එකක් අල්ලලා පාන්දරම එහෙනම් ගිහින් එමු... ම..ට බය අපට දවසකින් එන්න පුළුවන් වෙයිද කියලා කෙල්ලේ...'

'පුළුවන්... පා..න්..ද..රම යන්... මෙහෙන් තියෙන පළවෙනි බස් එකේ...'

'ම්...'

'අපට තාත්තිව බලන්න පුළුවන් වෙයි...' වර්ෂා කුස අතගා පුතුට කීවාය. එහෙත් වර්ෂාත් ප්‍රියංවදත් කොළඹ යන දිනට පසුදින විමුක්තිගේත් මංජුලාගේත් විවාහ මංගල උත්සවය පැවැත්වෙන බව ඇය දන උන්නේ නැත.

වර්ෂා කොළඹ එන්නට යන්නේ එවැනි දිනයකය. ඇයට විමුක්තිව බලා ගන්නට නම් පොත්හල අසළ කොහේ හෝ සිට සැඟවී සිටිය යුතුය.

ඉදිරි පැය විසි හතර ඇත්තටම තීරණාත්මකය. එහෙත් ඒ බවක් අසරණ කෙල්ල දන උන්නේ නැත. ඇය තදින් විශ්වාස කළ දෙයක් විය. ඒ විමුක්තිව කිසිදු අහිමි නොවන බවය. අනිද්දා උදේ දහයකුත් ගාණකට යෙදෙන නැකතින් මංජුලාත් විමුක්තිත් පෝරු මස්තකයට නඟින්නට නියමිතය. දිනන්නේ මේ දෛවයද... නොවේනම් වර්ෂාගේ විශ්වාසයද..





වර්ෂාත් ප්‍රියංවදත් කොළඹ එන්නට අනුරාධපුර ප්‍රධාන බස් නැවතුමට ආවේ පාන්දර තුනහමාරටය.

රජරට අහස පුරා වූයේ ලා දම් පැහැයට හැරුණු දූක්බර පාටකි. පරිසරයේ වූයේද තුනී සිසිලසකි. රාත්‍රියට අනුරාධපුර වැව් බඳවල් සිපගෙන එන සුළඟ නිදහසේ නගරය පුරා සැරි සරයි. මේ සුළඟ මේ තරම් සනීප ඒ නිසාය.

වර්ෂා ඇඟට තරමක් පහසු සායකුත් බ්ලවුස් එකකුත් ඇඳගත්තාය. තවම එහෙමම කියා බඩක් නෙරා පැමිණ නැතත් පරිස්සමින් ඇය දෙස බලන්නෙකුට ඇය ගැබ්ගෙන ඇති බව වහා කිව හැක.

මේ පහන් වන්නේ බදාදා දවසටය. වර්ෂා මේ කොළඹ බලා යන්නට හදන්නේ විමුක්තිගේත් මංජුලාගේත් විවාහ මංගල උත්සවයට පැය විසි හතරක් පමණක් තිබියදීය.

ඒ බව වර්ෂාවත් ප්‍රියංවදවත් දන උන්නේ නැත. මේ ගමන පුදුමාකාරය. දෛවෝපගතය. මේ හදිසියේ වර්ෂාව කොළඹ යවන්නේ ඇයි...

එහෙත් උදේ ඇහැරුණ මොහොතේ සිට වර්ෂාට මහා පුදුමාකාර හැඟීමක් දනෙන්නට විය. එය පපුවේ යමක් කැවෙන්නාක් බඳු හැඟීමකි. 'අනේ මන්ද අද මොනවා හරි වෙයි කියලත් හිතෙනවා... අනේ ඔයාව දකගන්න විතරක් මට ඉඩක් තිබ්බොත් ඇති... ඊට වඩා දෙයක් නම් වෙන්න එපා...'

මහා පාන්දර වර්ෂාවත් ප්‍රියංවදවත් බස් රියට ඇරලුවේ මාමාය. ඒ මොහොතේදී අනුරාධපුර නගරය පුරා වූයේ පුදුමාකාර නිහඬ නිසල බවකි.

'මාමා යන්න මාමේ... අපි යන්නම්...'

ප්‍රියංවද වර්ෂාගේ අතින් අල්ලාගෙන බස් රියට නැඟ කීවාය.

'එන්න රෑ වෙනවනම් කෝල් එකක් දෙන්න ලොකු දුව... තේරුණාද...'

'හොඳමයි මාමේ...'

ජීවිතය කොතරම් පුදුමාකාරද... අද ජීවිතයට රැකවරණය දෙන්නේ මෙතුවක් ජීවිතයේ උන් මිනිසුන් නොවේ.

'ඔයාට මාමේ මං කොච්චර ආදරේ කළාද... පුංචි කාලේ ඔයා ගෙදර එනවා කිව්වොත් මට ඊට වැඩිය දෙයක් නෑ...' වර්ෂා සිතුවේ මොරගොඩ මහතා ගැනය. සුරම්‍යා අරම කළ එක ගැන ඇයට පුදුම නැත. එහෙත් මාමාත් තමාව කොන් කළා යැයි ඇගේ සිත කියන්නට විය.

'කෙල්ලේ...'

වර්ෂා අනුරාධපුර කොළඹ පාරට පසුවෙන කළුවර කෙත්වතු දෙස බලාගෙන කල්පනා කරද්දී ප්‍රියංවද කතා කළාය.

'ම්...'

'මොනාද හිතන්නේ...'

'මුකුත් නෑ කෙල්ලේ...'

'උඹ බයෙන් වගේ නේද මේ ගමන යන්නේ...'

'අනේ මන්ද කෙල්ලේ... ම..ගේ හිතට මහ මොකක්ද දැනෙනවා...'

'ගිහින් ඉක්මනට එමු... අපරාදේ මං මේ මෝඩ ගමනක් දාගත්තේ...'

වර්ෂා සිනාසී ප්‍රියංවදගේ අතක් අල්ලාගත්තාය.

'එ..ක පාරක් හරි එයාගේ මූණ බලාගන්න ඕන...'

'නොහිතපු දෙයක් දකින්න වෙයිද අපිට...'

ප්‍රියංවද ඇසුවේ චකිතයෙනි.

'ම..ට අයියව විශ්වාසයි ප්‍රියා... එයා එහෙම ක..ර..න්..නෑ... එයාට එහෙම මා..ව දලා...'

රජරට අහස දෙස බලාගෙන උන් වර්ෂාගේ දෑස් තෙමී තෙමී ගියේය.





'උඹේ විශ්වාසෙ මට හරි පු..දු..ම..යි... ඒත් මොරගොඩ ගෙදර ලොකු...'

'මඟුලකට ලෑස්ති වෙනවා.. මට ඒක දැනෙනවා ප්‍රියා...'

'ක..වු..ද දන්නේ.. ඒ.. මඟුල අද..ද හෙ..ට..ද කියලා...'

'ම්.. වෙන්නත් පුළුවන්... ඒත්... මට මගේ විශ්වාසේ ඉන්න දීපත් කෙල්ලේ... එ..යා ගැ..න ම..ට ඒ තරම් භක්තියක් තියෙනවා...'

ප්‍රියංවද කෙල්ලගේ අත ගෙන සනීපෙට පිරිමැද්දය.

'විමුක්ති අයියා උඹව දලා කොහොම අර හෝන්තුව බඳින්නද නේද... එහෙම වෙන්නේ නෑ තමා...'

'ඒක විශ්වාසයක් ප්‍රියා... මං.. එහෙම අදහනවා... උඹ දන්නවද එද මං නැන්දට ලේ පෙරාගෙන ඒක කියලා ආවේ... මං අඬ අඬ එයාට ඒක කිව්වා...'

'මො..නා..ව ද උඹ කිව්වේ...'

'පුළුවන් නම් පුතාව වෙන ගෑණියෙක්ට බන්දලා දෙන්න කියලා... මං එද කිව්වා විමුක්ති අයියා බැන්දෙත් බඳින්නේ මාව විතරයි කියලා... එහෙම නොවුණොත් එයාගේ ජීවිතේ විනාශ කරපු වගකීම එයාට ගන්නත් කියලා මං ආවේ... එද මට එහෙම විශ්වාසයක් ඇති වුණා ප්‍රියා... එද අයියයි මමයි කළුවර ගිය දවසෙ... මුළු දවසෙම මම හිටියේ එයත් එක්ක... මේ.. බ..ඩ..ට මේ..කා ආ..වෙ..ත් එ..ද... ඊ..ට ක..ළි..න් අපි එ..හෙ..ම ඉඳලා නෑ... එද එහෙම නැන්දට කිව්වෙත් ඒ තරම් විශ්වාසයක් මට තිබ්බ නිසා... එයාලා මඟුල් ගෙවල් දයි... ඒත් මගේ කොල්ලව අයිති කරගන්න එයාලට බෑ... බෑම තමයි...'

ආදරයකට මේ තරම් බලයක් තිබෙනා බව ප්‍රියංවද දැන උන්නේ නැත. මේ ආදරයට මේ තරම් බලගතු බලයක් එන්නේ මේ කෙල්ලගේ හදවතේ ඇති ආදරය නිසාය.

ඇත්තම කිවහොත් ඔහුට ඒ තරම් ආදරය කරන්නට කිසිවකුත් මේ මිහිතලය මතින් සොයා ගත නොහැක.

'ම..ට හරි ආසයි අඩුම ගානේ මේ..ඩ..ක්..ක..ව වත් හම්බ වෙන්න... ඒත් බෑ... මේ ප්‍රශ්නේ දෙවියන්ට මං බාර කරලා තියෙන්නේ... අම්මත් මා ගාව ඉන්නවනේ කෙල්ලේ... මට පිහිටක් ලැබෙයි...'

'ඔව්... උඹට පිහිටක් ලැබෙයි... අපි එතකල් ඉවසමු කෙල්ලේ... උඹ කියනවා වගේ මේ කාලේ අපි ඉවසමු...'

'එයාව දෙයියෝ මට ඇරෙන්න කාටවත් දෙන්නෑ කෙල්ලේ... දෙයියෙක් එහෙම පවක් කර ගනීද...'

වර්ෂා කියනා දේවල් වලට ප්‍රියංවදගේ පපුව හිරි වැටී යන්නට විය. ආදරය දෑසට පෙනි පෙනී අහිමි වී ගොස් තිබියදී... නන්නාඳුනන නගරයක බඩදරු අම්මා කෙනෙක් වී අනාථව සිටියදී තමන්ගේම කියනා අයගෙන් ලොව ඇති රුදුරුම තින්දුව විඳ තිබියදී මේ කෙල්ල මේ තරම් විශ්වාසයෙන් සිතන්නේ කෙසේද...

විමුක්ති බොහෝ සේ හොඳ කෙනෙකු බව ප්‍රියංවදද දනී... එහෙත් ඔහු කෙදිනක හෝ ඒවි යැයි සිතන්නේ කෙසේද... රහසේ හැංගී ගිය තමා වෙනුවෙන්ම ජීවත් වේවි යැයි සිතන්නේ කෙසේද...

ඔහුගේ විවාහය කොහොමත් තිබුනේ ලියාපදිංචි කරය. එසේ තිබියදී ඔහුට ඕනා වේලාවක මංජුලා සමඟ ජීවත් විය හැක. එසේ තිබියදී ඔහුගේ ඇඟේ රස්නයක් වත් මංජුලාට විඳ ගන්නට නොහැකි වෙතැයි වර්ෂා සිතන්නේ කෙසේද...

ප්‍රියංවද තම උරහිසට බරව ඉන්නා ඇගේ මුහුණ දෙස බලා උන්නාය. දඹුල්ල දෙසට එද්දී පෙරදිග අහස පුරා යංතම් ආලෝක පදස සටහන් වෙන්නට විය. ඊටත් පසු පෙරදිග අහසම රන්වන් පැහැයට හැරිණි. වර්ෂා අලුත් හිරු කිරණින් එළිය වූ වෙල් යායවල් දෙස බලා උන්නේ ආශාවෙනි.

බස් රිය උදෑසන තේ බීම පිණිස දඹුල්ල පසු කර නැවතිණ.

'යන් කෙල්ලේ මොනවා හරි කමු... උඹට බඩගින්නේ ඉන්න





හොඳ නෑ...'

'අද නම් බඩගින්නක් නෑ...'

'එහෙම බෑ... වරෙන්...'

ප්‍රියංවද වර්ෂාගේ අතින් අල්ලාගෙනම ඇයව බැස්සුවාය. ඔහු එනවාම නම් මේ කෙල්ලව ඇස් දෙක සේ බලා ගත යුතු නොවේද... නැත්නම් ඔහු දෙස් කියනු ඇත. ප්‍රියංවදට සිතුණේ එලෙසිනි.

'ඔහොම ඉඳගෙන ඉඳපන්...'

ගස් යට තැන තැන කුඩා මේස දමා තිබුණි. වර්ෂාට හෝටලය තුළට යන ප්‍රියංවද ගැන දුක සිතුණි. ඇය තමාව බලාගන්නේ කොතරම් ආදරයකින්ද...

දඹුල්ල කුරුණෑගල පාරට එහා පැත්තෙන් වූ දිග කුඹුරු යාය දෙසින් ආ පවන් පොද වර්ෂා විඳගත්තේ ආශාවෙනි. මුළු බස් රියම බැස තැන තැන උදේ ආහාරය ගනිති. තේ බොති. මේ අත්දැකීම් ඇයට නුපුරුදුය. එහෙත් මේ ජීවිතයේ කොතරම් නුපුරුදු දේවල් වලට දන් පුරුදු වෙන්නට තියෙනවාද...

මේ තරම් ඉක්මනින් දරුවකු හදන්නට හිතකවත් තිබ්බේ නැත. එහෙත් දන් ජීවිතය ගෙවෙන්නේ මාතෘ සායන වලය... පුංචි කිරි සිහින වලය. ඔහු මේවා දන්නවා නම්...

ප්‍රියංවද ඒ ඉක්මනට වේටර් කොල්ලෙක්ව අල්ලාගෙනය. ඇය තමාට වඩා ජීවිතයේ බැට කෑ කෙල්ලෙකි. ඒ නිසා සමාජයට බය නැත.

'හරි මල්ලී... ඔහොම තියන්න... ආ.. මේක තියාගන්න...'

ප්‍රියංවද කොල්ලා අත රුපියල් විස්සක් තැබුවාය. වර්ෂා ප්‍රියංවද දෙස බලා සිනාසුණාය.

'මාර සෙනහ බං... මං පොඩි එකාව අල්ල ගත්තා...'

ප්‍රියංවද ඉදිආප්පත් උණුවෙන් දමූ පොල් රොටි කිහිපයකුත් හාල්මැස්සන් හොද්දකුත් පොල් සම්බෝල ටිකකුත් ගෙනවිත් තිබුණාය.

'මාළු තිබ්බා කෙල්ලේ... මං ගත්තේ නෑ... දන්නෑනේ අලුත්

මාළුද කියලා... මේ දවස්වල බඩ අමාරු වෙන්න හොඳ නෑ...'

ඇය තමාව බලා ගන්නේ කොතරම් ආදරයෙන්ද...

'අ..නේ මේ ඇති කෙල්ලේ...'

'හිටපන්... කෝ... මං උඹට බිත්තර ආප්පෙකුත් ගෙනත් දෙන්නම්... උණුවෙන් දද හිටිය...'

'මේ.. ඇ..ති...'

'හිටපන් වස්තුවේ...'

වර්ෂා දුව යන ප්‍රියංවද දෙස බලා උන්නේ දුකිනි. ටික වෙලාවකින් ඇය ආවේ උණු බිත්තර ආප්ප දෙකකුත් කට්ට සම්බෝලයකුත් අරගෙනය.

'ඔහොම කාපන් කෙල්ලේ... කොළඹ හෝටල්වලට ගිහින් කන්න බෑනේ... නැත්නම් උඹ බඩගින්නේ...'

'මට බඩගින්නේ ඉඳලා පුරුදුයි...'

'උඹටත් පුරුදුයි මටත් පුරුදුයි... ඒත් බඩේ ඉන්න එකාට පුරුදු නෑනේ...'

එක අතකට ප්‍රියංවද කියනා කතාව ඇත්තය. මේ බඩේ ඉන්නා දරුවා වෙනුවෙන් මේ දස මාසය කැප විය යුතුමය. ඔහු ඉන්නා කාලයක මෙසේ බඩ වුවා නම් ඔහු තමාට වේල් දහයක් පහළොවක් කවනු ඇත.

'ප්‍රියා...'

'කෙල්ලේ...'

'තව මාස හයකින් පැටියා එනව නේද...'

ඇයටත් හිතෙන්නේ පුදුමාකාර දේවල්ය.

'ඒකනේ... උඹ කනවා මදි කෙල්ලේ...'

'මං ඇවිත් කන්නම්...'





'උඹත් දුර්වලයි නේ... අපි කොළඹින් බඩු ටිකකුත් අරන් එමු...'

'එහෙම කොළඹින් මොනවත් ඕන නෑ කෙල්ලේ... අර අම්මා උයන කිරි කොස් මාළුවයි වැව් මාළුවයි අඟුණ කොළ සම්බෝලෙයි ඇති...'

'අපි අලුත් වෙල් මාළු ටිකක් කමු... පැටියා එනකොට ඌට හොඳට කිරි තියෙයි...'

ඒ දවස් වර්ෂා මවා ගන්නට උත්සාහ කළාය. තවම එහෙම අමාරුය.

# 02

විමුක්ති ඇහැරුණේ ප්‍රමාද වී‍ය. ඔහු පැය දෙකක්වත් නිදගත්තේ නැත. මුළු රාත්‍රිය පුරාම ඔහුගේ හිස හිරි වැටුණාක් මෙන් විය.

තමා මේ අවදි වූයේ තම විවාහයට පෙර දිනට බව විමුක්ති දැන උන්නේය. ජීවිතය වෙනුවෙන් ගන්නා තීරණයක් ගත යුත්තේ අද දිනය තුළය.

විමුක්ති දිග සුසුමක් හෙළා ඇඳේ පහළට බේරී වැටුණේය. ඔහුට ටයිල් පොළොව මැදින් පෙනෙන්නේද වර්ෂාවය.

'හෙට මං බඳිනවා... මොකද උඹ හිනාවෙන්නේ... මං බඳී කියලා හිතනවද... ආ... උඹ හොඳටම දන්නවා මං එහෙම කරන්නැ කියලා නේද... එහෙනම් කොහෙද හැංගිලා උඹ ඉන්නේ... නේද...'

විමුක්ති බිමට හුල්ලමින් කීවේය. මේ කෙල්ල කොහේ ඉන්නවා ඇත්ද... ඇය එසේ ටික කාලයකට හෝ සැඟවී ගියේ මේ ප්‍රශ්න ටික කලකින් නොවිසඳෙන බව දැනගෙනද... මේ සෙනෙහස ජීවිතය පුරා තියා ගන්නවාද නැද්ද කියා තීරණය කළ යුත්තේ තමාය. කෙල්ලට ඒ වෙනුවෙන් කළ යුතු දෙයක් ඇත්තටම නැත. වර්ෂා





හොරු අරගෙන ගියාක් මෙන් සැඟවී ගියේ ඒ නිසාද...

දැන් කුමක් කරන්නද... කොහේ කියා යන්නද... හෙට උදේ නමයේ සිට කොළඹ ප්‍රධාන පෙළේ තරු පහේ හෝටලයකට ආරාධිත අමුත්තන් එක් වන්නේ තම මංගල උළෙලටය.

පුදුමය. මේ මොහොතේදී ඒ වෙනුවෙන් සියල්ල සකසා ඇති බව විමුක්ති දනී... එහෙත්... එසේ විය හැකිද...

කාමරයේ දුරකථනය නාද විය. විමුක්ති එය අතට ගත්තේ දැස් පියාගෙනමය.

'හෙලෝ...'

එහා පසින් ආවේ මංජුලාගේ හඬය.

'ගුඩ් මෝනිං මනමාල මහත්තයා...'

'මෝනිං...'

ඔහු දැස් පොඩි කරමින් කතා කළේය.

'දැන්ද ඇහැරුණේ...'

'ම්.. ඇයි කතා කළේ...'

'ඒක මාර වැඩක්නේ... හෙට මැරි කරනවා... අද වයිෆ් කතා කළාම අහනවා ඇයි කතා කළේ කියලා... හෙට ඉඳලා අපි එකම බෙඩ් එකක ඉන්නේ... නිදගන්නේ...'

විමුක්තිට මංජුලාගේ වචන තේරුණේ මහා විහිළුවක් ලෙසිනි. එසේ විය හැකිද... විය හැකි නම් ඊට වඩා පුදුමයක් තවත් නැත.

'ෆොටෝග්‍රැෆර් පොඩ්ඩක් ඔයාව හම්බවෙන්න ඕනලු...'

'මාව.. ඒ මොකටද...'

'වෙඩින් ෆොටෝ එකට ලෙන්ස් එහෙම සිලෙක්ට් කර ගන්න...'

'ඒකට මාව මොකට හම්බවෙන්නද...'

'මංද... ඔන්න තව දෙයක්.. මං මැලේෂියා ටිකට් ගත්තා හොඳද... හෙට වෙඩින් එකෙන් පස්සේ අපි ටිකකට ගෙදර ආවා... හරියට රෑ හත අට වෙද්දී එයාර් පෝට් එකේ...'

'බලමුකෝ...'

මධුසමයට මැලේෂියා යන්නට නම් විවාහ විය යුතුය. විවාහ මංගල උත්සවයට තව ඇත්තේ පැය විසි හතරකටත් වඩා අඩු කාලයකි. එහෙත්...

'එහෙම කියලා බෑ... යන්නම ඕන... සති දෙකක්වත් ඉමු...'

විමුක්ති කට කොනකින් සිනාසුණේය.

'ටිකට් එක පරිස්සම් කරලා තියාගන්න... සමහර විට ඒක රිෆන්ඩ් කර ගන්න වෙයි...'

'ඇයි ඒ...'

'සමහර විට...'

විමුක්ති කීවේ එපමණකි. දන් ඔහුව පෙරටත් වඩා ඇවිලෙයි.

ඒත් මංජුලා සිතුවේ හෙටින් පසු තත්වය මීට වඩා බොහෝ සෙයින් වෙනස් බවය. 'උඹ හෙට මාව බැඳලා අනිද්දා ඕන නම් ඩිවෝස් කරපන්... එදට මට දීපන් අඩුම ගානේ කෝටි දෙකක් වත්... නැත්නම් මම ඩිවෝස් එක දෙන්නේ නෑ... උඹව මරාගෙන කනවා... හෙට හවස් වෙනකල් මට කල් දීපන්...'

කෙනෙක් හිතන්නේ හිතනා දේවල් සතුව බලයක් නැතැයි කියාය. කෙනෙක් දෙයක් සිතද්දී ඒ තරංග එහෙමම අවටට විහිදී යයි. කෙනෙක් අයහපත් දෙයක් සිතුවහොත් උපදින්නේ විෂ තරංගය. ඒවා ඉතා ඉක්මනින් අන් අයට පැතිරී යයි.

මංජුලාව දකිද්දී විමුක්තිට අපුලක් එන්නේ ඒ නිසාය.

'අනුලක්කේ...'

විමුක්ති කාමරයේ දොර ළඟට ගොස් කෑගැසුවේය. ඔහුට ඇත්තටම අනුලාව ඕන වූයේ අවශ්‍යතාවයකට නොවේ. හදවතට දනුණ අතිශය දරුණු පාළුවටය. බියටය.

'ඇ..යි පුං..චි ම..හ..ත්..තයෝ...'

අනුලා ආවේ දුවගෙනය. බඩදරු ගෑණි දුවගෙන එනවා දුටු විට විමුක්තිගේ බඩ පපුව පිච්චීගෙන ගියේය.





'අ..නේ මං හදිස්සියකට කතා කළා නෙමේ...'

ඔහු මෘදුව කීවේය.

'මං බය වුණාත් එක්ක...'

අනුලා විමුක්ති දෙස බලා කීවේය.

'ම..ට හ..රි පාළුවක් ආවා අනුලක්කේ... හරි බයක්...'

අනුලා මේ සද්ධන්ත කොල්ලා දෙස බලා හීල්ලුවාය. තව දිනයකින් ඔහුට බාර ගන්නට වන දෛවය සියල්ලන්ම හොඳින් දන උන්නෝය. ඔහුද ඒ බැව් දන උන්නේය.

'ම..ට තේරෙනවා... ඊයේ රෑ මායි ධනෙයි මේධා නෝනලගේ ගෙදරත් ගියා...'

විමුක්ති ඇඳ මත ඉඳගත්තේ ඇස් පුංචි කරගෙනය.

'මොනාද ඔයාලා කතා කළේ...'

'අපේ පුංචි මහත්තයයි වර්ෂා නංගියි ගැන තමා...'

'අනුලා...'

'මේ වැරැද්ද මගේ අතින් උනොත් අනුලක්කේ මම හොඳ මිනිහෙක් නෙමේ... ඒ කෙල්ල ම..ට මො..න..ව..ද නු..දු..න්..නේ...'

විමුක්තිගේ දෑසේ කඳුළු පිරී ගියේය. අනුලා ඔහු ළඟටම විත් ඒ හිස පිරිමැද්දේ දුකත් ආදරයත් කැටිවූ හදවතිනි.

'උ..ද..වි..ව..ක් තියෙනවනම් ම..ට කි..ය..න්..න ර..ත්ත..රන් මහත්තයෝ... මං කරන්..න..ම්.. අන්තිම මොහොතේ හරි මං කරන්නම්...'

කරුමය එවැන්නක් සිහි නොවීමය.

'මොනවා හරි කරන්න වෙනවා අනුලක්කේ...'

අනුලාට කිසිවක් කතා කරන්නට බැරි විය. දෙවියන් මේ තරම් මිනිසුන්ව අසරණ කරන්නේ ඇයි... මේ තරම් නපුරු දෛවයන්ට මැදි කරන්නේ ඇයි...

'මං තේ ටිකක් අරන් එන්නම්...'

අනුලා කාමරයෙන් පිට වන්නට හැදුවා පමණි. විමුක්ති හිස



Hemantha007
For free distribution

වැරෙන් බදගෙන ඇඳට බර විය.

'ආ... අ..ම්..මා...'

ඔහුට හිටි හැටියේම සිදු වූයේ කුමක්ද... අනුලා දුවගෙන මෙන් පැමිණ විමුක්තිගේ හිස අල්ලා ගත්තාය.

'ඇ..යි පුංචි මහත්තයෝ...'

'ම..ගේ ඔ..ළුව අනු..ල..ක්..කේ...'

'ඇ..යි...'

'මො..ක..ක්..ද හි..ර..වෙ..න..වා වගේ...'

'අ..නේ ඉ..න්..න මම...'

'එපා.. මේ පැත්ත ටිකක් මසාජ් කරන්න අනුලක්කේ... තව තද කරලා...'

අනුලා ඔහුගේ හිස සැහෙන වේලාවක් මසාජ් කළාය. ඇයට පුදුමය. මේ උදෑසනේදීත් ඔහුගේ වත පුරාම දහදියය.

'පු..ං..චි ම..හ..ත්..ත..යා...'

'වෙලාවකට එහෙම හිරවෙනවා අනුලක්කේ... හිතාගන්න බෑ...'

'ප්‍රශ්නමනේ ඔළුවේ... දත් නාන්න එහෙම එපා... මං රස්නෙට තේ ටිකක් හදගෙන එන්නම්...'

අනුලාට පහළට යද්දී හීල්ලින. පහළ සූරම්‍යා බලාගෙන උන්නාය. ඇයට මේ කිසිවක් තේරුම් ගන්නට තරම් හිතක් නැත.

'පුංචි මහත්තයා මොනාද කරන්නේ අනුලා...'

'ද..න් නැ..හි..ට්ටේ ලොකු නෝ..නා...'

'පුදුම මනමාලයෙක්... අද බුක් ෂොප් එකත් වහලනේ... ගෙදර ඉඳපුදෙන්...'

අනුලා කිසිවක් කීවේ නැත. වර්ෂා මේ ගෙදරින් හිටි හැටියේම ගියේ මේ කිසිවක් දරා ගන්නට බැරි වූ නිසා නොවේද... ගැණු කරන දේවල් වල කොතරම් ඇත්තක් තිබෙනවාද...

අනුලාට කුස්සියට යද්දී බැලුනේ වර්ෂාගේ කාමරය දෙසය.





එද වැසූ පසු එය අරින්නට වත් ඇය ගියේ නැත. 'ඒත් උඹ නංගියේ කවදහරි මේ ගෙදරටම එනවා... ඒක මට නිකමට හිතෙනවා...' අනුලා සිතුවාය.

විමුක්ති ගෙදරින් පිටවී කෙළින්ම ආවේ පොත් හලටය. අම්මා සතියක් එය වසා දමන්නට කීවද විමුක්ති පොත් හල වැසුවේ නැත. මේ විවාහය වෙනුවෙන් මේ ජීවිතයේ අල්ප මාත්‍ර හෝ දෙයක් වෙනස් කරගන්නට ඔහු කැමති වූයේ නැත.

උදේම ශ්වේතා පැමිණ උන්නාය. විමුක්තිගේ මුහුණ දකිත්ම ශ්වේතාගේ පපුව හෝස් ගා ඇවිලිණි. ඒ තරම් අසරණ මුහුණක් ඇය කෙදිනකවත් ඔහුගෙන් දක තිබුනේ නැත.

විමුක්ති පොත් හලේ ඔහුගේ කාමරයට පැමිණ එහෙමම දෑතින් හිස ඔබා ගත්තේය. ශ්වේතා ඔහු සමීපයට ආවේ බොඳ වූ දෙනෙතිනි.

'අ..යි..යේ...'

'ම..ට පි..හි..ට..ක් ඇත්තෙම නැද්ද නංගී...'

ඔහු අසනා දේට පිළිතුරු දෙන්නේ කෙසේද...

'ම..ම අයියේ...'

'ඔව් ඔයාලා ළඟ කොහෙද තීරණ... ඇත්ත තීරණ ගන්න ඕන මායි...'

'අ..යියේ...'

'කියන්න නංගි...'

'ඒ..යා..ව බ..දි..න..ව..ද...'

ශ්වේතා ඇසුවේ කඳුළු වැටෙද්දීය. විමුක්ති ඒ කඳුළු දෙස මොහොතක් බලා උන්නේය.

'මං.. එ..හෙ..ම කරයි කියලා ඔයා හිතනවද...'

ශ්වේතා නැහැයි කියන්නට මෙන් හිස දෙපසට වැනුවාය.

'ඒ..ත් අ..යියේ ඔ..යා...'

'මො..නා..ද කරන්නේ නේ..ද...'

'ම්...'

'මොනවා හරි දෙයක් ඇති...'

ශ්වේතාට වර්ෂාව අද උදේ සිට සිහිවෙන්නට විය. ඒ ඇගේ ඉරණම ගැන දුක සිතීය. එහෙත් මේ දන් විමුක්ති කියන්නේ මොනවාද...

'උදෙන්ම බැංකුවට යන්න...'

විමුක්ති ශ්වේතාට කීවේය.

'ගි..හි..න් අයියේ...'

'ම..ට සල්ලි ටිකක් ඕ..න චෙක් එකක් දෙන්නම් මාරු කරන් එන්න...'

ඔහු හදිස්සියේ මුදල් ගන්නේ ඇයි...

'හි..ත..න් ඉන්න දෙයක් තියේ..න..ම් කියන්න අ..යියේ...'

'කියන්නම් නංගී... බැංකුවට ගිහින් එන්නකෝ...'

විමුක්ති කීවේ එපමණකි. ශ්වේතා ගිය පසු ඔහු ඔහුගේ ජංගම දුරකථනයෙන් ගුවන් ටිකට් පත් වෙන් කරනා ආයතනයක් කරන ඔහුගේ මිතුරෙකුට කතා කළේය.

'ස..කුන්ත... මචං මම විමුක්ති...'

'විමුක්ති... ඉතින් කොහොමද මචං... උඹ මැරි කරන්න යනවා කියලා ආරංචියි...'

'තවම නෑ... මට පොඩි හදිස්සියක් මචං...'

'කියපන් මචං මොනාද කරන්න ඕන...'

'අද රෑ සිංගප්පූරුවට ෆ්ලයිට් තියෙනවද...'

'ඔව්... ෆ්ලයිට් දෙකක් තියෙනවා... රෑ දෙළහට එකක් තියෙනවා... පාන්දර දෙකට අනිත් එක... ඇයි මචං...'

'මට මිඩ් නයිට් ෆ්ලයිට් එකේ සීට් එකක් බුක් කරපන් මචං... දන්මම...'





'උඹට අදම යන්න ඕනද...'

'ඔව්... අදම... අද රෑම.. බුක් කරලා කතා කරපන්... මං උඹට සල්ලි එවන්නම්...'

'පිස්සුද මචං... ඇවිත් දීපන්... මං බුක් කරලා උඹට කතා කරන්නම්...'

'ඉක්මනට මචං...'

විමුක්ති දුරකථනය වසා බැලුවේ පොත් හල දෙසය. වර්ෂා පොත් හල මැදින් තමා වෙතට එන්නාක් මෙන් ඔහුට හිතෙන්නට විය.

තමා සිංගප්පූරුවට යන්නට සිතුවේ ඇයි... ඒ සිතුවිල්ල ආවේ කොහෙන්ද... මේ ප්‍රශ්නයෙන් පැන යනවා ඇරෙන්නට වෙන විසඳුමක් ඇත්තටම නැත.

'මං තීරණ ගන්න කල් ගත්තා වැඩියි... මට තිබ්බා උඹවත් එක්කගෙනම රටකට යන්න... එහෙනම් අපි දිනුම්...' විමුක්ති එසේ සිතුවේය. 'අදවත් දන්නවනම් උඹ කොහෙද ඉන්නේ කියලා මම අද රෑම උඹව එක්කගෙන යනවා... ඒත් ඔයා කොහෙද රත්තරන්...' විමුක්ති දිග සුසුමක් හෙළමින් සිතුවේය.

තමා සිංගප්පූරු ගිය විට හෙට මොරගොඩ පවුලට වෙන නින්දව ගැන විමුක්ති දන උන්නේය. එහෙත් ඒ නින්දව එක මොහොතක් තුළ ඇති වන්නකි. ඒ නින්දවට බයේ තම ජීවිතයම කඳුළු ගඟක් කර ගත හැකිද... නැත.

ආදරය කළේ මෙසේ කඳුළු ඇස්වල තබාගෙන වෙන්ව යන්නට නම් නොවේ.

'අ..යි..යේ...'

විමුක්ති ශ්වේතා දෙස බැලුවේය.

'සතියක් දෙකක් සමහර විට මාසයක් මාස දෙකක්...'

'ඉතින්...'

'මං නැති උනොත් බුක්ෂොප් එක බලාගන්න පුළුවන් නේද....'

'ම..ම... අයියේ... ඇයි අ..යියා...'

'මට කියන්න පුළුවන්ද කියලා...'

'පුළු..ව..න්... ඒ..ත්.. මු..ලින් අ..ක්කා ගියා.. ද..න්...'

'ඔව් මං දන්නවා...'

'එහෙනම් පුළුවන් නේද.. මං අයියටත් කියන්නම් මේ පැත්ත බලන්න කියලා...'

'අ..යියේ...'

'කො..හෙ..ද ය..න්..නේ...'

විමුක්ති කිසිවක් කීවේ නැත.

'මං කියන්නම්... නොකියා යන්නෑ...'

'කො..හෙ..ද...'

'බැංකුවට යන්නකෝ නංගියේ...'

විමුක්ති චෙක්පතක් ලියා ශ්වේතා අත තැබුවේය. ඔහු මේ තරම් මුදලක් එකවර ගන්නේ ඇයි... ශ්වේතාට එය සිතා ගත නොහැකි විය.

'මේ ප්‍රශ්නේ එයා කොහොම විසඳන්නද...' ශ්වේතා පොත් හලේ කවුන්ටරයට එමින් සිතුවාය.





# 03

වර්ෂාත් ප්‍රියංවදත් පිටකොටුවෙන් බැස්සේ මීට පැයකට පමණ පෙරය. ප්‍රියංවදට වර්ෂාව තනියෙන් බැංකුවට එවන්නට සිතුනේ නැත.

'මගේ සැටිෆිකට් ටික එන ගමන් ගමු... දන් බැංකුවට ගිහින් උඹේ වැඩේ කරමු...'

'ඒත් ප්‍රියා...'

'උඹ කියන්නේ උඹව තනියෙන් යවන්න කියලද... බෑ කෙල්ලේ...'

'අපි රෑ වෙන්න කලින් යන්නත් ඕනනේ...'

'ඒක පුළුවන්... රෑ උනොත් මං දන්න තැනක් තියෙනවා නතර වෙන්න... උඹ බයවෙන්නෙපා...'

'ම..ට මේ කො..ළඹ න..ත..ර වෙ..න්..න තැ..න..ක් නෑ..නේ කෙ..ල්ලේ...'

'මං දන්නවා... යමන් බැංකුවට...'

වර්ෂාත් ප්‍රියංවදත් නුගේගොඩ බැංකුවට යන්නට බස් රියට නැග්ගේ ඉන් පසුය. ඒ යන අතරවාරයේ පොත් හල පැත්තටද

ගොස් ඔහුගේ මුහුණ බලාගත යුතුය. යළි මාස දහයකට ඒ මුහුණ පෙනෙන්නේ නැත.

කොළඹ සිදුවෙමින් පැවති කිසිවක් වර්ෂා දන උන්නේ නැත. හෙට විමුක්තිගේ විවාහය යෙදී ඇති බවද ඇය දන උන්නේ නැත. එවැන්නක් දන උන්නා නම් ඇය මේ ගමන කිසිවිටකවත් එන්නේද නැත.

වර්ෂාත් ප්‍රියංවදත් නුගේගොඩින් බැස්සේත් ශ්වේතා විමුක්ති දුන් චෙක්පත රැගෙන බැංකුව වෙත පිය නැඟුවේත් එකම විටය.

වර්ෂා බැංකුවට යන්නට ප්‍රථම පොත් හලට පෙනෙන නොපෙනෙන මානයේ තිබූ කඩයක දෙරකඩට වී ඒ දෙස බැලුවාය. ඔහුගේ වාහනය පොත් හල ඉදිරියේ ඇත. 'අනේ වස්තුවේ චුට්ටකට එළියට එන්නකෝ... මටයි මගේ පැටියටයි ඔයාගේ මූණ ටිකක් බලාගන්න...' වර්ෂා සිතුවේ ප්‍රියංවදගේ අත දැඩිව අල්ලාගෙනය.

'අයියා ඇතුලෙනේ කෙල්ලේ... අ..නේ කො..හො..ම..ද...'

වර්ෂාට ඇඬුණි. ඔහුගේ මුහුණ බලාගන්නට නම් පොත් හලට යා යුතුමය. එය කෙසේ නම් කරන්නද...

එහෙත් ඒ මුහුණ නොබලා යා නොහැක. කොහොමටත් යා නොහැක.

'අපි ටිකක් වෙලා ඉමු කෙල්ලේ... අයියා එළියට එයි...'

'මං කො..ච්..චර අසරණද...'

වර්ෂා දෙනෙතේ මතුවූ කඳුළු පිසදමමින් සිතුවාය. එහෙත් දිගටම කඳුළු උනයි. ඇය කඩයේ අගුවට වී පොත් හල දෙසම බලා උන්නාය.

මුලින්ම ශ්වේතා දුටුවේ වර්ෂාව නොවේ. ප්‍රියංවදවය. ඇයව දකිද්දී කෙල්ලට මහා සතුටක් ඇතිවිය. ඇගෙන් වර්ෂා ගැන තොරතුරක් ලබා ගත හැකි බව ඇයට ප්‍රියංවදව දුටුවනම හැඟී ගියේය. ප්‍රියංවද ළඟට දුවගෙන එන්නට හදද්දීම දුටු දසුනින් ශ්වේතාව උන් තැනම ගල් ගැසුණි. ඇයට ඇස් අදහාගත නොහැකි විය. එහෙමම මදටිය ඇට තරම් කඳුළු කැට දෙකක් ශ්වේතාගේ





දෑසින් පැන්නේය.

ඇය දුටුවේ ඉස්සි ඉස්සී පොත්හල දෙස බලමින් උන් අසරණ වර්ෂාවය. ශ්වේතා අතකින් මුව වසා ගත්තේ ඇයට එහෙමම ඇඬෙන්නට ආ නිසාය.

කෙල්ල අඩියක් වත් පෙරට තබන්නට බැරි තරමට ගල් ගැසී උන්නාය.

'දෙ..යි..ය..නේ.. මේ...'

කෑ ගසා ඇයට කතා කරන්නට හැදුවද ඇගේ මුවින් වචනයක්වත් පිට වූයේ නැත.

ඊළඟ තත්පරයේදී ඇය අමාරුවෙන් වෙව්ලන දෙපා වාරු කරගෙන වර්ෂා වෙත දුව ආවාය.

කෙල්ලන් දෙදෙනා එකිනෙකාව දක්කේ අඩි පහක් පමණ පරතරයක් ඔවුන් අතර තිබියදීය. කෙල්ලෝ දෙන්නාටම ඇඬුණේ එකම විටය.

'නං..ගි..යේ.. නං...'

වර්ෂා කතා කළේද අමාරුවෙනි. ඊළඟ මොහොතේදී ඔවුන් දෙදෙනා එකිනෙකාව වැළඳ ගත්තේ අඬාගෙනමය. ප්‍රියංවද දෙන්නාගේම හිස පිරිමැද්දය.

'අ..නේ අ..ක්..කේ.. ම..ම...'

'මු..කු..ත් කි..ය..න්..නෙ..පා කෙ..ල්..ලේ මං.. දන්නවා මා..ව හෙව්වා කියලා...'

'අ..නේ මං හි..තු..වේ නෑ අ..ක්..කේ මෙහෙම...'

'අ..ඬ..න්..නෙ..පා නංගියේ...'

ශ්වේතා වර්ෂාගේ මුහුණ පමණක් නොව අත පයද අතගෑවාය.

'ම..ට හ..රි සතුටුයි...'

'අ..නේ අ..යියා ඇ..තු..ලේ ඉ..න්..නා..වා අ..පි ය..න්..කෝ මේ දනුත්...'

ශ්වේතා ගොත ගසමින් කීවාය.

‘දැ..නු..ත් ම..ත..ක් කළාද...’

‘නොකරන්නේ කවදද.. ඒ.. ජී..වි..තේ..ම...’

‘එ..හෙ..ම කි..ය..න්..නෙ..පා කෙල්ලේ...’

‘අ..පි.. ටි..ක..ක් එ..හා..ට ය..න් අ..ක්..කේ...’

ශ්වේතා වර්ෂාවත් ප්‍රියංවදවත් රැගෙන මාවතින් තරමක් මෑතින් වූ ගස යටට ගියාය.

‘දැ..නු..ත් ඇ..ස්..වල ක..දුළු තිය..න් උන්නේ... පව්.. බලන් ඉන්න බෑ... මේ වගේම තමයි...’

ශ්වේතා කීවේ වර්ෂාගේද දෙනෙත් දෙස බලාය.

‘අ..පි..ට එ..හෙ..ම ඉ..න්..න..ම වෙ..නවා නංගියේ...’

‘ඒ..ත්...’

ශ්වේතා වර්ෂා දෙස බැලුවේ බියමුසුවය. මේ සිදුවන කිසිවක් ඇය දන්නේම නැද්ද...

‘අ..යියා ගො..ඩක් අස..රණ වෙලා ඉ..න්..නේ... හරි පුදුමයි.. ඒත්... අ..ක්..ක..ට...’

‘ආදරෙයි... නේද කෙල්ලේ...’

‘ම්.. කො..හො..ම..ද එ..හෙම ආ..ද..රේ කරන්නේ... දැ..න් ඔයා මෙතන හැංගිලා හිටියේ අ..යියව බ..ල..න්..න නේද...’

වර්ෂා දෑස් මිරිකමින් හිස සැළුවාය.

‘ඇ..යි දෙ..යියෝ මේ අපරාදේ කර..න්..නේ...’

ශ්වේතා බිම බලාගෙන කීවාය. වර්ෂාට ඇගේ මුහුණින් අමුත්තක් දැනුණි. ඇය තදින් ඇගේ අත අල්ලා ගත්තාය.

‘නංගියේ...’

‘ඒ..ක එ..හෙ..ම..ම වෙයිද අ..ක්..කේ...’

ශ්වේතා කතා කළේ අඩමිනි.

‘මො..ක..ක්..ද නං..ගියේ...’





එකවරම ශ්වේතා හිස එසෙව්වාය. නැත. ඇය දන්නේ නැත. හෙට මේ විවාහ මංගල උත්සවය පැවැත්වෙන බව ඇය දන්නේ නැත.

‘අ..ක්..ක දැ..න්..නේ.. නෑ...’

ශ්වේතා ඇසුවේ ගොත ගසමිනි. එය එසේ වේ නම් කොච්චර අපරාධයක්ද...

‘මො..ක..ක්..ද කෙල්ලේ... මො..කක්ද මො..ක..ක්ද වෙ..න්..නේ...’

‘මේ.. හෙ..ට වෙ..න්..න ය..න දේ...’

වර්ෂාගේ පමණක් නොව එය අසා උන් ප්‍රියංවදගේද යටි පතුල් සීතල වීගෙන ගියේය.

‘නංගී... මොකක්ද හෙට වෙන්නේ... ඇයි උඹ මේ...’

කෙල්ලට ආයෙත් ඇඬුණි. වර්ෂාට මහා බියක් දැනෙන්නට විය. ඇය ශ්වේතාගේ උරතලය මතන් සූරත තැබුවේ ගල් ගැසුණාක් මෙනි.

‘නංගී...’

‘එ..යා..ලා ඒ..ක ක..රයිද අක්කේ...’

‘මා..ව පු..ච්..ච..න්..නේ නැ..තු..ව කිය..ප..න් ව..ස්..තු..වේ... මො.ක..ක්..ද...’

ශ්වේතා වර්ෂාගේ දෑතින්ම අල්ලා ගත්තාය. ඊටත් පසු එක දිගට වර්ෂා දෙස බලා උන්නාය.

‘අ..ක්..කේ...’

‘මො..න..ව..ද වෙ..න්..නේ නංගියේ...’

‘මංජුලා..ගෙ..යි අ..යිය..ගෙ..යි...’

වර්ෂා කතා කළේ නැත. ඇය එක දිගටම ශ්වේතා දෙස බලා උන්නාය. එය පුදුමාකාර බැල්මකි. පු..දු..මා..කා..ර බැල්මකි. ටික වේලාවකට පසු වර්ෂා ශ්වේතා දෙස බලාගෙන කඳුළු අතරින් සිනාසුණාය. ශ්වේතා පමණක් නොව ප්‍රියංවදද ඒ දෙස බලා උන්නේ පුදුමයෙනි.

'හෙ..ට උ..දේ ද..හ..ය..ට වෙ..ඩි..න් එ...'

ශ්වේතා කියන්නට ගිය දේ වර්ෂා වැළැක්වූවාය.

'ම..ගේ විමුක්ති ම..ට එ..හෙ..ම ක..ර..න්..නේ නෑ... එ..හෙ..ම වෙ..න්..නෑ... අ..පරාදේ වෙ..ඩි..න් එ..කට එ..න ක..ට්ටිය.. 'ම..න..මාලි ඉ..දි..යි... ම..න..මා..ලයා නෑ.. ප..ව්...'

වර්ෂා කතා කළේ එක කඳුළක්වත් නොහෙලාය. ශ්වේතා ප්‍රියංවද දෙස බැලුවාය. එසේ වන්නේ කෙසේද... හෙට මුළු මොරගොඩ පරම්පරාව ඉදිරියේම ඒ මංගල්‍යය සිදුවෙයි.

'ම..ට ම..ගේ විමුක්තිව විශ්වාසයි... ම..ට..ත් වඩා... එයා දෙවියෙ..ක්... එ..යා.. ම..ගේ ම..ගේම වි..ත..ර..යි.. එහෙම කා..ටවත්...'

ඒ ටික කියාගෙන යද්දී වර්ෂාගේ කටහඬ බිඳී ගියේය.

'අ..ඩන්නෙපා අක්කේ දරාගන්න... අයියා අසරණයි...'

'එයා එහෙම අසරණ වෙන්නෑ... එ..යා ම..ගේ... කා..ට..ව..ත් ම..ගේ වි..මු..ක්..තිව අ..යි..ති වෙ..න්..නෑ...'

ශ්වේතා වර්ෂාගේ අතකින් තදින් අල්ලා ගත්තාය.

'එ..හෙ...න..ම් ය..න්... ඔයාගේ විමුක්ති ඔයාව හොයනවා... දුක් විඳිනවා... ය..න්... ගිහින් බලන්න ඔයාගේ කොල්ල දුක් විඳින හැටි... යන්... උදේ මූණ දකිද්දී...'

ශ්වේතා අඩමින් පොත් හල පෙන්නුවාය.

'මො..නා ක..ර..න්..න ය..න..වද කො..හේ ය..යිද... දෙ..යියෝ තමා ද..න්..නේ... අ..නේ ඔ..යා වෙනුවෙන් ඔයාගේ විමුක්ති පිච්චෙන හැටි ඔයා ද..න්..නා..ව නම්...'

'මං ද..න්..නවා නංගියේ... එ..යා එහෙම දු..ක් විඳින්නේ මං නිසා... මේ හිඟන කෙ..ල්ල නිසා...'

'ගිහින් එ..ක පාර..ක් ඒ මූ..ණ අතගාලා එ..න්..න...'

වර්ෂා බැලුවේ තම අත්ල දෙසය.





'එ..හෙ..ම පු..එ..ව..න් න..ම් කො..ච්චර හොඳද... ඒත්...'

'වෙඩින් කාඩ් බෙදලා රටටම අඩබෙර ගහලා මහ මඟුලක් කන්න යන්නේ... ම..ට පුදුමයි...'

'එ..යා..ලා පව්...'

වර්ෂා මහ පාර දෙස බලාගෙන සිතුවාය.

'ඒ..ත් ඔ..යාගේ විමු..ක්ති මොනවා කියලා ක..ර..න්..නද...'

'ද..න්..නෑ... ඒ..ත් එ..යා...'

පපුව කඩා ඉහිරීගෙන එන සෙයක් වර්ෂාට දැනුණි. එහෙමම ඇගේ දෑස් මළානික වී නිලංකාර වී ගෙන යන්නට විය... ඇය කඩා වැටුණේ ප්‍රියංවදගේ වතටය.

'අ..නේ.. කෙ..ල්..ලේ...'

ප්‍රියංවද කෑගැසුවාය.

'අ..නේ අක්කේ... මේ.. මොකද වුණේ... ප්‍රියා අක්කේ... ඇයි මේ...'

'ඉක්මන් කරපන් නංගියේ... අර පො..ඩි කඩේට.. අරගෙන යන්...'

ප්‍රියංවදත් ශ්වේතාත් දෙදෙනාම එක්ව වර්ෂාව වත්තන් කරගෙන අසළ වූ කුඩා තේ කඩයට ගෙන ගියෝය.

'අ..නේ ව..තු..ර ටිකක් දෙන්න...'

කඩයේ උන් වයසක මුදලාලි වහා වතුර වීදුරුවක් දුන්නේය. ප්‍රියංවද වඩාත් බිය වූයේ වර්ෂා උන් තත්වය නිසාය.

'අනේ මේ තත්වේ තියෙද්දී කෙල්ලට...'

කියවෙන්නට ගිය දේ ප්‍රියංවද ගිල ගත්තාය. වර්ෂාගේ මූහුණට වතුර ඉසිමින් ශ්වේතා ප්‍රියංවද දෙස බැලුවාය.

'න්..නෑ... නංගී දිගටම අස..නී..පෙ..න් හිටි..යේ...'

'පව්...'

ශ්වේතාට ඒ ගැන සැකයක් ඇති නොවීම ප්‍රියංවදගේ සැනසීමට

හේතු විය.

˙කෙ..ල්ලේ... කෙ..ල්ලේ...˙

වර්ෂා වතුර බිංදු මුහුණ මත තිබියදී දෙනෙත් විවර කළේ අමාරුවෙනි. ඇය ප්‍රියංවදගේ උරතලයට බරවී යළිත් ඇඬුවාය.

˙එ..හෙ..ම වෙ..න්..න බෑ නේද ප්‍රියා... ම..ගේ විමුක්ති එ..හෙ..ම...˙

ප්‍රියංවදගේ පමණක් නොව ශ්වේතාගේද බඩ පපුව පිච්චීගෙන ගියේය.

˙එ..යා..ට ක..ර..දරයක් නෑ නේද...˙

˙නෑ.. ඒත්...˙

˙ම..ට මො..න..වත් කියන්න එපා නංගියේ... එයා හෙ..ට මංජුලාව බඳින්නෑ... එහෙම වෙන්නෑ... එයා මගේ... එයා ම..ගේ මේ උ..කුලේ නිදගෙන කි..ව්වේ... ම..ගේ දෙ..යියෝ... මා..ව දා..ලා ය..න්..නෑ ය..න්..නෙ..ම නෑ...˙

ආදරයකට මේ තරම් බලයක් ඇත්ද... ශ්වේතාට උදේ විමුක්ති කී දේ සිහිවිය. ˙නංගි හිතනවද මං එහෙම කරයි කියලා...˙ පුදුමය.

˙ඔ..ය වි..ශ්..වා..සෙ..ම ඉ..න්..න ර..ත්..ත..ර..න්... ඒ..ක..ත් තව පැය කීයද... ඔ..යා කිය..න්..න ඔයා..ගේ විමුක්තිව එ..හෙම ඒකිට දෙ..න්..නෙ..පා කියලා...˙

˙කි..ය..න්..න දෙයක් නෑ නං..ගියේ... දෙ..යියෝ එ..හෙම කරනවා...˙

වර්ෂා නැගිට්ටාය. ඒ අනුව ශ්වේතාද නැගිට්ටාය.

˙උ..දේ.. අ..යියා මේ.. චෙ..ක් එක දු..න්..නා මා..රු ක..රගෙන එ..න්න කියලා... ලො..කු ගාණක්...˙

˙මෙ..ච්චර ගා..ණ..ක් ඇයි ඒ..˙

˙දන්නෑ...˙

ඔහු මේ තරම් මුදලක් එකවර ගන්නේ ඇයි...

˙බු..ක් ෂොප් එ..ක මා..ස..ය..ක් දෙ..ක..ක් ම..ට බලාගන්න





පුළුවන් නේ..ද කියල..ත්...˙

වර්ෂාට විමුක්ති එසේ කියන්නට ඇත්තේ ඇයිදැයි සිතාගන්නට නොහැකි විය.

˙නං..ගී...˙

˙කියන්න අ..ක්කේ... මේ අත් දෙකින් ඕන දෙයක් කරන්නම්.. මට ජීවිතයක් දුන්නේ ඔයා...˙

වර්ෂා ශ්වේතාගේ දෑත තදින් අල්ලා ගත්තාය.

˙කි..ය..න්..න අක්කේ...˙

˙මා..ව මෙහෙම හම්බ උනා කියලා අයියට කියන්නෙපා... එයාට මේ වෙලාවේ මං ගාවට එන්න බෑ...˙

˙ඒත්...˙

˙මට තේරෙනවා නංගියේ... යන්න පුළුවන් නම් මං මේ සෙරෙප්පු දෙක දාලා බුක්ෂොප් එකට දුවන් යන්නේ... ඒත් බෑ... මට පිහිට වෙයන් කෙල්ලේ...˙

˙අ..නේ මං...˙

˙මං දන්නවා...˙

˙කියන්නෙපා... එයා ඒකෙන් තවත් අසරණ වෙනවා... මට පොරොන්දු වෙයන්...˙

˙මං පො..රො..න්දු වෙනවා... කියන්නෑ... ඒත් මට අක්කා ඉ..න්න තැනක්...˙

˙මං උඹට කතා කරන්නම් නංගියේ...˙

˙මී.. ඔයා නැතුව කොච්චර පාළුද... බුක් ෂොප් එකම හිස්...˙

˙දවසක එනවා...˙

˙ඕකම එයා කිව්වා... අයියා අද උදේ කිව්වා... ඉන්න බුක් ෂොප් එක දාලා යනවා කිව්වාම එයා කිව්වා... අද කිව්වා...˙

˙මොකක්ද කිව්වේ...˙

‘දවසක අපි දෙන්නම බුක් ෂොප් එකට එනවා කියලා...’

කඳුළු අලුත් විය. ඒවා එහෙමම පැන්නේය. ඇය ප්‍රියංවද දෙස බැලුවේ ‘බලන්න’ කියා මෙනි.

‘ඔව් එ..න..වා... ක..ව..ද..හරි එනවා...’

‘මං අයියට කියන්නෑ... ඒත් ද..වසක එ..යාට ඇවිත්...’

‘මං එනවා වස්තුවේ... මං කොහොමද මගේ පණ නැතුව ඉන්නේ...’

‘අක්කා ජී..ව..ත් වෙන්..නෙ..වත් කො..හො..ම..ද.. මම ගිහින් සල්ලි ටි..කක් වත් අ..රන් එන්නද...’

වර්ෂාට මේ කෙල්ල ගැන ඇතිවූයේ පුදුමාකාර දුකකි.

‘එ..පා කෙ..ල්ලේ... දනට තියෙනවා... ඕ..න උ..නොත් මං උඹට කියන්නම්...’

‘අ..නේ.. පව්... ද...න් ගියානම් දෙන්නටම දෙන්නා ගැනම.. දු..ක හිතෙයි...’

වර්ෂා උණු කඳුළු ගලන දෙනෙත පිසද ගත්තාය. ඊටත් පසු සිනාසෙන්නට වෙර දරුවාය.

‘උඹත් වෙඩින් එකට යන්න ඇඳුම් ලෑස්ති කළාද...’

‘ම..ම.. අ..ක්ක එ..හෙම හිතනවද...’

‘මං උඹ ගැන දන්නවා... බයවෙන්නෙපා... මගේ කොල්ලා ඔය වෙඩින් එකට එන්නෑ...’

ඇය නැවත නැවතත් මෙසේ කියන්නේ කෙසේද...

‘එහෙනම් ගිහින් අයියට චෙක් එක මාරු කරලා සල්ලි ගිහින් දීපන්... එයාට මොකක් හරි ඕන කමක් ඇති...’

‘දි..ග..ටම කල්පනා කරනවා... පව්... දිගටම මතක් වෙනවා ඇති...’

‘එ..යා එ..හෙමයි... හ..රි පු..දු..ම කෙ..නෙක්...’





වර්ෂා උන්නේ හිරිවැටීගෙනය. මේ කිසිවක් ඇයට අදහාගත නොහැක. හදවත ඇතුලාන්තයෙන් දැවෙමින් පිච්චෙමින් තිබුණි.

‘නං..ගි..යේ... ම..ට අයියව එ..ක පා..ර..ක් බල..න්..න ඕන... ඒත් එ..යා එළියට එ..න්නෑ..නේ..’

ශ්වේතා වර්ෂාගේ අත අල්ලාගෙනම කල්පනා කරන්ට වූවාය.

‘මං ගිහින් අයිය එළියට එවන්නම්... බයවෙන්නෙපා... ම..ට කතා කරනවා නේද...’

‘ඔ..ව්.. බුදු සරණයි...’

‘බු..දු සරණයි.. ප..රි..ස්..ස..මින් ඉ..න්න අ..ක්..කේ...’

කෙල්ලෝ දෙන්නා වැළඳගෙන මොහොතක් උන්නෝය.

‘ය..න්..නම් ප්‍රියා අක්කේ...’

‘හොඳයි කෙල්ලේ...’

වර්ෂා හිරි වැටී ගියාක් මෙන් ශ්වේතා යන අයුරු බලා උන්නාය. ප්‍රියංවද ඇගේ උරතලය මතට සුරත තැබුවේ අමාරුවෙනි.

‘කෙ..ල්..ලේ...’

ඇය කතා කළේ උගුරින් මෙනි.

‘ප්‍රියා...’

‘මෙ..හෙ..ම...’

‘ම..ට ම..ට..ත් ව..ඩා එ..යාව විශ්වාසයි ප්‍රියා... ඒ.. වි..ශ්වාසේ එයා බි..ඳින්නේ නෑ... විමුක්ති කියන්නේ දෙවියෙක් ප්‍රියා...’

දෙනෝ දහක් දෙනා යන පාර අයිනේදී වර්ෂාගේ දෙනෙත් එක දිගට තෙත් වෙමින් තිබුණි. ශ්වේතා පොත් හල ඇතුළට පිය මැන්නේ ඒ මොහොතේදීය.

ඔහු උන්නේ බිත්තිය දෙස බලාගෙනය.

‘අ..යියේ...’

‘ම්...’

‘ස..ල්ලි ගෙනාවද නං..ගී...’

ශ්වේතාගේ දෑස්වල වූ කඳුළුත් මුහුණේ වූ වෙනසත් විමුක්ති දුටුවනම හඳුනාගත්තේය. 'ඔයාගේ කෙල්ල අර කඩ අගුවේ ඉන්නවා කියලා ඔයාට කියන්න පුළුවන් නම්' ශ්වේතා සිතුවේ පපුවට අතක් තබාගෙනය.

'ඇ..යි නං..ගී...'

'නෑ.. මූ..කුත් නෑ.. අ..යියේ...'

'එ..හෙ..න..ම්...'

'මේ..වා ගැ..න හිත..ද්දී ම..ට දු..කයි...'

විමුක්ති නැඟිට විත් කෙල්ලගේ හිස පිරිමැද්දේය.

'අඩන්නෙපා... දෛවය කොහොම හරි අපිට...'

'ඔව්... එච්චර විශ්වාසෙකින් එයත් කියනවනේ...'

'කවුද... කවුද නංගිට එ..හෙම...'

'නෑ.. ඒ.. දවස්වල අ..ක්කා.. කිය..න..වනේ...'

විමුක්ති දුක්බර ලෙස බලා උන්නේය.

'අ..යියේ.. සොරි මේ ම..ම අ..ද අයි. ඩී. එ...ක ගෙ..න..ත් නෑ... මේක ම..ට මාරු කරන්..න...'

'කමක් නෑ දෙන්න නංගී... මං යන ගමන් කෑෂ් කරන් යන්නම්...'

විමුක්ති ශ්වේතාගේ අතින් චෙක්පත ගත්තේය.

'අ..යියේ...'

'කො..හෙද ය..න්න හ..දන්නේ...'

'මං ඇවිත් කියන්නම් නංගී...'

'අනේ ඔයා යන ගමන ඔයාගේ කෙල්ලවත් ඔතනින් තියාගෙන ගියානම්...' එහෙත් හිතනා දේවල් ඒ අයුරින්ම කළ හැකිද...

විමුක්ති යතුරත් ගෙන පොත් හලෙන් පිටතට ආවේ මොකක්දෝ අමුත්තක් හදවතට දැනෙද්දීය. ඔහු පිටතට එනවාත් සමඟම වර්ෂාගේ පපුව සිරවී ගියේය.

විමුක්තිට මහ පුදුමාකාර හැඟීමක් දැනුණි. ඔහු පොත් හල



Hemantha007
For free distribution



ඉදිරිපිට නවතා තිබූ වාහනයට නොනැග එහි දෙරකඩ සිටගෙන මාවත දෙස බලා උන්නේය. 'උඹ මේ කොහේ හරි ඉඳන් මං දිහා බලා ඉන්නවා වගෙයි මට දැනෙන්නේ නංගියේ...' විමුක්තිට ඇත්තටම එසේ සිතුණි. ඒ සිතුවිල්ල පුදුමාකාරය.

ආදරයට මහා තරංග බලයක් ඇත. හදවතකින් පිටවෙන ඒ තරංග වලට පුදුමාකාර ගුප්ත වේගයක් ඇත. මේ මොහොතේ විමුක්තිට දැනුනේ පාරේ කොනක කඩ අගුවක් යටට වී උන් වර්ෂාගේ හදවතින් නික්මුණු තරංග වල බලයය.

විමුක්ති වාහනයේ දොර ඇරත් මොහොතක් බලා උන්නේය.

වර්ෂා ඔහුව දැක්කේ එවිටය. ඇය දෑතම පපුවට තබා ගත්තාය.

'අනේ රත්තරන්... මේ ඔයාව දකින අවසාන පාරද... නෑ... එහෙම වෙන්න බෑ නේද... ඔයා එහෙම කාටවත් අයිති වෙන්නේ නෑ නේද වස්තුවේ...'

වර්ෂාට ඇඬුණි. ඇය ඔහු දෙස බලා උන්නේ ප්‍රියංවදගේ උරහිසට බරවී ඉකිබිඳිමිනි.

'තව චුට්ටක් ඔහොමම ඉන්න රත්තරන්... දැන් මට විතරක් නෙමේනේ ඔයාව බලාගන්න ඕන... මගේ බඩේ ඉන්න ඔයාගේ පැටියවත් තාත්තිව බලාගන්න ඕනනේ... අනේ මං එයාට කිව්වා තාත්ති පැටියා අපට එහෙම කරන්නෑ කියලා... ම..ගේ දරුවා වෙනුවෙන් වත් දුවන් ඇවිත් ඔයාව නවත්තන්න මට බෑ දෙයියෝ... එච්චරටම අද මේ කෙල්ල අසරණයි...'

විමුක්ති වාහනයට නැග්ගේ ටික වේලාවක් උන් පසුය. වාහනයට ගොඩ වූ පසුවත් ඔහුට අර අමුත්ත දිගින් දිගටම දැනෙන්නට විය.

'මේ යන පාරකවත් බැරිවෙලාවත් උඹව හම්බවෙනව නම්... එහෙනම් මේ ජීවිතේ ගැන මට තීරණයක් ගන්න පුළුවන්...'

විමුක්ති සිතුවේ එහෙමය.

'ඔයා මෙහෙම මං ළඟින්ම යද්දී දුවගෙන දුවගෙන ගිහින් ඔයාගේ වාහනේට හැප්පෙන්න හිතෙනවා රත්තරන්... දෛවය අපි

දෙන්නා මැද්දෙන් ඉරක් ඇඳලා... ඔයාට මං ළඟට එන්න බෑ... මට ඔයා ළඟට එන්න බෑ... මොනවා කරන්නද කියලා දෙයියොවත් කියන්නෑ...'

වර්ෂා සිතුවේ එහෙමය.

හයිලෙවල් පාරට විමුක්ති වාහනය දැම්මේය. ඇය කඩ අගුවේ සිට වාහනයේ පැති වීදුරුව අතරින් පෙනෙන ඔහුගේ රුව දෙස බලාගෙනම උන්නාය. ලේවල පුසුඹ පවා ඉඹ ඉඹ විඳගත් ආදරය මෙසේ ළඟින් යද්දී ඒ ශරීරයේ ස්පර්ශ නොකර ඉන්නට ගැහැණු හිතක් හද ගැනීම කොච්චර අමාරු දැයි දන්නේ ලේ පුසුඹ දැනෙන ලෙස ඇට මස් නහර වල රස්නය දැනෙන ලෙස ඒ පිරිමි සිරුරට තද වී උන් ගැහැණු හිතක් පමණි.

ඔහු ඇය උන් කඩ අගුව අසළින් වාහනය ගත්තේය. එවිටම වාගේ වාහන තදබදයක් ඇති විය. විමුක්ති වාහනය නතර කර බලාගත්වනම බලා උන්නේය.

වර්ෂා අඩි දහයක් දොළහක් තරම් දුරකදී ඔහුගේ මුහුණ දැකගත්තේය. ඇගේ දෙනෙත් පලාගෙන දිය සීරාවකින් මෙන් කඳුළු ගලාගෙන යන්නට විය.

'මේ පැත්ත නම් බලන්න එපා වස්තුවේ... අ..නේ ම..ට දරාගන්න බෑ ර..ත්..තරන්... දුවන් ඇවිත් වාහනේ දොර ඇරගෙන ඉස්සරහ සීට් එකේ ඉඳගන්න හිතෙනවා රත්තරන්...'

මේ මොහොතේ නිකමට වත් විමුක්ති කඩය දෙස බැලුවා නම් ඔහුට නෙත් පුරා අඬමින් කඩ අගුවේ ඉන්නා ඇයව දැකගන්නට තිබුණි.

ඇත්තටම විමුක්ති බැලුවේය. එහෙත් ඒත් සමඟම හයිලෙවල් පාරේ ගමන් ගත් බස් රියක් පැමිණ වාහනයට මුවා විය.

'අ..නේ උ..ඹ..ව වෙ..වි..ල..න..වා කෙ..ල්..ලේ...'

වර්ෂාගේ අතකින් අල්ල උන් ප්‍රියංවද කීවේ අසරණවය.

'ම..ට බ..ල..න් ඉ..න්..න බෑ ප්‍රි..යා දු..ව..න් ය..න්..න හි..තෙ..න..වා...'





'ඉ..ති..න් ප..ල..ය..න් කෙ..ල්ලේ...'

'අ..නේ.. මං.. එ..හෙ..ම කො..හො..ම..ද ප්‍රි..යා ක..ර..න්..නේ...'

'ඒ..ත්.. මේ ක..සා..දේ උ..නො..ත් කෙ..ල්..ලේ...'

'උ..ඹ දැ..ක්..කද කෙ..ල්..ලේ ඒ මූ..ණ... අ..නේ එ..යා එ..හෙ..ම ක..රයි කියලා හිතන්න පුළුවන්ද...'

නැත... ප්‍රියංවද විමුක්තිගේ දුක්බර මුහුණින් දුටුවේ වර්ෂාගේ ඡායාවය. එහෙත් මොරගොඩ තිවස මහ මඟුලකට සැරසෙයි. ඒ ඇත්ත වසන් කළ නොහැක.

'අ..යි..යා උ..ඹ..ට නැ..ති..වෙයි කෙ..ල්ලේ...'

ප්‍රියංවද හිතාමතා එසේ කීවේ නැත. එහෙත් අමු අමුවේ පෙනෙන ඇත්ත වසන් කර දමන්නට කාටවත් නොහැක.

'මේ..ක..ගේ තා..ත්..තා.. එ..හෙම ක..ර..යි..ද ප්‍රි..යා...'

වර්ෂා ඇසුවේ ඇගේ කුසට අතක් තබාය. මේ ජීවිත දෙක අතර තවත් අලුත් ජීවිතයක් ඇති බව සියල්ලන්ටම අමතක වේ. එහෙත් ඒ දරුවා කුස තබාගෙන ඉන්නා අම්මාට එය අමතක කළ නොහැක. මේ කෙල්ල මේ කඩ අගුවලට හැංහෙමින් දුක් විඳින්නේ තමා වෙනුවෙන් පමණක් නොව කුසේ සිටිනා දරුවාත් වෙනුවෙනි.

'අ..පි කො..ළ..ඹ ආ..පු එ..කේ මේ..ක..ට මො..නව හරි ක..ර..න්..න පු..එ..ව..න් නම් කර..මු කෙල්ලේ...'

ප්‍රියංවද කීවේ ඇත්තටම මේ දුප්පත් කෙල්ලගේ ජීවිතය ගැන උපන් මහා දුකකිනි.

'ය..න පා..ර..ක ති..යෙ..න ප..න්..සල..කට දේවා..ලෙ..ක..ට ගිහින් දෙ..යියන්ට බු..දුන්ට මේ දු..ක කි..ය..නවා ඇ..රෙ..න්..න මං වෙ..න මො..ක..ක් ක..ර..න්..න..ද ප්‍රියා...'

ඇත්තද එයමය. ජීවන මහමඟ හද්ද දුකකට පත්වී අසරණව ඉන්නා මේ ජීවිතයට කළ හැකි අන් යමක් ඇත්ද...

'මං එ..යා..ට එ..ද බර්ත් ඩේ එක දවසෙදි කිව්වා... කල්පයක් ගියත් එයා එනකල් බලන් ඉන්නවා කියලා... එයාට ඒවා අලුතෙන්

කියන්න දෙයක් නෑ... අන්තිම දවසේ කළුතරදීත් කිව්වා... යන්න උනොත් මං යනවා... කියලා...˙

˙ඒත් මේ..වා වෙ..න්..නේ අ..යියගේ ඕ..න..ක..මට නෙමේ..නේ කෙල්ලේ...˙

˙ඇ..ත්..ත ප්‍රියා... ඒත්... ම..ගේ...˙

වර්ෂාට කතා කරගන්නට පවා බැරි විය. ඇය ප්‍රියංවදගේ උරහිසට බරවී ඉකිබිඳින්නට විය. මේ ආදරය උපන්නේම මහා දුකක් පපුවට දීය.

˙අ..නේ මේ ම..හ පා..ර ර..ත්..ත..ර..න්...˙

ආදරයක දුක පපුවට එන්නේ තැනක් නොතැනක් නොබලාය.

˙ම..ට ම..ගේ ආ..ද..රේ වි..ත..ර..යි වි..ශ්..වා..ස ප්‍රියා... එ..ච්..ච..ර..යි...˙

වර්ෂා කීවේ ඔහු ගිය පසු හිස්ව තිබූ මාවත දෙස බලාය.

˙අ..පි ය..න්...˙

මේ යන්නේ ඔහුව දමාද... සදහටම හැර දමාද... පපුවට එහෙම හිතෙන එකත් මහා දුකකි.

˙අ..ක්..කේ...˙

ශ්වේතා ආවේ හති දමමිනි. වර්ෂා ඇය දෙස බැලුවේ පෙහුණු දෑසිණි. ශ්වේතා දුවගෙන විත් වර්ෂාගේ දෑතින්ම අල්ලා ගත්තාය.

˙මං.. ය..නවා නං..ගියේ...˙

ශ්වේතා කතා කර ගත නොහැකිව මොහොතක් බලා උන්නාය. මේ ගලන ආදර ගඟ වෙනතකට හැරවිය හැකිද... නැත. එය කිසිසේත් කළ නොහැක.

˙එ..ක ව..තා..ව..ක් අ..යි..යව හම්බවෙලා ය..න්..න අ..ක්..කේ...˙

˙බෑ... නංගියේ... එ..යා මේ වෙලාවේ අ..ස..ර..ණ..යි... ම..ට බෑ... ඒ මූ..ණ බ..ල..න්..න...˙

˙ඒ..ත් තීරණයක් ග..න්..න...˙





˙අ..ර..න් තියෙ..න්..නේ කෙ..ල්ලේ...˙

˙ඒ කියන්..නේ...˙

˙එ..යා එ..යි... මං.. බලා ඉන්නවා...˙

වර්ෂාට බැලුනේ තම කුස දෙසය. ˙මගේ පැටියයි මායි දෙන්නම බලන් ඉන්නවා...˙ එසේ සිතුවද ඇය කීවේ නැත.

ශ්වේතා වෙව්ලන වර්ෂාගේ අත පිරිමැද්දය. ඇය ලොවට නොපෙනෙනා හදවතින් කොතරම් දුකක් විඳිනවා ඇත්දැයි ඉන්ම කිව හැක.

˙දෙ..ය..ක් කිය..න්..න දු..ව..න් ආවේ...˙

ශ්වේතා කීවාය.

˙කිය..පන් කෙ..ල්..ලේ...˙

˙අ..ද හෙ..ට අ..නි..ද්දා.. මො..නව වෙයිද කියලා හිතාගන්න බෑ.. ඒත්...˙

˙ඇයි...˙

˙හරි බයක් දනෙනවා අක්කේ... මහා මූසල දු..ක..ක්...˙

ඒ දුක වැඩියෙන්ම දනෙන්නේ මේ තනි පපුවට බව කාට කියන්නද...

˙මො..නවා උ..න..ත් එයා වෙනු..වෙ..න්...˙

˙ජීවත් වෙනවා...˙

ශ්වේතා අසන්නටත් පෙර වර්ෂා කීවාය.

˙ම..ට එ..ච්..ච..ර..යි දැ..න..ග..න්..න ඕ..න...˙

˙මැ..රෙ..න්..න හිතෙනවා.. ඒත් දැ..න් එ..හෙම බෑ...˙

දරුවා ගැන වර්ෂා නොකීවේ ශ්වේතාව අවිශ්වාස කළ නිසා නොවේ. ඇයට එය දරාගත නොහැකිව විමුක්තිට කියන බව දන්නා නිසාය.

˙අ..යි..යා එයි... ම..ට හිතෙ..නවා මෙ..හේ වෙන දේ..වල් හි..ත..න්..නෙ..පා...˙

නොහිතා කොහොමද... ජීවිතයේ ඇති එකමක සන්තකය අන් සතු වෙන්නට යද්දී ගැණියෙක්ට අන් දෙයක් සිතෙයිද...

'දැ..න් ගියා.. දැක්කද...'

'ම්... පපුවේ කැල්ලක් කඩාගෙන ව..ගේ ගි..යේ...'

'දනුත් අයියා යන්න ඇත්තේ අක්කා ගැන හිත හිත...'

'ම..ට ඒ..ක දැ..නෙ..නවා නංගියේ...'

ඔහු සිතන සිතුවිල්ලක් පාසා ඇයට සිතෙයි. සිතට මේ තරම් දුකත් ඒකමය.

'හෙ..ට කීය..ට..ද... මේ...'

වර්ෂා අහන්නේ විමුක්තිගේත් මංජුලාගේත් මංගල උත්සවය ගැන බව  ශ්වේතා දනී.

'ඒ..වා අහන්නෙපා ර..ත්තරන් අක්කේ... මේ මූණ බලාගෙන කියන්නේ කොහොමද...'

ශ්වේතා කීවේ බිම බලාගෙනය.

'ක..ම..ක් නෑ.. මං... මං...'

'ඔච්චර අසරණ වෙන්නෙපා අක්කේ... ආයෙත් මේ මහ පාරවල් වල අගු යටට එන්නත් එපා...'

'ම..ට කො..හො..ම..ත් එ..න්..න බෑ නං..ගියේ... මේ ආවෙත්...'

කුස තුළ දරුවා මෝරන්නට ගත් පසු මේ ගමන් බිමන් කළ නොහැක.

'මට කතා කරනවා නේද...'

'ම්.. එ..යා මො..න..වද කරන්න හදන්නේ...'

'හිතාගන්..න..ම බෑ.. කතා කරලා අහන්නකෝ...'

වර්ෂා කිසිවක් කීවේ නැත. ඇය ශ්වේතාගේ මුහුණ දෙස තවත් මොහොතක් බලා හිඳ දිග සුසුමක් හෙළුවාය.





# 04

**බැංකුවෙන්** මුදල් ගනිද්දී විමුක්ති වර්ෂාගේ ඉතිරි කිරීමේ ගිණුමටත් සල්ලි ටිකක් දැම්මේය. කෙල්ල කොහේ හිටියත් ඇයට ජීවත්වෙන්නට දේකුත් නැති බව ඇය දනගෙන උන්නාය.

'අද උඹ හිටියනම් මම උඹව එක්කගෙන යනවා... ඒත් ඇයි මං මේ තීරණේ එද ගත්තේ නැත්තේ... එහෙනම් තාමත් උඹ මං ළඟ නංගියේ...' විමුක්ති ඇත්තටම තැවුනේය.

විමුක්තිගේ ජංගම දුරකතනය නාද වූයේ ඔහු බැංකුවෙන් එළියට වහිනවාත් සමඟමය.

කතා කළේ සුරම්‍යාය. හෙට මඟුල තිබ්බෙද ඇයට මේ කොල්ලා ගැන බයය.

'පොඩි පුතා...'

'කියන්න අම්මේ...'

අම්මා දන් මොනවා කීවද තමාව වැළැක්විය නොහැක. සිදුවිය යුතු දේ සිදු වනු ඇත.

'කොහෙද මේ මංගල්ලයක් කටේ තියාගෙන රස්තියාදු ගහන්නේ...

බුක් ෂොප් එකේ බැලුවා එහෙත් නෑ...’

‘මං මේ බැංකුවට ආවා...’

‘සල්ලි ඉල්ලුවා නම් මං දෙනවනේ... මොකටද බැංකුවල රස්තියාදු වෙන්න ගියේ...’

‘ඇයි අම්මා කතා කළේ...’

‘හවස වැඩ මොනවත් දගන්නෙපා... ගෙදර ඉන්න ඕන... ඇඳුම් ටික ගෙනාවද...’

‘ගේනවා...’

‘විමුක්ති... මේක ඔයාගේ වෙඩින් එක...’

‘දන්නවා අම්මේ...’

‘මං අයියලටත් හවස එන්න කිව්වා... අද ඔයා තනියම ඉන්න අන්තිම දවස... හෙට ඉඳලා මං මගේ වගකීම අර කෙල්ලට දෙනවා...’

විමුක්ති කිසිවක් කීවේ නැත. ඔහු තම දෛවයට සිනාසුණේය.

‘මං එන්නම්...’

එපමණක් කියා විමුක්ති දුරකථනය තැබුවේය. වාහනයට නඟින්නට ප්‍රථම විමුක්ති සිතන්නට ගත්තේය.

‘සකු... මම විමුක්ති...’

ගුවන් ටිකට් පත මේ ගමන්ම අතට ගන්නට ඔහු සිතාගෙන උන්නේය.

‘හරි විමුක්ති... මං ටිකට් ඉෂූ කරලා තියෙන්නේ... මං උඹට ඇවිත් දෙන්නද...’

‘එපා මචං... මම එන්නම්... කීයටද සිංගප්පූ වලට ෆ්ලයිට් එක තියෙන්නේ...’

‘රෑ දොළහමාරට මචං... පාන්දර එහෙට ලෑන්ඩ් කරන්නේ... මං රිටන් එක දැම්මේ නෑ විමුක්ති... උඹ දවසක් කිව්වේ නැනේ...’

මේ යන ගමන ගැන මිස යළි එන දවසක් ගැන ඔහුට සිතා





ගැනීමට අමාරුය.

‘මං බලලා ඒක ගන්නම් සකු...’

විමුක්ති මහපාරට වාහනය දැම්මේ අරමුණකින් තොරවය. ඒ වෙද්දී ඒ ළඟම බස් රියක වර්ෂා හිස ගසාගෙන උන්නාය.

‘මට ගිහින් වත් උඹට කතා කර ගන්න විදිහක් නෑනේ... එහෙම උනානම් කොච්චර හොඳද...’

විමුක්ති දහ අතේ සිතුවේය.

‘ඔයා හෙට දවසට මුහුණ දෙන්නේ කොහොමද රත්තරන්... අනේ මට ඒක හිතාගන්න බෑනේ...’

ඒ ළඟම උන් වර්ෂා සිතුවාය.

වර්ෂාත් ප්‍රියංවදත් බැංකුවට ගියේ විමුක්ති ඉන් පිටව ගොස් සෑහෙන වේලාවකට පසුය. ඉතිරි කිරීමේ ගිණුමේ මහ සල්ලියක් ඉතිරි වී නැත. එහෙත් ඉතිරිව තිබූ කීය හෝ අද ගත යුතුය. නව මාස හය හතකින් මෙළොව එළිය දකින්නේ ඔහුගේ දරුවෙකි.

දරුවා වෙනුවෙන් බොහෝ දේ ගත යුතුය. මේ පිළිවෙලකට සැළසුම් කර සිදුවූ දෙයක් නොවේ. කොහොම සිදුවුවද උපදින දරුවා පින්බර ඇත් රුවනක් සේ මෙළොවට වැඩම්මවිය යුතුය. මේ දුප්පත් දැතින් ඒ දරුවාට දිය හැකි සැපක් දිය යුතුය.

කීයක් හෝ අතේ තිබිය යුත්තේ ඒ නිසාය. දරුවාට පුංචි කොට් එකක් ගත යුතුය. දරුවා ඉපදුණු පසු අවශ්‍ය කළමණා රැ සක් ඇත. ඒවා ආශාවෙන් එකතු කරන්නට ඇය බලා උන්නාය.

වර්ෂා බැංකුවට පිවිසියේ බැංකුව අසළ ඔහුගේ වාහනය නැති බව දැනගෙනය. ලෝකයේ ළඟින් ඉන්නට ළඟ දවටෙන්නට ආශාම කළ කෙනාගෙන් මෙසේ හිත හිතා වෙන්ව ඉන්නට වීමම කොතරම් දුකක්ද...

‘මං සල්ලි ටික අරන් එන්නම් ප්‍රියා...’

‘කෙල්ලේ...’

යන්නට ගිය වර්ෂාව ඇය මොහොතකට නවත්වා ගත්තාය.

'ඇ..යි ප්‍රියා...'

'නෑ... මේ සල්ලිත් අරන් ගිහින් වියදම් කරලා...'

'සල්ලි තියෙන්නේ වියදම් කරන්න තමයි කෙල්ලේ... අතේ සතේ නැතිවෙච්ච කාලෙට අපි තේ කහට ටිකක් හරි බීලා ඉමු...'

වර්ෂාගේ මේ ජීවන දර්ශනය ප්‍රියංවද අගය කළාය. ඇය ජීවිතයට බය නැත. ඒ නිසාම ඇය මේ ජීවිතය පුදුමාකාර ලෙස විශ්වාස කළාය. මේ කුසේ සිටිනා දරුවාගේ පියා හෙට වෙන කෙනෙක් හා විවාහ වෙයි. එහෙත් ඇය ඒ සියල්ල දරාගෙන ඉඳියි. ඒ කොහොමදයි ප්‍රියංවදට සිතාගත නොහැක.

වර්ෂා ගියේ ඇයට පුරුදු බැංකු සේවිකාව ළඟටය.

'අ..ම්..මේ ඔයාව දකපු කල්... බුක් ෂොප් එකේ මැනේජර්නේ දන්... නිකංවත් එන්නෑ බැංකුවට... නේද...'

ඇය මේ කිසිවක් දන්නේ නැත.

'වි..ක..ක් වැඩ නිරෝෂා... ඒකයි...'

'මිස්ටර් විමුක්ති මේ දන් ඇවිත් ගියේ... මං ඔයා ගැන අහන්නත් හදලා ඇහුවේ නෑ...'

'ඔයා ගැන කෙනෙක් කිව්වත් මගේ යටි පතුල් වල ඉඳලා මොකක්ද වෙනවා... එහෙම වෙන්නේ ඇයි මහත්තයෝ...' වර්ෂා විමසුවේ තම සිතෙනි.

'මගේ එකවුන්ට් එකේ සල්ලි ටිකක් තියෙනවා නිරෝෂා... අද ගන්න ආවේ...'

'ඉතින් බලන්න... මේ අයියලා නංගිලා ඇවිත් බැංකුවලට බොරුවට වැඩ දෙනවා...'

නිරෝෂා කීවේ මවාගත් අමනාපයකිනි. වර්ෂා අසරණව සිනාසුණාය.

'ඇයි නිරෝෂා...'

'සල්ලි ඕනනම් අයියගෙන් ඉල්ලගන්න තිබ්බනේ... එයා බැංකුවට





දම්මට පස්සේ නංගි ඇවිත් ආයෙත් ස්ලිප් ලියලා සල්ලි ගන්නවා...'

ඇයට මේ කිසිවක් සිතා ගන්නට බැරි විය.

'ඒ කිව්වේ...'

'ඇයි මිස්ටර් විමුක්ති කිව්වේ නැද්ද...'

'නෑ...'

'මේ දන් ටිකකට කලින් මිස්ටර් විමුක්ති ඔයාගේ සේවින් එකවුන්ට් එකට සල්ලි දම්මනේ...'

ළය ඇවිලෙන්නට ගත්තේ ඇතුලාන්තයෙනි. 'ආදරේ කරනවයි කියලා වස්තුවේ මෙහෙම ආදරේ කරන්නෙපා... මං මැරෙයි...' උනාගෙන ආ කඳුළු ඇය අමාරුවෙන් දරා ගත්තාය.

'ද..න් දලා ගියා...'

'ම්... ඉන්න බලන්න... මේ තියෙන්නේ පනස්දහක් දලා තියෙනවා...'

'මට සල්ලි ඕන කියලා ඔයාට දනෙනවා ඇති... ඇත්තටම වස්තුවේ මට නෙමේ ඕන... ඔයාගේ පැටියට... එයාව සැපට ගන්න එපැයි...' වර්ෂා කීවේ සිතෙනි.

'මං.. ඒ..කෙ..න් ස..ල්ලි ටිකක් ගන්නම්...'

'ම්... අනිත් දවසේ බුක්ෂොප් එකේදිම ඉල්ලගන්න...'

මේ බැඳීම ගැන... මේ ආදරය ගැන මේ ලෝකයට කෙසේ නම් කියන්නද...

වර්ෂාට ඔහු දමූ මුදල් සියල්ලම ගන්නට ලෝබ සිතුණි. ඇය ගත්තේ ඉන් ටිකකි. 'තාත්ති පැටියා අපේ වියදමට සල්ලි දලා... මං බයේ උන්නේ ඔයාට ලස්සන කොට් එකකුයි තව බඩු ටිකකුයි ගන්න සල්ලි මදිවෙයි කියලා... අපේ තාත්ති එහෙම අපි ගැන නොබලා ඉන්නෑ... ඒත් එයාට මේවා දනෙන එක තමා රත්තරන් පුදුම...' වර්ෂා කුසෙහි නිදන දරුවාට සිතින් කීවාය.

මුදල් ටික අතට ගෙන වර්ෂා ප්‍රියංවද ළඟට එද්දී ඇගේ ඇස්වල කඳුළුය.

'ඇයි කෙල්ලේ...'

'මං උඹට කිව්වේ එයා මහ පුදුම කෙනෙක් කියලා... එක ජීවිත කාලයක් නෙමේ ප්‍රියා... ආත්ම හතක් එයා වගේ කෙනෙක් එනකල් බලන් උන්නත් පව් නෑ...'

වර්ෂා විමුක්ති බැංකුවට මුදල් දමා තිබූ ආකාරය කියද්දී ප්‍රියංවදටද පුදුම සිතුණි.

විමුක්ති සිංගප්පූරුව බලා යන ගුවන් ටිකට් පත අතට ගත්තේ දහවල් දෙළහට පමණය. කටුනායකින් ගුවන් යානය පිටවෙන්නට තිබුනේ මැදියම් රාත්‍රියටය. අද රෑ යන මේ ගමනින් මේ හැම ප්‍රශ්නයක්ම නොවිසඳෙන බව විමුක්ති දන උන්නේය.

එහෙත් වෙන කළ යුතු දෙයක් නැත. හෙට දවසට මුහුණ දෙන්නට තරම් හයියක් තමාට නැති බව දන උන්නේය. රටින් පිටවෙන බව අම්මාටත් තාත්තාටත් දනුම් දෙන්නට විමුක්ති සිතා උන්නේ ගුවන් යානයට ගොඩ වෙන්නට මොහොතකට පෙරය. මේ තීරණයෙන් ඔවුන් කම්පනයට පත්වන බව විමුක්ති දන උන්නේය. හෙට දවසේදී මොරගොඩ පවුලට සෑහෙන නින්දවක් වන බවද ඔහු දන උන්නේය. එහෙත් වෙන කළ යුතු අන් දෙයක් නැත.

එහෙත් මේ ගත් තීරණය අයියාටත් මේධා අක්කාටත් දනුම් දිය යුතුය. ඒ තරම්ම ගුණමකු වන්නට ඔහුට හිතෙන්නේ නැත.

විමුක්ති යළි පොත් හලට පැමිණ ගුවන් ටිකට් පත දෙස බලාගෙනම දුරකථනය අතට ගත්තේය.

දුරකථනය ගත්තේ මේධාය.

'අ..ක්කේ...'

'අ..නේ මල්ලියේ... කොහෙද ඔයා...'

'මං බුක් ෂොප් එකේ අක්කේ... කෝ අයියා...'

මේධා දිග සුසුමක් හෙළුවාය. ඔහුගේ මංගල්ලය අද බොහෝ දෙනෙකුට අවමඟුලකි.

'අයියත් බලාගත් අත බලාගෙන ඉන්නවා මල්ලියේ... මාත්





එක්කත් කතාවක් නෑ...'

'මං ඔය පැත්තේ ටිකකට එන්නද...'

ඔහු ඇසුවේ අසරණ හඬිනි.

'මල්ලී... ඇ..යි ම..හ..ත්..ත..යෝ...'

'පො..ඩි..ඩ..ක් අයියයි අක්කයි එක්ක කතා කරන්න ඕ..න...'

'අ..නේ එ..න්න රත්තරන්... කාලද...'

'නෑ අක්කේ...'

'එන්නකෝ...'

විමුක්ති පිටවෙන්නට යද්දීම වාගේ ශ්වේතා විමුක්ති අසළට ආවාය. ශ්වේතාගේ මුහුණේ වූයේ අසාමාන්‍ය දුකකි.

'නංගී...'

'අ..යියා කොහේ හරි යන්නද...'

'ඔව්.. අයියලගේ ගෙදරට ටිකක් ගිහින් එන්න...'

'මට චූ..ටි..ටක් කතා කරන්න පුළුවන්ද...'

'පිස්සි... මේ මොනවද කියන්නේ එන්න...'

ශ්වේතා ඔහුගේ කාමරයට පැමිණ ඉඳගත්තේ ඔහුගේ කාමරයේ දොරද වසාගෙනමය.

'ඇ..යි නංගී...'

'අ..යියා මොන වගේ තීරණයක් ගන්න හිතාගෙන ඉන්නවද කියලා මං දන්නේ නෑ... ඒත් මං කියන දේ ඒ තීරණේ ගන්න කලින් හිතන්න...'

විමුක්ති නිසලව ඇය දෙස බලා උන්නේය.

'කියන්න නංගී...'

'කෙනෙක් අ..යියා එනකල් මේ මුළු ආත්මෙම බලාගෙන ඉන්නවා කියලා ඔයා දන්නවා නම්... අයියා මොකද කරන්නේ...'

ඔහු අහිංසක ලෙස සිනාසුණේය.

'එ..යාව හම්බවෙනකල් මාත් මුළු ජීවිත කාලේ පුරාම බලාගෙන ඉන්නවා...'

'ඒත්.. මේ මැරේජ් එ..ක...'

'කසාදේ... මේ ගැණිව මං බදියි කියලා නංගි හිතනවද...'

'කීයටවත් නෑ... ඒත් ඔයා.. මම.. වර්ෂා අක්කා... අපිට වඩා මේ ලොකේ නපුරුයි...'

'මං ඒ නපුරු ලෝකෙත් එක්ක මගේ කෙල්ල වෙනුවෙන් සටන් කරනවා... එයා බලාගෙන ඉන්නවා කියලා මං දන්නවා නංගී... මට දැනුත් හිතෙනවා මේ ළඟ පාතක හරි මේකි ඇති කියලා...'

ඔහු කීවේ ආදරබර හඬිණි. 'ඔව් අයියේ එයා මේ ළඟම ඉන්නවා...' ශ්වේතා කීවේ හිතෙනි.

'අයියට එහෙම හිතෙනවද...'

'ම්...'

'මනුස්සයෙක් ගැන දෙවියෙක් ගැන වගේ විශ්වාසේ තියාගෙන ගැණු ඉන්නේ කලාතුරකින්...'

'මං දන්නවා...'

'එහෙනම් අපි කතා කරලා වැඩක් නෑ අයියේ... ඒ කියන්නේ මංජුලා හෙට මංජුලා මොරගොඩ වෙන්නේ නෑ...'

'කවදවත් නෑ... මං ඇවිත් කියන්නම්...'

'අ..යියේ...'

'කියන්න නංගී...'

'ඔයාලගේ ජීවිත දෙක වෙනුවෙන් මට කරන්න දෙයක් තියෙනවනම් කියන්න... මං මේ අත් දෙකින් කරන්නම්...'

විමුක්ති කාමරයෙන් පිට වූයේ කිසිවක් නොකියා කෙල්ලගේ හිස පමණක් අතගාය. ශ්වේතාගේ හිතට දැනුණේ දුකට බර වූ මිහිරි සතුටකි.





ආදරයක් කොහොමත් ජයගන්නේ මෙවන් දුක්බර වේදනාවන් මැදිනි.

*   *   *   *   *   *   *   *   *   *

හිතට මේ දැනෙන්නේ දුකද බියද කියා වර්ෂාට තේරුම් ගත නොහැක. හෙට ඔහුගේත් මංජුලාගේත් මංගල්ලයට සියල්ල සූදනම්ය. නැන්ද දිනුම්ය. ඇය කෙසේ හෝ විමුක්තිව මංජුලාටම දුන්නාය.

'මං නැතුව ඔයාගේ පොඩි පුතා දුක් විඳින හැටි කවදහරි බලන්න... එයාව සනසන්න එයාව වදපු ඔයාටවත් බැරි වෙයි... කවදහරි එයා මේ ගෙදරටම මාව කැන්දන් එනවා... ඒක වෙනස් කරන්න මේ මොරගොඩ ගෙදරට බෑ...'

එද අවසන් දවසේ සුරම්‍යාට කියූ දේවල් වර්ෂාට සිහිවිය.

හෙටින් පසු ඒ කතා සියල්ල බොරුවේ. හෙට සුබ නැකතින් ඔහු මංජුලාව මොරගොඩ නිවසට කැන්දගෙන එනු ඇත.

කෙනෙක්ව කෙනෙකුට හිමි වූ පසු යළි ගැනීම සිහිනයකි. මංජුලා කොහොමටවත් විමුක්තිව දෙන්නේ නැත. ඇයට විමුක්ති යනු ජීවිතයක් නොවේ. ව්‍යාපාරයකි.

'එ..හෙ..ම වෙ..යි..ද ප්‍රියා...'

වර්ෂා හදිස්සියේම ඇසුවේ බස් රිය බම්බලපිටියට යද්දීය. ප්‍රියංවද ඇගේ අත තදින් අල්ලා ගත්තාය. කෙල්ල අද ඉන්නේ පියවි සිහියෙන් නොවන බව ඇය දනී.

'අ..යියව උඹට විශ්වාසයි නේ කෙල්ලේ...'

ඒ හැර වෙන කුමක් කියන්නද... දෛවය ජීවිත වලට කුමක් කරාවිදැයි කොහොම අනාවැකි කියන්නද...

'ම..ට හ..රි බ..ය..ක් දැනෙනවා ප්‍රියා... එ..යා..ලා ම..ගේ වි..මු..ක්..ති..ව...'

කියාගන්නට යන දේ ඇයට කියවෙන්නේ නැත.

'අ..යි..යට බෑ එහෙම කරන්න කෙල්ලේ...'

'ඔ..ව් එයාට බෑ... ඒත් නැත්ද ඉඩ දෙන එ..ක..ක් නෑ... එයා ගෙදරටත් හරි ආදරෙයි... පොඩි පුතා..නේ...'

'උඹට එහෙම බයක් තියෙනවනම් ඇයි අපි අයියව හම්බවෙන්නේ නැත්තේ...'

'මං.. හ..මි..බ..වෙලා මො..නවා ක..ර..න්..න..ද...'

'ඒත් නැත්නම් කෙළින්ම මොරගොඩ මහ ගෙදරටම ය..න්... ගිහින් කියමු මේ බඩේ ඉන්නේ විමුක්තිගේ දරුවෙක් කියලා...'

'බෑ ප්‍රියා... එයාට එහෙම නින්ද කරන්න බෑ... මේක හ..රි පිවිතුරු බැඳීමක්...'

'කොච්චර පිවිතුරු උනත් ඒක කඳුළක් නම් කෙල්ලේ...'

එසේනම් ඒ කඳුළ ජීවිත කාලයටම දරා ගත යතුය. වෙන කරන්නට දෙයක් නැත.

'මං ව..ගේ දුප්පත් කෙල්ලෙකුට ඒ කසාදේ නවත්තන්න බැරිවෙයි ප්‍රියා...'

'එහෙනම් වෙච්චදෙන්... එහෙමද...'

'මට තේරෙන්නෑ කෙල්ලේ...'

'මේ අහපන්... තව පැය දෙක තුනකින් අපි අනුරාධපුරේට යනවා... ඒ ගියාට පස්සේ මහදී උඹට තීරණ ගන්න බෑ... හෙට ආයේ අපි එනකොට මඟුල් පෙරහැර ගිහිල්ලත් ඉවරයි... ගන්න තීරණයක් දන්ම ගනින්... පැයක් ඇතුළත උඹට විමුක්ති අයියව හම්බවෙන්න පුළුවන්...'

ප්‍රියංවද කියන දේ ඇත්තය. එහෙත් තීරණයක් කෙසේ ගන්නද... ඔහු කොහේ උන්නද විනාඩි දහයකින් තමාව සොයාගෙන එන බව වර්ෂා දනී. එහෙත් ඒ අසරණ මුහුණ දෙස බලාගෙන අඬනවා විනා වෙන කුමක් කරන්නද...





'අපි ගෙදර යන් ප්‍රියා...'

'ගිහින් පස්සේ අඬන්නෙපා...'

'හැම දෙයක්ම දෙයියෝ බලාගනී...'

'දෙයියන්ටත් දෙයක් කරන්න බැරි වෙලාවක් එනවා කෙල්ලේ...'

'එ..හෙ..ම වෙලාවක අම්මා බලා ගනී... අම්මා කිව්වනේ චූටි මහත්තයා කවද හරි එනවා කියලා... මං..ට ම..ගේ අ..මි..ම..ව විශ්වාසයි ප්‍රියා...'

ප්‍රියංවද ඉන් පසු කිසිවක් නොකීවාය. එහෙත් ඇයගේද පසුව දන්නට ගනී.

'එක්කෝ මං අයියා එක්ක කතා කරන්නද...'

'එ..පා...'

'මේඩක්කට...'

'ඒත් එපා... මං ලොකු විශ්වාසෙකින් ඉන්නවා ප්‍රියා... ඒ විශ්වාසේ මට හොඳයි...'

'ඒත් වස්තුවේ මේ ඇත්ත...'

'මේ වෙන ඇත්තටත් වඩා මට මගේ ආදරේ විශ්වාසයි ප්‍රියා...'

එක අතකට එහෙම විශ්වාසයක් හැදෙන්නට තරම් ආදරයක් තිබෙන්නට ඇත. ඒ විශ්වාසය විමුක්තිගේ හදවතේ නැතැයි කිව නොහැක.

'ඔව්.. මඟුල් කන්න යන්නේ අයියා නෙමේනේ... මොරගොඩලනේ...'

'එයාගේ මූණේ එහෙම මනමාලයෙක්ගේ පෙනුමක් තිබ්බද...'

'නෑ... තිබ්බේ ආදරෙන් දුක් විඳින අසරණ කොල්ලෙක්ගේ මූණක්...'

ඔහු දුක් විඳින්නේද මේ ආදරය වෙනුවෙනි. දුක දෙකෙළවරක තබා දෙවය විසඳුමක් දෙනු ඇත.

'ප්‍රියා... පැටියට බඩු ටිකක් ගන්න ඕන...'

ප්‍රියංවදට වර්ෂා ගැන ඇතිවුයේ අසාමාන්‍ය දුකකි.

'මේ අවනඩුව දෙයියන්ටත් ජේන්න ඕන...'

වර්ෂා කිසිවක් කීවේ නැත. ඔහු තමාට වරදක් කළා යැයි හීනෙන්වත් හිතන්නට ඇය සූදනම් නැත.

'මේ හරියේ ඇති ෂොප් එකක් බැහැලා බලමු...'

'ම්...'

වර්ෂා බම්බලපිටියෙන් බැස්සේ දැස් පිසදගෙනය.





# 05

**විමුක්ති** සක්විතිගේ නිවස ඉදිරිපිට වාහනය නවතා ඉන් බැස්සේ සිංගප්පූරුව බලා යන ගුවන් ටිකට් පතද අතැතිවය. මේ තීරණය අසා අයියාත් මේධා අක්කාත් පුදුම වෙනු ඇත.

මේධා බලා උන්නේ නිවසට එන විමුක්ති දෙසය. ඒ මුහුණ දෙස බලන්නට බැරි තරම් දුකය. මේ මංගල්ලය මේ ජීවිතය අවමඟුල් ගෙදරක් කර ඇත.

'මල්ලියේ...'

මේධා බඩත් ඔසවාගෙනම මිදුලට පැමිණ විමුක්තිගේ අතක් අල්ලා ගත්තාය.

මේධාගේ නෙරා ආ කුස දක විමුක්තිට ඇය ගැන මහා දුකක් දැනුණි. මේ දිනවල ඇයට උපකාරයක් කළ යුතු දවස්ය. එහෙත් ඇයට උදව් කරන්නට කිසිවෙක් නැත.

'දැ..න් දවස් ළඟයි නේද අක්කේ...'

'ම්.. ළඟයි...'

විමුක්තිට හීල්ලින.

'ඔයා වෙනුවෙන් මොනවද අපි කළේ...'

‘පිස්සු කියවන්නැතුව ඉන්න... මොනවද ඔයා නොකළේ... ය..න්...’

සමහර දේවල් ගැන ඔහුගෙන් අහන්නට පවා දුකය. බයය. හෙට දවස... ඒ දවසට ඔහු කොහොම මුහුණ දෙන්නද... දෛවයට දෙන්නට වෙන විසඳුමක් තිබුනේම නැද්ද...

‘අයියා කෝ අක්කේ...’

‘අර කාමරේ...’

විමුක්ති දෙර රෙද්ද මෑත් කර බැලුවේය. ඇඳේ ඇලවී දෑතම හිස මත තබාගෙන සක්විති කල්පනා කරමින් උන්නේය.

‘අ..යියේ...’

අයියා මලෝ එකිනෙකා දෙස බැලුවේ ලොව සිටිනා අසරණම සොහොයුරන් දෙදෙනා ඔවුන් දෙදෙනා ලෙස හිතන්නාක් වැනිවය.

‘වරෙන් මල්ලියේ ඇතුළට...’

ඔහු ගොස් ඇඳ මතින් ඉඳගත්තේය. මේධාත් පැමිණ ඇඳ මතින්ම ඉඳගත්තාය.

‘දෙන්නම කාලා නැ නේද... මං පරිප්පු ටිකක් තෙම්පරාදු කරන්නද... පාන් ගෙනත්...’

‘අක්කට අමාරුයි...’

‘මොන අමාරුවක්ද මල්ලී... හදන්නද...’

‘ටිකකින් හදන්න... ඔයාගේ අතින් පරිප්පු ටිකක් වත් කාලම යන්න ආසයි...’

විමුක්ති කීවේ බිම බලාගෙනය. මේධාගේ පපුව මොකක්දේ හේතුවක් නිසා ඇවිලීගෙන ගියේය.

‘ය..න්..න කො..හේ ය..න්..න..ද ම..ල්ලියේ...’

මේධා ඇසුවේ තරමක බියෙනි.

‘මං ටි..ක..ක් දුරකට යනවා අක්කේ...’

විමුක්ති කියද්දී මේධා පුදුමයෙන් විමුක්ති දෙස පමණක් නොව





සක්විති දෙසද බැලුවාය.

‘මං..ජු..ලා..ව මැ..රි ක..ර..ලා...’

මේධා පසුව ඇසුවේ ඇවිලෙන හදවතිනි.

‘ඒ බැල්ලිව කවුරු බඳින්නද...’

‘එහෙනම්...’

‘උඹ මොනවද මල්ලි කරන්න යන්නේ...’

‘මා..ව හි..ර..වෙ..ලා අ..යියේ... මේ ඇ..ර ම..ට වෙ..න වි..සඳු..ම..ක් නෑ...’

‘කො..හෙ..ද යන්නේ... කවදද...’

මේධා ඇසුවේ මහා කුතුහලයකිනි. මේ ප්‍රශ්නයට පැහැදිලි උත්තරයක් නැති බව ඇය දන උන්නාය.

‘මං.. අ..ද රෑ... සිං..ග..ප්පූ ය..නවා... මේ.. ටි..කට් එ..ක...’

විමුක්ති කීවේ ඔහු අත තිබූ ගුවන් ටිකට් පත මේධා අතට දෙමිනි. මේධා එය ගෙන බලා උන්නේ පුදුමයෙනි. ඇයට එකවර මේ කිසිවක් සිතා ගන්නට නොහැකි විය.

‘සිං..ග..ප්පූ ය..න්..න.. ඔයා අ..ද රෑ...’

‘ඔ..ව්.. රෑ දෙළහකුත් ගාණට ෆ්ලයිට් එක තියෙන්නේ...’

‘ඒත්.. ම..ල්ලියේ...’

‘ම..ට මේ ප්‍ර..ශ්..න..යට හෙට මූණ දෙන්න බෑ අක්කේ...’

සක්විති සෑහෙන වේලාවක සිට තම සොහොයුරා දෙස බලා උන්නේය.

‘කොල්ලට යන්න දෙන්න බබා...’

ඔහු කීවේ එපමණකි. මේධාගේ දෑසින් කඳුළක් වැටුණි.

‘ඔ..යා.. අ..න්...ති..ම මො..හො..තේ හ..රි දෙ..ය..ක් ක..ර..යි කියලා මං ද..න..ගෙ..න උ..න්..නා මල්ලියේ...’

ඒ ටික කියද්දී ඇයට ඇඬුණි.

‘ප්‍රශ්න ගොඩක් ඇතිවෙයි... ඒත්.. ම..ට අ..ර කෙල්ල වෙනුවෙන්

මේ දේ කරන්නම වෙනවා... ඒකි වෙනුවෙන් විතරක් නෙමේ... මං වෙනුවෙනුත්...'

'ය..න්..න මල්ලියේ.. යන්න... ඔයා වගේ කොල්ලෙක්ට අර වේස ගෑණිව අයිති වෙන එක අපරාධයක්... ඒ අපරාධය නොවී ඕන දෙයක් සිද්ධ උනාට කමක් නෑ...'

මේධා එක හෙලාම කීවාය.

'මේ වි..ස..දුමට ඔයා ආපු එකයි දු..ක.. පව්...'

ඇය ඊට පසුව කීවාය.

'ත..නි..ය..ම..ද මල්ලියේ යන්නේ...'

'කෙල්ල හිටියනම් එක්කගෙනම යනවා අක්කේ... තීරණ ගන්න ප්‍රමාද කරන එක කොච්චර පාඩුද...'

'වෙන්න තියෙන දේ වුණා... කෙල්ල කොහේ හරි ඉන්නවනේ...'

'ම්.. මං එනකල්...'

කිසිවෙක් කතා කළේ නැත.

'අම්මටයි තාත්තටයි කීයටද උඹ කියන්නේ...'

'මං එයාර් පෝට් එකේ ඉඳලා කතා කරනවා... එයාලටයි මංජුටයි...'

'එ..හෙම හොඳයි...'

'මෙහේ මොනවා වෙයිද කියලා මල්ලි හිතන්නෙපා... ජීවිතයක් නැති වෙනවට වඩා මඟුලක් කැන්සල් වෙන එක හොඳයි...'

'මං මේ තීරණේ අද උදේ ගත්තේ අ..යියේ... වෙන කරන්න දෙයක් එන්නෙම නැති නිසා...'

'ඒක ගැන මල්ලී හිතන්නවත් එපා... බබා... මල්ලි යන එකේ කෑම ටිකක් ලෑස්ති කරන්න...'

'අනේ... මං ලෑස්ති කරන්නම්...'

'පරිප්පු ඇති අක්කේ...'





මේධා යන්නට පෙර විමුක්තිගේ හිස අතගා ඔහුගේ හිස සිප ගත්තාය.

'අපේ කොල්ල එහෙනම් චිංචි මානවිකාවගෙන් බේරුණා... මට හරි සතුටුයි...'

'මේ එන ප්‍රශ්න වලදී මට උදව් කරන්න අ..ක්කේ...'

'පණ දෙනවා රත්තරන්...'

මේධා කුස්සියට ගියේ එසේ කියාගෙනය. ඇය කුස්සියට ගිය හැටියේම අතට ගත්තේ කට්ටා කරවල කෑල්ලය.

'කරෝල ටිකක් තෙල් දලා පොල් සම්බෝලයක් හදලා පරිප්පු ටිකක් හදනවා...'

ඇය එසේ සිතා ගත්තාය. මේ යන ගමන ඔහුට දවස් කීයක් එහි ඉන්නට වේදැයි දන්නේ නැත. මේධාට දිගින් දිගටම සිහිවූයේ වර්ෂාවය. 'උඹ නම් කෙල්ලේ මේකට දීලා තියෙන්නේ පුදුම ආදරයක්... නැත්නම් මේකා මෙච්චර දෙයක් උඹ වෙනුවෙන් කරන්නෑ... මට නම් පුදුමයි...'

එක අතකට එහි පුදුමයක්ද නැත. ආදරය දනෙන්නේ ගෑණු පපුවලට පමණක් නොවේ. පිරිමියෙකුගේ හදවතටත් එය එලෙසින්ම දනෙයි.

'මං උඹව ඇරලවන්න එන්නද...'

සක්විති ඇසුවේ තරමක දුකෙනි.

'එපා අයියේ... මගේ යාළුවෙක් එනවා... අයියා ආවොත් මෙහේ අයියට ප්‍රශ්න එනවා... උඹ මේවා දන්න විදිහක් පෙන්නන්න එපා... අර ගෑණිට මේ වෙලාවේ එහෙම උනොත් දරාගන්න අමාරු වෙයි... දරුවත් ලැබෙන්න ළඟ එකේ...'

සක්විති තම සොහොයුරාගේ ජීවිතය ගැන මුල සිට සිතුවේය. මේ තරම් සැප සම්පත් විඳි කොල්ලෙකුටත් මේ හැටි දුක් විඳින්නට වූ හැටි පුදුමය.

'ගිය ගමන් මට කතා කරපන්...'

‘මෙහේ ගොඩක් ප්‍රශ්න ඇතිවෙයි අයියේ...’

‘තේරෙනවා... ඒවා මං බලන්නම්... වෙඩින් එක කැන්සල් කරලා අපි ඉන්වයිට් කරපු මිනිස්සුන්ට දන්නනවා... අරුන් නම් හෙණ ඩෙනාවක් නටයි...’

සක්විති කීවේ මංජුලාගේ ගෙදර ගැනය.

‘කවදහරි අම්මයි තාත්තයි මං හරි කියලා තේරුම් ගනීවි...’

‘එතකල් උඹ එහේ ඉඳපන්... අතේ සල්ලි තියෙනවද...’

‘ඔව්.. මං අද සල්ලි ටිකක් ගත්තා... මට ඒ ඇති...’

‘මදි උනොත් කතා කරපන්... මං ඇවිල්ලා හරි දෙන්නම්...’

‘උඹ මේ කෙල්ලව බලා ගනිං... පව්... තනියම හැම දෙයක්ම කරගන්නේ...’

විමුක්ති සක්විතිත් සමඟ කුස්සියට යද්දී මේධා කරවල බදිමින් උන්නාය.

‘ටක්ගාලා මේ ටික බැදලා පොල් සම්බෝලයක් හදලා දෙන්නම්... බත ලිපේ...’

‘මේ හදස්සියේ අක්කා ඇයි බත් ඉව්වේ...’

‘අනේ රට යන එකේ පාන් කවලා යවතෑකිද... ඔයා ආයේ මෙහෙන් කන්නෑනේ... මං දන්නවනේ ඔයාගේ හැටි...’

විමුක්ති ඇය දෙස බලා උන්නේ දුක්බරවය.

‘අ..ක්..කේ...’

‘මල්ලී...’

‘කෙල්ල මං බදිනවා කියලා දන්නවා ඇති නේද...’

මේධා දුක්බර ලෙස සිනාසුණාය.

‘මෙයාලා මඟුල් කන්න ලෑස්ති වෙනවා කියලා දන්නවා නම් ඇති.. ඒත්...’

‘ඇයි...’





‘නෑ මල්ලී... ඔයා කවදවත් එහෙම කරයි කියලා කෙල්ල හිතන්නෑ... ඒකි ගැන මං දන්නවා...’

‘උදේ ශ්වේතත් ඕකම කිව්වා...’

‘ඒකි ටික කාලයක් හැංගිලා වගේ ඉදී... කෙල්ලට වෙන කරන්න දෙයක් නෑ... ඒකි අසරණයි...’

‘ඒක මං දන්නවා අක්කේ...’

‘ඒත් කවදහරි ඒකිට ලොකු සාධාරණයක් අපි කරන්න ඕන...’

මේධා මෙහෙම කීවේ අද වර්ෂා ඉන්නා තත්වය ගැන නොදනය. අද ඇය විමුක්තිගේ දරුවෙක් කුස දරාගෙන ඉන්නා බව ඇය දන්නවා නම් මීට වඩා දෙයක් ඇය වර්ෂා වෙනුවෙන් කරනු ඇත.

‘මං කෙල්ලගේ පොතට උදේ සල්ලි ටිකක් දම්මා...’

‘ඒක හොඳයි... කොහොම ජීවත් වෙනවද කියලා අපි දන්නෑනේ...’

විමුක්ති සෑහෙන වේලාවක් තිස්සේ දෙයක් සිතමින් උන්නේය. ඔහු උන්නේ එයා මේධාට කියා ගත නොහැකිවය.

‘අක්කේ...’

‘මල්ලී....’

‘කෙල්ලව හම්බ උනොත්...’

‘ඉතින්...’

‘පාස්පෝට් එක හදලා එවනවද...’

‘සිංගප්පූරුවට...’

‘ම්...’

‘අ..නේ.. ලෝකේ එහා කොනට හරි ගෙනත් දෙන්නම්...’

මේධා කෑම ටික මේසයට දැමුවාය. හදිස්සියේ ඇය බිත්තර ඔම්ලට් එකකුත් හැදුවාය. සක්විතිත් සමඟ විමුක්ති කන්නට ඉඳගනිද්දී අයියා මලෝ දෙන්නා ගැනම ඇයට දුක සිතුණි.

‘අයියයි මල්ලියි දෙන්නම ඊයේ රෑ ඉඳලා කාලා නෑ...’

විමුක්ති අයියා දෙස බැලුවේය.

‘දැන් සතුටින් කන්නකෝ... මොනවා හරි වෙයිනේ... ඒක මේ වෙන්න ගිය දේට වඩා හොඳයිනේ...’

මේධා විමුක්තිට උණු උණු සුදු හාල් බත් හැඳි තුන හතරක් බෙදුවේ ආශාවෙනි.

‘කරෝල ටිකක් වැඩිපුර දන්න...’

‘අනේ.. පව්..’

‘හෙට ඉඳලා සිංගප්පූරුවේ චීන කෑම තමා කන්න වෙන්නේ...’

‘එහෙම වෙන්නෑ... ඉක්මනට එන්න ලැබෙයි... කාට කාටත් මේකෙන් පස්සේ ගොඩක් දේවල් තේරෙයි...’

මේධා පරිප්පු බෙදමින් කීවාය. හදිස්සියට හැදුවද පරිප්පු තෙම්පරාදුව සුවඳය.

‘හරි රහයි අක්කේ...’

‘හදිස්සියේ මල්ලී හැදුවේ... අපි හිතන් හිටියේ උයන් නැතුව ඉන්න... අයියාටත් කන්න බෑ කිව්වනේ...’

‘අක්කා නොකා ඉන්නෙපා...’

‘අවමඟුලක් තියෙද්දී කන්නේ කොහොමද...’

මේධා කීවේ දුක්බරවය.

කද්දී විමුක්තිට හිරවිය. ඔහුට එවේලේම සිහි වූයේ වර්ෂාවය. ඇත්තටම ඒ මොහොතේදී ඇය උන්නේ උදේටත් නොකාය. තේ එකක්වත් නොබීය. බම්බලපිටියේ ළඳරු බඩු සාප්පුවක දරුවාට අවශ්‍ය නොයෙකුත් බඩු තෝරමින් ඇය උන්නේ පෙඟී ගිය දෑසිනි.

‘වතුර ටිකක් බීලා කන්න මල්ලියේ...’

එක මොහොතකට ඒ මුහුණ දක ගන්නට ඇත්නම්... එසේ නම් මේ පපුවට කොතරම් නිවනක්ද... සැනසීමක්ද...

ඒ මොහොතේ විමුක්තිගේ ජංගම දුරකථනයට ඇමතුමක් ආවේය.

‘හෙලෝ...’





විමුක්ති දුරකථනයට අමතද්දී මේධාත් සක්විතිත් ඔහුගේ කට දෙසම බලා උන්නෝය.

‘විමුක්ති අයියා...’

කතා කළේ මංජුලාය. විමුක්ති නෙත් ඔසවා බැලුවේ මේධා දෙසය.

‘කියන්න මංජු...’

‘ඕ..ක්..කොම රෙඩිද බබා...’

එය ඇය ඇසූ ආකාරයට ඔහුගේ මුවහට සිනහවක් ආවේය.

‘හෙට උදේට බලපන් මං උඹත් එක්ක යන හැටි...’

‘ඔක්කොම රෙඩි...’

‘පුදුමයි... කොහෙද ඉන්නේ...’

‘මම... මේ පාරේ...’

‘ආ.. මං නම් සැලෝන් එකේ... ලෝං පේෂල් එකක් කරනවා...’

‘හොඳයි...’

‘අනේ බබා මාව පික් කරන්න එනවද... මං වෙහිකල් එක ඇරියා මගේ හෙඩ්ඩ්‍රෙස් එක ගේන්න...’

‘සොරි මංජු... මං ඉන්නේ ටිකක් දුර... එනකොට හවස් වෙනවා...’

‘අ..නේ... හෙට අපි මැරි කරනවනේ... ඉතින් අද ඔයාගේ වයිෆ්ව පික් කරගන්න බැරිද... බෑ බෑ විමුක්ති අයියා ඔයා එන්නම ඕන...’

‘සොරි මංජු... අමාරුයි...’

විමුක්ති එසේ කියා දුරකථනය තැබුවේය.

‘එයා සැලෝන් එකේලු... ඇවිත් පික් කරන්නලු... හිතන් ඇති එයාව මම ජීවිත කාලෙටම රහට පික් කරයි කියලා...’

විමුක්ති කියද්දී මේධා කටට අතක් තබාගෙන සිනාසුණාය.

‘බලපන් අයියේ... මගේ ජීවිතේ මොන රහක්ද... දුක විතරයි...’

අසරණව අහිංසකව විමුක්ති කියූ මේ කතාව පිටුපස ඔහුගේ වේදනාබර ජීවිතය ගැනම කෙටි සාරාංශයක් ඇත.

'මල්ලි... ජීවිතේ රහ වෙන්න පැණි රස සීනි විතරක් නෙමේ දවිල්ල මිරිසුත් ඕන... ඇඹුල් දෙහිත් ඕන... තිත්ත ගොරකත් ඕන... කට කාරන ලුණුත් ඕන...'

මේධා කීවේ නිවී සැනසීමෙනි. විමුක්ති එය පිළිගෙන මෙන් හිස වැනුවේය.

'සමහර විට මේ මගේ දවිල්ල කාලේ වෙන්න ඇති...'

'ගිහින් මොනාද කරන්නේ...'

'සිංගප්පූරුවෙද...'

'ඔව්...'

'මොනා කරන්නද... පාරවල් වල ඇවිද ඇවිද ඉන්නවා අක්කේ...'

'නරක කාලේ ආවාම විෂ්ණු දෙයියන්ටත් බටකොළ කන්න උනාලු... චූට්ටක් ඔහොම යන්නකෝ මල්ලියේ... තව ටිකක්... මොනවා හරි වෙයි...'

මේධා කීවේ අනාගතය ගැන නිශ්චිත බලාපොරොත්තුවක් හිතේ තබාගෙනම නොවේ.





# 06

විමුක්ති ගෙදර ආවේ තරමක වේදනාවකිනි. මේ ගෙදරට මෙහෙම කරන්නට වීම දුකකි. හැදූ වැඩූ අම්මාට තාත්තාට උපන් මහ ගෙදරට මෙහෙම කරන්නට තරම් ඔහු දඩබ්බර දරුවෙක් නොවීය. එහෙත් මේ මහ ගෙදර තමාගේ අහිංසකම ජීවන සිහිනය බිඳ දම්මේය.

මේ ගෙදර වැඩිම වුවහොත් අද ගත කරන්නේ පැය තුන හතරකි.

'පුංචි මහත්තයා...'

අනුලා ඔහු ගෙට ගොඩ වෙද්දීම කතා කළේ ඔහුගේ මුහුණෙන් මහා අමුත්තක් ආ නිසාය.

'ඇයි අනුලක්කේ...'

'නෑ.. මේ.. ඒත්... පුංචි මහත්තයා හ..රි කරදරෙන් වගේ...'

'කරදර නැද්ද අනුලක්කේ...'

'හිමින්... මං පස්සේ උඩට එන්නම්... පුංචි මහත්තයා කාලද...'

'අයියලගේ ගෙදරින් කරෝලයි පොල් සම්බෝලයි බතුයි කෑවා...'

අනුලා සැහෙන වේලාවක් විමුක්ති දෙස බලා උන්නාය. අද මොකක් හෝ සිදුවී ඇත. ඒ බව ඔහුගේ මුහුණෙන්ම පෙනෙයි.

'තව ටිකක් රෑ වෙලා ඔයාට එන්න තිබ්බේ... හෙට කසාදේ කියලවත් හිතනවද...'

සුරම්‍යා ආවේ කාමරයේ සිටය. ගේ පුරාම තැන තැන මංගල උළෙලට සුදනම් වන්නට ගෙනා බඩු මුට්ටුය. විමුක්තිට හැමෝම ගැන දුක සිතුණි.

'හෝම් කම්ං එකට දනුයි කියලා ඉවර වුණේ...'

විමුක්ති කතා නොකළේය. මේ මඟුල කියූ හැමෝටම එයට එන්නට එපායැයි කියන්නට සිදු වෙනු ඇත.

'මං කාමරේ බැලුවා වෙඩින් කිට් එක නැනේ...'

'එයාලා හවසට ගේනවා...'

විමුක්ති එපමණක් කීවේය. සුරම්‍යා තම පොඩි පුතා දෙස බැලුවේ තරමක චකිතයකිනි.

'පොඩි පුතා...'

'කියන්න අම්මේ...'

'හෙ..ට පු..තේ...'

'ම..ගේ ක..සා..දෙ..නේ අ..ම්..මේ...'

'ඉ..තින් පු..තේ...'

'මට මහන්සියි අම්මේ... ටිකක් මට ඉන්න දෙන්න...'

විමුක්ති උඩට ගියේ දවෙනා වේදනාවකිනි. අම්මාගේ මුහුණ දෙස බලාගෙන කිසිවක් කිව නොහැක. 'ඔයා අද රෑට මට පෙව්ව කිරි වලටත් සමහර විට ශාප කරයි... මේක පවක් නම් ඒ පව ගෙවෙද්දෙන් අම්මේ...' විමුක්ති උඩු මහලට යමින් සිතුවේ වේදනාවෙනි.

අනුලා උඩු මහලට ගියේ සැහෙන වේලාවකට පසුය. ඇය හදගෙන ආ තේක මේසය මත තබා ඔහු දෙස බැලුවාය.

'පුංචි මහත්තයා...'





'අනුලක්කේ...'

'මොකක් හරි දෙ..ය..ක්...'

'කොහොමද හිතුවේ...'

'පුංචි මහත්තයාගේ මූණ හරි අමුතුයි...'

විමුක්ති ඇඳෙන් නැඟිට පහළ බැලුවේය.

'මං රෑ..ට ය..නවා අනුලක්කේ...'

'ය..නවා...'

'ඔ..ව්...'

විමුක්ති සියල්ලම අනුලාට කීවේය. අනුලා දිලිසෙන දෑසින් ඔහු දෙස බලා උන්නාය.

'අ..නේ.. දෙ..යි..ය..න්..ගෙම පිහිටයි... ම..ගේ අම්මේ මං හින්දරෙන් හිටියේ...'

'මං රෑට යනවා අනුලක්කේ මෙහේ බලාගන්න...'

'අනේ අර පරට්ටිව දලා යන එකමයි හොඳ... ඔනේ කියනවා පුංචි මහත්තයා තැන තැන කොල්ලොලු...'

විමුක්ති සිනාසුණේය.

'මගේ ඇඳුම් ටික ලෑස්ති කරන්න අනුලක්කේ... වැඩිය ඕන නෑ...'

'අ..නේ මං ලෑස්ති කරන්නම්... සරම් දෙක තුනකුත් දන්නම්...'

'හිමිහිට... මගේ බෑග් එක ඇති ඒකට දන්න...'

'හොඳයි... අනේ මට නම් හරි සතුටුයි පුංචි මහත්තයා... හරිම සතුටුයි... මං තව දේකුත් කියන්නද...'

'කියන්න...'

'ලොකු මහත්තයා...'

'ඉතින්...'

'වර්ෂා නංගිව බලන්න රත්නපුරෙත් ගිහින්... ලොකු නෝනා

කෙල්ලට කරපු දේ ගැන හරි දුකින් ඉන්නේ... මේ කසාදෙටත් එච්චර සතුටකින් නෑ...'

'තාත්තවත් ඒක තේරුම් ගත්ත නම් ලොකු දෙයක් අනුලක්කේ...'

'මේ ගමන යන්න... ඇවිත් පුළුවන් ඔය රෙජිස්ට්‍රේෂන් එක කැන්සල් කරලා දන්න... කෙල්ලව නම් කවද බැඳගන්න බැරිද...'

'කොහේ ඉන්නවද කියලා දෙයියෝ තමයි අනුලක්කේ දන්නේ...'

විමුක්ති කීවේ දිග සුසුමක් හෙලාය.

'කොහේ හිටියත් මේ ළඟ ඉන්නවයි කියලා හිතාගන්න... ඕන වෙලාවට සරස්වතී වගේ පේන්න එයි...'

විමුක්ති වෙලාව බැලුවේය. දන් හවස පහට ආසන්නය. අඩුම වශයෙන් රෑ හතට අටටවත් ගුවන් තොටුපලට යන්නට සූදනම් විය යුතුය.

'අනුලක්කේ...'

'පුංචි මහත්තයා...'

'ආ... මෙතන සල්ලි ටිකක් තියනවා... වියදමට තියාගන්න...'

ඔහු මුදල් ටික අනුලාගේ අතගෙන එය මත තබද්දී අනුලාගේ දෑස් පෙඟී ගියේය.

'අනේ පුංචි මහත්තයා... මේ...'

'මට කරපු දේවල් වලට සල්ලි දුන්න එහෙම නෙමේ... මං ඔයාලට සළකන්න ආසයි... ඒත් මේක මගේ නරක කාලයක්...'

අනුලාගේ කඳුළු වැටිණි.

'එහෙම හිතන්නෙපා පුංචි මහත්තයා...'

'දරුවට මොනවා හරි ගන්න... මං එද්දිත් අරන් එන්නම්...'

ඔහු වන් කෙනෙකුට වර්ෂා වන් කෙනෙකුට මෙවන් විපත් කෙසේ වූවාද... අනුලා දහ අතේ සිතුවාය.

* * * * * * * * *





ප්‍රියංවදත් වර්ෂාත් නාවලට ආවේ ත්‍රී වීලරයක නැගීය. මොරගොඩ නිවස පිහිටා ඇති නාවල පටුමඟට ඇය ත්‍රීවීලරයෙන් ආවේ අරමුණකින්ම නොවේ. ඔහුව තව එක වතාවක් හෝ හැංගී හෝ බලා ගන්නටය.

'උඹට ඕන නම් ඔය ගේට්ටු කඩාගෙන යන්න පුළුවන්...'

ප්‍රියංවද කීවේ මොරගොඩ නිවස ඉදිරිපිටදීය. වර්ෂා මොරගොඩ නිවස දෙස බැලුවේ පසුවම ඇවිලීගෙන යද්දීය.

'අ..නේ අයියගේ කාමරේ උඩ ඇරලා දෙයියනේ...'

වර්ෂා කීවේ ත්‍රීවීලරයේ යකඩ පොල්ල අල්ලාගෙනය. ඔහු අනුලාත් සමඟ උඩ ඉන්නවා වර්ෂා දක්කාය.

'අ..නේ ඔයා මොනවද රත්තරන් කරන්නේ... මා..ව දලා ය..න්..නද සුදු මහත්තයෝ ඔයා හදන්නේ...'

වර්ෂා සිහින් ඇසුවාය. ඒත් සමඟම මොරගොඩ නිවසට ආ වාහනයක් ත්‍රී වීලරයට හරස් විය.

වාහනයේ උන්නේ මංජුලාය.

වාහනයේ උන්නේ මංජුලා බව නොදන වර්ෂා එබී බැලුවාය. එක මොහොතක් තුළ මංජුලා වර්ෂාව දක්කාය. ඇගේ බඩ පපුව රත් වී ගියේ වර්ෂාව දුටුවනමය. 'ගෙදිනුත් එළවපු බැල්ලි මෙහේ මොකද කරන්නේ... මේකි මුන්ගේ බංගලාවට ගිහිල්ලා මොන නාඩගමක් නටයිද දන්නෑ...' මංජුලා එහෙමම වාහනයෙන් බැස්සාය.

වර්ෂා මංජුලාව දුටුවේ එවිටය. පපුව හරහා විදුලියක් කෙටීගෙන යන්නාක් මෙන් විය. පපුවේ බැඳගත් ආදරය ඩැගැගන්නට යන්නේ මේ උකුස්සිය බව වර්ෂා දනී. ලෙයින් ලෙයට පොරොන්දු දුන් සෙනෙහසක් තම පපුවෙන් ලේ ගලද්දී ඇත් කළේ ඇයය.

'ප්‍රි..යා...'

'කෙ..ල්ලේ...'

'මංජුලා...'

'දෙ..යිය..නේ.. මේ පැත්තට එනවා නේ..ද...'

‘ඔ..ව්...’

ප්‍රියංවදටත් වර්ෂාටත් ඊට එහා කතා කරන්නට වෙලාවක් වූයේ නැත. මංජුලා ඒ වෙද්දී ත්‍රීවීලරය ආසන්නයටම පැමිණ හමාරය.

ගැණු දෙන්නාගේම දෑස් එකට හමුවිය. එක් අයෙක් ඔහුගේ දෛවයේ ආත්මගත හිමිකාරියයි. අනෙකා ඒ ආත්මයේ අයිතිය කොල්ල කන්නට ආ කොල්ලකාරියයි. දෛවය මෙවන් මොහොතක මේ දෙදෙනාව මුණගැස්සුවේ ඇයි...

වර්ෂාට ඉබේටම ත්‍රී වීලරයෙන් බැසුණි. එහෙත් ඇය දිගටම උන්නේ මංජුලාගේ දෙනෙත් දෙසම බලාගෙනය. ගැණියෙක් එක මොහොතකදී ආදරය ඉදිරියේ දේවතාවියකි. තවත් විටෙක කාලි යකින්නකි. වර්ෂාගේ දෙනෙත් වල තිබුනේ ඒ කාලි අම්මාගේ ඇස්වල ඇති බද්ධ වෛරයය.

‘ඇයි මො..ක..ද...’

එසේ ඇසුවේ මංජුලාය. ඇයට වර්ෂාගේ ඇස්වල ඇති වෛරය දරාගන්නට බැරි තරම්ය.

‘මා..ත් අහන්..නේ මො..කද කියලා තමයි...’

වර්ෂා කීවේ ඇවිලෙමිනි. මංජුලාව වෙව්ලන්නට විය. ‘පට්ට බැල්ලි... මේකි ඇවිත් ඉන්නේ හොඳකට නෙමේ.. මරල හරි මගේ පාරෙන් අයින් කරන්න ඕන...’ මංජුලා සිතුවාය.

‘ත..මුසේ මොකද මෙහේ කරන්නේ...’

වර්ෂා සිනාසුණාය. ප්‍රියංවද පවා වර්ෂා දෙස බලා උන්නේ පුදුමයෙනි. කෙල්ලගේ මුහුණේ කාලි අම්මාගේ අවතාරය ආවේෂ වූ මූහුණක් වැනිය.

‘ඇ..යි මනමාලිට බය හිතුණද මං මනමාලයව අරන් යයි කියලා...’

වර්ෂා ඇසුවේ දැවෙන දෑසින් ඇය දෙස බලමිනි.

‘ප..ට්..ට බැල්ලි... මම උඹට එකක් කියන්නම්... උඹ නෙමේ උඹේ අම්මා ආවත් විමුක්තිව ගන්න බෑ...’





කෙල්ල සිනාසුණේ මහපොළොවටය. ප්‍රියංවද ඇගේ අතකින් අල්ලා ගත්තාය.

‘අ..පි ය..න් කෙ..ල්ලේ...’

‘අරන් යනවා තමුසෙගේ හිඟන වහන්තරාව... නැත්තං...’

‘ඇයි නැත්තං... මොනවා කරන්නද... මරලා දන්නද...’

මංජුලාගේ අත මිට මෙළවී වර්ෂාගේ මුහුණ අසළටම ආවාය.

‘උ..ඹ හිතුවේ උඹව මරන්න බෑ කියලද.. මිනියවත් හොයා ගන්න බැරි විදිහට උඹව අද රෑ මරන්න පුළුවන්...’

‘එ..හෙ..නං පුළුවන්නම් මාව මරලා විමුක්තිව බැඳගෙන පෙන්නපං... පුළුවන්නම් පෙන්නපං...’

මංජුලා ඇවිලෙමින් වටපිට බැලුවේ අවසිහියෙන් මෙනි. මේ වෙන්න යන දේ වුවහොත් හැම සැලසුමක්ම වතුරේය. ‘මේ හිඟන බැල්ලිට ඒක කරන්න  දෙන්න බෑ...’

‘ත..මු..සේ මෙ..තනින් යනවද නැ..ත්තං මම...’

‘නෑ යන්නේ නෑ... යන්නෑ... විමුක්ති කියන්නේ.. ම..ගේ ප..ණ... මං... මෙ..ත..න මැ..රැ..ණ..ත් ම..ගේ වි..මු..ක්..ති..ව කා..ට..ව..ත් අයිති වෙ..න්න ම..ම ඉ..ඩ තියන්නෑ... මං.. මැ..රෙ..න..වා...’

දැන් මේ ගෑණි මොරගොඩ නිවසට ඇතුල් වුවහොත් වෙන දේ මංජුලා දන උන්නාය. නිසැකවම ඇතුලේ විමුක්ති ඇත...

‘බ..ල..පං මං උ..ඹ..ට ක..ර..න දේ.. බලා..ගෙන ඉ..ඳ..ප..න්...’

මංජුලා එසේ කියා වේගයෙන් වාහනයට ගියාය.

‘අජිත්... ඇතුළට ගිහින් ලොකු නෝනව එක්කං එනවා... හදිස්සියක් කියලා... විමුක්ති ඉන්න තැන එහෙම කියන්නෙපා තේරුණාද...’

‘හා පුංචි නෝනා...’

මේ ගෑණිව පලවා හරිනවා නම් පලවා හැරිය හැක්කේ ඇයට පමණක් බව මංජුලා දන උන්නාය.

'අ..නේ කෙල්ලේ... මේ.. මො..නාද වෙ..න්..නේ...'

ප්‍රියංවද කීවේ අඬමිනි.

'අ..පි ය..න් කෙල්ලේ...'

මංජුලා යළිත් ත්‍රී වීලරය අසළට ආවේ වර්ෂා හිරි වැටී මෙන් ඒ අසළ ඉඳිද්දීය. මෙවන් දෙයක් තුන් හිතකින් වත් බලාපොරොත්තු වූයේ නැත. එහෙත් ඔහුව මේ තරම් සැහැසි ලෙස අයිති කරගන්නට යද්දී මේ කුසේ ඉන්න දරුවා වෙනුවෙන් වත් වචනයක් කියා යා යුතුය. අද මේ සටන් කරන්නේ තම පණ මෙන් සුරැකි ආදරය වෙනුවෙන් පමණක් නොවේ. කුසේ සිටිනා ඔහුගේ ආදරයේ සංකේතය වෙනුවෙනි.

සුරම්‍යා පාරට දුවගෙන ආවේ කලබලයෙනි. පාරේ වන මේ කිසිවක් මොරගොඩ නිවසේ උන් කිසිවෙක් දන උන්නේ නැත.

සුරම්‍යා වර්ෂාව දක්කේ නැත. ඇය දුවගෙන ආවේ මංජුලා වෙතය.

'ඇ..යි මැ..ණික...'

වර්ෂා හිස එසවූයේ එවිටය. සුරම්‍යාගේත් වර්ෂාගේත් දෙනෙත් හමුවූයේ එකටම මෙනි. වර්ෂා උන්නේ ගලෙන් නෙලූ රත්වූ පිළිමයක් ලෙසිනි. වර්ෂාව දකිත්ම සුරම්‍යාගේ බඩ පපුව ඇවිලෙන්නට විය. ඇයව වෙව්ලන්නට ගත්තේ අසාමාන්‍ය ලෙසිනි. එද කෙස් වල්ලෙන් ඇද ඇයව මේ ගෙදරින් එළියට දමද්දී ඇය කියූ හැම වදනක්ම සුරම්‍යාට හොඳට මතකය. සුරම්‍යාගේ බඩ පපුව රත්වූයේ අද වර්ෂාගේ ඇවිලෙන දැස් දකීමෙන් පමණක් නොවේ. එද ඇය කෑගසා කියූ දේවල් සිහිවීමෙනි.

'මංජු...'

සුරම්‍යා ඇවිලෙමින් කතා කළාය.

'යන්න ඇතුළට...'

ඇය කියද්දී වර්ෂා දෑත් බැඳගෙන බලා උන්නාය.

මංජුලා ගියේ වර්ෂා දෙස තවත් වරක් දවෙන ලෙස බලාය.

'උ..ඹ එ..හෙ..න..ම් ආව වේ..ස බැල්ලි නේ..ද...'





සුරම්‍යා ඇසුවේ සිහින් හඬින් නමුදු වෙව්ලන කටහඬිණි.

'නැ..න්දේ මං...'

'කට ව..හ..ප..න් බැල්ලි... උ..ඹ මට නැදෑකම් කියන්න එනවද... ම..ගේ දරුවගේ ජීවිතේ කාලා...'

ඇය වෙනස් වී නැත. මේ ඉන්නේ එද තමාව ගෙදරින් ලේ එනතුරු ගසා පන්නා දමූ නැන්දමය.

'උ..ඹ මො..ක..ටද අ..ද ආවේ...'

'විමුක්ති අයියව බලලා යන්න...'

'ව..හ..ප..න් වේසි ක..ට...'

සුරම්‍යාගේ අත වේගයෙන් වර්ෂාගේ මුහුණ පුරා පතිත විය. වර්ෂාගේ මදකුද වෙනස් වූයේ නැත. එහෙත් ප්‍රියංවද පපුවට අතක් තබාගත්තාය.

'කෙ..ල්ලට ග..හ..න්..නෙපා... එයා ඉන්නේ මෙ..හෙම..'

ප්‍රියංවද කියන්නට හදද්දී සුරම්‍යා ඇයව නැවැත්තුවාය.

'උඹට අමුතුවෙන් කියන්න ඕන නෑ නේද විමුක්ති හෙට මංජුලාව බඳිනවා කියලා... ආ බැල්ලි... උඹ හිතං උන්නේ මගේ කොල්ලා උඹේ රෙද්ද ගලවන්න ආයේ එයි කියලද... ආ පට්ට බැල්ලි...'

ප්‍රියවදද මේ කතා ඉවසාගනු බැරුව බිම බලාගත්තාය. ඇය මෙහෙම කියන්නේ ඇගේ මුණුපුරෙක් කුස තබාගෙන ඉන්නා කෙල්ලටය. මොහොතකට කලින් ගැහුවේ ඒ බඩදරු ගැණිටය.

'රෙ..ද්දක් ග..ල..වලා මිනි..හෙක් අ..ල්ල ග..න්..න බෑ නැ..න්දේ... ඇ..යි ද..න්..නවද... තව ගැණියෙක් රෙ..ද්ද ගලවපු ගමන් ඒ මිනිහා ඒ ගැණී ළ..හට ය..නවා... ඔ..යා මේ ගෑ..ණි..ව..ද අ..යියට දෙ..න්..න ය..න්..නේ... මේ...'

සුරම්‍යා අත මිට මොළවා ගෙන වර්ෂා ළහටම ආවාය.

'නැ..න්..දේ හෙ..ට ම..හුලක් කන්න ය..න ගෙ..දරක දෙරකඩ

මෙහෙම දේ..වල් ක..ර..න්..නෙ..පා... මං ආවේ මඟුල් කඩන්න නෙමේ...'

'තෝ එ..හෙ..නං තො..ගේ...'

සුරම්‍යා කියන්න ගිය දේ ගිල ගත්තේ ඇයව වෙව්ලන්නට ආ නිසාය.

'නැ..න්ද අයියා ගැන දන්නෑ... එ..යා මෙයාව බ..දින්නෑ...'

එවර නම් සුරම්‍යා වියරු ලෙස සිනාසුණාය.

'උ..ඹ වගේ පට්ට හිඟන බැල්ලියෙක්ට මගේ ද..රුවන්ගේ කසාඳ නවත්තන්න බෑ ය..කෝ... ප...ල..ය..න් මෙ..ත..නි..න්... මේ හොඳ වෙලාවේ උඹ ම..ගෙ..න් මැ..රුම් කන්..නෙපා... පලයන් බැල්ලී...'

'ය..න්..නම් නැ..න්දේ... ඔයා එක දෙ..ය..ක් හොඳට මතක තියාගන්න... අ..ද මං දවසෙම හිටියේ මේ අ..වට... ඒ..ත් එ..ක ෆෝන් කෝල් එකක් මං අයියට ගත්තේ නෑ... බුක්ෂොප් එක ළඟට වෙලා එයා දිහා බලා උන්නා... ඒත් ඇතුළට ආවේ නෑ... මේ කඳුළු පෙ..න්..නලා ආ..දරේ ක..ර..න මි..නිහව නවත්තගන්න ම..ට ඕන නෑ... ඔ..යා හි..තු..වද මං ආවේ මේ ගෙ..දර..ට එ..න්..න කි..යලා.. අ..නේ නෑ... බ..ල..ලා ය..න්..න...'

වර්ෂාගේ දෑස් දෙකෙළවරින් නොනවත්වා කඳුළු ගලන්නට විය.

'එ..යා දු..ක් වි..දි..යි පව්... අ..ඩු..ම ගා..නේ එ..යාට ඉ..න්න දෙ..න්..න ති..බ්බා මං මං...'

'ම..ගේ දරුවන්ට මං දු..ක් විඳින්න දු..න්..නෑ... දු..ක් වින්දෙත් ඒක මං බලාගන්නම්... උඹ උඹ ගැන බලාගනිං... අම්මා අප්පා නැති එකේ මිනිහෙක්ව අල්ලගෙන බැඳපං...'

වර්ෂා කඳුළු ඔහේ ගලන්නට ඉඩ දුන්නාය.

'ඔ..යාට නැ..න්..දෙ අ..ද මං ඉ..න්..න ත..ත්වේ කියන්න බෑ... මං ය..න්..න..ම්...'





වර්ෂා යන්නට හැරුණේ එහෙම කියාගෙනය. සුරම්‍යා ගල් පිළිමයක් සේ බලා උන්නාය.

ඒ මොහොතේ අනුලා ගේට්ටුව ඇරගෙන පාරට දිව ආවාය. ඒ පාරේ කුමක් හෝ වෙන බව දනීය.

'දෙ..යිය..නේ කෙ..ල්..ල...'

අනුලාට සිහි එලවාගන්නට පවා බැරි විය. ත්‍රීවීලරයට ගොඩ වූයේ වර්ෂාම බව අනුලාට සහතිකය.

'අ..නේ දෙ..යිය..නේ එ..හෙ..නං කෙ..ල්ලත් හොයාගෙන ආවා... මේ.. වෙ..ලාවේ...'

අනුලාව වෙව්ලන්නට විය. මේ දුටු දසුන ඇගේ ඇතුලාන්තයම දවාලීය. කෝපාවිෂ්ඨව ගිනිගත් මුහුණින් යුතුව නිවස දෙසට එන සුරම්‍යා දෙස අනුලා බලා උන්නේ පුදුමයෙනි.

'මො..ක..ක්..ද මෙතන වු..ණේ... අ..නේ එ..ක ත..ත්පරේකට කෙ..ල්ල එක්ක ක..තා කරන්න තිබ්බ නම්...'

අනුලාගේ දෑස් තෙමීගෙන ගියේය. මෙච්චර කාලයක් හැංගී උන් කෙල්ල අද හවසම ආවේ ඇයි... ඇය එන්නට ඇත්තේ කවර අරමුණකටද... අනුලාට කිසිවක් සිතා ගන්නට නොහැකි විය.

සුරම්‍යා ගේට්ටුව අසළ උන් අනුලා දෙස බැලුවේ අර ආ කෝන්තියත් එක්කමය.

'ලො..කු නෝ..නා ඒ ව..ර්..ෂා නංගී...'

'ඔව්... ඒ හිඟන බැල්ලි තමා... ඇයි උඹට ඒකිව දක්කහම කසනවද... අ..නුලා මේවා උ..ඹ පොඩි පුතාගේ ක..ණේ තිබ්බොත් අ..ද රෑම මං උඹවයි මිනිහවයි මේ ගෙදරින් ය..වනවා... ම..ගේ දරුවගේ අනාගතේ කාපු වේස බැල්ලි... ආවා බ..ලලා යන්න...'

අනුලා සියල්ල වටහා ගත්තාය. ඇයට දුක මේ කිසිවක් ගැන නොවේ. කෙල්ලගේ අත මොහොතකටවත් අල්ලා 'කොහොමද නංගියේ' කියාවත් අසන්නට බැරි වූ එකටය.

'ව..හ..ප...න් ඔය ගේ..ට්..ටු..ව... මං දන්මම ගෙදරට සිකියුරිටි

ද..නවා...˝

අනුලා මහ පොළවට සිනාසුණාය. ˝ගෙවල් වලට සිකියුරිටි දයි... ඒත් ආදරේ කරපු හිත් වලට කොහොම සිකියුරිටි දන්නද... අ..නේ මොනවා හිතාගෙන බ..ලලා යන්න ආවද දන්නෑ...˝

අනුලා උන්නේ දෙගිඩියාවෙනි. මේ දුටු දේ කාට හෝ කියන තුරු හිතට නිවනක් නැත. මොරගොඩ නිවසට වාහන දෙක තුන එන්නට විය. ඒ මංගල්ලයේ විවිධ වැඩ වෙනුවෙනි. ට්‍රාන්ස්පෝට් ඒජන්සියේ සේවකයෝ දහයක් දෙළහක් මිදුලේ විවිධ වැඩ වල නිරත වී උන්නෝය.

දිගටම අනුලාගේ බඩ පපුව දගෙන ගියේය. ඇය බඩත් ඔසවාගෙන මොරගොඩ නිවසේ මිදුලේ ඇවිදගෙන ආවේ අතරමං වූ ලෙසිනි. කාට හෝ කෙල්ල ආ බව කියන තුරු හදවතට නිවනක් නැත. එහෙත් අද කතා කරන්නට පවා ඉඩක් නැත. නිවස සෙනඟින් පිරී ඇත.

මංජුලා උන්නේ තරමක චකිතයෙනි. ඇය පාරේ සිට ඇවිදගෙනම නිවසට ආ හේතුව අනුලා තේරුම් ගත්තේ දන්ය. ˝කෙල්ල ඉන්නවා දකින්න ඇත්තේ ගෑණි˝ අනුලා හරියටම වූ දේ අනුමාන කළාය.

සුරම්‍යා මංජුලාවත් අතින් ඇදගෙනම කාමරයට යනවා අනුලා දක්කාය. ඇය කාමරයේ එහා පැත්තේ ජනේලය අද්දරට ගියේ කාටත් නොපෙනෙන්නය.

˝ඒ ගෑණි කිව්ව ඒවා ඇහුවම විමුක්ති අයියව මැරි කරන්නත් මට එපා වුණා... ෂිත්...˝

මංජුලා හොඳට රහපානවා යැයි අනුලාට සිතුණි. ˝ගෑණි හදන්නේ මේකෙනුත් නැන්දම්මට ඩිමාන්ඩ් එක දන්න...˝ අනුලා යටි තොල සපාගෙන සිතුවාය.

˝ඔයාට පිස්සුද මැණික... ගෑණියෙක් උනාම ඔය වගේ දේවල් වලට කලබල වෙනවද... ඔයාට පිස්සුද... ඕක ඔය හිඟන පරට්ටි මවා ගත්ත දෙයක්... පොඩි පුතා එයාට අනුකම්පා කළේ... අර නැන්දගේ දුව නිසා...˝





සුරම්‍යා කතා කරන්නේ ලේලිව අතගාමින් බව අනුලා දනී.

˝ඒත් ඒකි කතා කරන්නේ විමුක්ති අයියා ඒකිව බැඳලා ළමයිනුත් ඉන්න ගානටනේ...˝

මංජුලා අඬන්නේ බොරුවට බව අනුලා දනී.

˝මේ වෙලාවේ ඕකට හිත නරක් කරගන්නෙපා... මං ඒවා බලාගන්නම්... ඔයාලා බැඳලා ටික දවසක් කොහේ හරි හනිමූන් යන්නකෝ...˝

˝ඒත් ඇ..න්ටි මට පුළුවන්ද මේ කොහේවත් නැති හිඟන ගෑණියෙක් එක්ක...˝

˝මං කිව්වනේ ඒ පැත්ත මං බලාගන්නම් කියලා... ඔය හිඟන උන් එහෙමයි...˝

˝අ..නේ මන්ද මෙහෙම මැරි කරලා අන්තිමට...˝

අනුලා සිතුවේ මේ ගෑණිගේ කපටිකම ගැනය. මේ තරම් ධනස්කන්ධයක් උරුම විමුක්ති පස්සේ ඇය වැටී ඉන්නේ අල්ප මාත්‍රවූ ආදරයකට නොවන බව අනුලා දනී. ˝පට්ටන්ද බැල්ලී හදන්නේ ඒකිගේ ඔක්කොම වේසකම් මේකෙන් හෝද ගන්න...˝

˝හරි.. දැන් ඔක්කොම හරි... මේ වෙච්ච දේ අමතක කරලා දන්න... දැන් ඔක්කොම ලෑස්තිද...˝

˝ම්...˝

˝මම ඔයාව බලාගන්නවා... විමුක්ති අයිති ඔයාට.... මෙච්චර පුතෙක් හදලා මං ඔය බැල්ලියන්ට දරුවව දෙනවද...˝

අනුලා උන් තැනින් ගියේ මේ කතාබහ අසා ඉඳීම තේරුමක් නැති නිසාය. ඇය බීම එකක් රැගෙන උඩට ගියේ විමුක්තිව බලන්නටය.

˝පු..ංචි ම..හ..ත්..ත..යා...˝

අනුලා ගේ වියපත් මුහුණ දක විමුක්තිට පුදුම සිතුණි. අනුලා බීම එක මේසය මත තබා යළි දුව ගොස් දෙරෙන් එබී පහළද බලා

දුවගෙන විත් විමුක්තිගේ අතක් අල්ලා ගත්තාය.

'අ..නේ ර..ත්තරන් පු.ංචි මහත්තයෝ... අද.. රෑ යනවම නේ..ද...'

'ඔ..ව් අනුලක්කේ...'

'යන ගමන නම් ර..ත්තරන් නොයා ඉන්නෙපා...'

'ඇයි අනුලක්කෙ මේ.. කලබල වෙලා...'

'දෙයක් නිසා කියන්නේ... අරකි ඇවිත්... මට විස්තර කිය කිය ඉන්න වෙලාවක් නෑ... පුළුවන් ඉක්මනට එයාර් පෝට් යන්න...'

'ය..නවා අනුලක්කේ...'

අනුලා මොහොතකට විමුක්තිව සිපගත්තාය.

'තුණුරුවන් සරණයි... දෙවි පිහිටයි... දුප්පත් කෙල්ල ඔයා එනකං ඉන්නවා... ඒක අමතක කරන්නම එපා... මේ වල් වේසිව නම් බඳින්නම එපා...'

අනුලා මෙසේ හදිස්සියේ කියන්නේ ඇයිදැයි විමුක්ති පවා සිතාගන්නට අසීරු විය.

'ම..ගේ බෑග් එක කොහොම හරි වා..හ..නේ..ට ද..න්..න...'

'මං දන්නම් මහත්තයෝ... ගිහින් ධනේ අයියට වත් කතා කරන්න... මං විස්තර කියන්නම්...'

මංජුලා උඩට එන හඩ ඇසෙන්නට විය. ඇය එද්දී ඇය පැළඳ ඉන්නා උස් පාවහන් වල සද්දය ඇසෙයි.

'තුණුරුවන් සරණයි.. මං යන්නම්...'

අනුලා තවත් වරක් විමුක්තිගේ හිස සිප පහළට ආවාය. මහදී ඇයට මංජුලාව මුණගැසුණි.

මංජුලාට අනුලාගේ මුහුණේ බැල්ම එච්චර ඇල්ලුවේ නැත. 'මේ ගෙදර නම් රහස් ගුහාවක්...' මංජුලා උඩට ගියේ එසේ සිතමිනි. 'මට මුන්ගේ කවුරුවත් වැඩක් නෑ... මහ ගෑණි හිතන් ඉන්නේ එයාගේ පුතාව නලවන්න එනවා කියලා... බැන්දට පස්සේ අර හිඟන ගෑණි එන තරමට හොඳයි... එතකොට දික්කසාදේ ගන්නේ





මිනිහා අනාචාරේ හැසිරුණා කියලා...' මංජුලා විමුක්තිගේ කාමරයට ගොඩ වූයේ එලෙස සිතමිනි.

'ආ.. මංජු ඉඳගන්න...'

විමුක්ති මංජුලාගේ පැමිණීම එක අතකට අපේක්ෂා කළේය. මේ තීරණය ගන්නට හිත සවුත්තු වෙන තරමට හොඳය. විමුක්තිගේ මුහුණේ කිසිඳු හැඟීමක් තිබ්බේ නැත. පාරේදී වර්ෂා කියූ දේවල් සමඟ මංජුලා විමුක්තිගේ මේ මුහුණ සංසන්දනය කළාය. 'දෙන්නගේ ලව් එක තදට ගිහින් තියෙනවා... මෙයත් මෙහේ මූඩ් ගහලා ඉන්නේ ඒකයි... හෙටින් පස්සේ ගෑණු දහයක් එක්ක ගියත් මට මොකද...' මංජුලා සිතුවේ යටි තොල සපමිනි...

'හරිනම් විමුක්ති අයියයි එන්නෝන මාව බලන්න... පුදුම මනමාලයෙක්... හෙට බඳින්න මනමාලියෙක් ඉන්නවද නැද්ද කියලවත් බලන්නෑ...'

විමුක්ති අසරණ ලෙස මංජුලා දෙස බලා සිනාසුණේය.

'මංජු... කවදහරි කියන්නෙපා මං තේරුම් කරන්න උත්සාහ කළේ නෑ කියලා... තේරුණාද...'

'මේ මොනාද මේ කියන ඒවා... මට තේරෙන්නෑ...'

'අපි ගොඩක් දෙනෙක්ට ගොඩක් දේවල් තේරුම් යනකොට කල් යනවා මංජු...'

'පිස්සු කියවන්නැතුව කියන්න ඔක්කොම රෙඩිද කියලා...'

'ඔ..ව්... ඔක්කොම රෙඩි...'

'මං විතරක් නැතුව...' විමුක්ති එය කීවේ සිතෙනි... 'මිනිහගේ කතාව නම් මට එච්චර ඇල්ලුවේ නෑ...' මංජුලා කකුලක් පිට කකුලක් දමාගෙන ඇඳේ ඉඳගනිමින් සිතුවාය.

'මොකද තාම ෂේව් එකක්වත් අරන් නැත්තේ...'

එයටද විමුක්ති සිනාසුණේය. ඔහු යමක් කියන්නට මෙන් ඇඳ අසළ වූ පුටුවකට බර විය.

'මංජු...'

විමුක්ති කතා කළේ දිග හුස්මක් ගෙනය. ඒ හුස්ම මංජුලාට සිතුනේ කුණාටුවක් වැනි යැයි කියාය.

'ම්...'

'මංජු ගොඩක් අය ආශ්‍රය කළා..නම්... එයාලට මොනාද කිව්වේ...'

විමුක්ති දෑස් දෙස බලා ඇසූ මේ ප්‍රශ්නයෙන් මංජුලා තැති ගත්තාය. විමුක්ති උන්නේ ඇගේ දෑස් ළඟම නිසා ඇයට දෑස් හංගාගන්නටත් තැනක් නොවීය.

'ම..ම කවුරු ආ..ශ්‍රය කරන්නද... විමුක්ති අයියා මොනාද මේ කියන්නේ...'

'ඇයි මංජු අවංකවම කතා කරන්නැත්තේ... අපි හස්බන්ඩ් ඇන්ඩ් වයිෆ් වෙනවමයි කියමු... ඊට කලින් හොඳ යාළුවෝ වත් වෙන්නෙපැයි...'

'මූ ඒ පාර මොන පොටටද එන්න හදන්නේ... අනේ දෙයියනේ හිතා ගන්නවත් බෑ...' මංජුලා සිතුවේ ඇවිලෙමිනි.

'මං අවංකවම ත..මා කතා කරන්නේ...'

'ඔයා හොඳ ළමයෙක් නෙමේ මංජු... මං හිතුවා අඩුම ගානේ අදවත්...'

'මෙහෙම ඔළුව අවුල් කරන්නෙපා විමුක්ති අයියා... හෙට අපි මැරි කරන දෙන්නනේ...'

විමුක්ති සිනාසුණා මිසක කිසිවක් කීවේ නැත.

'හොඳයි... අපි එහෙනම් පස්සේ කතා කරමු... මංජු දැන් ගෙදර ගිහිල්ලා රෙස්ට් කරන්න...'

විමුක්ති කීවේ හැඟීමකින් තොරවය. මංජුලා මොහොතක් ඔහුට පිටුපා සිටින විමුක්ති දෙස බලා හිඳ නැඟිට ඔහුව වැළඳ ගත්තාය.

'අයි ලව් යූ...'

'උඹ ඔය කිව්ව වචන තුනේ තේරුම වත් දන්නෑ මංජු...' විමුක්ති සිතින් කීවේය.





# 07

ප්‍රියංවදා කෙල්ලව පිටකොටුවට යන බස් රියකට නාවලින් නංවා ගත්තේ තවත් කොළඹ සිටියහොත් මොනවායින් මොනවා වේවිදැයි නොදන්නා නිසාය. නාවල සිට නුගේගොඩට එන තුරු වර්ෂා ප්‍රියංවදගේ උරහිසට හිස බර කරගෙන බලාගත් අත බලා උන්නාය.

හවස සිදුවූයේ බලාපොරොත්තු නොවූ දෙයකි. නාවල පාරට ගියේ ඔහුගේ මූහුණ ටිකක් බලාගෙනම අනුරාධපුරයට යන්නටය. තව කාලයකින් කොළඹ එන්නට නොලැබෙන්නේ දරුවා කුසේ වැඩෙන නිසාය. දැන් මාස තුනහමාරකට ආසන්නය. තව ටික දවසකින් කුස මෝරද්දී මේ කොළඹ ඒම අමාරුය. ඇරත් ඒ තත්වයෙන් තමාව දකිනවාට වර්ෂා කොහෙත්ම කැමති වූයේ නැත.

මංජුලාටත් නැන්දටත් අර තරම් දෙයක් කියා එන්නට වත් මේ හිතට සිහියක් තිබීම ගැන වර්ෂා දස දහස් වාරයක් සතුටු වූවාය. මොරගොඩ නිවසේ ගේ දෙරකඩදී තවත් වරක් අන්තයටම නින්ද අපහාස විඳින්නට දෙවියන් ඒ දෙරකඩට තමාව ගෙන ගියේය. ඔහු ගෙතුළ ඉන්නට ඇත...

නැන්දගේ කම්මුල් පාර නිසා පුපුරා තියෙන්නේ වම් කම්මුල නොවේ. හදවතය. ඇය අද ඒ ගැසුවේ කාටවත් නොවේ. තමාගේ පුතාගේ දරුවෙක් කුස තියාගෙන ඉන්නා ගෑණිටය.

‘ප්‍රියා...’

‘කෙ..ල්..ලේ...’

‘ම..ගේ බ..ඩේ අ..යි..ය..ගේ ද..රුවෙක් ඉන්නව කියලා මං අ..ද කිව්වනම්...’

‘එ..හෙ..න..ම් එතනදිම උ..ඹව මර..නවා...’

‘ඔ..ව්... ඒක තමයි වෙ..න්..නේ... එ..යයි මායි අතර කොච්චර දේවල් උනා..ද... ඒත් ලෝකය ඒ මොනවත් දන්නෑ...’

‘ඒත් විමුක්ති අයියා මේක දැනගත්තොත් වෙන්නේ වෙ..න දෙ..ය..ක්...’

සෑහෙන වේලාවකට පසු වර්ෂා නෙත් පිසදගෙන හිස එසෙව්වාය.

‘මේ ප්‍ර..ශ්නේ ප්‍රියා අ..පට විසඳන්න බෑ කියලා තවත් පාරක් ඔ..ප්පු වුණා...’

‘ඔ..ව්.. ඒක උඩ ඉන්න දෙයියෝ විසඳන්න ඕන ප්‍රශ්නයක්...’

‘මං.. උ..ඹට පො..රොන්දු වෙනවා ආයේ මේ කො..ළඹ පස් පාගන්නෑ... එ..යා ඇ..වි..ත් මාව එ..ක්..ක ගියො..ත් මි..සක්...’

ඒ හීනය හත් ගව්වකට එහාය. දෛවය ඒ තැනට එන්නට පෙර තව සෑහෙන දුක් දෙනු ඇත. සෑහෙන දුක් දෙනු ඇත.

‘අර බැල්ලිගෙයි නැන්දගෙයි කතා ඇහුවම වර්ෂා මට එක දෙයක් හොඳට තේරුණා...’

‘මො..ක..ක්..ද...’

‘මේ කසාදේ තනිකරම බොරුවක්... මංජුලා බයවෙලා ඇතුළට ගියෙත් ඒකයි... නැත්නම් ඔය ගෑණි ඔච්චර බයවෙන්නෑ....’





‘මං ඒක දන්නවා ප්‍රියා... අ..යියා මේ වෙලාවේ මේ ගැන මො..නවා හිතනවද කියලා දෙයියෝ තමයි දන්නේ... ඒ..ත් මොනාද දැනෙනවා ප්‍රියා...’

හිතට දැනෙන දේ ඇත්තටම තේරුම් ගන්නට නොහැක.

‘මෙහේ ලොකු අවුලක් වෙන්න යන්නේ ප්‍රියා... මං.. ඒ..ක..යි මේ..ඩක්..ක..ට වත් කතා ක..ර..න් නැ..ත්..තේ...’

‘අපි ඒ අවුලෙන් ඇත්වෙලාම ඉමු කෙල්ලේ...’

‘මට.. ස..ට..න් කරන්න බැරුව නෙමේ ප්‍රියා... ඒත් මේකා ගැන දුක හිතෙනවා... ම..ට හිතෙනවා ඒකා එක කාලෙක මේ හැම දෙය..ක්..ම...’

වර්ෂා ඉන් එහාට කිසිවක් කීවේ නැත. කොහොමටත් අද අනුරාධපුරයට යන්නේ දෛවයේ තීරණයක් දෙන තුරු ඒ රජරට හැංගීගෙනම ඉන්නටය.

*          *          *          *          *          *          *          *          *          *

සුරම්‍යා උන්නේ පිච්චෙමිනි. වර්ෂාව දුටු මොහොතේ සිට ඇගේ හදවත තුළ ගුප්ත බියක් ඇතිවී තිබුණි. ඇය විමුක්තිව හමුවූයේ වත් නැති බව පුල පුලා කීවාය. සුරම්‍යාට තිබූ එකම සැනසීමත් එයය. එහෙත් අර තරම් නින්ද අපහාස කර ගෙදරින් එලවා තිබියදීත් වර්ෂා විමුක්තිව සිතින් අයින් නොකිරීම සුරම්‍යාට ඉවසුම් දුන්නේ නැත. ‘හිඟන බැල්ලි පලි ගගහ පස්සෙන් එනවා ඇති... පොඩි පුතා බැන්දත් ඒකි ළඟට යන්න ගන්න පුළුවන්...’ සුරම්‍යා වර්ෂා ගැන සිතුවේ එලෙසිනි.

ඇයට තිබූ දුක තමාගේ සහයට කෙනෙක් නැතිවීමය. වර්ෂා මේ ගෙදරට අද හවස ආ බව කිසිවෙකුටවත් කිව නොහැක. කා සමඟවත් මේ ගැන කතා කළ නොහැක. ඇයට තිබූ දැවිල්ල ඒකය.

හෙට මංගල්ලයකි. එහෙත් ගෙදර කිසිවෙක් නැත. සුරම්‍යා සක්විතිට ගත්තේ තරහිනි.

'ලොකු පුතා... මෙතන මඟුල් කරන්න ඕන පිට මිනිස්සු ඇවිල්ලද... මල්ලිගේ මඟුල නේද... ෂිහ්... ඔයත් සහෝදරයෙක්ද... මේධටවත් මොළයක් නැද්ද ඔයාට යුතුකමක් කියලා දෙන්න...'

සුරම්‍යා කතා කළේම බැණගෙනය. සක්විතිට අම්මාට බණින්නට සිතුණේය. දන් මඟුල් කර වැඩක් නැතැයි කියන්නට තරම් සක්විතිට සිතුණි.

'එන්න තමයි අම්මේ යන්නේ... මෙහෙත් ඉන්නේ බඩදරු ගෑණියෙක්නේ... ඒ ගෑණි එපැයි ඔක්කොම තනියම කරන්න...'

සක්විති අම්මාට කීවේ තරහිනි.

'ඉතින් මේධට මෙහෙට ඇවිත් විවේක ගන්න බැරිද... මං කො..හොමද තනියම මේවා කරන්නේ...'

'හරි මං එන්නම්... හොටෙල් එකේනේ මඟුල ගන්නේ... ගෙදර මොනා කරන්නද...'

'රට මල්ලිට දෙහි වගයක් කප්පනවා... මේ මිනිස්සුන්ට කෑම දෙන්න ඕන...'

'හරි මං එන්නම්..'

සුරම්‍යා එහෙමම ගත්තේ මොරගොඩ මහතාටය.

'මහත්තයා මේ බඳින්නේ ඔයාගේ පුතෙක් නෙමේද...'

මොරගොඩ මහතා සුසුමක් හෙළුවේය.

'මං මේ දන් එනවා නෝනා... ඔක්කොම හරිනේ... මං මේ පොඩ්ඩට වාහනයක් බැලුවා හෙට යන්න...'

'පුදුමයි ඔයාට ඒකවත් මතක් වුණා... ධනසිරිවත් ඉක්මනට එවන්න...'

සුරම්‍යාගේ බඩ පපුව දන්නේය. අම්මා කෙනෙක් ලෙස ඇගේ මේ බිය සාධාරණය. හොඳට හෝ නරකට අම්මලා හිතන්නේ දරුවන් ගැනය. එහෙත් දෛවයේ විශාල බොරුවකට තමාව හසුවී ඇති බව සුරම්‍යාට වැටහෙන්නේ නැත. ඒ වෙනුවෙන් ගෙවන





වන්දිය තම පොඩි පුතාගේ ජීවිතය බව සුරම්‍යා දන්නේ නැත.

* * * * * * * * * * * *

අනුලා විමුක්තිගේ බෑගය ඔහුගේ වාහනයට දම්මේ කාටත් රහසේ මෙනි. මේ කරන්නේ පිනක් බව අනුලා දන උන්නාය. ධනසිරි ආ හැටියේම ඇය ඔහුව ඇදගෙන කාමරයට ගියාය.

'ධ..නේ..'

'ඇයි මේ හිනාවෙන්නේ... අඩන්න ඕන වෙලාවක් මේක...'

'නෑ ධනේ... එහෙම වෙන්නෑ... හෙට මේ මඟුල වෙන්නෑ...'

'වෙන්නෑ... ඔයාට පිස්සු... අරහේ හැමදේම ලෑස්ති කරලා තියෙන්නේ... පුංචි මහත්තයට අරකිව බඳින්නම වෙනවා...'

'උඩ එක්කෙනෙක් ඉන්නවා ධනේ... එයා එහෙම වෙන්න දෙන්නෑ...'

'ඉතින් මොකක්ද වෙන්නේ...'

'පුංචි මහත්තයා අද රෑට රට යනවා...'

අනුලා කීවේ රහසින් මෙනි.

'ර..ට යනවා...'

ධනසිරි අනුලා දෙස බලා උන්නේ පුදුමයෙනි.

'විශ්වාස කරන්නත් බෑ... පුංචි මහත්තයා කිව්වද...'

'ම්.. දන් මං ගිහින් බෑග් එක කාර් එකට දම්මේ...'

'එහෙනම් හෙට මෙහේ මහා ජංජාලයක් වෙයි...'

'වෙද්දෙන්... වෙන්න ගිය දේ ඊ..ට වඩා භයානකයිනේ...'

'එහෙනම් කොල්ලගේ ජීවිතේ බේරුණා...'

'ඒක නෙමේ පුදුම දේ ධනේ... හවස වර්ෂා ආවා...'

'මෙහේ...'

'ම්... ඒත් මංජුලයි මහ ගෑණියි කෙල්ලව බැණලා පාරෙදිම එලෙව්වා... මං මේ දැහින් දක්කා... පව්... කෙල්ලව දක්කම මට හීල්ලුනා...'

'කතා කළාද කෙල්ල එක්ක....'

'නෑ.. ත්‍රීවිල් එකක නැගලා ගියා...'

'එතකොට පුංචි මහත්තයා රට යන්නේ වර්ෂා නංගිවත් එක්කගෙනද...'

'වර්ෂා නංගී ආපු බව පුංචි මහත්තයා දන්නෑ... දන්නව නම් මෙතන වෙන දෙයක් වෙන්නේ... මං කියන්න ගියෙත් නෑ... ඔය යන ගමන ගිය දෙන්...'

'ඔ..ව් ඒක හරි... හොඳම දේ ඒක තමා... එහෙනම් මේ මඟුලට බොරුවට නැහිලා වැඩක් නෑ...'

'කොහෙත්ම වැඩක් නෑ... අද රෑට ඔක්කොම ඉවරයි...'

'පුංචි මහත්තයා කෙල්ලට මෙච්චර ආදරෙයි කියලා මං දනං උන්නෑ...'

'ඒක.. පු..දුම ආදරයක් ධ..නේ... පතාගෙන ආපු ආදරයක්... නැනයි මස්සිනයි නේ.. එයාලව වෙන් කරන්න කාටවත් බෑ...'

'මාරයි.. පුංචි මහත්තයට බුදු සරණයි කියලවත් කියන්න ඕන...'

'කාමරේ ඉන්නවා... පරිස්සමින් යන්න.. මේ ගෙදර බිත්ති වලටත් කන් තියෙනවා...'

අනුලා බඩත් ඔසවාගෙන යළි මහ ගෙදරට ගියේ අද රෑ මොනවායින් මොනවා වේදයි සිතමිනි. මොනවා වුණද හෙට වෙන්න ගිය දේට වඩා සියල්ල හොඳ වෙනු ඇත.

ධනසිරි කාටත් නොපෙනෙන්නට උඩු මහලේ විමුක්තිගේ කාමරයට ගියේය. විමුක්ති උන්නේ කාමරයේ ඇවිදිමිනි.





'ධ..නේ අයියා...'

'පුංචි මහත්තයා... අනුලා කිව්වා...'

විමුක්ති කටට ඇඟිල්ල තිබ්බේ ඒ දේ මෙතන කතා නොකරන ලෙසිනි.

'මං යනවා ධනේ... ගෙදර බලාගන්න...'

'අන්තිම මොහොතේ හරි මොනවා හරි වෙයි කියලා අනුලයි මායි හිතුවා පුංචි මහත්තයා... අනේ මට පුළුවන්කමක් තිබ්බනම් මං එයාර් පෝට් බස්සනවා...'

'මං යාළුවෙක් එක්ක යන්නේ... ධනේ ගියොත් ධනේ අයියට හොඳ නෑ...'

'ගිහින් පරිස්සමින් ඉන්න පුංචි මහත්තයා... මෙහේ මොනවා හරි කරන්න ඕන නම් මට කියන්න...'

'මං ගිහින් ධනේ අයියට කතා කරන්නම්... අනුලක්කව බලාගන්න...'

විමුක්ති ධනසිරිගේ උරහිසට තට්ටු කර කීවේය.

'බුදු සරණයි පුංචි මහත්තයා....'

'අයියලගේ ගෙවල් පැත්තත් බලන්න... අක්කට බබා ලැබෙන්න ළඟයිනේ...'

'ඔක්කොම බලන්නම් පුංචි මහත්තයා... ඒවා හිතන්නෙපා... මට හරි සතුටුයි...'

ධනසිරි පහළට ආවේ තෙත් වූ දෑසිනි. මේ ගෙදරට මොනවා වෙන්නට යනවාදයි සිතාගන්නට නොහැක.

මුළු මොරගොඩ නිවසම මඟුල් සිරියක් ගෙන ඇත. එහෙත් මනමාලයා අද රෑ පිටව යන්නේය. පුදුමය එයය.

# 08

උඩු මහලේ සිට විමුක්ති සක්විතිට ඇමතුවේ ඔහු එන වේලාවක් දැනගන්නටය. අයියලාත් ආ පසුව යනවා යැයි ඔහු සිතාගත්තේය. සිංගප්පූරුව බලා යන යානය ඇත්තේ මැදියම් රෑ නිසා වේලාව ඇතිය.

'අ..යියේ...'

'උඹ යන්නද මල්ලී....'

සක්විති ඇසුවේ දුකෙනි. මේධාද සක්විති දෙස බලා උන්නාය. මල්ලිගේ ජීවිතයේ වෙන මේ දේවල් නිසා අයියාද ඉන්නේ මහා දුකකිනි.

'අයියලා දැන් එනවද...'

'ඔව් මල්ලී... මේ නුගේගොඩ...'

'ඉක්මනට වරෙන්... උඹගෙයි අක්කගෙයි මූණු බලලම යනවා... තාත්තත් දැන් ආවේ...'

'මං විනාඩි පහෙන් ගෙදර මල්ලී...'

දුරකතනය තබා සක්විති මේධා දෙස බැලුවේ දෑස් ඇදුම්





කද්දීය. මේධා සක්විතිගේ වමත මත සුරත තබා තද කළේය.

'මල්ලී යන්නේ ප්‍රශ්නයක් නිසානේ මහත්තයෝ...'

'මංද බබා... මට මහ බයක් දැනෙනවා...'

'යන කොල්ලට යන්න දෙන්න මහත්තයෝ... වෙන විසඳුමක් නැනේ... අද රෑ වෙන ප්‍රාතිහාර්යයක් වෙන්නැනේ...'

'ඌ එහේ ගිහින් මොනා කරන්නද... ඇරත් තනියම...'

'පැටියා ලැබිලවත් හිටියනම් අපිට ගිහින් බලලා එන්න තිබ්බා නේද...'

'ම්...'

'කමක් නෑ... අපි හිම්හිට ගිහින් බලමු....'

'අම්මට බැරි වුණානේ අර කෙල්ලගේ හිත තේරුම් ගන්න... ෂිහ්... කොච්චර වාසනාවන්ත කෙල්ලෙක්ද...'

'අම්මා ඒක කවදහරි තේරුම් ගනී මහත්තයෝ...'

සක්විති නාවල මහ ගෙදරට වාහනය දැම්මේ තරමක බියකිනි.

'ගෙදර මහුල් කනවා වගේ සෙනඟ... අම්මටත් පිස්සු...'

'වටේ පිටේ අයට පෙන්නන්නත් එපැයි...'

සක්විතිත් මේධාත් වාහනයෙන් බසිද්දීම දුටුවේ සුදු පැහැගත් බෙන්ස් කාරය සරසන ආකාරයය. ඒ හෙට මංජුලාටත් විමුක්තිටත් පිටව යාම සඳහා සූදානම් කරන රථයයි.

'හෙට මේකෙ අපි දෙන්නවත් කොහේ හරි ගිහින් එමු...'

සක්විති කීවේ දුකටද විහිළුවටද කියා මේධාට තේරුණේ නැත. ඇය සක්විති පිටුපසම බඩත් ඔසවාගෙන ගියේ සක්විති කීවාක් මෙන්ම තරමක චකිතයකිනි. ඒ හැඟීම දැනෙන්නේ මේ මහ ගෙදරට පය තැබූ විටය.

තාත්තාත් අම්මාත් දෙස බලන්නට බැරි ගතියක් සක්විතිට දැනුණි. ඒ හැඟීම මේධාටත් එහෙමම දැනුණි.

'ඔන්න අයියයි නැනයි එන වෙලාව...'

සුරම්‍යා කීවාය. මොරගොඩ මහතා මේධා දෙස බලා සිනාසුණේ මේ අම්මගේ කතා වලට සිත තරක් කරගන්නට එපා යැයි කියන්නාක් මෙනි.

'මේ කෙල්ලට මහන්සි වෙන්න බැනේ සුරම්‍යා...'

'මං කිව්වේ මේධා ගැන නෙමේ.. මහ ලොකු ආදරණීය අයියා ගැන...'

'මේධට දන් ටික ටික අමාරුයි තාත්තේ... කෝ මල්ලී...'

'උඩ ඉන්නවා...'

උඩට යනවාට වඩා මෙහෙම ඉන්නා එක හොඳය. උඩට ගියහොත් යන ගමන ගැන මල්ලී සමඟ කතා කරන්නට වෙයි. එවිට සිතට අමාරුය.

'දන් හෙට මල්ලි බැන්දට පස්සේ ඔයයි මේධයි ඇවිත් මෙහේ ටික දවසක් ඉන්න... මට බැරියැ මේධව බලාගන්න...'

'මං දිගටම නිවාඩු දම්මා අම්මේ...'

'මං හැටන් වල කෙනෙකුට කිව්වා ගෙදරට වැඩට දෙන්නෙක්ව ඕන කියලා... මං දුවටත් දෙමළ ගෑණු කෙනෙක් ගෙනත් දෙන්නම්... තනියම කර ගන්න බෑනේ... මෙහෙත් අනුලට බබා ලැබෙන්නනේ...'

තාත්තා අම්මාට වඩා තෙතමනයක් ඇති කෙනෙක් බව මේධා කොහොමත් දන උන්නාය.

'මේ පොඩි පුතාගේ වැඩ ඉවර වෙනකම් මගේ හිතට කිසි නිවනක් නෑ... කොහොමත් ලොකු පුතා හෙට අනිද්දට ඔය රස්සාවෙන් අස්වෙන්න... තමන්ගේ බිස්නස් තියෙද්දී අනුන්ගේ තැන්වල රස්සාවල් කරන්න ඕන නෑනේ...'

'මෙතන දන් මගේ රස්සාවේ ප්‍රශ්නයක් නෑනේ අම්මේ... තාත්තා හොඳට ඒක කරගෙන යනවනේ... පස්සේ බැරුවයැ...'

මොරගොඩ මහතා මේ වලට කිසිවක් කියන්නට ගියේ නැත.

උඩු මහලේ උන් විමුක්ති අවසන් වතාවටත් ගුවන් ටිකට්





පතත් ගමන් බලපත්‍රයත් පරීක්ෂා කර බලා සාක්කුවේ ද ගත්තේය. ඔහු වාහනයේ යතුර අතට ගත්තේ දිග සුසුමක් හෙළීමෙන් අනතුරුවය.

විමුක්ති එයාර් පෝට් යන්නට ඇඳ ගත්තේ සාමාන්‍ය ලෙසිනි. සරල ඩෙනිම් කලිසමක් හා ටී ෂර්ට් එකක් ඇඳි ඔහු සාමාන්‍ය පාවහන් යුගලක් ද ගත්තේය. මේ යන ගමන කුමක් හෝ සැකයක් මතුවී යන්නට නොලැබුණොත් ජීවිතයේ යළි නිවැරදි කර ගත නොහැකි වැරදීමක් සිදුවන බව ඔහු දන උන්නේය.

ඔහු අවසාන වතාවටත් තම කාමරය දෙස බැලුවේය. වර්ෂා මේ ගෙදරින් යන්නට පෙරදු ඇය මේ ඇඳ පල්ලේ ඉඳගෙන තම දෙපා අතගෑ හැටි ඔහුට සිහිවිය.

'මා..ව දලද යන්නේ රත්තරන්...'

ඇය කාමරයේ සිට අහන්නාක් වැනිය.

විමුක්ති උඩු මහලේ පිටගැට පෙළින් සෙමෙන් සෙමෙන් පහළට බැස්සේය. පහළ සාලයේ උන් හතර දෙනාම ඔහු දෙස බැලුවේ එකම විටය. අම්මාගේත් තාත්තාගේත් මුහුණ දකිද්දී විමුක්තිගේ පපුව අලුතින් දවී ගියේය. 'මට සමාවෙන්න. මම මෙහෙම කරන්න හීනෙකින් වත් හිතපු දරුවෙක් නෙමේ. මොනා කරන්නද...' ඔහුගේ බොඳවූ දෙනෙත් කියා පෑවේ ඒ කතාවය.

මේධා තොල් පට තද කරගෙන විමුක්තිගේ මුහුණින් දෙනෙත් ගත්තේ තමාට දන් දන් ඇඬෙයැයි සිතුන නිසාය. සක්විතිගේ දෙනෙත්වල වූයේද එයාකාරම දුකකි. අද කොතරම් දුක්බර දවසක්ද... මේධා සිතුවේ නෙතින් එළියට පනින්නට දඟලන කඳුළු පපුව ඇතුළට දමා ගනිමිනි.

අනුලා කුස්සියේ දොරින් එබී විමුක්ති දෙස බලාගත්වනම බලා උන්නාය. ඔහු මේ යන්නේ ගුවන් තොටුපළට බව ඇය දන උන්නාය. තව සෑහෙන දවසකට ඔහුව දකින්නට නොලැබෙනු ඇත. අනුලා වරින්වර කුස්සියට ගොස් ආවේ එළියට එන කඳුළු පිස දමමිනි.

මේධා එක එක තැනට දෙනෙත් ගෙන ගියාය. ඇස්වලට මිරිස් ගෑ විලසින් දෙනෙත් දැවිල්ලය. කොහොමටත් කඳුළු නම් නවතින්නේ නැත. ඇය තොල් පට මුව තුළට ගෙන වේගයෙන්

සපා ගත්තාය.

විමුක්ති පහළට එද්දීම දක්කේ මේධාගේ තෙත් වූ නුවන්ය. මේධා ඒ කඳුළු සඟවාගෙන මෙන් සිනාසුණා.

විමුක්තිගේ අතේ තිබූ යතුර දක සුරම්‍යා කලබල වූවාය.

"පොඩි පුතා කොහේ යන්නද මේ රෑ..."

"කොල්ල මහ ගින්නකින් බේරෙන්න මුහුදු හතකින් එහාට යන්න හදනවා..." මේධා එසේ කීවේ සිතෙනි.

"මං මේ බු..ක් ෂොප් එකට දුවලා එන්නම් අම්මේ... බඩු වගයක් එහේ දලා ඇවිත්..."

"ඉතින් ධනසිරිව යවන්න... මේ රෑ ඔයා යන්නෙපා..."

"ධනේ දන්නෑ... මං ගිහින් අරන් එන්නම්..."

විමුක්ති එසේ කියා හතර දෙනා දෙසම එකවර බැලුවේය. සක්විති බිම බලාගත්තේ සුසුමක් කාටත් නොදනෙන්නට හෙමි හෙමින් පිට කරමිනි.

"ලොකු පුතත් යන්න මල්ලී එක්ක... මේ රෑ තනියම යන්නෝ මොකටද..."

"අයියා ඉන්න... මම ගිහින් එන්නම්... ය..න්..න..ම්..."

ඔහු එසේ කීවේ ඇස් හංගාගෙන මෙනි. විමුක්ති මොහොතක් වත් නිවසේ නොරැඳී එහෙමම වාහනයට ගියේය. අනුලා දුවගෙන ආවේ ගේ පිටුපස සිටය.

"තුණුරුවන් සරණයි පුංචි මහත්තයා... පරිස්සමින් ඉන්න හොඳේ..."

"යන්නං අනුලක්කේ..."

"මං සැන්ඩ්විච්ස් පාර්සලයක් මෙතන තිබ්බා... ඒක කකා යන්න... බඩගින්නෙනෙ..."

විමුක්ති අනුලා දෙස බලාගෙනම වාහනය මොරගොඩ නිවසින් එළියට ගත්තේය. මේ ගමන යන්නට බලාපොරොත්තු වූ ගමනක්

නොවේ. එහෙත් කරන්නට දෙයක් නැත.

නාවල පාරට වාහනය දමද්දී විමුක්තිගේ දෑස් තෙත් විය. දෛවය කොහොම දුක් දෙනවාදයි ඔහු දන්නේ නැත. "නෙත්තටම නෙති වෙනවා..." මලයාලම් සාස්තරකරු කී අයුරු ඔහුට සිහිවිය. "කමක් නෑ. ඒත් නැත්තටම නැති වෙලා හරි අන්තිමට මට උඹව ලැබෙනවනේ නංගියේ..." ඔහු අමු අමුවේ ගලන කඳුළු පිසද ගත්තේ එලෙස සිතාය.

සුරම්‍යාට මහා බියක් දැනුණි. මේ රෑ විමුක්ති නිවසින් පිට වූයේ ඇයි... තව ටිකක් බලා ධනසිරි සමඟ පොත් හලට යනවායැයි ඇය සිතාගත්තාය. ඇයට සියල්ලටම වඩා බය හවස වර්ෂා කියූ දේවල්ය.

"මේ රෑ ගියේ මෙකී හම්බවෙන්නද... ඕකී මේ ළඟම අහක ඇති... කතා කරලා ගෙන්න ගත්තාවද්ද..."

සුරම්‍යාගේ බඩ පපුව දන්නට ගත්තාය. ඇය කෝකටත් එක්ක විමුක්තිගේ ජංගම දුරකතනයට ඇමතුමක් ගත්තාය. ඒ ගිය තැනකින් වහා එන්නට කියන්නටය. එහෙත් එය ක්‍රියා විරහිතව තිබුණි.

සුරම්‍යාගේ බිය දෙගුණ විය. "ෆෝන් එකත් වහලා... මෙයා කොහෙද ගියේ..."

අම්මා ඉන්නේ සෑහෙන ඉවකින් බව සක්විතිට පමණක් නොව මේධාටද වැටහිණ. "කමක් නෑ දන් කොල්ලා ගිහින් ඉවරනේ..." මේධා හිත සනසා ගත්තේ එසේ කියාය.

"ලොකු පුතා... මං පොඩ්ඩක් ධනසිරි එක්ක එළියට යනවා... අර දේවාලේ කපු මහත්තයා එයි මල්ලිට දෙහි ටික කප්පන්න... කාමරේ ලෑස්ති කරලා තියෙන්නේ... එතන ඉන්න කියන්න..."

"හා අම්මේ..."

අම්මා ගැනත් සක්විතිට දුක සිතුණි. අම්මා මේ යන්නේ මල්ලීව බලන්නට පොත් හලට බව ඔහු දන උන්නේය.

"වැඩක් නම් මං ගිහින් බලන්නම් අම්මේ... අම්මා ඉන්න..."

"නෑ... ඔයා මෙහේ බලන්න... මං ඉක්මනට එන්නම්..."

සක්විතිට දිග සුසුමක් ගියේය.

"අම්මට සැකයි..."

මේධා මිදුලට පැමිණ කීවාය.

"වෙලාවකට පව් කියලත් හිතෙනවා..."

සක්විති කීවේය.

"මටත් නොහිතෙනවා නෙමේ... එයාගේ පපුවෙත් ගින්දර ඇති... ඒත් වෙන දේ විනාශයක් නම් මහත්තයෝ..."

"අනේ මන්ද... කාටවත් සැනසීමක් නෑ..."

මේ සිදුවන දේවල් ගැන මේධාටද දුකය. එහෙත් කුමක් කරන්නද කියා කාටවත් තේරෙන්නේ නැත.

"සක්විති මහත්තයා... තේ එක..."

අනුලා තේක අරගෙන පැමිණ දෙදෙනා දෙසම බැලුවේ හූල්ලමිනි.

"මං දවල් දක්ක දේ දක්කනම් සක්විති මහත්තයයි මේධා නෝනයි පුදුම වෙයි..."

"ඇයි..."

සක්විතිත් මේධාත් දෙන්නාම අනුලා දෙසට හැරී ඇසුවේ පුදුමයෙනි. අනුලා වර්ෂා ආ පුවත සියල්ලම දෙන්නාට කීවාය.

"වි..ශ්වාස කරන්නත් අමාරුයි... ඒ කියන්නේ කෙල්ල ආවා..."

"මෙ..හෙට ආවද නැත්නම්..."

"පව්... කෙල්ල දුකට එන්නැත්තේ... ඉවසගන්න බෑනේ මහත්තයෝ..."

"ලොකු නෝනා බැන්නා... ගහන්නත් ඇති... අඬ අඬා ත්‍රීවිල් එකේ ගියේ..."

මේධාට හීල්ලින.

"මං පුංචි මහත්තයට කිව්වේ නැත්තේ මේ ගමන නවත්තයි කියලා... එහෙම වුණා නම් හෙට වෙන දේ... නේද මේධා නෝනා..."





"අනුලක්කා කියන්නේ ඇත්ත..."

"කෙල්ල නිකං පෙනිලා නොපෙනී ගියා මේධා නෝනා... අනේ මූණ දක්කම පිච්චිලා ගියා... කැක්කුම නිසානේ එන්නැත්තේ..."

මේධා දෙනෙත් පිසද ගත්තාය.

"ඒ කියන්නේ කෙල්ල මේ ළඟකම ඇති..."

"ඔ..ව්..."

"කෙල්ල අපිටවත් කතා නොකරන්නේ අපිවත් අසරණ කරන්න බැරි නිසා... මම මේ ගෙදර ලේලි... ඔයා ලොකු පුතා... අනුලක්කා මේ ගෙදර වැටිලා ඉන්න ගෑණි... ඒකි.. ප..ව්..."

තුන් දෙනාම මිදුලේ සරසන මඟුල් කාරය දෙස බලා උන්නේ අවමංගල වාහනයක් සරසන දෙස බලා ඉන්නාක් මෙනි.

* * * * * * * * * *

සුරම්‍යා පොත් හල අසළින් බැස්සේ රෑ නමයට පමණය. ඒ වෙද්දී නගරය මෙන්ම පොත් හල අවටත් පාළුවට ගොස් තිබුණි.

විමුක්තිගේ වාහනය පොත් හල අසළ නැත. සුරම්‍යාගේ ඉහ මොළ රත්විය.

උන්නේ එහි ආරක්ෂක නිලධාරියා පමණි.

"විමුක්ති සර් දන් මෙහේ ආවද..."

"නෑ ලොකු මැඩම්... සර් හවස ගියානේ..."

"අනේ දෙයියනේ මේ කොල්ලා කොහේ ගියාද..." සුරම්‍යා සිතුවේ ඇවිලෙමිනි. ඇගේ දෙපා පණ නැති වීගෙන එන්නාක් මෙන් විය. ඇය අතේ තිබූ ජංගම දුරකතනයෙන් ගෙදරට ගත්තාය. ගත්තේ අනුලාය.

"ලොකු නෝනා..."

"පුංචි මහත්තයා ආවද..."

'ත..ව නෑ... ලො.කු නෝනා...'

'ආවම කොහෙවත් යන්න දෙන්නෙපා... මං දන් එනවා...'

'හා ලොකු නෝනා...'

සුරම්‍යාගේ ඔළුව කැරකෙන්නට විය. ඇය පොත් හල අසලට වී සැහෙන වේලාවක් උන්නාය. නැත. විමුක්තිගේ වාහනය ආවේ නැත. ඇය යළිත් මංජුලාට ගත්තාය.

'ඇයි ඇන්ටි...'

'විමුක්ති ඔහේ ආවද...'

'මෙ..හේ නෑ... ඇ..යි...'

'නෑ මං නිකං ඇහුවේ...'

'ඇයි ගෙ..ද..ර නෑ..ද්ද...'

මංජුලා ඇසුවේද චකිතයෙනි.

'නෑ.. මේ මොකක්ද ඇඳුමක් ගේන්න එළියට ගියා... මං හිතුවා ඒ ගමන් ඔහේ ඇවිත් කියලා...'

'ඇයි ෆෝන් එක...

'හරි පුතේ මං ඔයාට ගන්නම්...'

සුරම්‍යා වහා දුරකතනය කට් කළාය. ඇය යළි වාහනයට නැග්ගේ ඇවිලෙමිනි. ධනසිරි කිසිවක් නොකියාම උන්නේය.

'පුංචි මහත්තයා බුක්ෂොප් එකට ඇවිත් නැතේ ධනසිරි... මංජුලා මිස්ලගේ ගෙදර ගිහිනුත් නෑ...'

'ද..න් ගෙදර ඇවිත් ඇති ලොකු නෝනා... අපි ගෙදර යන්...'

'මගේ ඔළුව අවුල් වෙලා ධනසිරි... යන් ගෙදරට...'

සුරම්‍යාගේ දෙනෙතින් කඳුළු ගලා එන්නට විය. ඇය පිටුපස අසුනේ සිට ඇඬුවාය. ධනසිරිට කර කියා ගන්නට දෙයක් නැති විය. මේ ප්‍රශ්නය කොහෙන් කෙළවර වෙයිද...

ඒ මොහොතේ විමුක්ති උන්නේ සකුන්ත සමඟ වාහනයේ ගුවන් තොටුපළ බලා වේගයෙන් යමිනි. වර්ෂා උන්නේත් ඒ ළඟම





අනුරාධපුරය බලා යන නගරාන්තර බස් රියේය.

ඔවුන් දෙදෙනාම ගමන් ගත් වාහන අලුත් කැළණි පාලමට ළඟා වෙමින් තිබුණි.

* * * * * * *

සුරම්‍යා නිවසට ආවේ පරල වූ විලසිනි. විමුක්ති කොහේ ගියාද... ඇය හතර අතට ඇමතුම් ගත්තාය. එහෙත් විමුක්තිගේ ජංගම දුරකතනය තිබුනේ ක්‍රියා විරහිතවය.

'අර බැල්ලි මේ කොල්ලව ගෙන්න ගත්තද... පොඩි පුතා එහෙම කරයිද... මොකක්ද මේ වෙන්නේ...'

සුරම්‍යාගේ ගතම දහදියෙන් තෙත්වී තිබුණි. මංගල්ලය කටේ තියාගෙන මේ කොල්ලා කොහේ ගියාද... මේ දුක කියන්නටවත් කෙනෙක් නැත.

'ධනසිරි.. මං බහින්නම්... ආයෙත් ගිහින් බලන්න බුක් ෂොප් එකේ මේ පිස්සා ඇවිත්ද කියලා... ෆෝන් එකක් වහලා...'

ධනසිරි නිහඬවම වාහනයෙන් සුරම්‍යාව බස්සවා යළි එය හරවා ගත්තේය. පොත් හලේ බලා වැඩක් නැත. කොල්ලා දන් ගුවන් තොටුපළට ලංවී ඉන්නවා ඇත.

'ලොකු පුතා...'

සුරම්‍යා නිවසට ගොඩ වූයේ අඬාගෙනමය. සක්විතිට අම්මාගේ මුහුණ දෙස බලන්නට බැරි තරම් විය. කොහොමටත් මේ පුදුමාකාර දුෂ්කර මොහොතකි.

'අ..ම්මේ...'

'ම..ල්..ලි බු..ක් ෂොප් එ..කේ නෑ ලො..කු පු..තේ... යනකො..ටත් මට මොකක්ද වගේ වුණා...'

අම්මා කෙනෙකුට එය දනෙයි. තමා දෙමව්පියන්ගේ සිත රිද්දුවත් කවදාවත් මල්ලී අම්මාගේත් තාත්තාගේත් සිත රිද්දවා නැත. අම්මාගේත් තාත්තාගේත් දහ පුතා තමාය. හොඳ පුතා මල්ලීය. ඔහු

ඒ තරම් හොඳය. අද මේ ලෙස අම්මාගේ හිත රිදවන්නට වුයේ ඒ හොඳ පුතාටය. දෛවය මෙහෙම කරන්නට කොල්ලාට බල කළා මිසක ඔහු කවදවත් එසේ කරන්නට සිතූ කෙනෙක් නොවේ.

'මල්ලි ළඟ..ට යන්න ඇති අ..ම්මේ...'

'ඇයි පො..ඩි පුතා මෙ..හෙම සැරින් සැරේ ප්‍රශ්න දන්නෙ... මං පූජාවක් කරනවා වගේ නේද මේ මඟුල කරන්නේ... කොච්චර පේ වෙලාද කරන්නේ...'

කොපමණ ජේවී කළත් මඟුල වන්නේ අපිරිසිදු ගෑණියෙක් සමඟ නම් ඒ පූජාව තේරුමක් නැත.

'අම්මා කලබල වෙලානේ...'

'කලබලා නොවී කොහොමද... මෙතන වෙන දේවල් ඔයා දන්නෑනේ ලොකු පුතා...'

අම්මා වඩාත් බියවී ඇත්තේ හවස වර්ෂා ආ නිසා විය යුතුය. ඇය දන් සැක කරනවා ඇත්තේ මල්ලී වර්ෂා ළඟට ගොස් ඇතැයි කියාය.

'ප..ර..වි..ටියෝ මේ ගෙදරට ගේනකොට මට ඕක හිතුනේ නෑ..නේ... ගෙදර කෑවා බැල්ලි... හෙණ ගහනවා බැල්ලිට...'

අම්මා හෙණ ඉල්ලුවේ වර්ෂාටය. සක්විති අමාරුවෙන් බිම බලාගත්තේය. කාමරයේ සිට මේධා මේවා අහගෙනය.

'අනේ වාහනේ අරන් ගිහින් බලන්න ලොකු පුතා... මට කොහෙන් හරි ඉක්මනට පොඩි පුතාව ගෙනත් දෙන්න...'

සුරම්‍යා කීවේ පපුවට ගසාගෙන මෙනි. මේ ප්‍රශ්නය අද රෑට කොහොම පත්තු වේවිදැයි දන්නේ නැත. විමුක්ති ගුවන් තොටුපළේ සිට යනවා යැයි කියූ විට මේ අම්මා කොල්ලාව නැවත ගෙන්නා නොගත්තොත් පුදුමය.

සක්විති කාමරයට ආවේ එළියට යන බව මේධාට කියන්නටය. මේධා බිම බලාගෙනම උන්නාය. සක්විති ඇගේ නිකටෙන් අල්ලා කෙල්ලගේ මුහුණ එසෙව්වේය.





මේධාගේ ඇස්වල කඳුළුය.

'ඇ..යි බබා...'

'අනේ මන්ද මහත්තයෝ... මගේ හිතටත් මහ මොකක්ද වගේ...'

'මං පොඩ්ඩක් එළියට ගිහිල්ලා එන්නම්... නැත්නම් අම්මා සැක හිතයි...'

'ම්...'

සක්විති මේධාගේ හිස අතගා කාමරයෙන් පිට වූවේය.

Hemantha007
For free distribution

# 09

අනුරාධපුරය බලා යන නගරාන්තර බස් රියේ උන් වර්ෂාගේ පපුව දිගින් දිගටම හිරි වැටෙන්නට විය. 'ඔයා රත්තරන් හෙට මංජුලාව බඳින්නේ නැත්නම් මොනාද කරන්නේ...' වර්ෂාට හිතෙයි. 'අනේ මන්ද... ඔයාට කරදරයක් වගේ හිතට දැනෙනවා...' වර්ෂාට ඒ හැඟීම එද්දී විමුක්ති සකුන්තත් සමඟ උන්නේ ඒ අසළම වාගේය.

කැළණි පාලම දෙපසම වාහන තදබදය. පිටකොටුව දෙසින් එන වාහනද දෙමටගොඩ දෙසින් එන වාහනද සියල්ලම සිර වී තිබුණි.

'ඔයා ලොකු කරදරේක කියලා මට හිතෙනවා... ඒත් මං කොහොමද ර..ත්තරන් දාන ගන්නේ... ඔයාව මට බලන්නවත් එන්න බැනේ...'

'සමහර විට හැමෝම එකතුවෙලා මංජුලාට ඔයාව බන්දලා දෙයි... ඔයාට අසරණකමට කර කියා ගන්න දෙයක් නැතිවෙයි. අනේ එහෙම වුණොත් මේ බඩේ දහලන එකාට මං මො..නා..ද ර..ත්..ත..රං එළියට ආපු දවසකට කියන්නේ... ඔයාව මට අයිති





නොවෙන එක දරාගන්න මට පුළුවන්... තව ආත්ම ගාණක් මත්තට තියෙන නිසා.. ඒත් ඔයාව වෙන කෙනෙකුට අයිති වෙන එක මං... කො..හො..ම ද..රා ගන්නද වස්තුවේ...' වර්ෂා මේවා හිතද්දී ඇගේ දෑසින් කඳුළු ගලා යන්නේ දෑස් කැපීගෙන මෙනි.

ඇය කඳුළින් පිරුණු ඇස් කැළණි පාළම අවට වූ වාහන තදබදය දෙසට යොමු කළේ ඔහු මේ අවට ඉන්නාක් වැනි යැයි හිතෙනා නිසාය. එහෙම රස්නයක් පපුවට දැනෙනා නිසාය.

ඇත්තටම වර්ෂා ගිය බස් රියට අනිත් පස තිබුනේ සකුන්තත් විමුක්තිත් ගිය වාහනයයි. එහෙත් කැළණි පාළම අවට ප්‍රදේශයට වැටෙමින් තිබූ හීන් පොදයත් ඝන අඳුරත් නිසා වාහනයක ඇතුළත ඉන්නා කෙනෙක් පෙනෙන්නේ නැත.

'ඔයාගේ ජීවිතේට මොනවද වෙන්නේ කියලවත් අදින් පස්සේ මං දන්නේ නෑ... ඔයා මට බදගෙන දුක් විඳින්න මේ බඩට පැටියෙක් දීලා... මං එයා වෙනුවෙන් දුක් විඳින්න ඕන... මහ පාරවල් වල ගුටි කකා නවතින්ද විඳ විඳ මට ආයෙත් එන්න බෑ... සමහර විට මං එහෙම ආවොත් එයාලා මාව මරන්නත් පුළුවන්... ඔයාව සදහටම පපුවේ තියාගෙන මට මරණය උනත් බාරගන්න පුළුවන්. ඒත් මේ අහිංසකයා... මගේ නහර වලින් ජීවිතේ උර උරා බොන මේකව උපදින්නත් කලින් මරන්න මං කාටවත් දෙන්නෑ වස්තුවේ... විඳින්න තියෙන දුක් අනන්තෙටම විඳලා හරි මං මගේ පැටියව බිහිකරනවා... කාට අයිති උනත් ඔයා දවසක මං ගාවට ඒවි... එදාට මං මේ හැම දුකකටම සෑහෙන්න ඔයා ළඟට වෙලා අඬන්නම්... එතකල් මං දෛවයේ තීරණයක දන්නෙම නැතුව යනවා...' වර්ෂා දෙඋරහිසින් කඳුළු පිසදමා ගනිමින් සිතුවාය.

කැළණි පාළම නිමාවෙන්නේ එක් තුන්මං හන්දියකිනි. එකක් කොළඹ දෙස සිට එන පාරය. මේ දක්වා වර්ෂාත් ප්‍රියංවදත් ආ බස් රිය ආවේ ඒ පාරේය. අනෙක එතනින් වමට ඇති කටුනායක මීගමු පාරත් දකුණට ඇති නුවර පාරත්ය.

කැළණි පාළම ළඟින් වූ තුන්මං හන්දියෙන බස් රිය නුවර පාරට දමද්දී වර්ෂාගේ බඩ පපුව දගෙන ගියාක් වැනි විය.

කෙල්ලගේ මුහුණේ ඇති වූ වෙනස ප්‍රියංවද දුටුවාය.

'ඇයි කෙල්ලේ...'

'පි..ච්..චිලා වගේ ගියා ප්‍රියා...'

පිච්චෙන්නේ නැත්තේ කාගෙද... ප්‍රියංවද වර්ෂාගේ අතක් අල්ලාගෙන පිරිමැද්දේ සොයුරියක් තම බාල සොයුරියව නලවන්නාක් බඳුවය.

'හැ..ම දෙයක්ම හොඳින් විසඳෙයි.. එහෙම හිතාගෙන හි..ත හදගෙන යන් කෙල්ලේ...'

'ම්...'

විමුක්ති ආ සකුන්තගේ වාහනය මීගමු පාරට දම්මේත් ඒත් සමඟම වාගේය. දෙවියන් දෙදෙනාම අද දෙතුන් වරක් එක ළඟට කර පසුව මාවත් දෙකකට රැගෙන ගියෝය.

එහෙම කළේ ඇයි...

විමුක්තිගේ ඇතුලාන්තයද දවාගෙන එන බවක් ඔහුට දැනුණි. හිස දෙපැත්තෙන් පුපුරාගෙන එන්නාක් මෙනි. ඔහු ඇඟිලි තුඩු වලින් නළළත මිරිකා ගත්තේය.

'විමුක්ති.. ඇයි මචං...'

'නෑ මචං... ඔළුව හිර කරනවා වගේ...'

'ඇත්ත කියපන් උඹ ලොකු ප්‍රශ්නෙකින් නේද ඉන්නේ...'

විමුක්ති කතා කළේ නැත. ඔහු අතකින් දැඩිව හිස අල්ලා ගත්තේය.

'ඒ මචං.. ඇයි.. මචං...'

'ම..ට පෙනඩෝල් දෙකක් අරන් දීපන් මචං...'

සකුන්ත වහා වාහනය පාර අයිනේ නතර කර කඩයකට දිව්වේය. විමුක්තිට මේ ආවේ මීට පෙර දෙතුන් වතාවක් ආ තද හිසේ කෙරපීමය.

සකුන්ත වතුර බෝතලයකුත් පෙනඩෝල් දෙකකුත් රැගෙන එද්දී විමුක්ති වාහනයේ ඉදිරිපස අසුනේ පහත් වී හිස බදගෙන





උන්නේය.

'වි..මු..ක්..ති...'

'ම..ට ඉ..ව..ස..න්..න බෑ.. මචං...'

'ම..චං ආ.. මේ..ක බී..ප..න් මං උඹේ ඔළුව මසාජ් කරන්නද...'

සකුන්ත වාහනයේ රියදුරු අසුනට ගොඩවී විමුක්තිගේ හිස ඇඟිලි තුඩු වලින් දැඩිව මසාජ් කළේය.

'ම..ට.. අ..මා..රු..යි ස..කු... ඔ..ළුව පැ..ලෙන්න ව..ගේ... කලන්..තේ වගේ...'

සකුන්තට කර කියා ගන්නට දෙයක් නැති විය. ඔහු අසරණව විමුක්තිගේ හිස තදින් පිරිමැද්දේය.

මේ තමාට වෙන්නට යන්නේ කුමක්ද කියා හිතන්නටත් විමුක්තිට හැකියාවක් වූයේ නැත. ඔහු උන්නේ සිහියත් අසිහියත් අතරය.

කැළණිය නගරය පසු කරමින් උන් වර්ෂාව දිගින් දිගටම දැවෙන්නට විය. 'ඔයාට මොකක් හරි ලොකු කරදරයක් කියලා හිතෙනවා රත්තරන්... අ..නේ ඇයි මට එහෙම හිතෙන්නේ...' වර්ෂා සිතින් අම්මාව සිහි කළාය. 'ඉන්න තැනකින් චූටි මහත්තයා ළඟට යන්න අම්මේ... එයාට කරදරයක්...' වර්ෂා සිතුවේ ගිනි මැලයක් ඇවිලුවාක් මෙන් දන්නට ගත් පපුව පිරිමදිමිනි.

'අ..නේ ඔයාව කාට හරි අයිති උනත් කමක් නෑ... ඔයාට විපතක් නම් වෙන්නෙපා... ඔයා මේ ලෝකෙ කොහේ හරි හොඳින් ජීවත් වෙනවා කියලා හිතෙනකොටත් මට ජීවත් වෙන්න පුළුවන්...' වර්ෂා වැලි ගෑ විලසින් කකියන දෙනෙත් ප්‍රියංවද දෙසට යොමු කළාය.

'ඇයි දන්නෑ ප්‍රියා එහෙම හිතෙන්නේ...'

'කො..හොමද කෙල්ලේ...'

'එයාට කරදරයක් කියලා...'

මේ ආදරය කොහොම ඉවසාගන්නද...

'අයියට කරදරයක් ආවා නම් කෙල්ලේ කොහොමටත්... ඒ..ත්

එයා ඒ කරදරේට මූණ දෙන්නම ඕ..න...'

'එයා ගොඩක් හිත හයිය කෙනෙක් නෙමේ... මං දන්නවා එයා ගැන...'

'දැ..න් අ..පි කියලා මො..නවා...'

'මං දන්නවා...'

'දරාගන්නම වෙනවා කෙල්ලේ...'

සැබෑය. දරාගත යුතුමය. යළිත් මහගෙදර පාමුලට යා නොහැක.

'මං ඔයා නිසා මේ දුක් ඉවසනවා රත්තරන්...'

වර්ෂා කීවේ පවා හිසට සුරත තබාය.

විමුක්ති උන්නේ තදින් දෑස් පියාගෙනය. සකුන්ත ඔහුව අසළ කඩයකින් තේ එකක් රැගෙන බොන්නට දුන්නේය. පසුව සිද්ධාලේප කුප්පියක් ගෙන නළලත පිරිමැද්දේය.

'උ..ඹ ටි..කක් ඔහොම ඇස් පියාගෙන ඉඳපන්... මං ළං වෙලා කතා කරන්නම්...'

කොහොමත් විමුක්ති උන්නේ දෑස් පියාගෙනමය. සකුන්ත මොහොතක් ඔහු දෙස බලා වාහනය ගුවන් තොටුපළ කරා ධාවනය කළේය. තවම උන්නේ පෑලියගොඩය. කටුනායකට තව දුරක් ඇත.

*  *  *  *  *  *  *  *  *  *

සුරම්‍යා සැටිය මත ඉඳගෙන ඇඬුවාය. ඇය උන්නේ දෑතින්ම මුහුණ වසාගෙනය. ගල් බෝර දම්මාක් මෙන් පපුව ඇවිලෙමින් ඇවිලෙමින් යයි. එය ඉවසාගන්නට බැරි රුදුරු වේදනාවකි.

'ඇ..යි ම..ට පො..ඩි පු..තා මෙ..හෙම ක..ර..න්..නේ... මං ලෙඩෙ..ක් කියලවත් හිතුවද... මං බඩේ බැඳගෙන හදපු ම..ගේ කො..ල්ලා...'

සුරම්‍යා ඇඬුවේ එසේ කියමිනි. මොරගොඩ මහතාත් මේධාත් ඇයව සනසන්නට උත්සාහ කළෝය. මේ මොහොතේ බොරුවක් කියන්නට බැරි තරමට මේධා පවා තැති ගෙන උන්නාය.





'කො..ල්ලෝ ඔහොම තමයි... තව ටිකක් රෑ වෙලා එයි... සමහර විට යාළුවෙක් එක්ක ඇති...'

'මේ වෙලාවේ මොනාද මහත්තයා.. මගේ පපුවේ තියෙන ගින්දර කාටවත් තේරෙන්නෑ... ඌ මගේ කොල්ලා... මටයි දුක ඌ ගැන කැක්කුම...'

සුරම්‍යා කීවේ තරහිනි. මේධා දිග සුසුමක් හෙළුවාය. අපි ඌට කොච්චර කැක්කුමෙන් ඉන්නවද කියලා අම්මා දන්නෑ... 'ඇය සිතුවේ තරහෙනි.

'මේ ගෙදරට හෙණ ගැහුවා... හෙණ... පට්ටන්දර කාලකණ්ණි ගෑණියෙක්ගේ වහන්තරාවක් මේ ගෙදරට ගෙනත් මේ ගෙදර අපිරිසිදු කළා... ම..ට තිබ්බේ ඕකිව යැව්වට පස්සේ මේ ගෙදර තොවිලයක් නටන්න... මහ ගෑණිගේ භූත ආත්මේ ඉඳන් මේ ගෙදරට විණ කරනවා ඇති.. ම..ගේ කො..ල්ලව රැවැට්ටුවා.. ඌ අසරණයි අහිංසකයි... පව්... උගේ ජීවිතේ කෑවා... කෑවා.. බැ..ල්ලී...'

මෙතෙක් දවසක් බොහෝ දෙනා ඉදිරිපිට සඟවාගත් වර්ෂා සම්බන්ධයෙන් සුරම්‍යාගේ හිතේ වූ බද්ධ වෛරය පිටවෙන්නේ දැන්ය.

නාලනී නැන්දටත් වර්ෂාටත් බණිද්දී තාත්තා අසරණව බිම බලාගත් අයුරු මේධා බලාගෙනය.

'ක..වලා පො..වලා උ..ගන්නලා රට රාජ්ජවල ඇරලා... මං මගේ කොල්ලව හැදුවේ මල් පැලයක් ව..ගේ.. මල් පැලයක් වගේ... ෂිහ්...'

'සුරම්‍යා...'

මොරගොඩ මහතා කතා කරන්නට ගත්තේ ඔහුට ඉවසන්නට බැරිම තැනය.

'ඇයි... නංගිටයි ඒකිගේ හිහන බැල්ලිටයි බණිනකොට ඔයාට දුකද... මං මැරුණත් ඔය එකෙක්ට සමාව දෙන්නෑ... ගහනවා

කෝවිල් ගිහින් පොල්...'

'තේරුමක් ඇතුව කතා කරන්න සුරම්‍යා... මැරිච්ච මිනිස්සුන්ට බැණලා පව් පුරව ගන්නෙපා... නාලිනී ඔයාට කරපු වරදක් නෑ...'

'ඔව්.. දැන් පට්ට බැල්ලියෝ ඔක්කොම හොඳයි... උන්ගේ වනවර දුවලත් හොඳයි... මායි මෙතන නරක ගෑණි... මං මේ.. ගෙ..දර ඉ..න්..නෑ මේ කසාදේ උ..නේ නැ..ත්..න..ම්...'

මේධා දිගටම බිම බලාගෙන උන්නාය. අම්මා මේ ආවේෂ වූවා නොවේ. ඇය හරියටම දුම්මල අතට ගෙන ආවේෂ වන්නේ විමුක්ති ගුවන් තොටුපළේ සිට කතා කළ පසුවය. තවම ඔහු යන්නට වෙලා ඇති.

'පු..තේ.. ලොකු පුතාට ආයෙත් කතා කරලා බලන්න මල්ලිව හම්බ උනාද කියලා...'

'හො..දයි තාත්තේ...'

'කා..ට..ව..ත් කැක්කුමක් නෑ...'

අම්මා ඒ ඇණුම් පදය එල්ල කළේ තමාටත් එක්ක බව මේධා දනී. කැක්කුම ඇත්තේ පපුවේය.

සක්විතිට කතා කර පලක් නැත. ඔහු ඔය කොහෙට හෝ වී ඉන්නවා විය යුතුය. එහෙත් මේ රහපෑම කරන්නම සිදුවී ඇත. මේධා දුරකථනය වෙත ගියේ පපුවෙන් ආ හුස්ම එකවර පිට නොකර ටික ටික පිට කරමිනි.

'මහත්තයෝ...'

ඇය කතා කළේ සෙමෙනි. සක්විති ඒ මොහොතේ ඉන්නේ නුගේගොඩ නගරයට ආසන්නව වාහනය නවතා ඔහේ කල්පනා කරමිනි. වෙන කරන්නට දෙයක් නැත. දැන් මෙහේ සොයන්නට මල්ලී කෙනෙක් නැත.

'බබා...'

'මල්ලී... හ..ම්..බ වු..ණා..ද...'

මේධා කතා කරන්නේ අම්මාත් තාත්තාත් ළඟ ඉඳිද්දී බව





සක්විති දැන උන්නාය.

'මං මේ හොයනවා කියන්න බබා... හොයලා වැඩක් නැනේ.. ඌ තව ටිකකින් කතා කරයි... තව ටිකක් මං බලන්නම්...'

'අම්මත් අඬනවා...'

'මං එන්නම්...'

මේධා දුරකථනය තබද්දීම සුරම්‍යා ඇය දෙස බැලුවාය. ඒ දෑස් වලට මුහුණ දෙන්නට පවා අසීරුය.

'ත..වම හොයනවලු අම්මේ... තැන තැන බලනවලු...'

මේධා කීවේ දෙනෙත් සඟවාගෙන මෙනි.

'අ..නේ දෙ..යියනේ.. මං කියලා කොහේ හොයන්..න..ද...'

මේධා බැලුවේ මොරගොඩ මහතා දෙසය. ඔහු උන්නේද කල්පනාබරවය. සමහර විට තව මොහොතකින් විමුක්ති කතා කළ පසුව ඔහුද විමුක්තිට බැණ වදින ඇත.

කොහොමත් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැත.

'ලොකු මහත්තයා... කර් එක සරසලා ඉවරයි අපි ය..න්..න..ද...'

හෙට මංජුලාටත් විමුක්තිටත් මධුසමය බලා යන්නට වාහනය සැරසූ මල් නිර්මාණ කරන අය පැමිණ කීවෝය.

'හොඳයි... හොටෙල් එකේ ඩෙකරේෂන් කරන කට්ටිය තාම ඉවර නැතුව ඇති නේද...'

'නෑ ලොකු මහත්තයා... පාන්දර තමයි අලුත් මල් එන්නේ...'

'දැන් ඒ මල් වලින් වැඩක් නෑ...' මේධා සිතින් සිතුවාය.

# 10

සිතූ තරම් වේගයකින් මීගමු පාරේ ගුවන් තොටුපළ වෙත වාහනයක් පදවාගෙන යාම පහසු නැත. රාත්‍රී දහය වනතුරු මීගමු පාරේ විශාල වාහන තදබදයක් ඇත. සකුන්ත වත්තල නගරය පසු කළේ දැන්ය.

ඔහු විමුක්තිගේ මුහුණ දෙස බැලුවේය. ඉදිහිට වාහනය තුළට එන කඩ සාප්පු එළියෙන් ඔහුගේ වෙහෙසකර මුහුණ දුක්බර ලෙස පෙනෙයි. ඔහු ඉන්නේ තරමක නින්දක යැයි සකුන්තට සිතුණි.

"තව ටිකක් ඔහොම හිටපුවාවේ ජා ඇල පැන්නම නැඟිට්ටනවා..."

සකුන්ත සිතුවේ එහෙමය.

එහෙත් ඒ මොහොත වන විටත් ඔහු දෛවයේ රුදුරු මොහොතක් පතිමින් සිටිනා බවක් සකුන්ත දැන උන්නේ නැත.

වර්ෂා උන්නේද දෑස් යංතමට සඟවාගෙනය. හිතට දැනෙන මහා කෙඩෙත්තු ගතිය කියාගන්නට බැරි තරම්ය. මෙහෙම යංතමට දෑස් පියවා ගත් විට මතක් නොවෙනා දෙයක් නැත.

සමහර විට මතක් කරන්නට පවා කෙල්ලට ලෝබය. "ඔයා නැතුව කොච්චර කල් ඉන්න වෙයිද... එතකල් මට මතක් කර කර

වත් ඉන්න තියෙන්නේ ඔයත් එක්ක ඒ ගත කරපු දවස් ටික විතරයි... මං ඒ මතකය හරි පරිස්සමින් පපුවේ තියන් ඉන්නේ...' වර්ෂා දෑස් පියාගෙනම සිතුවාය.

'ඕනවට වඩා හිතන්නත් එපා කෙල්ලේ...'

ප්‍රියංවද හිමිහිට කීවාය.

'එ..හෙම නෑ ප්‍රියා... ඒත් එයාට කරදරයක් කියලා හිතෙද්දී ඉවසන්න බෑ...'

'අයියා විතරක් නෙමේනේ කෙල්ලේ... උඹ උනත් ඉන්නේ කරදරේකනේ... අ..පි පැටියා එනකල් කොච්චර පරිස්සම් වෙන්න ඕනද... නැන්ද උඹට ගහද්දී මගේ පපුව පත්තු වුණා...'

'ම..ට ඒවා රි..දෙ..න්නෑ ප්‍රියා.. මේවා හිරිවැටිලා තියෙන්නේ...'

'පපුවත් ටික කාලෙකට හරි එහෙම හිරිවට්ට ගනිං කෙල්ලේ...'

වෙන කියන්නට දෙයක් නැත.

'ආයේ කොළඹ එන්නම හදන්නෙපා කෙල්ලේ... ආවයි කියලා මෙතන දෙයක් වෙනස් කරන්න බැරිනම් ඒ එන ගමන තේරුමක් නෑ...'

'ම්.. එ..යාව බලාගන්න එක විතරයි...'

'බලන්න ඕන වුණාම උඹ ළඟ තියෙන ෆොටෝ එක බලපං.. එච්චරයි...'

'ඔව්.. ඒක හිතට සැනසීමයි... හිමින් හිමින් මං හිත හදාගන්නවා..'

'ඒකනේ...'

'එහෙම හිත හදාගෙන ඉන්නනම් ප්‍රියා...'

එහෙම කියද්දී ප්‍රියංවදගේ පපුව අකිලීගෙන ගියේය. ඇය කෙල්ලගේ අත පිරිමැද්දේ දෑස්වල කඳුළු පිරෙද්දීය.

'පැ..ටි..යා වෙ..නු..වෙන් කෙල්ලේ...'

'මං දන්නවා ප්‍රියා... වෙලාවකට කියන දෙයක් මේ පපුව

අහන්නෑ...'

ඒක හැම කෙල්ලෙකුටම වෙයි. ආදරයේදී ගිනි ගන්නේ ගෑණු හදවත්ය.

'අපි ගියාම උඹටයි දරුවටයි අයියටයි තුන් දෙනාටම බෝධි පූජාවක් තියමු... එතකොට ඔය සාංකා ගතිය ඇරිලා යයි...'

'මා..ත් හිතුවා...'

'දෙයක් වෙනවනම් වෙනවමයි... ඒක නොවෙනවා නම් ශක්‍රයා ආවත් වෙන්නෑ...'

'ඔව්.. එයා අරකිව බඳින්නෑ...'

වර්ෂා කීවේ නුවර පාර දෙස බලාගෙනය. 'ඒත් මං හිතන්නේ ඔයා එහෙම නොකර මොනවද කරන්නේ කියලා...' වර්ෂා සිතුවාය. කොහොමටත් දැන් ඉතිරි වී ඇත්තේ මේ සියල්ල දෛවයට දී අර රජරට කලාපේ හැංගීගෙන ඉන්නටය. මිනිස්සුන්ට කළ නොහැකි දේවල් ඔවුන් පවරන්නේ දෙයියන්ටය. 'දේවතාවුන් වහන්සේලා කීයකට හරි පහන් පත්තු කරලා මං ඔයාව පතනවා... එච්චරයි රත්තරං මේ දුප්පත් අත් දෙකින් මට කරන්න පුළුවන්...'

සකුන්ත වාහනයේ වේගය එකවර වැඩි කළේය. ගුවන් තොටුපළට පැය තුනකට පෙරවත් විමුක්තිව ඇරලිය යුතුය. සකුන්ත වාහනයේ වේගය වැඩි කළේ එසේ සිතාගෙනය.

විමුක්ති උන් ඉරියව්වෙන්ම දෑස් පියාගෙන උන්නේය.

'ප්ලයිට් එකේදී උඹ හොඳට නිදගනිං... පාන්දරනේ සිංගප්පූ වලට ලෑන්ඩ් කරන්නේ...'

සකුන්ත කීවේය. විමුක්තිගෙන් ප්‍රතිචාරයක් නොවීය.

'නින්ද ගිහින්...'

ඔහු සිතුවේය. ඒත් සමඟම පාර හරහා බයිසිකල් කාරයෙක් දැම්මේය. සකුන්ත වේගයෙන් තිරිංග තද කළේය.

එකවරම විමුක්ති ඉඳගෙන උන් අසුන මතදීම කඩා වැටිණි. ඔහු කඩා වැටුනේ සකුන්ත දෙසටය.





'විමුක්ති...'

සකුන්ත කෑ ගැසුවේය. එහෙමම ඔහු පාරේ පැත්තකට කර වාහනය නතර කර තමා දෙසට කඩා වැටුණු විමුක්තිගේ වත දැකින්ම නැගිට්ටෙව්වේය. එහෙත් යළිත් ඔහු කඩා වැටුණි.

'අනේ දෙයියනේ... කොල්ලට සිහිය නැතිවෙලාවත්ද... විමුක්ති... විමුක්ති... නැගිටපං මචං... විමුක්ති...'

සකුන්ත අඬන්නට මෙන් කෑ ගැසුවේය. එහෙත් ඔහුගේ දෑස් ඇරුනේ නැත.

'විමුක්ති... විමුක්ති...'

සකුන්ත ඔහුගේ කම්මුල් වලට දෑත තබා ගැසුවේය. ඒවා සුදුමැලි වී ගොස් තිබුණි.

'දෙයියනේ කොල්ලට මොකද වුණේ...'

සකුන්ත වතුර බෝතලය ගෙන ඉන් වතුර සෑහෙන ප්‍රමාණයක් විමුක්තිගේ මුහුණට ඉස ඒ තෙත අතින්ම ඔහුගේ මුහුණ අතගෑවේය.

'විමුක්ති... විමුක්ති... නැ..ගි..ටපං මචං...'

නැත. විමුක්තිගේ එක ඇහිපිල්ලමක් වත් සැලුනේ නැත. සකුන්තට ඇඬෙන්නට මෙන් ආවේය.

'දෙ..යියනේ මං දැන් මොකද කරන්නේ... ප්ලයිට් එකට තව පැය තුනයි.. මෙ..හෙම කො..හොමද මේ කොල්ලව එයාපෝට් අරන් යන්නේ...'

සකුන්ත යළිත් වරක් විමුක්තිගේ මුහුණට වතුර ඉස ඔහුගේ මුළු වතම සෙලවුවේය. නැත. සිහිය නම් එන්නේ නැත.

සකුන්තගේ වතින් දහදිය වැගිරෙන්නට විය. හදිස්සියේ විමුක්තිට මේ වූයේ කුමක්ද... මොහොතකට කලින් ඔහු හිස අල්ලාගෙන කෑගැසුවේය. පසුව ඔහු නිදාගත්තේය.

'සිහිය නැතිවෙලා ගොඩක් වෙලා... ම..ම හිතන් උන්නේ නිදි කියලා...'

සකුන්ත එහෙමම ඔහුගේ අත වමතින් අල්ලාගෙන වාහනය

ටික දුරක් ධාවනය කළේය. කඳනට ආසන්නව තිබූ වෛද්‍ය මධ්‍යස්ථානයක් දක සකුන්ත විමුක්තිව දැතින්ම ගෙන එයට දිව්වේය.

'අ..නේ මො..නවා හරි කරන්න.. සිහිය එන්නෑ...'

සකුන්ත අවසරයක් නොගෙනම වෛද්‍යවරයාගේ කාමරයට ඔහුව රැගෙන ගියේය.

'මේ කවුද...'

'ම..ගේ යාළුවා ඩොක්ටර්.. එයාර් පෝට් බස්සන්න ගිය ගමන්... එකපාරට ඔළුව අල්ලගෙන කෑ ගැහුවා ඔළුව රිදෙනව කියලා පස්සෙ පෙනඩෝල් බීලා නිදගත්තා... මහදි බලද්දී...'

සකුන්ත ගොත ගසමින් කියන්නට විය.

'එළියෙන් ඉන්න... මං බලන්නම්...'

වෛද්‍යවරයා සීරුවෙන් විමුක්තිව පරීක්‍ෂා කළේය. ඔහුගේ රුධිර පීඩනය බැලුවේය. ඒ මොහොතේ සකුන්ත උන්නේ වෛද්‍ය මධ්‍යස්ථානයේ එහෙට මෙහෙට දුවමිනි.

'මේ තත්වයෙන් කොහොමද විමුක්තිව එයාර් පෝට් එකට දන්නේ...'

සකුන්ත සිතුවේ දහ අතේ කල්පනා කරමිනි. විමුක්තිට වූ දේ හිතා ගන්නට වත් අමාරුය. ඔහුට මෙසේ වෙන ලෙඩක් වත් තිබුණාද...

'ඩොක්ටර් කතා කරනවා...'

සකුන්ත වහා වෛද්‍යවරයාගේ කාමරයට දුව ගියේය.

'ඩොක්ටර්...'

'එයාර් පෝට් නේද යනවා කිව්වේ...'

'ඔ..ව් ඩොක්ටර්...'

සකුන්ත කීවේ විමුක්ති දෙස බලාය. ඔහු තිබූ ලෙසම දෑස් පියාගෙන ඉඳියි.

'කොහෙටද යන්න ගියේ...'





'සිංගප්පූරුවට...'

'තනියම...'

'ඔ..ව් ඩොක්ටර්.. එයාට මොකද...'

'මේ තත්වය යටතේ එයාව කොහෙත්ම ප්ලයිට් එකක යවන්න හොඳ නෑ... මටත් ට්‍රීට් කරන්න අමාරුයි... ඉක්මනට ජාතික රෝහලට හරි නවලෝකෙට හරි ගෙනියන්න... පුළුවන් තරම් ඉක්මනට...'

ඔහුටත් වටින්නේ ජීවිතයයි.

'හො.. හො..දයි ඩොක්ටර්...'

'ඔයා අතරමඟදී මොනවත් කරන්නෙපා... කෙළින්ම හොස්පිට්ල් යන්න... සිහිය ආවත් එයාර් පෝට් ගෙනියන්නෙපා...'

'හා.. ඩොක්ටර්...'

සකුන්ත එහෙමම විමුක්තිව ගත්තේය. ඔහුගේ දෑසින් කඳුළු වැටෙන තරම්ය. සකුන්ත බයටම විමුක්තිව ඉන්දවූයේ ඉදිරිපස අසුනේය. 'පව්.. අද රෑ සිංගප්පූ යන්න ගිය එකා...' සකුන්ත විමුක්තිගේ මුහුණ අතගා සිතුවේය.

කුමක් කරන්නදයි එකවර සකුන්තට සිතා ගත නොහැකිය. වඩාත් වටින්නේ දෙස්තර මහත්තයා කී කතාවය. සකුන්ත මීගමු පාරේදී එහෙමම වාහනය හරවා ගත්තේය. ඔහු වේගයෙන් වාහනය ධාවනය කළේ කොළඹ දෙසටය.

*  *  *  *  *  *  *  *  *

කඩවත පසු කරමින් උන් වර්ෂාව වෙව්ලන්නට මෙන් විය. ප්‍රියංවදගේ උරතලයට බරවී උන් ඇය නැගිට්ටේ එකවරම ගැස්සී මෙනි. හිතට දනෙනා අමිහිරි බිය කුමක්ද... ඇයටම තේරෙන්නේ නැත.

ප්‍රියංවද කෙල්ලගේ මුහුණ දෙස බැලුවාය. ඒ දෑස් ඇරී ඇත.

'කෙල්ලේ...'

"ම්..."

"උ..ඹ..ව වෙ..විලනවා ව..ගේනේ..."

"ම..ට මො..ක..ක්..ද වු..ණා වගේ ප්‍රියා..."

ප්‍රියංවදට සියල්ලටම වඩා බිය කෙල්ල ඉන්නා තත්වය නිසාය. ඇය වර්ෂාගේ නළලතටත් ගෙළටත් පිටි අත්ල තැබුවාය.

"අ..නේ දෙයියනේ ගිනි රස්නෙට උණ..."

ඇගේ වත ගිනි කබලක් මෙනි.

"එ..යාට මොකක් හරි කර..දරයක් ප්‍රියා..."

කෙල්ල කියවන්නේ උණ විකාරයෙන් මෙනි. ප්‍රියංවදගේ බිය වැඩි විය. මේ තත්වයේ සිටියදී මෙහෙම වෙන්නට හොඳ නැත.

"අ..නේ දෙයියනේ හැන්ඩ් බෑග් එකේ පැනඩෝල් දෙකක් වත් නෑ... කෙල්ලේ..."

ප්‍රියංවද නැවත කතා කළාය.

"එ..යාව දෙයියෝ බලාගන්න ඕන..."

ප්‍රියංවදගේ දෑස් තෙත් විය. ඇය කෙල්ලව උකුලේ නිදි කරවාගෙන හිස අතගෑවාය. වත ගිනි මැලය මෙනි. බලා ඉන්නේ කොහොමද...

"අ..නේ මේ.. අ..යියේ..."

ප්‍රියංවද කතා කළේ නගරාන්තර බස් රියේ කොන්දොස්තරටය. ඔහු පමණක් නොව අනෙක් මගීන්ද ප්‍රියංවදත් වර්ෂාත් දෙස බැලුවෝය.

"අ..සනීප වෙලා..."

ප්‍රියංවද අනිත් මගීන් දෙස බලා අසරණව කීවාය.

"ඇ..යි මි..ස්.."

"අ..නේ අයියේ පොඩි උදව්වක් කරන්න..."

"ඇයි... මේ මිස්ට මොකද..."

"හොඳටම උණ... එයාට ටිකක් අමාරුයි... මට ක්‍රීම් සෝඩා එකකුයි පැනඩෝල් කාඩ් එකකුයි බස් එක නවත්තලා අරන් දෙන්න... පින් සිද්ධ වෙයි..."

ප්‍රියංවද හැන්ඩ් බෑගය ගෙන ඔහුට මුදල් දුන්නාය. බස් රිය ටික දුරක් ගොස් කඩයක් අසළ නැවතිනි. ප්‍රියංවද ඇගේ උකුලට බරව උන් කෙල්ලගේ පිට අතගෑවේ කඳුළු පුරවාගෙනය.

අද දවසටම ඇගේ බඩට කිසිවක් වැටී නැත. ප්‍රියංවද එය පවා සිහිකළේ දුකෙනි. මහපාරවල් වල ගුටි කකා රස්තියාදු වෙවී බැණුම් අහ අහා කොච්චර දුකක්ද... "අනේ නාලිනී නැන්දේ මේ කෙල්ල දිහා බලන්න..." ප්‍රියංවද සිතින් කීවාය.

"ආ... ඉක්මනට දෙන්න..."

"මං දෙන්නම්... අපි යන්..."

බස් රිය යළි ඉදිරියට ගියේය.

"කෙල්ලේ..."

"ම්..."

"චුට්ටක් නැඟිටපං ර..ත්..ත..රං..."

වර්ෂා නැඟිට්ටේ අමාරුවෙනි. ඇය උන්නේ පුදුමාකාර ලෙස තෙහෙට්ටු වීය.

"මේ පැනඩෝල් දෙක බීලා මේ ක්‍රීම් සෝඩා එක බීපන්... අපි රෑට කන්න නැවැත්තුවාම ආප්පයක්වත් කමු..."

"ම..ට බයයි ප්‍රියා..."

"ද..රුවා ගැන හිතපන් රත්තරන්..."

දවසටම මොනවා වත් කෑවේ නැත. බඩේ දරුවෙක් සිටිද්දී එහෙම කරන්නට හොඳම නැත. වර්ෂා පැනඩෝල් දෙක බී ක්‍රීම් සෝඩා බෝතලයෙන් බාගයක්ම බීගෙන බීගෙන ගියාය.

"උ..ඹ මේ චුට්ට බී..පන්..."

"ම්.. නිදගනිං... ඇහැට ටිකක් පියවෙන්න දීපන් කෙල්ලේ... උඹට විතරක් නෙමේනේ විවේකයක් ඕන..."

වර්ෂා එහෙමම ප්‍රියංවදගේ උකුලට බර වූවාය. ප්‍රියංවද ආසනයේ මදක් ඇය පැත්තට හැරී කෙල්ලව වඩාත් සුව පහසු ලෙස උකුලට ගත්තාය.

රිය රෑ කෑමට නැවැත්වූ විට කෙල්ලට කන්නට මොනවා හෝ අරන් දිය යුතුය. ප්‍රියංවද ඇගේ අත් බෑගය ඇර එහි තිබූ ඇගේ බිලවුසයක් ගෙන කෙල්ලගේ අත් වැහෙන්නට දම්මාය. නගරාන්තර බස් රියක් නිසා ඇතුලේ සීතල වැඩිය.

ඇය වර්ෂාගේ හිස සෙමෙන් සෙමෙන් පිරිමදිමින් දහසක් දේ සිතුවාය. කෙල්ල මේ අවුරුදු විසිතුනට විසි හතරට වින්ද සැපක් නැත. ඇය වින්ද තරමක් වින්දේ දුක්ය. තම අම්මාගේ මිනිය අවුරුදු විසි එකේදී විසි දෙකේදී ඇස් දෙකින් දකින්නට වීමම කොතරම් දුකක්ද... ඇය ඒ දුකද වින්දය. දැන් තවත් දුක්ය. තව කල්ප කාලයකට මේ දුක් පියවෙන පාටක් නැත.

කෙල්ලගේ හිසකේ අතර අතැඟිලි යවමින් ප්‍රියංවද ඇයව තව තවත් තම වතට තද කරගත්තාය. මොන හේතුවක් නිසාවත් ආයේ කොළඹට කෙල්ලව එක්කාගෙන එන්නේ නැතැයි ඇය සිතාගත්තාය.

* * * * * * * *

කඳනේ සිට කොළඹට එන තුරු සකුන්ත සිය පාරකට වඩා විමුක්තිගේ නම කෑ ගසා කීවේය. ඔහුගේ අතපය මුහුණ සෙලවූවේය. නැත. ඔහු නැඟිටින්නේම නැත. කැළණි පාලම අසළින් වාහනය කොළඹට දමද්දී සකුන්තගේ ගත පුරා දහදිය වැගිරී තිබුණි.

විමුක්ති වැනි තරුණ කොල්ලෙකුට මෙහෙම වූවා කියා සිතාගන්නටත් නොහැක. දැන් කොල්ලාව කොහේ ගෙන යන්නටද කියා සිතා ගන්නටත් නොහැක.

'මං ගාව විමුක්තිගේ ගෙදර නම්බර් එක වත් නෑ...'

සකුන්ත වාහනය දෙමටගොඩ පාරට දම්මේ එහෙම සිතාගෙනය. ඔහු පුදුමාකාර ලෙස අසරණව උන්නේය. විමුක්ති ඉදිරිපස අසුනේ පැත්තකට වැටී උන්නේ මැරුණාක් මෙනි.

'අ..නේ නැඟිටපං මචං... උඹ ඔහොම ඉඳිද්දී බලන් ඉන්න බෑ...'

වාහනය සංඥා එළි අසළ නතර වෙද්දී සකුන්ත කීවේය. නැත.





ඔහු සදාකාලික නින්දකට වැටුණාක් මෙනි. සකුන්ත විමුක්තිගේ පපුවට අත තබා බැලුවේය.

හුස්ම වැටෙන්නේ පවා හෙමින් හෙමිනි. සකුන්තව වෙව්ලන්නට විය. එකවරම ඔහු විමුක්තිගේ ජංගම දුරකතනය ඔහුගේ පය පාමුළ වැටී තිබෙනවා දක්කේය.

'සක්විති අයියගේ නම්බර් එක හරි ගෙදර නම්බර් එක හරි ඒකේ ඇති...'

විමුක්තිගේ ජංගම දුරකතනය තිබුනේ ක්‍රියා විරහිතවය. සකුන්ත වහා එය ක්‍රියාත්මක කළේය. ඒ ටික පවා ඔහුට කරගන්නට බැරි තරම්ය.

සකුන්ත දුරකථනය ක්‍රියාත්මක වූ සැටියේ බැලුවේ එහි මතකයයි. එහි මුල්ම හරියේ Aiya කියා සක්විතිගේ අංකය තිබුණි.

'දෙයියන්ගේ පිහිටයි... මට තනියෙන් තීරණයක් ගන්න බෑ...'

සකුන්ත එහෙමම ඒ අංකය එබුවේය. තත්පර කිහිපයක් තුළ සක්විතිගේ ජංගම දුරකථනයේ ඒ ඇමතුම සම්බන්ධ විය. ඒ මොහොතේ ඔහු උන්නේ මිදුලේය. ඇතුලේ ඉන්නට බැරි අම්මාගේ ළතෝනිය නිසාය.

'දෙයියනේ මල්ලී...'

විමුක්තිගේ නම Malli ලෙස සක්විතිගේ ජංගම දුරකථනයේ සටහන් වී තිබුණි. ඇමතුම එද්දී ඒ නම සක්විතිගේ දුරකථනයේ සටහන් වෙයි.

'ඇ..යි ම..ල්ලී ම..ට කතා කරන්නේ...'

සක්විති ටික දුරක් ඉදිරියට ගියේය.

'මල්ලී...'

සකුන්ත හති ලෑවේය.

'ස..ක්..වි..ති අයියා නේද... ආ...'

සකුන්ත කතා කළේ අමාරුවෙන් මෙනි.

'ඔව්.. කෝ.. ම..ල්ලී...'

"අ..යියේ මං සකුන්ත කතා කරන්නේ..."

විමුක්තිගේ හැම මිතුරෙක්ම සක්විතිද දන උන්නේය.

"සකු... ඇයි මල්ලී කලබලෙන් වගේ.. කෝ මල්ලී..."

සකුන්ත එකවර කතා කළේ නැත.

"සකු.. ඇයි මල්ලී..."

"අ..යියේ පො..ඩි කරදරයක් අයියේ..."

"ඇයි මල්ලී... මල්ලි කෝ..."

"විමුක්ති මං ගාව ඉන්නවා.. ඒ..ත්..."

සකුන්ත ගොත ගසමින් සියල්ල කීවේය. සක්විතිව වෙව්ලන්නට විය. මේධා මිදුලට ආවේ සක්විතිට ආ ඇමතුම විශේෂ එකක් බව දනගෙනය.

"මං.. මො..කක්ද අයියේ කරන්නේ... කියපං මං ඉක්මනට..."

"උඹ කෙලින්ම නවලෝකෙට මල්ලිව ඇඩ්මිට් කරපං... අම්මලා එක්ක එන්නේ... එයාපෝට් ගිය කතාවක් කියන්නෙපා..."

"හරි බං හරි... ඉක්මනට වරෙන්..."

මේධා සක්විතිගේ වතට සුරත තැබුවේ බියෙනි. දවල් සිට කුමක්දෝ බියක් හදවතට දනෙමින් තිබුණි.

"ඇ.. ඇ..යි ම..හ..ත්..ත..යෝ..."

"ම..ල්..ලි..ට මො..ක..ක්ද අසනීපයක් හැ..දිලා... දන්... කතා කර කර ඉන්න වෙලාවක් නෑ බබා... අපි යන්..."

"අනේ මල්ලිට..."

මේධාට කෑ ගසා ඇඬුණි. දහවල් සිට පපුවට දනෙමින් තිබුනේ මේ බිය නොවේද...

"අ..නේ ම..ල්ලි..යේ..."

මේධා කෑ ගසා ඇඬුවාය. සක්විති ගෙට ගියේ ඇයව වත්තන් කරගෙනය.

"ඇයි ලො..කු පුතා ඇයි..."

මොරගොඩ මහතා පමණක් නොව සුරම්‍යාද දුව ආවාය.

"තා..ත්..තේ ම..ල්ලිව නවලෝකෙට ඇ..ඩ්මි..ට් කරලා.. කො..ල්ලට මො..කක්ද වෙලා..."

"පො..පො..ඩි පුතාට..."

"ඔව් අම්මේ..."

"අ..නේ දෙයියනේ..."

මොරගොඩ මහතා පුදුමයෙන් මෙන් සක්විති දෙස බලා උන්නේය. ඔහු උන්නේ කතා කර ගන්නට පවා නොහැකිවය.

"ම..ල්..ලි..ට මො..ක..ක් හරි..."

"බයවෙන්නෙපා තාත්තේ... අපි යන්..."

සියල්ලන්ම වාහනයට ගොඩ විය. මේධාගේ ඇස්වලින් කඳුළු ගලා යන්නට විය.

"පො..ඩි පුතාට මොනවත් වෙන්නෑ දුවේ..."

සුරම්‍යා කීවාය.

"මේ.. ම..හල.. කො..ල්..ල..ගේ ජීවිතේ වි..නාශ කළා අ..ම්මේ විනාශ කළා... පව් අහිංසකයා... ඌ.. පව්..."

මේධා කෑ ගසා අඬමින් කීවාය. මේ ඇගේ අදහස මේ පවුල ඉදිරියේ කියූ ප්‍රථම අවස්ථාවය. සුරම්‍යා තම ලොකු ලේලිය දෙස බලා උන්නේ පුදුමයෙනි.

# 11

**සකුන්ත** නවලෝක රෝහලේ දැඩි සත්කාර ඒකකයට විමුක්තිව ඇතුල් කළේය. ට්‍රොලියේ තබාගෙන ඔහුව හදිසි ප්‍රතිකාර ඒකකයට ගෙන යද්දී සකුන්තගේ පපුවම ගින්දරින් ඇවිලිණි.

විමුක්තිගේ ගුවන් බලපත්‍රයත් ගුවන් ටිකට් පතත් සකුන්ත අතය. විමුක්ති ගුවන් තොටුපළට යමින් උන් බවක් කියන්නට එපා යැයි සක්විති කීවේ ඇයි දැයි සකුන්ත සිතුවේය. කොහොමත් විමුක්ති උන්නේද විදේශ ගමනකට යන කෙනෙකු ඉන්නා සතුටින් නම් නොවේ.

රෝහලට මුලින්ම දුවගෙන ආවේ සක්විතිය. ඔහු සකුන්තව දුටු හැටියේ ඔහු ළඟටම දුව ආවේය.

'මල්ලී...'

'අයි සී යූ එකට ගත්ත අයියේ...'

'මොකද මල්ලිට උනේ සකු...'

'මා..ත් එක්ක එයාපෝට් ගියේ... මහදි එකපාරටම...'

සකුන්තට සියල්ල විස්තර කරන්නට නොලැබිණි. මොරගොඩ මහතාත් සුරම්‍යාත් මේධාත් එතනට එමින් උන්නෝය.





'මල්ලී එයා පෝට් ගිය බවක් උඹ කියන්නෙපා...'

'නෑ අයියේ නෑ...'

සුරම්‍යාත් මේධාත් දෙදෙනාම උන්නේ ඇඬුම් බරවය.

'මො..ක..ක්ද පුතේ පොඩි පුතාට වුණේ...'

'බයවෙන්නෙපා අම්මේ... මල්ලිව අයි සී යූ එකට අරන් තියෙන්නේ ඩොක්ටර්ස්ලා බලනවනේ...'

'අ..නේ මගේ දරුවා... මොකක්ද පුතා මගේ කො..ල්ලට වු..ණේ...'

'අ..ම්මේ විමුක්තියි මායි වාහනේ ගියේ...'

'කො..හෙද ගියේ...'

'මේ.. නිකං මාව හම්බ වෙන්න ආවේ මා..ව බස්සන්න ආවේ...'

'එතකොට...'

'එතකොට තමා ඔළුව හිර කරනවා කියලා කි..ව්වේ..'

මොරගොඩ මහතා දැඩි දුකකින් නවලෝක රෝහලේ කෙළවරකට වී උන්නේය.

'ම..ගේ ද..රු..ව..ව බේරගන්න ඕ..න.. අ..නේ.. හෙට කසාද බඳින්න හිටපු කොල්ලා... මො..න හෙණයක් වැදුනද...'

මේධා බිම බලාගෙන ඇඬුවාය. විමුක්තිට හදිස්සියේ වූයේ මොනවාදැයි එකවර ඇයටද සිතාගන්නට බැරි විය.

'ම..හත්තයෝ...'

'ම්...'

'ම..ල්ලිට එ..ක පාරක් බුක් ෂොප් එ..කෙත්...'

'ඕ..ව්.. මොකක් හරි තිබ්බාද...'

'ඩොක්ටර්ට ඒක කියන්න මහත්තයෝ...'

'බබා ඔහොම වාඩිවෙලා ඉන්න... කලබල වෙන්නෙපා...'

කිසිවෙකුට විමුක්තිව බලන්නට ලැබුනේ නැත. සකුන්ත සක්විතිව මඳක් එහාට එක්කාගෙන ගියේය.

"අයියේ..."

"සකු..."

"මො..ක..ක්ද මේ විමුක්තිගේ වෙඩින් එකේ කතාව..."

"ඒක දිග කතාවක් මල්ලී... දන් වැඩක් නෑ..."

"විමුක්ති එයාපෝට් යද්දී හිටියේ ෂොක් වෙලා වගේ..."

"ඔව්.. මේක උංට මහ නරක කාලයක් මල්ලී..."

"අ..යියේ... විමුක්තිගේ පාස්පෝට් එකයි සිංගප්පූ එයා ටිකට් එකයි මං ගාව..."

"තියාගෙන පස්සේ දීපන් මල්ලී..."

"මොනා වුණාද කියලා හිතාගන්න බෑ අයියේ..."

"එයාපෝට් යන්න කලින් වෙච්ච එක එක අතකට හොඳයි... උඹවත් හිටියා... බෝඩිං උනාට පස්සේ වුණානං..."

සුරම්‍යා උන්නේ ඇවිලෙමිනි. මේ ඇති වූ දේ සාමාන්‍ය දෙයක් වේවායැයි ඇය දස අතේ පැතුවාය. කෙසේ හෝ හෙට එළිවෙන්නට පෙර විමුක්ති යථා තත්වයට පත් වේවායැයි ඇය පැතුවාය. කවුරු කොහොම කිව්වද මේ කසාඳය කරනවා යැයි සුරම්‍යා සිතාගෙන උන්නාය.

"පොඩි පුතා ඔය ළමයා එක්ක ඩ්‍රින්ක් ගත්තද..."

සුරම්‍යා සකුන්තගෙන් ඇසුවේ සැකයෙනි.

"අ..නේ නෑ ඇන්ටි... එහෙම දෙයක් වුණේ නෑ..."

"පොඩි පුතා ඔය ළමයා එක්ක ගිහින් කාවද හම්බවුණේ..."

සුරම්‍යා මෙසේ ප්‍රශ්න කරද්දී සකුන්ත පුදුම විය.

"නෑ.. ඇ..න්..ටි කවුරුවත් හම්බ උන් නෑ..."

"මල්ලිට මොකක් හරි අමාරුවක් තිබ්බා අම්මේ... වතාවක් බුක් ෂොප් එකේදිත් ෆේන්ට් වෙලා තිබ්බා..."

සුරම්‍යාට ඒත් සැකය. අරහේ මංගල්ලයට සියල්ල සූදානම්ව

ඇත. එහෙම තියෙද්දී මේ වූ විපත කුමක්ද... සුරම්‍යා සිතෙන් බාරයක් වූවාය..

"මොකක්ද ලොකු පුතා මේ මල්ලිට වුණේ..."

මොරගොඩ මහතා සක්විතිගෙන් ඇසුවේ සුරම්‍යාට නොඇසෙන්නටය.

"ම..ට..ත් හිතා ගන්න බෑ තාත්තේ... මල්ලි කොහොමත් උන්නේ ලොකු දුකකින්..."

"පොඩි එකා මොනා හරි බී..ව්ව..ද.. ජී..වි..තේට මො..කක් හරි කරගන්න..."

තාත්තා එහෙම දෙයක් සිතුවේ කෙසේද... සක්විතිගේ පවා ළය සෙලවී ගියේය.

"එ..හෙ..ම ක..ර..න එකක් නෑ තාත්තේ... මල්ලි අපට එහෙම දුකක් දෙන්නෑ..."

"එයා ප්‍රශ්නෙකින් හිටි බව මාත් දන්නවා..."

"හිතාගන්න බෑ තාත්තේ..."

ටික වෙලාවකින් හෙදියක් හදිසි සත්කාර ඒකකයේ සිට ආවාය.

"නර්ස් දන් අයි සී යූ එකට ගෙනාපු ලෙඩාට..."

"ඩොක්ටර් දන් එනවා..."

සියල්ලන්ගේම ඇස්වල කඳුළුය. වෛද්‍යවරයා හදිසි ප්‍රතිකාර ඒකකයේ සිට ආවේ බිම බලාගෙනය.

"ඩොක්ටර් ම..ගේ පුතාට..."

මොරගොඩ මහතා ඔහු වෙතට දුව ගියේ අසරණ ලෙසිනි.

"මේ ලෙඩාගේ තාත්තද..."

"ඔව්..."

ඔහු මොහොතක් කල්පනා කරමින් උන්නේය.

"කියන්න ඩොක්ටර්... පුතාගේ තත්වේ භයානක නෑ නේද... අපට එයාව ගෙදර එක්කං යන්න පුළුවන් නේද..."

සුරම්‍යා ඇසුවාය.

'අමාරුයි... එයාට තවමත් සිහිය නෑ... අපිට හදිස්සියේ සිහිය ගන්නත් බෑ...'

'දෙ..යි..ය..නේ.. ඒ.. ඇයි...'

'එයාට හදිසි තත්වයක් ඇතිවෙලා තියෙනවා... හිසේ නහරවල තෙරපීමක්... දවස් දෙක තුනක ටෙස්ට් වගයක් කරන්න ඕන... ඊට පස්සේ තමා කියන දෙයක් කියන්න පුළුවන්...'

'අ..නේ දෙයියනේ...'

සුරම්‍යා බිත්තියකට හිස ගසාගෙන ඇඬුවාය. ඒත් සමගම වාගේ මේධා සක්විතිගේ වත බදාගෙන වැටෙන්නට ගියාය. සක්විති සිහිසුන් වූ මේධාව දෑතින්ම අල්ලා ගත්තාය.

'ඇ..යි මේ ප්‍රෙග්නන්ට් ළමයව මෙහේ ගෙනාවේ.. කෝ බලන්න...'

වෛද්‍යවරයා මේධාව පරීක්ෂා කර බලා වතුර බිඳක් ඉස ඇගේ සිහිය ගත්තේය.

'මේ කවුද...'

'මගේ නෝනා ඩොක්ටර්...'

'මේ ළමයට රෙස්ට් කරන්න දෙන්න... මෙහෙම ටෙන්ෂන් වෙන එක හොඳ නෑ...'

මේධා පුටුවකට බරවී ඇඬුවාය. මොරගොඩ මහතා ඇගේ හිස අතගෑවේ පුදුමාකාර දුකකිනි.

'තා..ත්..තේ... ම..ල්ලී...'

'අපි එයාව සනීප කරගමු පුතේ...'

සුරම්‍යා උන්නේ ඉහිලුම් නොමැතිවය.

'ම..ගේ ද..රුවට හූනියම් කරලා... නැත්නම් ගහක් ගලක් වගේ හිටිය කොල්ලා... අනේ දෙයියනේ හෙට මොකද වෙන්නේ.. දරුවව මෙහේ සනීප කරගන්න බැරි නම් අපි වෙන තැනකට හරි ගෙනියමු මහත්තයා...'





වෛද්‍යවරයා බැලුවේ මොරගොඩ මහතාගේ මුහුණය.

'ඇයි ඔයාලට ඉවසන්න බැරි... අතක පයක තුවාලයක් නෙමේනේ..'

'හෙට පුතාගේ වෙඩින් එක ඩොක්ටර්.. ඒකයි...'

'ඕ මයි ගෝඩ්...'

වෛද්‍යවරයා නළලත රැළි කර ගත්තේය.

'ඔයාලා කැමති නම් වෙන හොස්පිට්ල් එකකට අරන් යන්න... ඒත් වැඩක් නෑ...'

'අ..නේ එ..හෙම දෙයක් නෑ ඩොක්ටර්...'

'එයාගේ මොලේ ස්නායු වලට ගොඩක් හානි වෙලා තියෙනවා... හොඳම දේ වෙඩින් එක කල් දාන එක... සනීප වෙන්න ටිකක් කල් යනවා... මේ වගේ ලෙඩේකට ඉක්මනින් ප්‍රතිකාර කරන්න බෑ... අපි හෙට පාන්දරම එයාව ටෙස්ට් වලට ගන්නවා... දනට ට්‍රීට්මන්ට් දීලා සේලයින් දීලා තියෙන්නේ... අවශ්‍ය නම් ලෙඩාව බලන්න පුළුවන්... සිහිය ගන්න උත්සාහ කරන්නෙපා... ඒක හානි කරයි... මට ලෙඩාගේ විස්තර හෙට උදේට ඕන... මට ගෙදර අය එක්ක කතා කරන්නත් ඕන... මං දන්නෑ මෙහෙම කියන එක හරිද කියලා... ඒත් මෙහෙම තත්වයක් වෙන්නේ තද මානසික පීඩනයක් තිබ්බාම...'

වෛද්‍යවරයා කීවේ එපමණකි. සියල්ලන්ම විමුක්තිව තබා තිබූ විශේෂ කාමරයකට ගියේ කඳුළු පිරි දෙනෙතිනි. ඔහුට හුස්ම ගැනීම පහසු කරන උපකරණ පළඳ තිබුණි. අතකට සේලයින් දී තිබුණි. විමුක්තිව දකිද්දී මේධාට යළිත් ඇඬුණි. සක්විති ඇයව තුරුල් කර ගත්තේය.

'ප..වි.. අ..හිං..ස..කයා... කසාදෙකට ජීවිතෙන් ව..න්දි ගෙ..ව්වා...'

මේධා කීවේ රහසින් මෙන් සක්විතිගේ උරතලයට බරවීය. මොරගොඩ මහතා කොල්ලා දෙස බලා දෑස් පිසද ගත්තේය. 'මල්

පැල වගේ දරුවෝ හදලා උන්ගේ ජීවිත විනාශ කරන තීරණ ගන්නෙපා මහත්තයෝ...' ගල්හේන මීට මාසයකට පමණ පෙරදී කියූ කතාව මොරගොඩ මහතාට සිහිවිය. මේ සිදුවූයේ එය නොවේද...

'ලොකු පුතා...'

'තා..ත්..තේ...'

'ම..ල්ලිව බේරගන්න ඕන...'

'ම..ගේ ප..ණ දීලා හරි කොල්ලව බේ..රගන්නව තා..ත්තේ...'

සක්විති කීවේ අඬමිනි. ඔහු එහෙම අඬනවා මේධා කවදවත් දැක නැත.

'මේ.. මො..ක..ද වු..ණේ ම..හ..ත්..තයා අපි දන් හෙට...'

'කසාදෙකට වඩා දරුවගේ ජීවිතේ ගැන හිතන්න නෝනා... දරුවට ආදරේ නම් අවුරුදු දහයක් හරි දරුවා වෙනුවෙන් ඉන්නෙපැයි එයාලා...'

මොරගොඩ මහතා කියද්දී මේධාද එය එක පයින් අනුමත කළාය.

'අපට මේ මොන පවක්ද පල දුන්නේ...'

'පල දුන්නේ දුප්පත් අහිංසක කෙල්ලෙකුට දුන්න ගින්දර...' මේධා සිතින් කීවාය. 'කරුමෙට මේ කරුමේ පඩිසන් දුන්නෙත් මේ අහිංසකයගේ ජීවිතෙන්...'

'ලොකු පුතා...'

'තාත්තේ...'

'මංජුලාගේ ගෙදරට ගිහින් මේක කියන්න... එයාලත් දනගන්නෙපැයි... ඒ ගමන්ම හෝටලේටත් ගිහින් මේක කැන්සල් කරලා දන්න...'

සුරම්‍යාට හෝ ගා ඇඬුණි. 'නැ..න්..ද අයියා ගැන දන්නෑ... එයා මෙයාව බඳින්නෑ...' වර්ෂා හවස යද්දී ශපථ කර කියූ ආකාරය සුරම්‍යාට සිහි විය. සුමරම්‍යා වෙව්ලා ගියේ එය සිහි වීය. එහෙත් මේ

මොහොතේ කරන්නට වෙන දෙයක් නැත.

"ද..රු..වට උදේ වෙද්දී සිහිය එ..යි..."

"නෝනා... මගේ යකා අවුස්සන්නෙපා... මගේ ඇස් දෙක වගේ මුන් දෙන්නා... අතක් පයක් කැඩිලා ගියත් කමක් නෑ... මගේ දරුවෝ ජීවත් වෙන්න ඕන... මං ජීවත් වෙලා ඉද්දී මගේ දරුවන්ගේ මිනියට කර ගහන්න කියලද කියන්නේ..."

මොරගොඩ මහතා කීවේ පාලනය කරගත් කේන්තියෙනි.

"ඒත්.. අපි කො..හොමද මේ මඟුල..."

"මඟුල... මඟුල මඟුල... බදින්න... හිටපු උන් හොඳ නම් මූට මෙහෙම දෙයක් වෙන්නෑ... ලොකු පුතා යනවා... ප්‍රශ්නයක් නම් මට කතා කරන්න කියනවා..."

මොරගොඩ මහතා කීවේ කේන්තියෙනි.

"හො..ඳ..යි තාත්තේ..."

"ගිහින් ඇවිත් මේ දරුවව ගෙදර දාලා ඔයා මල්ලි ගාවට එන්න... මේ සම්බන්ධයෙන් ඉන්න හොඳම ඩොක්ටර් කවුද කියලා බලාල එයාව අල්ලගන්න..."

"ඔව් තාත්තේ..."

මේධා යන්නට පෙර අඩමින්ම විමුක්තිගේ හිස සිප ගත්තාය.

"මං.. පා..න්..දරම කෝ..විලට ය..නවා අ..ම්මේ... ම..ල්ලිට මොනවත් වෙ..න්..නෑ..."

මේධා කීවේ අඬමිනි.

සක්විති රෝහලේ කෝරිඩෝව දිගේ ආවේ ඇස්වල වූ කඳුළු පිසිමිනි. මේධා ඔහුගේ අතකින් අල්ලා ගත්තාය.

"ම..ල්ලිට මොනවත් වෙන්නෑ ම..හත්තයෝ..."

"හිතාගන්න බැරි දුකකින් ඌ ජීවත් වෙලා තියෙන්නේ... අපි දක්කේ උගේ දුකෙන් ටිකයි..."

"අනේ දෙයියනේ රටකට ගියාට පස්සේ මෙහෙම වුණානම්... දැන් අපි ඉන්නවනේ... ර..ත්තරං.. කොල්ලව බේර ගමු..."

"ඔ..ව්.. මං මේ රස්සාවෙනුත් අස්වෙලා හරි මෙකව බේර ගන්නවා... ඌට මෙ..හෙම වෙන්න දෙන්නෑ..."

වාහනයට නැඟ්ග පසු මේධාට සිහිවූයේ වර්ෂාවය. "එද වගේම අදත් උඹට මේකට මෙහෙම වෙද්දී දැනෙන්න ඇති. ඒත් උඹට එන්න දෙන්නෑනේ කෙල්ලේ..."

# 12

සක්විති කෙළින්ම වාහනය රැගෙන ගියේ කිරුළපන පිහිටි මංජුලාගේ නිවසටය. 'සමහර විට මේ අසනීපය මේ කසාදය නවතාලන්නට දෙවියන් කළ දෙයක් වන්නට බැරිද...' මේධා එසේද සිතුවාය. කෙසේ වුවද කොල්ලා අද උන්නේ අවධානම් අධියකය.

මංජුලාගේ නිවස ඇති උද්‍යාන පාරට හරවද්දීම ඒ නිවසේ තරමක සාදයක් බව සක්විතිටත් මේධාටත් අවබෝධ විය. ඒ තරමටම වාහන එහි විය. බටහිර ගීතයක් නිවස ඇතුළතින් වාදනය වෙමින් තිබුණි.

'පට්ට බැල්ලියෝ... අපේ එකා ජීවිතයත් මරණයත් අතර සටනක්... මුන් මෙහේ බාල් දනවා... ඇයි ධනස්කන්දේ හෙට ලැබෙනවනේ...'

මේධා කතා කළේ වෛරයෙනි.

'යන් බබා...'

සක්විති පරිස්සමින් මේධාව වහනයෙන් ගත්තේය. මල්ලිට ඇති ආදරය නිසාම ඇය උන්නේ තෝන්තු වීය.

නිවස ඇතුළතින් එන අත්පොලසන් හඬත් කෑ ගැසීමත් මේධාගේ

පපුව පමණක් නොව සක්විතිගේ පපුවද කෝපයෙන් රත් කරලීය.

මංජුලා උන්නේ නිවසේ සාලයේ තවත් ඇය වැනිම වූ සංකර යුවතියන් ගැහැණුන් දහයක් පහළොවකුත් තරුණියන් රොත්තකුත් සමඟ ඩාන්ස් කරමිනි. ඇය ඇඳ උන්නේ කළු කොටම කොට සායකුත් නූල් තුන හතරක් උඩු කයට දම්මාක් වැනි හීන් ස්කිනි වර්ගයේ ටී ෂර්ට් එකකුත් ඇඳගෙනය. ඇය කොතරම් ලෙස උමතුවෙන් නටමින් උන්නාද කිවහොත් මේධාත් සක්විතිත් ආ බවක්වත් දක්කේ නැත. අත් පොළසන් දෙමින් කෑ ගසමින් ඇය නටමින් සිටිද්දී සක්විතිට සිහිවූයේ වර්ෂාවය. "උඹ වගේ බැල්ලියෙකුව මල්ලිට නොලැබී ඌට මොනවා උණත් හොඳයි..." සක්විති කේන්තියෙන් සිතුවේය.

සක්විතිවත් මේධාවත් දක්කේ සාලයේ උන් තවත් පිරිසක් සමඟ මධුවිත බොමින් උන් මංජුලාගේ පියාය. ඔහු කලබලයෙන් දුවවිත් සංගීතය සපයමින් උන් පිරිසව නැවැත්වීය. මංජුලා වියරු වැටී උන් මත්වූ මුහුණින් බැලුවේ එවිටය. දොරකඩ උන් මේධාවත් සක්විතිවත් ඇය දුටුවේ එවිටය

"එ..න්න එන්න පුතා... අද මේ දුවගේ යාළුවෝ ටික ඇවිත්... අද එයා මෙහේ ඉන්න අන්තිම දවසනේ..."

"නෑ.. උඹ සදකාලයටම ඔහේ ඉඳපන්..." මේධා සිතින් කියමින් බැලුවේ මංජුලා ඇඳ උන් ඇඳුම දෙසය. "උඹ වගේ ඇවිදින වල් කරත්තයක් මගේ මල්ලිට කොහොම දෙයියෝ දෙන්නද... ඌට අරම කළේ ඒකයි... ඒ දුක හොඳයි එක අතකට උඹව බඳිනවට වැඩිය..." මේධා යළි යළිත් සිතුවාය.

"මේ ගෑණියි මිනිහයි ඇවිත් තියෙන්නේ හොඳකට නෙමෙයි..." මංජුලා සිතුවාය.

"එ..න්න අයියේ..."

ඇය කතා කළේ සිහි එලවා ගනිමිනි. මංජුලාගේ මවත් ඒත් සමඟම ආවාය.

"මොකද මේ නෑදෑයෝ ගේ දොරකඩ එන්න ඇතුළට..."

"ඇයි පුතා මොකක්ද ප්‍රශ්නේ..."

"පො..ඩි කරදරයක් අන්කල්... ඒක ඇන්ටිටයි අන්කල්ටයි කියලා යන්න ආවේ..."

සක්විති සියළු හැඟීම් මැඩගෙන කීවේය.

"කරදරයක්.. කාටද..."

"ම..ල්..ලි..ට..."

"විමුක්ති අයියට..."

මංජුලාගේ පපුව රත්විය.

"ඇයි.. විමුක්ති අයියට මොකද..."

සක්විති සියල්ල විස්තර කළේය. තිදෙනාම අසා උන්නේ දෙපා පණ නැති වීගෙන යද්දීය. දන් සියළු සැලසුම් යළිත් වතුරේය.

"මල්ලී දන් නවලෝකේ අයි සී යූ එකේ..."

"මේ.. පැ.. පැයකින් දෙකකින් රිකව වෙයිනේ... නිකං ෆේන්ට් එකක් වෙන්න ඇති..."

මංජුලා කීවේ තමාවම සනසා ගනිමිනි.

"නෑ මංජු... මල්ලිට මාස හය හතක ට්‍රීට් කරන්න ඕන... එයාට සිහිය එන්නම දවස් තුන හතරක් යයි..."

"එතකොට වෙඩින් එක..."

මංජුලාගේ මව ඇසුවේ උගුරේ කටේ ලේ සිඳී යද්දීය.

"තාත්තා කිව්වා වෙඩින් එක කැන්සල් කරන්න වෙනවා කියලා අන්කල්ටයි ඇන්ටිටයි කියන්න කියලා..."

තිදෙනාම මුහුණට මුහුණ බලාගත්තෝය. මේධා බලා උන්නේ ගැණු දෙදෙනාගේ කපටි දෙනෙත් දෙසය.

"එ..හෙම කොහොමද... දන් ඔක්කොටම ඉන්වයිට් කරලත් ඉවරයි..."

"කරන්න දෙයක් නෑනේ අන්කල්... අපට මල්ලිගේ ජීවිතේ

බේරගන්න ඕන..."

"ඒත්... මේ.. මො..නවද කියන්නේ... මේ රටේ ඩොක්ටර්ස්ලා නැද්ද... අන්කල් ඒවා බලාගනී... විමුක්ති හෙට වෙඩින් එකට එනවා... මේවා නිකං විහිළු කතා..."

මේධා උන්නේ දැවෙමිනි.

"අපට වටින්නේ මල්ලිගේ ජීවිතේ... වෙඩින් එක හෙට කෙරෙනවා කියලා නම් හිතන්නෙපා අන්කල්... ප්‍රශ්නයක් තියෙනවා නම් තාත්තට කතා කරන්න... මං යනවා මල්ලි ගාවට..."

"එහෙම වෙන්න දෙන්න පුතා... ඔයා යන්න... මං විමුක්තිව බලාගන්නම්... ඔය පැය දෙක තුනට විමුක්තිට සිහිය ගන්න බැරිද... පස්සේ ආයෙත් ට්‍රීට්මන්ට් ගන්න පුළුවන්නේ..."

"මල්ලිගේ ජීවිතෙත් එක්ක එහෙම සෙල්ලම් කරන්න දෙන්න බෑ... කරන දෙයක් සක්විතියි තාත්තයි බලලා කරයි... අන්කල්ලා ඒ ගැන හිතන්න ඕන නෑ..."

මේධා කීවේ ඔහුගේ මුහුණවත් නොබලාය. මංජුලාව වෙව්ලන්නට විය. "මේක කුමන්ත්‍රණයක්..." ඇය වෛරයෙන් උණු වී ගිය හදින් සිතුවාය.

"එහෙනම් මංජු... පාටිය එන්ජෝයි කරන්න... අපි යනවා... උදේට පුළුවන් නම් එන්න කොල්ලව බලන්න..."

සක්විති වාහනයට ගියේ මේධාගේද අතක් අල්ලාගෙනය. මංජුලාගේ මවත් පියාත් සෑහෙන වේලාවක් ගල් ගැසුනාක් මෙන් බලා උන්නෝය.

"මංජුයි තමුසෙයි එනවා මාත් එක්ක... මං නේ එයාව හෙට වෙඩින් එකට ගේන්නේ..."

සැම්සන් වාහනයේ යතුර අතට ගත්තේ වේගයෙන් එසේ කියාය.

"ඌ මැරිලා හිටියත් මං ඌව හෙට පෝරුවට නග්ගනවා... මොරගොඩලා දන්නෑ මගේ හැටි..."

සැමිසන් වේගයෙන් වාහනය පාරට දම්මේ එසේ කියාගෙනය.

"මේක මේ වෙඩින් එක නවත්තන්න ගහපු කුමන්ත්‍රණයක්... අර බැල්ලි හවස එහෙට එද්දී මට හිතුණා... ඒකී මේ දෙන්නා එක්ක හරි එකතුයි... ඕක බොරුවක් තාත්තේ..."

මංජුලා කීවේ දැවෙමිනි. "එක පැයකට මාව කැන්දගෙන ගියා කියලා ඔප්පු කරගත්තට පස්සේ මට එයා මැරුණත් කමක් නෑ... ඊට පස්සේ ජීවිතේ ජොලි කර කර ඉන්න පුළුවන්... මූන් ඒකම තමයි වළක්වන්න හදන්නේ..." මංජුලා ලේ රස දනෙන තරමට තොල් පට සපාගෙන සිතුවාය.

"අ..පි දැන් ගි..හි..න් මොනාද කරන්නේ..."

මංජුලාගේ මව ඇසුවේ මුහුණ දෙකෙළවරින් ගලන දහදිය පිස දමමිනි. මේ මංගල්ලය හෙට නොපැවැත්වුවහොත් වෙන්නේ සියදිවි නසා ගන්නටය.

"ඒක මමනේ බලාගන්නේ... මොරගොඩලාව නිදි කරවන්නත් මම දන්නවා නින්දෙන් ඇහැරවන්නත් මම දන්නවා..."

මංජුලා මේ මොහොතේදීත් ඇගේ පියාගේ බලපුළුවන්කාර කම් ගැන විශ්වාසයෙන් උන්නාය. සේලයින් බට එල්ලාගෙන හෝ හෙට විමුක්ති සමඟ පෝරුවට නැගිය යුතුය.

"අ..ම්මේ මං අර ගෑණිට කතා කරන්නද..."

මංජුලා මේ ඇසුවේ සුරම්‍යා ගැනය. මොරගොඩ පවුල ගැන ඔවුන් කතා කරන්නේ එලෙසිනි.

"ඒ ගෑණිත් එක්කත් ඔහොම කතා කරලා බෑ... ඉන්නකෝ ටිකක් හොස්පිට්ල් එකට යනකං..."

"මේ කසාදේ කරන්න ඒ ගෑණිට නම් තිබ්බේ ලොකු කුලප්පුවක්... ඒ පැත්තෙන් ගෑණිව තමා කුලප්පු කරන්න තියෙන්නේ..."

"මොනාද මේ මෙයාට එකපාර වුණේ..."

"මිනිහා මහ සයිකෝ මිනිහෙක් අම්මා... අර හිඟන කෙල්ලෙක්ට ලව් කරලා ඒකි මත්තෙම නැහෙන්න යනවා ඇති... මං අම්මට

කිව්වේ ඒකිත් හවස ආවා කියලා... ඊට පස්සේ තමා මේ ඔක්කොම..."

"ඒකි ගැන තාත්තට කියන්නනේ තිබ්බේ... මේ හිඟන බැල්ලියෙක්ව ඉවර කරන්න බැරිද..."

කොහොමත් ඉස්සරහට ඒ දේ කළ යුතුම බව දන් මංජුලා දනී.

"මෙ..යා පිස්සා වගේ මොනා හරි බීලා ඇති... ස්ලීපින් ටැබ්ලට් හරි..."

"මිනිහා ඒ කෙල්ලට එච්චරටම ආදරේද..."

සැම්සන් ඇසුවේය.

"වෙනැත්ති... කකුල් ලෙව කකා ලව් කරන ජාතියේ අම්මණ්ඩි කෙනෙක්... මෙයාගේ නෑනනේ..."

"සුරම්‍යා හොඳ වෙලාවට ඒකිත් එක්ක පැටලුනේ..."

"එයා පැටලුනාට අනිත් උන් ඒකිට හරි ආදරෙයි... ඔය දන් ආපු ගෑණි ඒකිට පණ වගේ... නිකං ඉඳිද්දිත් ඒකිගේ අතින් අල්ලගෙන ඉන්නේ..."

ඔවුන් රැගත් වාහනය නවලෝක රෝහල ඉදිරිපිට නැවතිණ. තිදෙනාම රෝහලේ දැඩි සත්කාර ඒකකය වෙත දුව ගියේ කලබලයෙනි.

දැඩි සත්කාර ඒකකයේ පිටත රැඳී උන්නේ මොරගොඩ මහතාත් සක්විතිත් පමණි. සක්විති මේධාව බස්සා යළි රෝහලට ආවේ වේගයෙනි. මොහොතකින් මංජුලාලා මෙහේ එන බව ඔහු හොඳින් දන උන්නේය.

"නි..කං වත් එයාලට කො..ල්ලව හො..ල්ලන්නවත් දෙන්නෙපා ම..හ..ත්තයෝ..."

මේධා එද්දීත් කීවාය. "විමුක්ති හෙට වෙඩින් එකට එනවා... මේ නිකං විහිළු කතා..." මංජුලා ගේ මව කියූ වදන් සක්විතිට පවා සිහිවෙයි.

බලාපොරොත්තු වූවාක් මෙන් තුන්දෙනාම දැඩි සත්කාර ඒකකයට

කිව්වේ ඒකිත් හවස ආවා කියලා... ඊට පස්සේ තමා මේ ඔක්කොම...'

'ඒකි ගැන තාත්තට කියන්නනේ තිබ්බේ... මේ හිඟන බැල්ලියෙක්ව ඉවර කරන්න බැරිද...'

කොහොමත් ඉස්සරහට ඒ දේ කළ යුතුම බව දන් මංජුලා දනී.

'මෙ..යා පිස්සා වගේ මොනා හරි බීලා ඇති... ස්ලීපින් ටැබ්ලට් හරි...'

'මිනිහා ඒ කෙල්ලට එච්චරටම ආදරේද...'

සැම්සන් ඇසුවේය.

'වෙනැත්ති... කකුල් ලෙව කකා ලව් කරන ජාතියේ අම්මණ්ඩි කෙනෙක්... මෙයාගේ නැනනේ...'

'සූරම්‍යා හොඳ වෙලාවට ඒකිත් එක්ක පැටලුනේ...'

'එයා පැටලුනාට අනිත් උන් ඒකිට හරි ආදරෙයි... ඔය දන් ආපු ගෑණි ඒකිට පණ වගේ... නිකං ඉදිද්දිත් ඒකිගේ අතින් අල්ලගෙන ඉන්නේ...'

ඔවුන් රැගත් වාහනය නවලෝක රෝහල ඉදිරිපිට නැවතිණ. තිදෙනාම රෝහලේ දැඩි සත්කාර ඒකකය වෙත දුව ගියේ කලබලයෙනි.

දැඩි සත්කාර ඒකකයේ පිටත රැඳී උන්නේ මොරගොඩ මහතාත් සක්විතිත් පමණි. සක්විති මේධාව බස්සා යළි රෝහලට ආවේ වේගයෙනි. මොහොතකින් මංජුලාලා මෙහේ එන බව ඔහු හොඳින් දන උන්නේය.

'නි..කං වත් එයාලට කො..ල්ලව හො..ල්ලන්නවත් දෙන්නෙපා ම..හ..ත්තයෝ...'

මේධා එද්දීත් කීවාය. 'විමුක්ති හෙට වෙඩින් එකට එනවා... මේ නිකං විහිළු කතා...' මංජුලා ගේ මව කියූ වදන් සක්විතිට පවා සිහිවෙයි.

බලාපොරොත්තු වූවාක් මෙන් තුන්දෙනාම දැඩි සත්කාර ඒකකයට





දුවගෙන එද්දී සක්විතිගේ පපුව පවා හෙලවිණ. ඔහුට සැනසීමට තිබූ එකම කාරණාව තාත්තා මේ මොහොතේ මල්ලීගේ ජීවිතය ගැන පමණක් සිතීමය.

'තා..ත්..තේ...'

මොරගොඩ මහතා උන්නේ දැඩි සත්කාර ඒකකය ඉදිරිපිට වූ පුටුවේ වාඩිවී බිත්තියට හිස බර කරගෙනය.

'ම්...'

'අ..රගොල්ලෝ ඒ..නවා...'

මොරගොඩ මහතා බැලුවේ ඉන් පසුය.

'අ..නේ අ..යියේ පුතාට මොකද... දන් සනී..පයිනේ...'

මංජුලාගේ මව ආවේම එසේ කියාගෙනය. මොරගොඩ මහතා බලා උන්නා මිසක කතා කළේ නැත.

'පුතා දිගටම වෙඩින් එකට මහන්සි උන නිසා පොඩ්ඩක් ස්ට්‍රෙස් තියෙන්න ඇති...'

සැම්සන් කීවේ වෛද්‍යවරයෙකු ලෙසිනි.

'පුතාගේ ත..ත්..වේ ටිකක් බරපතලයි සැම්... ම..ට දරුවගේ ජීවිතේ ගැන බ..යයි...'

මොරගොඩ මහතා කීවේ අවංක දුකකිනි. ඇතුලාන්තය දවාගෙන එන බවක් ඔහුට දනෙයි. පුංචි කාලයේදීවත් මේකා වෙනුවෙන් මෙහෙම දුකක් මේ පපුවේ පැමිණ නැත.

'පි..ස්..සුද මොරේ... මේ ගස් ගල් වගේ කොල්ලන්ට මොන ලෙඩද... මං දන් එන ගමන් ස්පෙෂලිස්ට් කෙනෙක්ටත් කතා කළා... ඩොක්ටර් කිව්වේ ඕකට පොඩි ට්‍රීට්මන්ට් එකක් කළාම හරි කියලා... මං කිව්වාම හෙට කොල්ලගේ වෙඩින් එක කියලා ඩොක්ටර් කිව්වේ වෙඩින් එකෙන් පස්සේ ටිකක් රෙස්ට් කරන්න දෙන්න කියලා...'

'ඒකනේ... මේ ලොකු පුතාලා ඇවිත් කිව්ව විදිහට අපිත් බයවුණා... කෙල්ලත් එන මහ දිගටම අඬනවා...'

සක්විති ඇතුලාන්තයෙන් සිනාසුණේය. 'උඹ අඩන හැටි මං දන්නවනේ...' මවාගත් දුකකින් බිම බලාගත් මංජුලා දෙස බලා සක්විති සිතුවේය.

'මං ඩොක්ටර් ඉදිරිමාන්නට කතා කරන්නම් මොරේ... අපි මෙහෙදිම පුතාට ට්‍රීට්මන්ට් කරලා පැයකින් දෙකකින් ගෙදර එක්කගෙන යන්... අද වෛද්‍ය විද්‍යාව කොච්චර දියුණුද... මේ පොඩි ෆේන්ට් එකකට කලබල වෙන්නෙපා...'

මංජුලාගේ පියා කියද්දී වැඩියෙන්ම බය වුණේ සක්විතිය. ඔවුන් හදන්නේ මල්ලීව හෙට කෙසේ හෝ වෙඩින් එකට ගෙන්නා ගන්නට බව සක්විති දනී.

'ම..ට ම..ගේ කොල්ලගේ ජීවිතෙයි වටින්නේ සෑම්... මට ඉන්නේ මුන් දෙන්නා විතරයි... කවදහරි මගේ මිනියට හරි කරගහන්න මගේ කොල්ලෝ දෙන්නා ඉන්න ඕන...'

මොරගොඩ මහතා කීවේ දුක්බරව නමුත් ස්ථිර හඬකිනි. ඒ කතාවට මංජුලාගේ පමණක් නොව ඇගේ දෙමව්පියන්ගේද පපු රත් විය.

'ඉ..තින් අ..යියේ මේ අයියා කතා කරන්නේ පුතාට හාට් ඇටෑක් ආවා ව..ගේ..නේ...'

ඒ වචන තුළ මංජුලාගේ මවගේ හිතේ තිබූ වෛරයද කේන්තියද තිබුණි.

'මල්ලිගේ ජීවිතේ අනතුරක තියෙන්නේ... මේක එහෙම පොඩි ෆේන්ට් එකක් නෙමේ... අන්කල්ලා ඇයි තේරුම් නොගන්නේ...'

සක්විති කීවේ වචන බර කරය.

'පු..තාලා මේ නිකං බයවෙලා ති..යෙ..න්..නේ.. මං...'

'සෑම්...'

මංජුලාගේ පියා දිගටම කතා කරන්නට යද්දී මොරගොඩ මහතා ඔහුව නැවැත්තුවේය.

'දරුවට අමාරුයි... ඒක තමා ඇත්ත... එහෙම නොවුණා නම්





තමා මාත් ආස... ම..ගෙත් පපුව පිච්චෙනවා... ඒත් අපි ඇත්තටම මුහුණ දෙන්න ඕන... පුතාව බලන්නේ මේ සම්බන්ධයෙන් ඉන්න හොඳම ඩොක්ටර්... එයාට වැඩිය කෙනෙක් ලංකාවේ නෑ... එයා දන් පුතාව බලලා ගියේ... කොටින්ම තියෙන තත්වේ හැටියට එකපාර දරුවට සිහිය ගන්නවත් බෑ...'

සැම්සන් බැලුවේ තම බිරිඳ දෙසය. මංජුලාට අඬන්නට පවා අමතකව තිබුණි.

'අ.. අ..න්..කල් එ..ත..කොට හෙ..ට වෙ..ඩින් එ..ක...'

මොරගොඩ මහතා තරමක් කරුණාවෙන් මංජුලා දෙස බැලුවේය.

'ඔයාට බලන්න ඉන්නම වෙනවා... ඔයත් හිතන්න හෙට වෙඩින් එකද වටින්නේ විමුක්තිගේ ජීවිතේද කියලා... හෙට ඔයාව බැඳලා අනිද්දා එයාගේ ජීවිතේට අනතුරක් උනොත්... ඔයාට ජීවිතයක් තියෙනවද...'

'එහෙම වෙනවනම් කොච්චර ෂෝක්ද... එහෙනම් මම සෙම්ට්‍රි එක වටේ බල්බ් එල්ලනවා...' මංජුලා සිතින් සිතුවාය. ඇය සිතන මේ දේවල් ඇගේ මුහුණින් මනාව පෙනෙනා බව ඇය දන උන්නේ නැත.

'වෙඩින් එක කැන්සල් සෑම්... අපිත් ඉන්වයිට් කරපු අයට කතා කර කර කියනවා... කාටත් තේරුම් ගන්න පුළුවන්නේ... ලෙඩ දුක් කාටත් හැදෙනවනේ... නැතුව මෙතන වෙන ප්‍රශ්නයක් නෑ...'

'ඒ..ත් මෙ..හෙම එකපාර වුණේ කොහොමද... හෙට වෙඩින් එක තියෙද්දී... අදම...'

මංජුලාගේ මවගේ කතාව මොරගොඩ මහතා කුපිතවන සුළු විය.

'හැමදේම වෙන්නේ දෙයියෝ බුදුන්ට අනුවයි කියලා කතාවක් තියෙනවනේ මංජුලාගේ අම්මේ...'

'ඒක පුදුම කතාවක්නේ... මහලක් කියන එක සුළු පටු දෙයක්ද...'

මොරගොඩ මහතා ඇය දෙස මෙවර නම් බැලුවේ කේන්තියෙනි.

"ම..ට මගේ පුතා ජීවිත කාලෙම ගෑණියෙක් නැතුව හිටියනම් කමක් නෑ... ඌ ජීවත් වෙන්න ඕන..."

මොරගොඩ මහතා කීවේ ඇවිලෙමින් මෙනි. "මොරගොඩලා එක්ක කොහොම කතා කරන්නද කියලා මං දන්නෑ... අනේ දෙයියනේ ලස්සනට හෙට තියෙන්න තිබ්බ මඟුල..." මංජුලාගේ මව සිතුවේ හූල්ලමිනි.

"මහ ලොකුවට කොල්ලට ආදරේලු... මෙතන ඇවිත් මඟුල් ගැන කතා කරනවා... උගේ මූණවත් බලන්න ඕන කමක් නෑ..." සක්විති සිතුවේ බිම බලාගෙනය.

"සෑම්... ඩොක්ටර් මට පොරොන්දු වුණා කොල්ලගේ ජීවිතේ බේරලා දෙනවා කියලා... ඒත් ඉවසන්න කිව්වා... මං මේ වෙලාවේ හිතන්නේ ඒකගේ ජීවිතේ ගැන විතරයි.. අපි නොදන විමුක්තිට ලෙඩක් තිබිලා තියෙනවා... ඒ නිසා මේ වෙලාවේ වෙන දේවල් අපි අමතක කරලා දමු.. ඔය වෙඩින් එක කොහොමත් හෙට කෙරෙන්නෑ... මං කොල්ලව ගෙනියන්න දෙන්නෑ..."

මොරගොඩ මහතා ඔහුගේ අවසන් තීන්දුව ප්‍රකාශයට පත් කළේය.

"අ..පි මොරේ අර ස්පෙෂලිස්ට එක පාරක්..."

"බෑ.. සෑම් බෑ... බොහොම කණගාටුයි... මගෙන් ඔහොම අහන්නත් එපා... සෑම් ගිහින් මඟුලේ වැඩ ටික නවත්තන්න... තව පැය කීයද තියෙන්නේ..."

"අ..පි එ..හෙම කො..හො..ම..ද කරන්නේ..."

මංජුලාගේ මව ඇසුවේ ගහගන්නට මෙනි.

"මට කරන්න දෙයක් නෑ... වෙඩින් එකක් ගන්නම ඕන නම් දුවට වෙන මනමාලයෙක් හොයාගෙන හෙට බන්දවන්න.... මගේ කොල්ලට එන්න බෑ... මගෙන් තවත් මේ ගැන අහන්නත් එපා..."

Hemantha007
For free distribution

"මොරගොඩ පවුලට කෙල්ලෝ දෙන්න ගිහින් දැන් අපි කොච්චර බාල්දු වුණාද..."

"කොල්ලව බඳින්නේ මංජුලානේ... එයා විමුක්තිට ආදරේ නම් අවුරුදු දහයක් හරි ඉඳී... ගෑණු එහෙම කරනවා... දැන් හිතන්න ඕන මේ දරුවගේ ජීවිතේ ගැන... අපි සල්ලි නැති මිනිස්සු නෙමේනේ... මඟුල් දහයක් ගන්න මං ගාව සල්ලි තියෙනවා... මගේ බිස්නස් තාම වැටිලා නෑ... ඒ නිසා පුළුවන් වෙලාවක උදේ හිතලා රෑට මඟුල් කන්න මට පුළුවන්..."

තාත්තා නියමෙට ගැහුවා යැයි සක්විතිට සිතුණි. ව්‍යාපාර වලින් නැත්තටම බංකොලොත් වී සිටින සැම්සන්ලා හදන්නේ පොත්ත සුදු දුවව ඉස්සරහට කර මේ කසාදයට මල්ලිගේ ජීවිතය සිර කර දේපොල ටිකට විදින්නටය.

"දැන් විමුක්තිට මොනාද කරපු ට්‍රීට්මන්ට්..."

සැම්සන් ඇසුවේ සැකයෙන් මෙනි.

"කරන්න පුළුවන් හැමදේම මල්ලිට කරලා තියෙන්නේ අන්කල්... හෙට ටෙස්ට් වගයකට මල්ලිව ගන්නවා... ඊට පස්සේ තමයි හරියටම ට්‍රීට්මන්ට් පටන් ගන්නේ..."

සැම්සන් ඉන්පසු කතා කළේ නැත. ඔවුන් තිදෙනාගේම මුහුණුවලින් පෙනෙන්නට තිබුනේ අන්ත පරාජයක අඳුරු දුක්බර සෙවනැලිය. මේධා කියූ කතාව හරිය. දෙවියන් සමහර විට මෙහෙම කරන්නට ඇත්තේ මේ කසාදය නවත්වන්නටම විය යුතුය.

# 13

සුරම්‍යා ඉන්නේ විමුක්තිටත් වඩා සිහිසුන් ගාණටය. ඇයට මේ සිදුවූ දේ සිතාගන්නටත් බැරි තරම්ය. අර තරම් ලස්සනට කරගෙන ආ මංගල්ලය මෙසේ හිටි හැටියේම නතර කරන්නට කටයුතු යෙදුනේ කෙසේද... විමුක්තිට මේ තරම් දරුණු අසනීපයක් හදිස්සියේ හැදුනේ කෙසේද...

සාලයේ සැටිය මත ඇය වැටී උන්නේ මැරුණ ගාණටය. පැය තුනක් තිස්සේ ඇය මෙතනට වී ඇඬුවාය. පැය තුනක් තිස්සේ ඇය මෙතනට වී ඇඬුවාය.

'අපි හිමිහිට මල්ලිව බේරගමු අම්මේ.. අම්මා දුක්වෙන්නෙපා...' මේධා ඇයව සනසන්නට වෙර දැරුවාය.

'හෙණයක් පාත්වුණා වගේ මොනාද මේ උ..නේ මගේ කොල්ලට... ගෙදරින් යද්දී මට මහ බයක් ආවා.. ඒ හිතිච්ච දේ එහෙමම වුණා...'

'මල්ලිට එකපාර ඒ..හෙම වුණා නෙමේ අම්මේ... එකපාරක් බුක් ෂොප් එකෙත් වැටිලා තියෙනවනේ...'





'ඒ..ත් මේ ගහක් ගලක් වගේ උන්න කොල්ලට ඒ..හෙම වුණේ ඇයි...'

මේධාටත් එය නම් සිතාගන්නටවත් නොහැක. ඇයට හවස දුටු විමුක්තිගේ මුහුණ සිහි වෙයි.

'අ..නේ මං කොහොමද මේ.. දුක දරාගන්..නේ.. හෙට මනමාලයෙක් වෙලා පෝරුවේ ලස්සනට ඉන්නවා බලන්න හිටියේ...'

'අම්මා ආස වුණාට දෙයියෝ එහෙම ඉන්නවා බලන්න ආස නෑ...' මේධා සිතින් කීවාය.

'තාත්තයි සක්විතියි මල්ලී ළඟ ඉන්නවනේ... මල්ලිට මොනවත් වෙන්නෑ... මො..න..ව..ත් වෙන්නෑ...'

එහෙම සිතුවද මේධාගේ සිතටද බයය. හුස්ම ගැනීමේ උපකරණ සවි කර තිබූ විමුක්තිගේ මුහුණ බලද්දී හදවතට ඇතිවූ කම්පනය තවමත් එහෙමමය.

මුළු මොරගොඩ නිවසම මළ ගෙයක් වැනිය. මේ තියෙන්නේ හෙට මනමාලියෙක් කැන්දගෙන එන්නට උන් නිවසය. එහෙම ගෙදරට මෙහෙම දෙයක් උදවේයැයි කිසිවකු සිතන්නේ නැත.

මේධා පාළු මිදුලට බැස තෝන්තුවාවෙන් මෙන් බලා උන්නාය. සක්විති දිගටම ළඟ ඉන්නා බව මේධා දනී. අයියා මල්ලීට කොතරම් ආදරේදැයි මේධා පවා හරියට දැනගත්තේ අදය.

හෙට මනාල යුවළට පිටත්ව යාම සඳහා සරසා තිබූ සුදු පැහැ ගත් කාරය මල් වලින් සැරසී මිදුලේ තිබුණි. මේධා ගොස් එහි මැද සකසා තිබූ මල් අතගා බැලුවාය. පසුව එහි සිට වාහනයේ වීදුරුව තෙක් ඇද තිබූ සැටින් පටිද අල්ලා බැලුවාය. ඒත් සමඟම ඇයට මහ පුදුමාකාර කුරිරු සතුටක් දැනුණි.

'උඹ මේ කාර් එකේ නැගලා කොල්ලගේ ජීවිතෙත් අරගෙනම යන්න හිටියේ... මොන කරදර ආවත් ඒක දන් වෙන්නෑ...' මේධා සිතුවාය. ඒත් සමඟම ඇයට සිහිවූයේ විමුක්ති අසනීප වූ පුවත කියන්නට පාක් රෝඩ්හි මංජුලාගේ නිවසට යද්දී ඇය ඇඳ උන් අසංවර ඇඳුමය. එය ඇඳගෙන ඇය නටමින් උන් අසංවර විදිහට

'ගණිකාවක් වත් හෙට තමන් මනමාලියෙක් වෙන බව දන්නවානම් එයා වගේ ඉන්නෑ...' මනමාලියක් වීම කවර මට්ටමේ යුවතියකගේ වුව ජීවිතයේ සුන්දරම මොහොතය. මංජුලා අරම උන්නේ තව හෝරාවකින් දෙකකින් පෝරුවට ගොඩ වන්නට තිබියදීය.

අනුලා මිදුලට ආවේ ඒ මොහොතේය. බඩවල් දෙකක් එක ලෙස ඔසවාගෙන උන් මේ ගැහැණු දෙදෙනාම මේ මොහොතේ හිතන්නේ විමුක්තිගේ ජීවිතය ගැනය.

'මේධා නෝනා...'

අනුලා හදාගෙන ආ තේ එක ඇය මේධාට දුන්නාය.

'ක..න්..න බොන්න වත් හිතෙන්නෑ අනුලක්කේ...'

'එ..හෙම කියලා බෑනේ මේධා නෝනා... දරුවෙකුත් අපේ බඩවල් වල ඉන්නවනේ...'

මේධාට හීල්ලින. දින දී ඇත්තේ ලබන මාසයේ මුලය.

'දරුවා බිහිවෙන්නෙත් මේ කරදර මැද්දේ...'

අනුලා මේධා දෙස මොහොතක් බලා උන්නාය.

'මේධා නෝනා...'

'අනුලක්කේ...'

'මේ..ක කරදරයක්ම නෙමේ මේධා නෝනා... පුංචි මහත්තයට මොනවත් වෙන්නෑ...'

'මාත් එ..හෙම හිතන්නෑ අනුලක්කේ...'

'මං නම් කියන්නෙම මේක කළේ දෙයියෝ... පුංචි මහත්තයව අර කෙල්ලට මිසක් වෙන බැල්ලියෙක්ට අයිති වෙන්න දෙන්නෑ මේධා නෝනා...'

'ඒක මාත් දන්නවා අනුලක්කේ... කෙල්ල මෙහේ කොහේ හරි තාම ඇති...'

'ඔ..ව් දන්නව නම් දුවගෙන එයි...'

'කෙල්ල නේන එක හොඳයි... මේ ප්‍රශ්න විසඳෙයි කාලෙක...





ඒකි ඉන්න තැනක හිටපුවාවේ...'

'ඔව් ආවොත් කෙල්ල මරයි...'

'කෝ...'

මේධා ඇසුවේ ගෙතුළ දෙස බලාය.

'තාම සැටියට වෙලා ඉන්නේ... එයාවත් පිච්චෙනවා ඇති.. ඒත් හිතන්නේ මඟුල ගැනමයි...'

'අදත් එයා කෙල්ලටම දුක් දුන්නනේ... ඒවා පල දෙනවා... අද වැඩියෙන්ම ගින්දර විඳින්නේ අම්මනේ...'

'මී.. අරගොල්ලෝ පුංචි මහත්තයව බලන්න ඇවිත් මොනා කළාද දන්නෑ...'

'තාත්තා මඟුල ගන්නෑ... ඒක මට විශ්වාසයි... සමහර විට මෙහෙමම මේ මඟුල කැඩිලා යයි...'

'එහෙම වෙනව නම් පුංචි මහත්තයා අසනීප වුණ එකෙන් වරදක් නෑ... කෙල්ල වෙච්ච බාර වල හැටියට පුංචි මහත්තයට මොනවත් වෙන්නෑ...'

'මී.. ඒකිත් මහ පුදුම කෙල්ලෙක්නේ...'

'ඒ ආදරේ හැටි මේධා නෝනා... ගෑණු ආදරේ නිසා කාලි අම්මා කෙනෙක් වෙනවනේ...'

මේධා යළිත් සැරසූ මංගල වාහනය දෙස බැලුවාය.

'මේකේ නැගලා මල්ලිත් අරකිත් එක්ක ගියානම්...'

'කොහොමත් එහෙම වෙන්නෑනේ... පුංචි මහත්තයා රට යන්නනේ ගියේ...'

'දෙයියන්ගේ පිහිටෙන් ඔය අසනීපේ එයාර්පෝට් යද්දී ආවේ... එහෙදි ආවනම්..'

'ධනෙයි මායි කතා වුණොත් ඒකයි... මේවල මොකක් හරි බලගතු දේකුත් තියෙනවා මේධා නෝනා...'

මංජුලාත් ඇගේ දෙමව්පියනුත් රැගත් කාරය මොරගොඩ නිවසට ඇතුල් වූයේ ඒ මොහොතේදීය. මේධාගේ හිත ගැස්සිණ.

'හොස්පිට්ල් එකට ගිහිල්ලා වැඩේ කරගන්න බැරිවෙලා මෙතනට එනවා ඇති...'

මේධා කීවේ තරහිනි.

'මේධා නෝනා ඕවලට කතා කරන්න යන්නෙපා...'

'නෑ අනුලක්කේ...'

මුලින්ම ආවේ මංජුලාය. ඇය නටමින් උන් ඇඳුම දන් මාරු කරගෙන ඇත. 'ඇඳන් හිටපු එකෙන්ම ආවනම් හරි...' මේධා සිතුවාය.

මේධාගේත් මංජුලාගේත් දෙනෙත් ගැටුනේ මිදුලේදීමය. මේධා සිනාවත් වූයේ නැත. 'මං වගේ කෙල්ලෙක් මේ ගෙදර ලේලි වෙනවට මේකි ආසම නෑ.. අර වගේ මෝඩ හෝන්තුවක් ආවම මේකිට ලේසිනේ දේපොළ ටික ගන්න...' මංජුලා එසේ සිතුවේ හැම ගැණියෙක්ම සිතන්නේ එකම ලෙස යැයි සිතාගෙනය.

මංජුලා එතනින් ගෙතුළට ගියේ කතාවත් නොකරය. මේධා ඇගේ දෙමව්පියන් සමඟවත් සිනාසුණේ නැත. ඔවුන්ගේ මුහුණුවල ඇත්තේ බරපතළ පරාජයක ලකුණුය.

'බඩ පපුව පත්තු වෙලා වගේ යන්නේ... මහ අම්මණ්ඩිගේ මූණ තිකං මෙ..හෙම...'

අනුලා කීවේ රහසින් මෙනි. මේධා දිග සුසුමක් හෙළුවාය.

'අපි යන් ඇතුළට... මෙහේ ආවේ මොන නාඩගමකටද දන්නෑනේ... පුළුවන් නම් සිහි නැතිවෙලා ඉන්න කොල්ලගේ අතේ තීන්ත ගාලා කසාද සහතිකේට ඇඟිලි සළකුණු හරි තියා ගනී...'

'ඔ..ව් හැබැයි ආදරේට නෙමේ...'

'අ..නේ මේ පට්ට බැල්ලිගේ ආදරේ... මං දන්නවනේ මේකිගේ හැටි...'

මේධා සාලයට ඇතුල් වෙද්දී මංජුලා සුරම්‍යා ළඟ ඉඳගෙන





පුදුමාකාර රංගනයක නියැලෙමින් උන්නාය.

ආදරයට කැක්කුමට එන කඳුළු මොනවා දැයි මේධා දනී. තමන් ආදරේ කරන මිනිහට කුමක් හෝ සිදු වූ විට ගැණියෙක් ඇවිලෙන්නේ කොහොමදැයි මේධා හොඳින් දන උන්නාය.

'වි..මු..ක්..ති අයියට එහෙම අසනීපයක් හැදෙන්න විදිහක් නෑ ඇන්ටි... කාටවත් බෑ.. මේ..ක වෙන දෙ..ය..ක්... මේ කසාදේ නවත්තන්න කවුරුහරි ක..රපු දෙයක්... එයා හොඳට හි..ටි..ය..නේ... මෙ..හෙම වෙ..න..වද තරුණ වයසෙනේ...'

මංජුලා සුරම්‍යාට කීවේ අඬමිනි.

'ම..ට..ත් මේ මො..න..වත් හිතාගන්න බෑ ද..රු..වෝ.. මොනවත් බෑ... ම..ගේ කො..ල්ලට මො..න ප..ව..ක් පල දුන්නද...'

සුරම්‍යා ඇඬුවාය. අම්මා නම් අඬන හැටි දකිද්දී මේධාටද දුක සිතුණි. මොනවා උනත් තම දරුවෙක් වෙනුවෙන් අම්මා කෙනෙකුගේ නෙතින් ගලන්නේ පිරිසිදු කඳුළුය. විමුක්තිව හැදූ දුක දන්නේ මේ අම්මාය.

'සුරම්‍යා මේක තේරුමක් නැති වැඩක්... පුතාව ඉන්ටෙන්සිව් දාගෙන... මොනවද මේ කරන්නේ... ෆේන්ට් එකක් උනාම ඉක්මනට සිහිය අරගෙන ට්‍රීට්මන්ට් කරන්න ඕන... සිහිය ගන්නෙත් නැතුව ඔක්සිජන් දෙන්නේ මොකටද...'

සැම්සන් කීවේ අසුන් ගන්නේවත් නැතුවය.

'පු..තා..ගේ ත..ත්..වේ බර..පතලයි කියලනේ කිය..න්නේ... දරුවගේ ජීවිතේ ගැ..න..ත් හිතන්නෝනනේ සැම්...'

'අපිත් හිතන්නේ කොල්ලගේ ජීවිතය ගැන තමයි අක්කේ... ඒත් මොරගොඩ අයියා පුතාව ඩොක්ටර් කෙනෙක්ට පෙන්නන්නවත් දෙන්නෑනේ... සැම් දන්නවා හොඳ ඩොක්ටර් කෙනෙක්... මේ සල්ලි ගරන ඩොක්ටර් කෙනෙක් බොරු කරන්නේ...'

මේධාගේ පපුව සීතල වීගෙන ගියේය. මංජුලාලා හදන්නේ

විමුක්තිව කෙසේ හෝ හෙට වෙඩින් එකට ගෙන්නා ගන්නටය.

'මෙ..හෙ..ම ති..බ්..බොත් තමයි අයියගේ ජීවිතේ අනතුරේ වෙන්නේ ඇන්ටි... ෆේන්ට් උනාම සිහිය ගන්නේ නැතුව ට්‍රීට්මන්ට් කරනවද... මොනාද ඒ කරලා තියෙන්නේ... මූණට බට ගහලා... අයියට එක්කෝ ගැස්ට්‍රයිටීස් වගේ අමාරුවක් ඇති... නොකා ඉන්න ඇති... නැත්නම් මහන්සිය...'

අම්මා මංජුලා දෙස බලා උන්නේ ඇය කියන දේවල් ඇත්ත යැයි පිළිගන්නා ලෙසිනි.

'සැම් කියන ඩො..ක්..ටර් කවුද...'

'එයා අක්කේ මේ ලන්ඩන් කොලිෆයිඩ් ඩොක්ටර් කෙනෙක්... මං කතා කරපු ගමන් කිව්වා අයියෝ ස්ට්‍රෙස් ඇති පොඩි ට්‍රීට්මන්ට් එකක් කරලා දම්ම ඇති කියලා... ඕනනම් වෙඩින් එකෙන් පස්සේ ටිකක් රෙස්ට් කරන්න දෙන්න කියලා...'

'අයියයි ලොකු පුතයි සැම් කියන කතාව පිළිගන්නෙම නෑ... හරිම තදයි... විමුක්ති අයිති එයාට විතරක් නෙමේ... දැන් විමුක්ති අපෙත් පුතා...'

මංජුලාගේ මව කීවේ අඬමිනි. මේධාගේ පපුව හිරවෙන්නට මෙන් ගියේය. මේ මොහොතේ කතා කළද වැරදිය. නොකරත් බැරිය.

'සල්ලි බල්ලට ගියාවේ... වෙඩින් එක කැන්සල් කරන එක මහ දෙයක් නෙමේ.. ඒත් මේක දෙන්නගෙම ජීවිත වලට එච්චර හොඳ නෑ... පෝරුවේ නැකැත් නවත්තන එක දෙන්නටම හොඳ නෑ... වස් වදිනවා...'

'දැ..න් ඒ ඩො..ක්..ටර්ව ගෙන්නන්න පුළුවන්ද...'

සුමරංගා ඇසුවේ සැටියෙන් නැගිටිමිනි.

'ඔ..ව් දැන් පුළුවන්... ඕක මොකක්ද... පැයෙන් නව ලෝකෙට එයි... අක්කලා මේ නිකං පිච්චෙනවා...'





සුරමංගා බිම බලාගෙන කල්පනා කරන්නට වූවාය.

'අ..ම්මේ...'

මේධා ඉදිරියට ආවේ බඩත් ඔසවාගෙනය. මංජුලා දිග සුසුමක් ගත්තාය.

'පුතේ...'

'මල්ලිව බලන්නේ හොඳම ස්නායු ඩොක්ටර් කෙනෙක්... මල්ලිට මෙහෙම අරව මේවා කරලා ඒ කොල්ලගේ ජීවිතෙත් එක්ක සෙල්ලම් කරන්නෙපා... අපට ඉන්නේ එච්චරයි...'

මේධා කීවේ කඳුළු සලමිනි.

'ඔයා පුදුම දේවල්නේ කියන්නේ... විමුක්ති කියන්නේ මගේ හස්බන්ඩ්... එයාගේ ජීවිතේ ගැන මටයි කැක්කුම... මං මගේ හස්බන්ඩ් ගැන බලාගන්නම්... එයාව මටයි සනීප කරගන්න ඕන...'

මංජුලා කීවේ හැපින්නක ලෙසිනි. ඇය වෙව්ලුවාය. 'මොනවා හරි කරලා මූව නැගිට්ටවන්න යද්දී මේ බැල්ලි එනවා ඒකට හරස් කපන්න... මං උඹ ගැන බලාගන්නම්...' මංජුලා වියරුවෙන් සිතුවාය.

'අපට අපේ දරුවගේ ජීවිතේ බේරගන්න දෙන්න... මගේ කෙල්ලටනේ එයා ගැන කැක්කුම...'

මේධාගේ ඇස් කැපීගෙන මෙන් කඳුළු වැටුණි. ඇයට වචනයක් වත් කතා කර ගන්නට නොලැබිණ. ඇයට වැඩියෙන්ම දුක මංජුලාත් ඇගේ මවත් මෙසේ කියද්දී තම නැන්දම්මා බලා සිටීමය.

'අපිටත් කොහොම හරි ඕන මල්ලිගේ ජීවිතේ බේරගන්නනේ...'

සුරමංගා කීවාය. මේධා යටි තොල සපාගෙන ගලන කඳුළු වලට ගලා යන්නට දුන්නාය.

'ඇ..යි තා..ත්..තටයි සක්විතිටයි මල්ලී ගැන කැක්කුමක් නැ..ද්..ද... ආ අම්මේ... මට නැ..ද්ද... හරි අම්මා කැමති දෙයක් කරන්න... අපේ එකා ඉන්නේ ජීවිතයයි මරණයයි අතර සටනක කියන එක අම්මා අමතක කරන්නෙපා... සක්විති අම්මා බයවෙන නිසා කිව්වේ නෑ...

අපි හිතනවට වඩා එයාගේ මොළේට හානි වෙලා... සි..හිය ආ..ව..ත් එ..යා..ට මේ මඟුල් වලට ය..න්..න බෑ... හෙට මඟුල වෙනුවට මල්ලිගේ...'

කියන්නට ගිය දේ ගිලගෙන මේධා එතනින් කාමරයට ආවාය. සූරම්‍යා ඉන්නේ තීරණයක් ගත නොහැකිවය.

'මං මහත්තයට කතා කරලා බලන්නම්...'

අච්චර කියලත් මේ අම්මා තමාගේ කතාව නෑසූ බව දන් මේධා දනී. 'මං පිට ගෑණිනේ... බලමුකෝ...' ඇය තම ඇඟලුමෙන්ම තෙත මුහුණ පිසදගෙන ඇඳමත ඉඳගත්තාය.

සූරම්‍යා ගත්තේ මොරගොඩ මහතාටය.

'ම..හ..ත්..තයා මං...'

මංජුලා තව මව දෙස බැලුවේ කපටි දැසිනි. 'මේ මොරගොඩ ගෙදර උන්ව අල්ලේ නටවන්න පුළුවන්... පිටින් ආපු ගෑණු තමා අමාරු...' මංජුලාගේ මව සිතුවාය.

'ඇ..යි නෝ..නා...'

'පු..තා..ට කො..හො..ම..ද...'

'මායි ලොකු පුතයි ළඟ ඉන්..නවා... ඩොක්ටර් දනුත් කතා කළා... උ..දේට බලමු.. නෝනලා නිදගන්න...'

'මේ... සෑම්ලා ඇවිල්ලා ඉන්නේ...'

සූරම්‍යා කීවේ තරමක බියෙනි.

'ද..න් එයාලා ඔහේ මොකට එනවද... මං එයාලට කියන්න ඕන දේ කිව්වා...'

'අ..පට තනි තීරණ ගන්න බෑ මහත්තයා...'

'සූරම්‍යා... මගේ කොල්ලෝ ගැන මං තීරණ ගන්නම්... උන් ගන්න ගෑණුන්ගේ අම්මලා තාත්තලා මට වැඩක් නෑ... ද..රුවගේ මළ කඳ පෝරුව උඩින් තියන්නද ඕන...'

මොරගොඩ මහතා කීවේ වෙව්ලමිනි. මොහොතකට කලින්





මේධා කීවේ මේ කතාවය.

'අපි මේ කියන ඩො..ක්ටර්ට පෙ..න්..නුවොත්...'

'පෙ..න්..නන්න කියනවා උගේ... සූරම්‍යා මගෙන් කුණුහරුප අහගන්නෙපා... මං මුගේ තාත්තා... මං ඒකා ගැන බලාගන්නම්... තාම උගේ බාරකාරයා මම... මම මගේ ලොරි එකසිය පනහම විකුණලා මේකව පිටරට එක්ක ගිහින් හරි මේකව සනීප කරනවා... මුන්ට ගෑණු නැති උනාට කමක් නෑ... මං ගේන්නම් මුන්ට ඕන තරම් ගෑණු... මට මගේ කොල්ලව නිදහසේ සනීප කර ගන්න දෙන්න සූරම්‍යා... මං මෙච්චර දවසක් ඔය මඟුල් කරගන්න දුන්නනේ... සෑම්ලට කියන්න මඟුල කැන්සල්... ඒක එහෙමම තමයි...'

එසේ කියා මොරගොඩ මහතා දුරකථනය වැසුවේය. සූරම්‍යා දිග සුසුමක් හෙලා දුරකථනය තැබුවාය. අම්මා තාත්තගෙන් හොඳ දෙකක් අහගන්නට ඇති බව මේධා දනී.

මංජුලාත් ඇගේ මවත් පියාත් සූරම්‍යා දෙස බලා උන්නේ සැකයෙනි.

'අන්කල් කියන්නේ ඇත්ත... අ..පි ටි..කක් ඉවසමු පුතේ...'

සූරම්‍යා මංජුලා දෙසට හැරී කීවාය. ඇගේ මූළු බඩ පපුවම දවාගෙන ගියේය.

'ඇ..යි.. එතකොට හෙට...'

'ඔ..ව් මඟුල කෙරෙන්නෑ... අයියට බරපතලයිනේ දුවේ...'

මංජුලා නිවසින් පිටවූයේ වේගයෙනි. මොරගොඩ නිවසින් පිටවෙද්දී ඇයව වෙව්ලන්නට විය.

මේධා එහෙමම ඇඳට බර වූවාය. ඇගේ දෙනෙත් වලින් රහසේ මෙන් කඳුළු ගලා යන්නට විය. මහ ගෙදර ගෙවෙන අද රාත්‍රියේ මොකක්දේ තනිකමක් නොවේනම් බියක් ඇයට දනෙමින් තිබුණි. 'මම මගේ දරුවා නාමයෙන් වර්ෂා නංගියේ උඹට දිව්රලා කියනවා... මං උඹට මේ කොල්ලව අයිති කරගන්න ලොකු දෙයක් කරනවා...' මේධා සිතුවේ අඩමිනි.

# 14

"මේ කුරිරු ලෝකේ අද ඔයාට වෙන කෙනෙක්ව දෙන්න යනවා... ඒත් රත්තරන් මගේ හිත කියනවා ඔයාව අද එහෙම කාටවත් අයිති වෙන්නෑ කියලා... තව දුරටත් සදහටමත් ඔයා මගේ කියලා මගේ හිත කියනවා... ඒත් මුළු රැයක්ම මට ඔයා ගැන දැනිච්ච බය මොකක්ද... ඒක හිතාගන්න බෑ... සෑහෙන කාලයකට මට ඔයාව දකින්නවත් ලැබෙන එකක් නෑ... ඒත් අපි වෙන් වුණා කියලා මම හිතන්නෑ... ඒත් එක්වෙන්න සමහර විට මේ ආත්මෙම මට කැප කරන්න වෙයි. කමක් නෑ... මං ඔයාගේ පුතාව හදගෙන ජීවිතේ තනියම ගෙවන්නම්... අමාරුයි. ඒත් වෙන විසඳුමක් නෑ... මගේ අම්මට මූණ දෙන්න වුණා වගේ දෙයක් මට වුනේ නෑ... ඔයා මගේ හිතේ දෙවියෙක් වගේ ඉන්නවා... ඔයා ඒ මතකය අපිරිසිදු කරන්නෑ... ඒක විතරයි මට තියෙන සැනසීම...'

වර්ෂා මහා පාන්දර කොහොඹ ගහ යට වූ ලී කොටයේ වාඩි වී ඈත යාය දෙස බලාගෙන සිතුවාය. හදවතට මහා වෙනසක් දැනෙනා බව ඇත්තය. අද ඔහුගේ මංගල උළෙල බව ලෝකයම කියයි. ඔවුන් කියන්නේ අද විමුක්ති මොරගොඩ මංජුලාව කැන්දගෙන





එන බවය. අද නමයයි ගාණකට හෝ දහයයි ගාණකට මංගල නැකැත් යෙදී ඇත. එහෙත් වර්ෂාගේ සිත පමණක් එය එසේ නොවේයැයි කියයි.

'මං ආදරේ කරපු විමුක්ති කවදාවත් වෙන ගෑණියෙක්ව කැන්දගෙන එන්නෑ...'

ආදරයේ මේ පරම විශ්වාසය පමණක් මේ බඩදරු ගෑණිව ජීවත් කරවයි. පුදුමය. තාත්තා කෙනෙක් නැති දරුවෙක් බඩේ තියාගෙන එහෙම සිතාගෙන ජීවිතයට කොහොම මුහුණ දෙන්නද... එහෙත් ජීවිතය ඉදිරියේ අන් විසඳුමක් නැත්නම් මේ කුසේ නිදන දරු පැටියාව ජීවත් කරන්නට වෙන ක්‍රමයක් ඇත්ද...

ආදරය නිසා පිළිසිඳ ගත් දරුවාව ඒ ආදරය ගැන වූ විශ්වාසයෙන්ම ජීවත් කරවනවා යැයි ඇය සිතා ගත්තාය. ජීවිතයට අන් විසඳුමක් නැත. ඇත්තටම නැත.

ලබන සතියේ පමණ අලුතින් ඉදි කරන ගෙපැළට ගෙවදින්නට හද දෙන්නෙමි යැයි ඊයේ ප්‍රියංවදගේ මාමා පොරොන්දු විය. ඒ ගෙදරටත් ගිය පසු ජීවිතය නිස්කලංකය. හදවතේ අපමණව දුක් කන්දරා ගොඩ ගැසී ඇති බව ඇත්තය. එහෙත් ඒ සියල්ල දරාගෙන ජීවිතයට මුහුණ දෙමියැයි ඇය සිතාගත්තාය.

වර්ෂා අලුත් ගෙපැළ පැත්තට ගියේ යංතම් හිරු පායා එද්දීය. ඇය ගඩොල් බිත්ති අතර යමින් සෑහෙන දේ සිතුවාය. ජීවිතයේ අසරණ වූ මොහොතක මේ දුප්පත් අම්මාත් දුවත් තමාට පිහිට නොවන්නට ජීවිතයට වෙන දේ හිතාගන්නවත් නොහැක.

මේ බිත්ති කපරාරු කරන්නටම අවශ්‍ය නැත. මෙහෙම හොඳය. ජීවිතයේ කටුක ලෙස තනිවූ ගැහැණු තුන්දෙනෙකුගේ ජීවිත වලට මේ කටු බිත්ති දුකක් නොවේ. පොළොවට කටු සිමෙන්ති ටිකක් හොඳටම ඇතිය.

බඩට දැන් මාස තුනකි. තව මාස හයකින් දරුවා බිහි කරන්නට සූදානම් විය යුතුය. ඒ මාස හය ජීවිතයේ ගෙවෙන අමාරුම මාස හයක් බව වර්ෂා දනී. බලාපොරොත්තුවක් නැති අනාථ ජීවිතයක් උඩට දරුවෙක් බිහි කරද්දී අම්මා කෙනෙක් පුදුමාකාර කැප

කිරීමක් කළ යුතුය.

"ඔයා බයවෙන්නෙපා මහත්තයෝ... මම ඔයයි ඔයාගේ පැටියයි වෙනුවෙන් ඒ කැප කිරීම කරනවා..."

වර්ෂා සිතින් කීවේ ඇගේ කුස අත ගාමිනි. සායට යටින් අත දමා කුස අතගාද්දී දැස් තෙමී යන තරම් ආදරයකින් වර්ෂාගේ ළය ඇවිලෙයි.

දරුවා ලැබෙන තෙක් කෙසේ හෝ ඉවසා ඉන්නට පුළුවන. එහෙත් දරුවා ලැබුණු පසු මොනවා හෝ කළ යුතුය. ඔහුගේ දරුවාව හිඟන පැටියෙක් මෙන් හැදිය නොහැක.

වර්ෂා අලුත් ගෙපැළේ බිත්තියකට බරව මේවා සිතමින් උන්නාය. අලුත් දවසක ලා හිරු රැස් දෙරවල් නොදමූ ගෙපැලේ හිඩැස් අතරින් ඇතුළට ගලා එන්නට විය. වර්ෂා මොහොතකට දැස් පියා ගත්තාය.

"කෙල්ලේ... උඹ කො..හෙද..."

ප්‍රියංවද ආවේ හති දමාගෙනය.

"අ..නේ.. කියලවත් එන්නෙපැයි බං... උදේ පාන්දර බලද්දී ඇඳේ නෑ..."

ප්‍රියංවදගේ ඇස්වල කඳුළුය. වර්ෂා ඇගේ අතකින් අල්ලා ගත්තාය.

"ම..ම නි..කං මේ පැ..ත්..තට ආ..වා කෙල්ලේ..."

"අ..ද උඹට බ..යයි නේ..ද..."

"බ..යයි දුකයි... පත්තු වෙනවා... ඒත් ම..ට අයියව විශ්වාසයි කෙල්ලේ..."

"ඒ විශ්වාසේ හිටපං... උ..ඹට වරදින්නෑ වස්තුවේ..."

ප්‍රියංවද කීවේ වර්ෂාගේ මුහුණද අතගාය. ඒ මුහුණ තෙතය.

"ප්‍රියා..."

"කෙල්ලේ..."

"අපි ඉක්මනටම ගෙදරට එමු..."

"එනවා කෙල්ලේ... මේ සෙනසුරාදට එමු... මේ බිමට මොනවා හරි ටිකක් දාගෙන එමු..."

"ඔ..ව්.. තව ටි..ක දවසකින් මේ බඩ..."

"මට තේරෙනවා... ලෝකෙට බය වෙන්නෙපා... මං උඹව රකිනවා... ඇස්දෙක වගේ..."

වර්ෂාව ඉඹ ප්‍රියංවද කීවාය.

"ප්‍රියා..."

"ම්..."

"අද කසාදේ වෙන්නෑ කෙල්ලේ... එහෙම වෙන්න බෑ..."

"මටත් හිතෙනවා..."

"එයා කාටවත් අයිති නෑ..."

වරින් වර ඇය මෙසේ කියන්නේ තම හදවත සනසා ගන්නද නොවේනම් ඇත්තටම එසේ සිතෙන නිසාද කියා ප්‍රියංවද දන්නේ නැත.

"හවස් අතේ පන්සල පැත්තේ යන්... උඹේ හිතටත් බරයිනේ... අනික ඉතින් අපි අලුත් ගේකටත් ගෙවැදෙන්නනේ යන්නේ..."

"ය..න්.. අපි පොඩි බඩු ටිකකුත් ගමු... මං සල්ලි අරන්නේ කෙල්ලේ ආවේ..."

"අපට මේ තියෙන බඩු ඇතිනේ කෙල්ලේ..."

"ඇති ඇති... ඒ වුණාට අලුත් ගෙදරකට අලුත් හට්ටියක් මුට්ටියක් වත් තියෙන්නෙපැයි... මට පැටියට කොට් එකකුත් බලන්නෝන..."

"දන්..මම..."

"පුළු පුළුවන් වෙලාවට ඒවා කරගන්නවා..."

"උඹ තනිවෙලා කියලා හිතන්නෙපා... මං ඒවා කරන්නම්..."

"අනේ එහෙම හිතන්නෙපා ප්‍රියා... මට ආසයි.."

'නැන්ද අරම බණිද්දී මට දරුවා ගැන කියන්නත් හිතුණා...'

'එහෙම කිව්වනම් එයාලා විශ්වාස කරන්නෑ...'

'ඒ අදනේ... බලපං එන එකාගේ මූණ... විමුක්ති අයියගෙම කපාපු පලුව වෙයි...'

'එ..හෙම වෙනවනම් මාත් ආසයි... පුතෙක්... එයා වගේ...'

ප්‍රියංවද දිග සුසුමක් හෙළා ඇගේ හිස අතගෑවාය.

'යන්.. තේ එකක් ගිහින් බොමු... අද අම්මා එළකිරි ටිකක් ගෙනත්... උඹටම කියලා...'

ප්‍රියංවදත් වර්ෂාත් අලුත් ගෙපැලේ සිට ආවේ අත්වැල් පටලාගෙනමය.

*  *  *  *  *  *  *  *  *  *

විමුක්තිව විශේෂ පරීක්ෂණ කිහිපයකට උදෙන්ම ගනු ලැබීය. සිහිය නැති විටම ඒ පරීක්ෂණ කිරීම පහසු නිසා ඔහුගේ සිහිය කෘතිමව ගන්නට වෛද්‍යවරු උත්සාහ කළේ නැත.

'සල්ලි ගැන හිතන්නෙපා ඩොක්ටර්... මගේ කොල්ලව මට බේරලා දෙන්න... පුළුවන් උපරිම දේ කරන්න...'

මොරගොඩ මහතා විමුක්තිව බාරගත් වෛද්‍යවරයාට කීවේ අත් දෙක එකතු කරය. ඔහුගේ මුහුණ පුරා අසීමිත දුකක් පැතිර ගොස් තිබුණි.

'මං.. අද හවස ජැපැන් යන්න හිටියේ... මේ පේෂන්ට් වෙනුවෙන් මං ඒ ගමනත් කැන්සල් කළා... මං උපරිම උත්සාහය ගන්නවා... මට ටිකක් කල් යයි... ඒත් ළමයව බේරලා දෙන්නම්... කලබල වෙන්නෙපා...'

'නෑ ඩො..ක්..ට..ර් ම..ට කල් ගියාට කමක් නෑ... දරුවගේ ජීවිතේ...'





'මෙහෙම වෙන්න ලොකු හේතුවක් ඇති... අපි ඉස්සෙල්ලා පේෂන්ට් චෙක් කරලා බලමු...'

මොරගොඩ මහතාට සැනසීමක් දැනුනේ වෛද්‍යවරයා එසේ කියූ පසුය.

'ඩො..ක්..ටර්..'

සක්විති කතා කළේ මොරගොඩ මහතා සිටිද්දීමය.

'ඔව්.. මේ...'

'මේ මගේ මල්ලී ඩොක්ටර්...'

'ම්.. බයවෙන්පො... අපි මල්ලිව බේරගමු...'

'මෙහෙම වෙන්න ඩොක්ටර් හේතුවක් තිබ්බා... මල්ලී පහුගිය කාලේ ජීවත් වුණේ ලොකු මානසික පීඩනයකින් ඩොක්ටර්... පෙළක් වෙලාවට එයා මාව හම්බවෙන්න ඇවිත් මං ළඟ මගේ වයිෆ් ළඟ ඇඬුවා...'

මොරගොඩ මහතා තම ලොකු පුතා දෙස බලා උන්නේ තෙරපාගත් වේදනාවෙනි. මේවා මෙහෙම වූයේ ඇයිදැයි ඔහුටවත් සිතා ගත නොහැක.

'එයා මොකකින් හරි දුක් වින්ද... එහෙමද...'

'ඔව් ඩොක්ටර්... මල්ලිට එහෙම දුක් විඳලා පුරුදු නෑ... එයා හුරතලේට හැදුනේ... ප්‍රශ්න කියන ඒවා දරාගන්න ඕන කියලා එයා දන්නෑ...'

'මට තේරෙනවා... මං ඔයාට පස්සේ කතා කරන්නම්... අපි ඉස්සෙල්ලා මේ නර්විස් චෙක් කරලා ඉමු...'

සක්විති දෑස් පිසදා ගත්තේය. මොරගොඩ මහතා ඔහුගේ පිටට තට්ටු කළේ ආදරයෙනි.

උදේ සියල්ලන්ගෙන්ම විමුක්තිට වෙන් කළ රෝහල් කාමරය පිරී ගියේය. මංජුලාත් ඇගේ මවත් ආවේ වෙඩින් එක ගන්නට අවස්ථාවක් ඇත්දැයි අවසන් මොහොතේ හෝ සොයා බලන්නටය.

'මල්ලිව ඇතුළට ගත්තා අම්මේ... අද හවස් වෙනකං අපිට මල්ලිව බලන්න බෑ... දිගටම චෙකප්ස් වගයක් තියෙනවා...'

සක්විති කියද්දී සුරම්‍යා දැස් මිරිකා ගත්තාය.

'මල්ලිට සිහිය එයිද ලොකු පුතේ...'

'හ..වස එ..යිලු අ..ම්මේ...'

'ඩොක්ටර් මො..නාද කිව්වේ...'

'කො..හොම හරි මල්ලිව බේරල දෙන්නම් කිව්වා...'

මේධා ඇඬුවේ රෝහල් කාමරයේ ජනේලයක් අද්දර සිටය. උදේ පාන්දර කොල්ලාගේ මුහුණවත් බලාගන්නට බැරි වීම ඇයට මහා දුකක් විය.

'මල්ලිට මොනාත් වෙන්නෑ...'

සක්විති ඇගේ හිස අතගා කීවේය.

'මි.. මං.. උ..දේ යනවා කෝවිලට බාරයක් වෙන්න...'

'තනියම යන්නෙපා... මාත් එන්නම්...'

සක්විති කීවේ රහසින් මෙනි. ඔහු සියල්ලන් බලා සිටිද්දී මේධාගේ අතක් අල්ලාගෙනම රෝහල් කාමරයෙන් පිට විය. මොරගොඩ මහතා බිම බලාගෙන දිග සුසුමක් හෙළුවේය.

සුරම්‍යා මොරගොඩ මහතා දෙස බලා උන්නේ අන්ත අසරණ දෙනෙත් වලිනි. මොනවා වුවද සුරම්‍යා මේ පවුලට ඇගේ ජීවිතයටත් වඩා ආදරය කළාය. යම් මොහොතක මේ පවුලේ තුන් හතර දෙනා වෙනුවෙන් පණ ඉල්ලුවොත් එය පවා ඇය දෙවරක් නොසිතා දෙන තරමට ඇය ඇගේ පවුලට ආදරය කළාය. එසේ වී තිබියදී පවුලට මෙසේ හෙණයක් පාත් වූවාක් මෙන් තිබෙද්දී කාටත් වඩා බිය වූයේ ඇයය.

සුරම්‍යා තම සැමියා ගැන ඕනාවටත් වඩා දන උන්නාය. ඔහු ජීවිතයේ කරදර වලට බය කෙනෙක් නොවේ. අනන්ත කරදර එද්දී ඔහු මේ තරම් හෙල්ලුනේ නැත. වැඩිම වුණොත් ඔහු කළේ මහ රෑ එළිවන තුරු බ්‍රැන්ඩි බෝතලයක් තබාගෙන තනිවම වත්තට වී බීම





පමණි.

එහෙත් අද ඔහුගේ මුහුණෙන් පෙනෙන්නේ මහා විපතක ලකුණුය. ඔහු මේ තරම් දුකින් ඉන්නවා සුරම්‍යා කෙදිනකවත් දක නැත. ඇය සිතා උන්නේ දරුවන් දෙන්නාට වැඩියෙන්ම ආදරය කරන්නේ තමා කියාය. එහෙත් අද එය වැරදි බව සුරම්‍යා තේරුම් ගත්තාය. උන් දෙන්නාට මොරගොඩ මහතා කෙතරම් ආදරරේදැයි සුරම්‍යා හරියටම දන්නේ අදය.

ඔහුගේ බොර පාටට හැරුණු දෙනෙත් දෙස බලන්නට පවා බැරිය. සුරම්‍යා ඔහු වෙත ළං වූවාය.

'දරුවා ස..නීප වෙ..යි මහත්තයා...'

ඇය කීවේ සාරි පටින් කඳුළු පිසිමිනි. මොරගොඩ මහතා සුරම්‍යා දෙස බැලුවේ ජීවිතයේ සියල්ල අහිමි වූ පියෙක් ලෙසිනි.

'මගේ දරුවෝ මං හිතපු තරම් සැපෙන් ජීවත්වෙලා නෑ නෝනා...'

මොරගොඩ මහතා කීවේ දවියන තරම් හඬකිනි. ඔහු එහෙම කීවේ ඇයිදැයි සුරම්‍යාට තේරුම් ගියේ නැත.

'කොල්ලට අපල ඇති... ඒ..ක..යි මේ...'

'පොඩි පුතාගේ මූණ බලන්නවත් බෑ නෝනා...'

'එ..හෙ.ම කියන්නෙපා... අපේ දරුවන්ට මොනවත් වෙන්නෑ මහත්තයා...'

'මං මැරුණත් මගේ දරුවන්ට මං දුක් විඳින්න දෙන්නෑ...'

මොරගොඩ මහතා කඳුළු පිසගනිමින් කීවේ පොඩි දරුවකු සේය. සුරම්‍යා කිසිවක් කියා ගන්නට නොහැකිව ඔහු දෙස අපමණ වූ දුකකින් බලා උන්නාය.

* * * * * * * * * * *

මේධා සක්විති සමඟ ගියේ කොළඹ වැල්ලවත්තේ පිහිටි මයුරපති කෝවිලටය. විමුක්ති වෙනුවෙන් බාර වන්නට ඔහුගේ ආදරය

වෙනුවෙන් ආශිර්වාද ලබා ගන්නට වර්ෂා වැඩියෙන්ම ආවේ ගියේ මේ මයුරපති කෝවිලටය. ඇතැම් දවසක පාන්දර තේවාවට තනිවම කෝවිලට එන කෙල්ල ඉන් පසු ඒ ගමන්ම මේධා බලන්නට එන්නේ මේධාට පූජාවද රැගෙනය.

එක් දිනක් එසේ ආ දවසක කෙල්ල බුලත් කොළයක දමාගෙන ආ සින්දූර් කුඩු ඇඟිලි හතරට ගත්තාය. මේධා උන්නේ ඇඳේ වැතිරිය. ඒ දිනවල දරුවකු නැති දුකින් මේධා ජීවත් වූයේ පුදුමාකාර දුකකිනි.

"කෝ... මං සාය පහළට ටිකක් දන්නද..."

කෙල්ල අසද්දී මේධා පුදුමයෙන් ඇය දෙස බැලුවාය.

"සා..ය..."

"ම්.. ඉන්නකෝ..."

"ඇ..යි කෙල්ලේ..."

"ඉ..න්..න..කෝ ටිකක්..."

වර්ෂා මේධාගේ සාය පහළට කර ඇගේ යටි බඩේ නොවේනම් ගර්භාෂය අවට දේවාලයෙන් ගෙනා සින්දූර් කුඩා ගෑවාය. මේධා බලා උන්නේ ඇස්වල කඳුළු පුරවාගෙනය.

"ඇ..යි කෙල්ලේ මේ..."

"මං උදේ අපිට බබෙක් ගැනත් හිතුවා... එහෙම හිතලා තමා මේ උදේ පූජාවෙන් සින්දූර් ඉල්ලං ආවේ... මං බබා ගැන කිව්වම ස්වාමි තමයි කිව්වේ දරු බොක්ක ළඟ ගාන්නයි කියලා..."

එදා දවසම නාන්නෙවත් නැතුව මස් මාළු නොකා සින්දූර් කුඩු රැක්ක බව මේධාට සිහි විය.

"දවසක් මහත්තයෝ..."

මේධා කෝවිලට ගොඩ වෙද්දී ඔය කතාව සක්විතිට කීවාය.

"ප..ව්.. කොල්ලයි කෙල්ලයි දෙන්නම පව්..."

සක්විති කීවේ දුකෙනි.

"අපිට බබෙක් බඩට එන්න ඒවත් හේතු වුණානේ මහත්තයෝ...

කෙල්ලනේ ඩොක්ටර්ස්ලා ළඟට හිටං එක්ක ගියේ...'

'මට ඒවා අමතක නෑ බ..බා...'

මේධා කෝවිල දෙරකඩින් පිච්ච මල් මාල දෙකක්ම ගත්තේ උන් දෙන්නාම වෙනුවෙනි.

'දරුවෙක් බඩේ ඉන්දද්දී කාටවත් හෙණ ඉල්ලන්න හොඳ නෑ... නැත්නම් මං මංජුලා කරන්න ගිය වැඩේට ඇවිත් පොල්ම ගහනවා...'

මේධා කීවේ තරහිනි. ඔවුන් යද්දී උදේ පූජාව අවසන්ව තිබුණි. මේධා මල් මාලා දෙක මැණියන්ට පළඳවන්නට ස්වාමිට දී දෑස් පියාගෙන වැඳගත්තාය.

'උ..න් දෙන්නා එකතු කරන්න කල් ගත්තට කමක් නෑ... ඒ..ත් කවදහරි ඒ දේ කරලා දෙන්න... එදට ඒ බාරේ ඔප්පු කරන්න මං කිරි කල හතක් අරගෙන මැණියෝ ගාවට එනවා...'

මේධා පැතුවේ එයම පමණි. සක්විති ස්වාමි ගෙනා සින්දූර් කුඩු ටිකක් ඉල්ලාගෙන පහත් වී මේධාගේ නෙරා ආ කුසේ ගෑවේ වර්ෂා කළ දේ සිහිවීය. මේධාගේ දෙනෙත් අලුතින් තෙත් විය.

ඇය සක්විතිගේ අතකින් අල්ලාගෙන කෝවිල් බිමට එහායින් වූ පහන් තට්ටුවේ එළඟිතෙල් පහන් තුන හතරක්ද දල්වූවාය. ඇගේ හිතට සහනයක් ආවේ ඉන් පසුය.

'මල්ලිට මේක ගැට ගහන්න...'

මේධා කෝවිලෙන් ගත් කළු නූලක් බුලත් කොළයක ඔතා සක්විතිට දෙමින් කීවාය.

'ඇ..යි මහත්තයෝ බ..යෙ..න් වගේ...'

සක්විතිගේ මුහුණ දැක මේධා ඇසුවේ දැඩි දුකකිනි. ඔහු මේ තරම් දුකින් ඉන්නේ විමුක්ති ගැන සිතා බව මේධා දනී.

'නෑ බබා...'

'මල්ලිට මොනවත් වෙන්නෑ... මේ ඔක්කොම දෙයියන්ගේ වැඩ මහත්තයෝ... හැම දෙයක්ම හොඳ විදිහට විසඳෙයි... මගේ දරුවට

ඉන්න එකම මාමට එහෙම වෙනවද...'

මේධා ඇත්තටම කීවේ දැඩි ආත්ම විශ්වාසයකිනි.

'කා..ලා නෑ..නේ බ..බා.. මං බුරියානි බත් ටිකක් අරන් දෙන්නද...'

සක්විති ඇසුවේ මේධා වාහනයට ගොඩ කරවමිනි.

'අ..නේ ඒ..වා කො..හොම කන්නද...'

'බ..ඩ..ගි..න්..නේ ඉ..න්..නෙපා බබා...'

'ඔයත් කාලා නෑනේ ම..හ..ත්තයෝ...'

'මං මොනවා හරි කන්නම්... මං බත් එකක් ගේන්..න..ද...'

'එ..පා... මං ගෙදර ගිහින් පොල් සම්බෝල ටිකක් හදාගෙන බත් ටි..කක් කන්නම්...'

එහෙම කන්නේද දරුවා ගැන සිතාය. පෙරුම් පුරා බඩට ගත් දරුවාට මොනවත් වුවහොත් කාට නම් කියන්නද...

'එ..හෙ..නම් බි..ත්..ත..රේකුත් කන්..න...'

'ම්...'

'මං දවල්ට බත් අරන් එන්නම්...'

'ක..ම..ක් නෑ මල්ලි ගාව ඉන්න...'

සක්විති වාහනය පැදවූයේ මේධාගේ අතකින් තදින් අල්ලාගෙනය. ඔහු ඉන්නේ තමාටත් වඩා දුකක් පපුවේ තබාගෙන බව මේධා දනී.





# 15

උදේ දහය පහුවෙද්දී මංගල උත්සවය ගැන තොරතුරු විමසා මංජුලාගේ නිවසට දුරකථන ඇමතුම් එක දිගට ගලා එන්නට විය. ඒ ඇමතුමකට පිළිතුරු දෙන වාරයක් වාරයක් පාසා මංජුලාව අලුතින් දැවෙන්නට විය.

'විමුක්ති මොරගොඩ කියන එකාව මං කවදාහරි හිභන අනාථයෙක් කරනවා... ඕකවයි ඔය පවුලේ උන්වයි දවසක මං පාරටම බස්සනවා...'

මංජුලා කෑ ගැසුවාය. ඇය හැසිරුණේ වියරුවෙන් මෙනි.

'බැඳලා ටිකකින් මූට මේ ටික උනානම් ඉවරයි... එහෙනම් මං මූට මැරිලා යන්නම මොනවා හරි පොවනවා...'

එවැනි පව්කාර සිතුවිලි වලින් මංජුලාගේ ළය පිරී ගියේය. වෙඩින් එක කැන්සල් කළේ ඇයිදැයි බොහෝ දෙනා අසද්දී මංජුලාගේ ලේ කකියන්නට විය.

'බලමු... විමුක්ති මොරගොඩ... මං උඹව අතාරින්නෑ...'

'මොන දේ උනත් මහ ගෑණිව අත්අරින්න තරකයි...' කවදාහෝ

දවසක මේ සටනේ ජයග්‍රහණය පවතින්නේ සුරම්‍යාගේ කැමැත්ත උඩ බව මංජුලා දන උන්නාය. 'ඒ ගෑණිට අර බැල්ලිව පෙන්නන්න බෑ... ලොකු ලේලිවත් වැඩියම අල්ලන්නෑ ගෑණිට... මං කරන්නම් උන් දෙන්නටම හොඳ වැඩක්...'

සියල්ලටම පෙර වර්ෂා ඉන්නා තැනක් දන ගත යුතු යැයි මංජුලා සිතා ගත්තාය. මේ විවාහයට ඇති ලොකුම බාධකය ඇයය. ඇය වැනි කෙල්ලක්ව තම පාරෙන් ඉවත් කිරීම ඒ තරම් අමාරු දෙයක් නොවේ යැයි මංජුලාට සිතුණි.

'අ..ම්මේ...'

මංජුලා කාමරයට වී බලාගත් අත බලා උන් අම්මාගේ උරතලයට අත තබා ඇඳ මත ඉඳ ගත්තාය.

'තාත්තටත් පිස්සු හැදිලා වගේ...'

මංජුලා අම්මා දෙස බලා උන්නේ නොහඬාය.

'ඔයා කැමති තීරණයක් දන් ගන්න... කැමති නම් සිංගප්පූ යන්න.. කාලයක් එහේ යන්න ආසයි කිව්වනේ... ගිහින් කැමති කාලයක් ඉන්න...'

අම්මා මෙසේ කියන්නේ දුකට බව මංජුලා දනී. විමුක්ති සමඟ ගිවිස ගන්නට ප්‍රථම මංජුලා සිතා උන්නේ සිංගප්පූරුවේ රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යන ඇගේ හොඳම මිතුරිය වූ ෂෙනෙල් සමඟ එක්වන්නටය. එහෙත් ඒ තීරණය පසෙක දමා තාත්තා ගෙන ආ යෝජනාවට මංජුලා කැමති වූයේ ව්‍යාපාර වලින් ඒ තරමටම පාඩු ලබමින් තිබූ නිසාය. කවර තත්වයක් යටතේ වත් ඒවා නවත්වන්නට ඇය කැමති වූයේ නැත.

'ඔය සල්ලි පෙන්නන සල්ලිකාරයන්ට වඩා මොරගොඩලට සල්ලි තියෙනවා.. ළඟදි නුගේගොඩින් ගත්තා අක්කරයක ඉඩමක්... ඒක කෝටි ගාණක් වෙනවා..'

එද තාත්තා කියූ කතාව මංජුලාට මතක් විය.

'අම්මේ...'





'ම්...'

'මට සිංගප්පූ යන්න ඕනේ නෑ... මට මාස තුන හතරක් දෙන්න... මං මේ ප්‍රශ්න ඔක්කොම ලස්සනට විසඳන්නම්... මං මොරගොඩ ගෙදරට යනවා... සමහර විට හෙට අනිද්දා මං එහේ නවතියි... මං කවදහරි ඒ ගෙදරින් එළියට එන්නේ මොරගොඩලව පාරට බස්සලා... තාත්තට කියන්න බයවෙන්නෙපා කියලා... එක ගාමන්ට් එකක් හරි අපි බේරගමු... මං ගේන්නම් සල්ලි...'

මංජුලාගේ මව මංජුලා දෙස බලා උන්නේ පුදුමයෙනි. ඇයට වෙලාව බැලුනි. හරි නම් මේ වෙලාවේදී තම දුව පෝරුවේය. එවැනි තත්වයක් ගිලිහී ගිය පසුත් මෙසේ කිව හැක්කේ තමාගේ දුව වැනි පුදුමාකාර දුර්ලබ ගණයේ දුවෙක්ට බව ඇය දන උන්නාය.

'දැ..නුයි වස්තුවේ මගේ ඇ..හට ලේ ටිකක් ඉනුවේ...'

මංජුලා සිනාසුණාය. ඒ සිනහව වෛරයත් කපටිකමත් එකට කැටි කළ සිනහවකි.

'විමුක්තිට ඉක්මනට සනීප නොවන තරමට හොඳයි... ඌ සදකාලික පිස්සෙක් කරනවා මම...'

'මාත් හරි අසරණවෙලා පැටියෝ හිටියේ...'

'ම..ට අද හරි දුකයි අම්මේ... ජීවිතේ කවදවත් මට මෙහෙම දෙයක් වෙලා නෑ... ම..ට ටිකක් රිලැක්ස් වෙන්න ඕන... මං කොළඹින් ටිකක් එළියට යනවා... හෙට එන්නම්...'

ඇය කිසිවක් කීවේ නැත.

'සුරම්‍යා එ..හෙම හෙව්වොත්...'

මංජුලා සිනාසුණාය.

'විමුක්තිට බාර වෙන්න මං නෑ කෙනෙක් එක්ක දළඳා මාළිගාවට ගියා කියන්න...'

මංජුලා සිනාසෙමින් කියූවේ අම්මාට හාදුවක් දෙමිනි.

'මං පීසා එකක් ඕඩර් කළා... ඔයා ඒක කන්න... මේ දුව

ඉන්නකල් බයවෙන්නෙපා...'

මංජුලා කීවේ දැඩි අධිෂ්ඨානයකිනි.

*   *   *   *   *   *   *   *   *   *   *

මොරගොඩ මහතා රෝහලින් පිටතට ආවේ මළකඳක් මෙනි. ඔහුට ජීවිතයේ කෙදිනකවත් මේ තරම් හිස් බවක් දනී නැත. ගෙදර යන්නට වත් ඔහුට හිතක් තිබුනේ නැත.

'ලොකු ම..හ..ත්..ත..යෝ... ගෙදරද අපි යන්නේ...'

ධනසිරි ඇසුවේ හෙමිහිටය. ඔහු ඉන්නේ දරුණු වේදනාවකින් බව ධනසිරි තේරුම් ගෙන උන්නේය.

'ඕ..හොමම නාවලට යන් ධනසිරි...'

එසේ කියා මොරගොඩ මහතා ආසනයට බරවී දෑස් පියා ගත්තේය. ඔහුගේ පියවී ගිය දෑස් යට කඳුළු ඇති බව ධනසිරි දැන උන්නේය.

'පු..ංචි මහත්තයට මුකුත් වෙන්නෑ ලොකු මහත්තයා...'

ධනසිරි කීවේ ඔහු දෙස බලා ඉන්නට බැරුවය.

'ධනසිරි...'

'ලොකු මහත්තයා...'

'නංගිගේ කෙල්ල ගැන ආරංචියක් නැද්ද...'

මොරගොඩ මහතා ඇසුවේ දෑස් පියාගෙනමය. ධනසිරි ඊයේ සිදුවූ දේ කියම්දේ නොකියම්දේයි සිතමින් ටික වේලාවක් උන්නේය. එක අතකට මේ සිදුවූ දේවල් වල හැටියට ඔහු මේය දැනගත්තාට කම් නැත.

'ලො..කු මහත්තයා මේ...'

'දන්න දෙයක් තියෙනවනම් කියපං බං... ඔක්කොම උනාට පස්සේ උඹලා ඔක්කොම කියන්නේ...'

'වර්ෂා නංගී ඊයේ හවස...'





'ඉතින්...'

'නෑ ලොකු මහත්තයා වර්ෂා නංගී ඊයේ හවස මහගෙදරට ඇ..වි..ත් තියෙනවා...'

මොරගොඩ මහතා දෑස් ඇර ධනසිරි දෙස බැලුවේ පුදුමයෙනි.

'ඊ..යේ හැන්දෑවේ...'

'ඔ..ව් අ..නේ කලබලයක් මොනවත් කරන්න නෙමේ ලොකු මහත්තයා... බ..දි..න්න කලින් අපේ පු..ංචි ම..හ..ත්..ත...ය..ව බලලා ය..න්..න...'

මොරගොඩ මහතා කතා නොකර ධනසිරි දෙස බලා උන්නේය.

'ඉ..ති..න්...'

'එ..න්..න දු..න් නෑ...'

'මොනාද වුණේ ධනසිරි...'

'ලො..කු නෝ..නා ලොකු මහත්තයා කෙල්ලව පැ..න්..නුවා...'

මොරගොඩ මහතා එහෙමම බිමට නෙත් බර කර ගත්තේය. 'උ..ඹේ කෙල්ලට අන්තිමට ම..ගේ ගෙ..ටවත් එන්න බැරි වුණා...' මොරගොඩ මහතා සිතින් නාලිනීට කීවේය.

'විමුක්ති වර්ෂට හම්බවුණාද...'

'අ..නේ නෑ ලොකු මහත්තයා... මට ලැබෙන්න ඉන්න දරුවා පල්ලා... ඒ කෙල්ල එ..හෙම දෙයක් කළේ නෑ.... වෙ..න කෙ..නෙකුට අයිති වෙනවනේ කියලා හිතලා බ..ලලා ය..න්..න ඇවිත් තියෙන්..නේ...'

මොරගොඩ මහතා ඉන් පසු කතා කළේ නැත. මේ සිදුවෙන කරදර වල නිමක් නැත. මොකක්දේ ලොකු විපතක පෙර නිමිති මතුවී ඇතැයි මොරගොඩ මහතාට පෙනුණි.

'ධනසිරි...'

'ලොකු මහත්තයා...'

'ලොකු පුතාලගේ ගෙදරට යන්...'

ධනසිරි යළි වාහනය නුගේගොඩින් හරවා සක්විතිගේ ගෙවල් පාරට දම්මේය. වාහනය පාරට දමද්දී නිවසේ ගේට්ටුව ඇරියේ ගෙදර වැඩට ඉන්නා දෙමළ පිරිමි ළමයා වූ මුත්තුය.

"කෝ කොලුවෝ නෝනා..."

"ලොකු ම..හත්තයා නෝනා ඇතුලේ..."

මොරගොඩ මහතා ගෙට ඇතුල් වූයේ වෙහෙස බර මුහුණිනි. සාලයේ මේධා පෙනෙන්නට උන්නේ නැත. ඔහු එහෙමම කෑම කාමරය හරහා කුස්සියට ගියේ ඇය එහි ඇත්දැයි බලන්නටය. යද්දී දුටු දසුනින් මොරගොඩ මහතාගේ පපුව උණු වී ගියේය. මේධා කුස්සියේ කුඩා මේසයේ වාඩිවී ඇණු සම්බෝල ටිකක් පිඟානකට දමාගෙන රෝස් පාන් ගෙඩියක් කමින් උන්නාය. එකවර කුස්සියට ඇතුළු වූ මොරගොඩ මහතාව දක මේධා කලබලයෙන් කමින් උන් පිඟාන වසා නැඟිට්ටාය.

"තා..ත්..තේ..."

මොරගොඩ මහතා කතා නොකරම ඇය දෙස බලා උන්නාය. තමා කකා උන් දෙය ඔහු දකින්නට ඇති බව මේධා දනී.

"ද..රුවෙක් බ..ඩේ තියාගෙන ඕ..හොම ක..න..වද දරුවෝ..."

මොරගොඩ මහතාගේ බොඳවූ දෑස් දක මේධාගේද පපුව උණු විය.

"අ..නේ නෑ තා..ත්..තේ මං මේ හ..දිස්..සියට පා..න් පෙත්තක් කෑ..වේ..."

මොරගොඩ මහතා කුස්සියේ කුඩා මේසයේ පුටුවක් ඇදගෙන එහි වාඩි විය.

"මං හිතාගෙන හිටියේ මගේ දරුවෝ හොඳට සැප විඳිනවා කියලා..."

මොරගොඩ මහතා උදේ සුරම්‍යාට කියූ දේ යළිත් මේධාටද කීවේය.

"අ..නේ තා..ත්..තේ මේ මොනාද කියන්..නේ... එ..හෙ..ම දු..ක්

විඳින්නෑ තා..ත්..තේ.. අ..පි..'

ඔහු දෙනෙත් එසෙව්වේය.

'දන් මල්ලි විඳින්නේ සැපක්ද...'

ඔහුගේ කතාවට මේධාගේ දෑස් උණුවී වැගිරෙන්නට විය.

'එ..යා හින්ද තමා මේ ගින්දර... එ..යා දුක් විඳිද්දී අ..පි බ..ත් ක..ට..ක් ක..න්නේ කොහොමද තා..ත්..තේ.. ප..ව්...'

මේධා පහත්වී කඳුළු පිසදගත්තේ අමාරුවෙනි.

'තා..ත්..ත කාලා නෑ නේ..ද තා..ත්..තේ...'

ඔහු සිනාසුනා පමණි.

'මං බත් උයලා තියෙන්නේ තා..ත්..තේ.. ටක් ගාලා හොදි මාළුවක් හදන්නම්...'

'පොල් සම්බෝල ටිකක් හදන්න පුතේ ඇති...'

මේධාගේ දෑස් යළි තෙත්විය. ඇය මේ තාත්තල පුතාලගේ හිත් ගැන හොඳට දන උන්නාය. මේධා ඉක්මනින් පොල් සම්බෝලයක් හද බිත්තරයක් බැද්දය.

'මේ ප්‍රශ්න කොහොම විසඳන්නද කියලා මට තේරෙන්නෑ පුතේ...'

මොරගොඩ මහතා කීවේ මේධා බෙද දුන් බතුත් පොල් සම්බෝලත් කමිනි. ඔහුටද ඊයේ රෑ සිට කෑමක් නැති බව මේධා දනී.

'ම..ටත් තේරෙන්නෑ තාත්තේ... මල්ලි ගැන ම..ටත් හරියට දුකයි...'

'අ..ර කෙල්ල පුතාටවත් කතා කරන්නේ නැද්ද...'

ඔහු අසන්නේ වර්ෂා ගැන බව මේධා දනී.

'කො..හේ ඉන්නවද... කො..හො..ම ජීවත් වෙ..නවද කියලා ද..න්නෑ තා..ත්..තේ...'

'නාලිනීත් මට ඉන්න තැනක ඉඳන් දෙස් කියනවා ඇති...'

'නෑ තා..ත්..තේ... නාලිනී නැන්දවත් කෙල්ලවත් තාත්තට දෙස් කියන්නෑ...'

ඔහු බත් එක කෑවේ පොඩි දරුවකු සේය.

'ඔයා මේ ප්‍රශ්න ගැන හිතන්න යන්නෙපා... දරුවා ගැන හිතන්න... ඒ දරුවවත් අපේ පවුලට වාසනාව අරගෙන එයි...'

'ල..බ..න මාසෙට දින දීලා තියෙන්නේ තා..ත්..තේ...'

'පරිස්සම් වෙන්න පුතේ...'

මේධා හිස වැනුවාය. මොරගොඩ මහතා තම ලේලිය දෙස බලා උන්නේ ආදරයෙනි.





# 16

වර්ෂාගේ දෙනෙත් සැන්දෑවේ පියවී ගියේ ඉබේටම මෙනි. වේල් දෙක තුනක් හරියට කෑමක් නොගත් නිසාත් හදවතේ වූ අප්‍රමාණ බර ගතිය නිසාත් ඇගේ දෙනෙත් ඇදේ ඇලවූ සැනින් ඉබේටම මෙන් පියවී ගියේය.

ඒ කෙටි නින්ද අතරමැදදී වර්ෂා අම්මාව සිහිනෙන් දක්කාය. නාලනී වර්ෂාගේ අතින් අල්ලාගෙන ගියේ පිටිසරබද ගුරු පාරක් මැදිනි. පසුව විශාල කුඹුරු යායක් අසළ පිහිටි පොල් අතු සෙවිලි කළ ගෙයකට නාලිනී වර්ෂාව කැටුව ගියාය.

ඒ ගෙපැලේ වූ කුඩා ඇඳක වර්ෂාව ඉන්දවූ නාලිනී කෙල්ලගේ අතකින් අල්ලාගෙනම ඇයව පපුවට තුරුල් කර ගත්තාය. වර්ෂා ඉකි බිඳ බිඳ අම්මට තුරුල් වී ඇඬුවාය.

'අ..ද අ..යි..යා අ..ම්මේ...'

'මං දන්නවා පුතේ... ඔයා කියන්න යන්නේ චූටි මහත්තයා අද බඳිනවා කියලා නේද...'

වර්ෂා අඬමින්ම හිස වැනුවාය.

'එ..යා ම..ගේ අ..ම්මේ... ම..ගේ බ..ඩේ ඉ..න්..න දරුවගේ තා..ත්..තා...'

නාලිනී කෙල්ලගේ හිස අතගෑවේ පුදුමාකාර ලෙසිනි. ඇය දහ දෙළොස් වතාවක් පමණ කෙල්ලව ඉම්බාය.

'චූටි මහත්තයා ඔයාගෙම තමා පු..තේ...'

'ඒ..ත් අ..ම්මෙ නැන්ද..ලා...'

එවර නාලිනී පුදුමාකාර සිනාවක් පෑවාය.

'එ..හෙම වෙන්නෑ... දවසක අයියා ඔයා ගාවට එනවා... එතකල් ඉන්..න...'

'ඒත් අම්මෙ එයා...'

'මං කිව්වනේ මැණික චූටි මහත්තයා අයිති ඔයාට... ඔයාගේ මේ බඩේ ඉන්න පැටියට...'

'ඕ..ඕ..ය ඇ..ත්..ත..ම...ද අම්මේ...'

'මැණික බයවෙන්නෙපා... ටිකක් කල් යයි... ඒත් චූටි මහත්තයා එනවා...'

'ම.. ම..ගේ දෙ..යි..යෝ ගැ..න දන්නවා අම්මේ... එයා ම..ට එ..හෙම කරන්නෑ...'

'ඔව්... එයා එහෙම කරන්නෑ... අපිට අපේ චූටි මහත්තයව ඉක්මනටම ලැබෙයි...'

නාලනී වර්ෂාගේ ඇඳිවත යටින් අත දමා ඇය අතගෑවාය.

'මං එයත් එක්ක මේ දවස්වල කතා කරනවා...'

'ම..ගේ පැටියා එක්ක...'

වර්ෂා ඇසුවේ පුදුමයෙනි.

'ම්... එයාගේ තාත්තා වගේම හුරතල් කොලු පැටියෙක් ඉන්නේ... හරි ලස්සනයි...'

'අ..නේ මගේ...'





වර්ෂා නාලිනීගේ පපුවම බද ගත්තාය.

'ම..ට ම..ගේ දරුවවයි අයියවයි රැකලා දෙන්න අ..ම්මේ...'

'මං ඔයලා තුන් දෙනාවම රකිනවා පු..තේ...'

අම්මාගේ පපුවේ උණුසුම තවත් ලබන්නට මෙන් වර්ෂා ඇගේ පපුවට තවත් ළං වූවාය.

'ඇයි පුතේ නොකා ඉ..න්..නේ...'

'මං කො..හො..ම..ද අ..ම්මෙ කන්..නේ...'

'මං ඉන්නවනේ පුතේ මේවා බලාගන්න... ඔයා දරුවා වෙනුවෙන් කාලා බීලා ඉන්..න...'

'ඔයාගේ...'

'ඉතින්...'

'අ..ර මුරුංගා කිරි හොද්දයි... කීරමින් බැදුමයි කො..ස් මැල්ලුමයි එක්ක බත් ක..න්න හරි ආසයි...'

වර්ෂා එය කියූ පසු නාලනී ඇයව තුරුල් කරගෙන සෑහෙන වේලාවක් ඇඬුවාය.

'ළඟදි දවසක...'

'ඉතින්...'

'ක..වු..රු හරි කෙනෙක් එයි මගේ මැණික ඉන්න තැනට...'

'ඇ..වි..ත්...'

'මගේ මැණිකට බත් එකක් දීලා යයි... ඒක කන්න...'

'අ..නේ.. ම.. ම...ට...'

වර්ෂා ඇඬුවාය. සෑහෙන වේලා ඇඬුවාය. ඇය නින්දෙන් නැගිට්ටේද අඬාගෙනමය. ප්‍රියංවද දූවගෙන ආවේ ඒ හඬටය. ඇය දුවගෙන විත් ඇඳ මත වාඩිවී කෙල්ලගේ අතක් අල්ලා ගත්තාය.

'ඇයි කෙ..ල්..ලේ...'

වර්ෂා දුටු සිහිනය අකුරක් නෑර කීවාය.

'නාලනී නැන්ද හීනෙන් හරි ඇවිත් උඹට මෙහෙම කිව්ව එක හොඳයි... අයියා කාටවත් අයිති නෑ තමයි කෙල්ලේ...'

'කො..හො..ම හි..තා..ග..න්..න..ද ප්‍රියා...'

'එ..හෙම වෙන්නෑ... ඒ ටික විතරක් හිතලා ජීවත් වෙයන්...'

වර්ෂා ප්‍රියංවද දෙසම බලා උන්නාය.

'නො..කා... ඉ..න්..න එකටත් බැන්නා...'

'ඒකනේ.. ද..න්..වත් ක..මු කෙල්ලේ...'

'කෑම එක..ක් අරන් ක..වුරු හරි එයිද ප්‍රියා...'

'හෙට අනිද්දම එයි...'

වර්ෂාට මේ කිසිවක් පුදුම නැත. අම්මාත් තමාත් එකටබැඳී ජීවත් වූ විදිහට ඇය එහෙමම තමාව දමා යන්නේ නැත. අලුත් ආත්මයකට පවා නොගොස් ඇය මෙසේ තමා වටා සැරි සරන්නේ තම ජීවිතයට සැනසීමක් ලැබෙන තුරු බව වර්ෂා දනී.

'ඒ..ත් ප්‍රියා... මංජුලා... අ..ද වෙඩින් එ..ක.. ඒවා...'

'අපි ඒවා හිතන්න ඕන නෑ.. අයියා උඹේ... උඹට එච්චරම නේද ඕන...'

'ම්... එ..හෙම නැ..ත්..න..ම් කො..හො..මද ප්‍රියා ජී..ව..ත් වෙ..න්..නේ...'

ප්‍රියංවද කිසිවක් නොකියා සෑහෙන වේලාවක් වර්ෂා දෙස බලා උන්නාය.

*     *     *     *     *     *     *     *     *     *     *

මංජුලා ඇගේ මිතුරියක වූ ආශා සමඟ මාරවිල ගියේ සෑහෙන දේවල් හිතන්නට සිතාගෙනය. ජීවිතයේ ප්‍රථම වරට ජීවිතය සමඟ ඕනවට වඩා සෙල්ලම් නොකළ යුතු යැයි මංජුලා අද සිතා ගත්තාය. සියල්ල කළ යුත්තේ කල්පනාවෙනි.





අම්මාත් තාත්තාත් දෙන්නාම කියන්නේ ඇත්තය. මොරගොඩලා එහෙම ලේසියෙන් අත්හැර දමිය හැකි අය නොවේ. විමුක්ති මොනවා කළද මේ විවාහයට සුරම්‍යා අකමැති නැත. ඒ නිසා ඒ කැමැත්තෙන් ඕනවටත් වඩා ප්‍රයෝජන ගත හැක.

ඇය ආශාව මේ ගමනට එක් කර ගත්තේ ඇය මංජුලාගේ ජීවිතයට සමීපම මිතුරිය නිසාය. ජීවිතයේ හැම දෙයක්ම හෘදයාංගමව කතා කළ හැක්කේ ඇය සමඟ පමණි. එහෙත් මීගමු පාරේ වත්තලට එනතෙක් මංජුලා වදනක් වත් කතා කළේ නැත. ඇය රිය පැදවූයේ බර කල්පනාවකය.

ආශා ඇයට බාධා කළේ නැත. වරින් වර මංජුලා දිග සුසුම් හෙළද්දී ආශා තම මිතුරිය ගැන ඇත්තටම දුක් වූවාය.

'මංජු...'

වත්තල නගරය පසු වෙද්දී ආශා සෑහෙන තරම් ආදරයකින් මංජුලාගේ වමතට සුරත තබා කතා කළාය.

'සොරි.. ආශා...'

මංජුලා දුක්බර ලෙස සිනාසුණාය.

'ටේක් ඊට් ඊසි කෙල්ලේ...'

'මා..ව අද පිච්චෙන දවසක් බං... ඇත්තටම පිච්චෙනවා... මොනවා වුණත් අද මගේ වෙඩින් එක ගන්න තිබ්බ දවස... ඒක සිද්ධ වුණානම් අද...'

'ඒක සීරියස් ගන්නෙපා මංජු...'

'නෑ ආශා... මට මේ මොරගොඩලා එක්ක මරාගෙන මැරෙන්න කේන්තියි... අද ගෙදරට කෝල්ස් එද්දි මායි අම්මයි ෆෝන් එක ගලවලා දම්මා... මොබයිල් ඕෆ් කළා... ෂිහ්...'

මංජුලා කතා කළේ ආවේගයෙනි.

'මට ගොඩක් දේවල් නැතිවෙනවා දකින්න මං ආස නෑ බං...'

'ම..ට තේරෙන්නෑ මංජු... තේරෙන්න කියපන්... මං උඹට උදව් කරන්නැද්ද...'

මංජුලා තම මිතුරියගේ සුරත වතම මතට දම්මාය.

'ම..ට උදව් කරපන් ආශා... මට විමුක්තිව බඳින්න ඕන... එක පැයකට හරි... ඊට පස්සේ මං උගේ ජීවිතේ අපායක් කරනවා... අපායක්... මං ඌට ඌවම එපා කරවනවා...'

'ඒක අ..ද වෙන්නනේ ගියේ බං...'

'ඔ..ව්.. මොකක් හරි වුණා... ආයෙත් එහෙම දෙයක් වෙන්න මං ඉඩ තියන්නෑ...'

ආශා මංජුලා දෙස බලාගෙන සිනාසුණාය.

'උඹට ඒක ලේසියෙන්ම කරන්න පුළුවන්... උඹට ඔය විමුක්තිව බැඳගන්න බැරි නම් කාටවත් බෑ...'

'තැන්ක්ස්... මං ඒක කොහොම හරි කරනවා බං...'

මංජුලාගේ මුහුණේ වූයේ වියරු කුරිරු බවකි. තමාගේ ජීවිතයේ සතුට නැති කරන අයට ජීවිතයේ කවදක වත් සතුටක් විඳින්නට බැරි වන ලෙස උන්ගේ ජීවිත විනාශ කරන බවට මංජුලා තමාටම සහතික වූවාය.

'සොරි කෙල්ලේ... මං උඹව දගෙන ඇවිත් මේවා කියවනවා... අපි මාරවිල ක්ලබ් ෆාම් එකට ගිහින් හොඳට ජොලියක් දමු...'

'උඹ බයවෙන්නෙපා... මං උඹත් එක්ක ඉන්නවා...'

මංජුලා සැනසුම් සුසුමක් හෙළුවාය. ජීවිතේ මොන කරදර ආවත් සතුටින් ඒ ප්‍රශ්න වලට මුහුණ දෙනවා යැයි ඇය දැඩිව සිතා ගත්තාය.





# 17

**සක්විති** රෝහලේ දැඩි සත්කාර ඒකකය අසළ නොනිදා පහන් කළේය. කොයි මොහොතක හෝ විමුක්තිට සිහිය ඒ යැයි ඔහු බලා උන්නේය. එහෙත් රාත්‍රී අට වන තුරුත් විමුක්තිගේ සිහිය ආවේ නැත.

සක්විතිට උණ ගන්නට මෙන් විය. ලස්සනට තිබූ කොල්ලාගේ ජීවිතයට මේ හිටි හැටියේ වූයේ කුමක්දැයි ඔහුට හිතාගන්නට පවා බැරි විය.

විමුක්තිගේ ස්නායු පද්ධතියේ සෛල කිහිපයකට හානි වී ඇතැයි ප්‍රධාන වෛද්‍යවරයා කී කතාව සක්විති කිසිවෙකුටවත් කීවේ නැත. මේ තිබෙන තත්වයේ හැටියට ඒ කතාව දරාගෙන ඉන්නවා ඇරෙන්නට කිසිවෙකුට වත් කිව නොහැක.

මල්ලිගේ ජීවිතය ඇත්තේ අවධානම් අඩියක බව සක්විති දන උන්නේය. ඔහුගේ ජීවිතයට අනතුරක් වුවහොත් කාටවත් සතුටක් නැත.

සක්විතිට වර්ෂාව සිහිවිය... මෙවන් මොහොතක ඇය උන්නානම් තමාත් සමඟ රැය පහන් කරන්නේ කෙල්ලය. මල්ලීගේ ජීවිතය

කෙල්ලට ලැබුණා නම් මේ කිසිදු දුකක් නැත. කොල්ලාට මෙහෙම වන්නේද නැත. මේ තරම් විනාශයක් වෙන්නට පෙර මීට වඩා මල්ලීගේ ප්‍රශ්නයට මැදිහත් වෙන්නට තිබ්බායැයි සක්විතිට සිතුණි.

මේධා සක්විතිට කතා කළේ ඒ මොහොතේය.

‘බබා...’

‘ම..හ..ත්..ත..යො මල්ලිට සිහිය...’

‘තව නෑ බබා... මාත් බලං ඉන්නවා...’

‘අ..නේ දෙයියනේ...’

‘බයවෙන්නෙපා... ඩොක්ටර් කිව්වනේ සිහිය ලැබෙන එක පරක්කු වෙයි කියලා...’

‘ඒත්...’

‘දෙයියන්ට හැම දේම බාර කරමු...’

මේධා එහා පැත්තේ සිට අඬන හඬ සක්විතිට ඇසුණි. ඇය තම මස්සිනාට කොතරම් ආදරය කළාදැයි සක්විති දන උන්නේය.

‘මල්ලිට මොනාත් වෙන්නෑ බබා...’

‘ම්.. මං හවසත් බාරයක් වුණා...’

‘බබා කෑවද...’

‘න..ව නෑ...’

‘ඉතින් බලන්න... අපේ දරුවා බඩේ බබා...’

‘මං කන්නම්... ඔ..යා මො..නාද කන්නේ...’

‘මං ද..න් තේකක් බිව්වා...’

‘මං ගැන හිතන්නෙපා... මල්ලි ගාව ඉන්න... රෑ පැයෙන් පැයට මට කෝල් කරන්න.. නැත්නම් බයයි...’

සක්විති ඇඟිලි තුඩින් නළලත තද කර ගත්තේය. ජීවිතය මේ තරමටම දුකක් වූයේ ඇයි...

‘බ..බා...’





‘ම්...’

‘කෙල්ල කොහෙද දන්නෑ නේද...’

‘ඇයි...’

‘අපිට ඕන වෙයි...’

‘ඒත්...’

‘මල්ලිට ලොකු අමාරුවක්ද තියෙන්නේ...’

සක්විති මොහොතක් කතා නොකර උන්නේය.

‘සනීප වෙන්න කල් යයි... අපි කොල්ලව බලා ගන්න ඕන...’

‘මං දන්නවා... කෙල්ල කොහේ ඉන්නවද කියලා කවුද දන්නේ... දෙවෙනි පාරටත් ඒකිට ගහලා පන්නලනේ...’

වර්ෂා නොපෙනීම යන්නට ඇතැයි සක්විතිට සිතුණි. ඇය නොපෙනීම යන්නට ඇත.

*   *   *   *   *   *   *   *   *   *

වර්ෂාට මහ රෑ නින්ද ගියේ නැත. නින්ද යාගෙන මෙන් එද්දී ඇයට ඇහැරිණි.

‘ඔ..යා කොහේ හරි දුක් විඳිනවයි කියලා මට හිතෙනවා... ම..ට එහෙම හිතෙන්නේ ඇ..යි... එහෙමම හිතෙන්නේ ඇයි...’

මේ දැනෙන හැඟීම පුදුමාකාර යැයි ඇයට සිතුණි. අද විමුක්තිගේ විවාහය සිදු වූවාද... එසේ සිදු වූවා නම් අද ඔහුත් මංජුලාත් සිටින්නේ මධුසමයේ නොවේද...

එහෙම සිතද්දීත් වර්ෂාගේ ළය දහ දෙළොස් කඩකට කැඩී යන්නට විය. එවැනි දෙයක් සිදුවෙනවා නම් අම්මා හීනෙන් විත් අරම කියන්නේ නැත.

එහෙත් ඒ තරම් උත්සවාකාරයෙන් අද පවත්වන්නට දගෙන තිබූ මඟුල නොකෙරුණා යැයි කොහොම සිතන්නද... විමුක්ති ඒ

ප්‍රශ්නයට කොහොම මුහුණ දුන්නේද...

වර්ෂා ඇඳමත ඉඳගෙන දහ අතේ කල්පනා කළාය. අද රාත්‍රිය ජීවිතයේ උදවූ ගෙවා දමන්නට අසීරුම රැයක් යැයි වර්ෂාට සිතුණි.

ඒ මොහොතේදී වර්ෂාගේ කුසේ වැඩෙනා දරුවා ප්‍රථම වරට දඟලුවේය... වර්ෂාට පුදුම සිතුණි. මාස තුන පැන්නා පමණි. ඔහු බඩේ සිට දඟලන්නේ කෙසේද... වර්ෂා අඩමින් දෑතම කුසට තබා ගත්තාය. 'අ..නේ ඔයාගේ අ..ම්මයි තාත්තයි දුක් විඳිනවා ඔයාට දනුණද පැටියෝ... තාත්තිත් කොහේ හරි ඉඳන් දුක් විඳිනවා වගේ මට දැනෙනවා... ඔයාටත් එ..හෙම දැනෙනවද...' වර්ෂා පිරිමදින්නට පිරිමදින්නට ඔහුගේ දඟලීම වැඩි විය.

'අ..නේ ඉක්මනට ඔයාගේ මූණ බලන්න පුළුවන්නම්...' වර්ෂා ඇඬුවේ ඇස් මිරිකාගෙනය.

'අදින් පස්සේ මේ මොන දුක තිබ්බත් මට ඔයා වෙනුවෙන් මේ දුක දරාගෙන ජීවත් වෙන්න වෙයි... දවසක ඔයාගේ තාත්තා එනවා කියලා ආච්චිත් අම්මිට ඇවිත් කිව්වා... එහෙම එන දකට මං ඔයාව මලක් වගේ එයාට පෙන්නන්න ඕන...'

වර්ෂා එහෙමම දෑස් පියාගෙන විමුක්තිගේ රුව දෙනෙත්වල ඇඳ ගත්තාය. අවසන් දවසේ කළුතර හෝටලයේදී මේ උකුලේ මුහුණ තබාගෙන උන් ඔහුගේ අහිංසක මුහුණ වර්ෂාට යළි යළිත් සිහිවිය. ඒ හිස තව එක වරක් මේ උකුලේ තබාගෙන ඉන්නට වරමක් ලැබෙනවා නම්...

හෙටින් පසු ජීවිතය අලුතින්ම සිතිය යුතුය. වැටී ඉන්නට ගෙපැළක් දන් ලැබෙනා බව ඇත්තය. එහෙත් ජීවත් වන්නට ක්‍රමයක් තිබිය යුතුය. ප්‍රියංවද හදන්නේ වී ගබඩාවක ලිපිකාරිනියක් ලෙස සේවය කරන්නටය. එවැනි තැනක කෙල්ල කොහොම රස්සාව කරන්නේදයි වර්ෂාට සිතාගත නොහැක.

ගෑණු තුන්දෙනාට බත් හුණ්ඩු දෙකක් ලිපේ තියාගෙන පොල් සම්බෝලයක් වුව හදගෙන කන්නට පුළුවන් බව ඇත්තය. එහෙත් උපදින දරුවාගේ ජීවිතය ඒ තැනට ඇද දමන්නේ කෙසේද...

ප්‍රියංවදගේ ජීවිතයටද තේරුමක් තිබිය යුතුය. කෙල්ල හදන්නේ





මේ උපදින දරුවාට කිරි අම්මා කෙනෙක් වී ජීවත් වන්නටය. ආදරය නිසා ඇය ජීවිතයේ විඳින්නට හැකි උපරිම දුක වින්දය. රත්නපුර දිසා අධිකරණයේ පැවති ඇගේ දික්කසාද නඩුවට ඇයත් සමඟ ගියේ අම්මාය. හැම නඩු දිනයකටම පසු කෙල්ල ගෙදර නොගොස් අම්මා සමඟ අඬමින් ආ හැටි වර්ෂාට මතකය.

කිසිවෙක් දුකක් මිසක සැපක් කියා දෙයක් විඳ නැත. අමුතුවෙන් සැපක් නැති වුවද සිමෙන්ති පොළොවේ වැටී හෝ සැනසීමෙන් ජීවත් විය යුතුය.

දරුවා බඩේ තියාගෙන රස්සාවක් කළ නොහැක. ඇරත් මේ රජරට කරන්නට කියා එහෙමම රස්සාවක්ද නැත.

'තාත්තිගේ බුක් ෂොප් එක තිබ්බ නම් ඔයාවත් බඩේ තියාගෙන මම කොහොම හරි ඒකෙ වැඩ කරනවා...' වර්ෂා මේවා කියන්නේ බඩේ ඉන්නා දරුවාටය.

ජීවිතයේ සිදු වූ සියල්ල හීනයක් මෙනි. දන් ඒ හීනය විඳ අවසානය. යළිත් ජීවිතයේ සතුටක් විඳින්නට සෑහෙන කාලයක් බලා සිටිය යුතුය. ජීවිතයේ උදවූ එක් මොහොතක රහසින් පමණක් විඳි ඒ සිහිනයේ සුව යළිත් දෛවය සඳහටම නොදෙන්නටත් පුළුවන.

එහෙත් ජීවත් විය යුතුය. 'ඔයා එනවා කියලා බලාපොරොත්තු තියාගෙන මං ජීවත් වෙන්නම්...' වර්ෂා අවසානයට ඇඳෙන් නැඟිට වින් වතුර ටිකක් බීගෙන බීගෙන ගියේ හෙට සිට අලුතින්ම ජීවිතය පටන් ගනිමි යැයි දැඩිව අධිෂ්ඨාන කරගෙනය.

'මයියොක්කා වවලා හරි මං ඔයාව ජීවත් කරවන්නම් පුතේ...' ඇය බඩට සීතල අතක් තබා කීවාය.

* * * * * * * * * *

විමුක්තිගේ ස්කෑන් පරීක්ෂණ වාර්තා පරීක්ෂා කර බැලූ දොස්තර සමරනායකගේ දෑස් විශාල විය. මේ තරම් තරුණ වයසේ කොල්ලෙකුගේ මොළයට මේ තරම් හානි විය හැකි දැයි ඔහු සිතුවේ පුදුමයෙනි.

බරපතලම කාරණාවක් නොවන්නට එය විය නොහැක. රෝගියාව සනීප කරන්නට සෑහෙන කාලයක් යන බව ඔහු තේරුම් ගත්තේය.

මේ හානි වූ සියුම් සෛල යළි ප්‍රකෘතිමත් කිරීම සිතනා තරම් පහසු දෙයක් නොවේ. එය කළ යුත්තේ පරිස්සමිනි.

දෙස්තර සමරනායක සක්විතිව ඔහුගේ කාමරයට කැඳවූයේ විමුක්ති මුහුණ දී තිබෙන බරපතල තත්වය ගැන කියා ඔහුව බය කරන්නටම නොවේ. මේ තත්වයෙන් ඔහුව සනීප කර ගැනීමට දරන්නට ඇති වෙහෙස පිළිබඳව තේරුම් කර දෙන්නටය.

'ඩො..ක්..ටර්...'

වෛද්‍ය සමරනායක මහතා සක්විති දෙස බලා උන්නේ කරුණාබරවය.

'ඩො..ක්..ටර් ම..ල්ලි..ට...'

'අපිට ටිකක් මහන්සි වෙන්න වෙයි... ඔයාලටත් සෑහෙන කල් බලා ඉන්න වෙයි...'

සක්විතිගේ මුහුණ දුකින් පීඩිත විය.

'එ..යාගේ ජීවිතේ...'

'ජීවිතේ ගැන නෙමේ බය...'

'එ..හෙ..නම් ඩොක්ටර්...'

'එයාට කොමා තත්වයක් ඇතිවෙලා වගේ... අපි සිහිය ගන්න ට්‍රයි කරනවා... ඒත් ඒක බලෙන් කරන්න බෑ... සිහිය ගත්තත් සනීපයි කියන්න බෑ...'

සක්විතිගේ දෑසින් කඳුළු ගලා යන්නට විය.

'ඔහොම කඩා වැටෙන්නෙපා... ඔයා මේ පවුලේ ශක්තිමත්ම කෙනා... ඔයා හයියට ඉන්න ඕන...'

'ම..ගේ ම..ල්ලිට...'

කියන්නට ගිය දේ පවා ඔහුට කියවෙන්නේ නැත.





'මං සනීප කරලා දෙන්නම්...'

'ඇයි ඩො..ක්ටර්.. මෙහෙම වුණේ...'

'ඒක දැන් හිතලා වැඩක් නෑ... අර ගෑණු ළමයා ගැන තොරතුරක් ලැබුණද...'

දෙස්තර සමරනායක මහතා ඇසුවේ වර්ෂා ගැනය. උදේ සක්විති ඒ හැම විස්තරයක්ම වෛද්‍ය සමරනායකට කීවේය.

'තා..ම නෑ ඩොක්ටර්...'

ඔහු දිග සුසුමක් හෙළුවේය.

'මං හෙට ඉඳලා ට්‍රීට්මන්ට් පටන් ගන්නවා... අවශ්‍ය වුණොත් අපි එයාව පිටරටත් අරගෙන යන්... ඒත් අවශ්‍ය උනොත් විතරක්...'

'ම..ල්..ලි..ට මෙ..හෙම ජී..වි..ත කා..ලෙම...'

සක්විති ගොත ගසමින් ඇසුවේය.

'අපි සටන් කරමු... අපිට බැරිවෙන එකක් නෑ...'

වෛද්‍යවරයා කීවේ සන්සුන් බවිනි.

සක්විති ඇඬුවේ තනිවමය. ඔහු රෝහලේ කොරිඩෝව කෙළවරකට වී ඇතිවන තුරු ඇඬුවේය. 'උඹට මේ ප්‍රශ්නෙන් මේ තරම් දෙයක් වෙන බව දන්නව නම් මම කවදවත් මේ කසාදේ වෙන්න දෙන්නෑ මල්ලී...' සක්විති අඬමින් කීවේය.

'ම..හ..ත්..ත..යෝ...'

මේධා සක්විතිගේ උරතලයට සුරත තැබුවේ ඇස් ලොකු කරගෙනය. සක්විති මේධාගේ උරතලයට හිස තබාගෙන ඇඬුවේය.

'ම..ට කි..ය..න්..න ම..හ..ත්..තයෝ... ම..ල්..ලි..ට මො..ක..ද...'

මේධා ඇසුවේ වෙව්ලමින් මෙනි. බරපතල දෙයක් නොවේනම් ඔහු මෙසේ පොඩි දරුවෙකු මෙන් නාඩන බව මේධා දනී. සමහර විට විමුක්තිගේ රෝගය විනිශ්චය කරන්නට ඇත. සක්විති අඬන්නේ එය දරාගෙන ඉන්නට බැරි නිසා විය යුතුය.

'ඒ..ක කො..හොම ඔයාට කියන්..න..ද බ..බා...'

මේධාගේ බඩ පපුව දගෙන ගියේය. ඇයට සිහිවූයේ විමුක්තිගේ අහිංසක මුහුණය. ඔහුට කොහොම විපතක් වූවාද...

"අ..නේ මහත්තයෝ.. මං බඩදරු ගෑණි... පිච්චෙනවා වස්තුවේ... කියන්නකෝ..."

සක්විති ගැස්සී හිස ඔසවා මේධාගේ උරතලයෙන් අල්ලා ගත්තේ එවිටය. "ඔහොම කඩා වැටෙන්නෙපා... ඔයා මේ පවුලේ ශක්තිමත්ම කෙනා... ඔයා හයියට ඉන්න ඕන..." දෙස්තර සමරනායක කියූ වදන් සක්විතිට සිහි විය.

"සො..රි බබා..."

"ම..ල්ලිට ඇයි මහත්තයෝ..."

"අපිට කොල්ලව ගොඩ ගන්න ටිකක් දුක් විදින්න වෙයි බබා..."

සක්විති කීවේ සන්සුන්වය.

"ඒ.. කිය..න්..නේ..."

සක්විති දෙස්තර සමරනායක කියූ සියල්ල සන්සුන්ව මේධාට කීවේය.

"අ..නේ දෙ..යි..ය..නේ..."

මේධාට කියවුණේ ඇගේ බඩ පපුව දවීගෙන යද්දීය.

"බයවෙන්නෙපා බබා.. මං කොල්ලව කොහොම හරි බේරගන්නවා..."

"ම..ටත් සහෝදරයෙක්ට ඉන්නේ ඒකා විතරයි... අපේ දරුවෙක්ට මාමා කියන්..න..."

සක්විතිගේ පපුව කැඩී කැඩී ගියේය. ඔහුට යළිත් වරක් ඇඬුණි.

"එ..හෙ..ම අ..නතුරක් කොල්ලට වෙන්නෑ මහත්තයෝ... අ..පි ඉන්නවනේ..."

"අ..පි විතරක් ඉඳලා මදි බබා..."

"එහෙනම්..."

"ඩොක්ටර් කිව්වා කෙල්ලව හ..ම්බ උනොත් ඒක ලො..කු උදව්වක් කියලා..."

"අ..නේ දෙයියනේ... මේ කෙල්ලව කො..හෙ..න් අපි හොය..න්..න..ද..."

"බලමු... මං කොහොම හරි මේකව සනීප කර ගන්න ඕන බබා..."

"ම..ට තේරෙනවා... බයවෙන්නෙපා... මා..ත් ඉන්නවනේ..."

මේධා සක්විතිගේ හිස අතගෑවේ ආදරයත් දුකත් මුසුවූ හැඟීමෙනි. උදවී ඇත්තේ මහම නපුරු දවස් කිහිපයක් බව මේධාට ඉවෙන් මෙන් දනුණි.

# 18

රාත්‍රී දහයට පමණ විමුක්ති දෑස් හැරියේ නන්නාඳුනන අන්ධකාර ලෝකයකටය. ඔහුට ලෝකයම පෙනුණි. එහෙත් ඔහු ඒ කිසිවක් ගැන දන උන්නේ නැත. ස්නායු පද්ධතියේ ඉතාම සංවේදී ස්නායු වලට හානි වීම නිසා ඇතිවන භයානක කෝමා තත්වයකට ඔහු මුහුණ දී තිබුනේය.

දෑසින් පෙනුණත් පෙනෙන දේ වටහාගන්නට බැරි තත්වයකට ඔහු මුහුණ දී තිබුණි. කණට අනන්ත දේ ඇසුණත් ඒවා මේ යැයි වටහා ගන්නට ඔහුට තේරුමක් තිබුනේ නැත. ශරීරය චලනය කරන ඇතැම් ශෛලවලට හානි වී තිබූ නිසා ඔහුට සෑහෙන කාලයක් යන තුරු අත් පා සෙලවීම පවා අසීරු දෙයක් විය.

විමුක්තිට සිහිය එද්දී සක්විති උන්නේ ඔහුගේ ඇඳ අසළමය. එහෙත් ඒ බවක් සක්විති නොදුටුවේ විමුක්ති ඔහේ දෑස් පමණක් හැර ඔහේ සිවිලිම දෙස බලා උන් නිසාය.

එක බඩවැල කඩාගෙන ආ තම එකම සොහොයුරා අන්ධකාර ලෝකයකට දෑස් විවර කර ඇති බව සක්විති දන උන්නේ නැත. වෛද්‍ය සමරනායක මහතා කෝමා තත්වයක් ගැන කීවද මල්ලිට





සිහිය ආ සැනින් ඔහු තමාව හඳුනා ගන්නා බව සක්විති විශ්වාස කළේය.

එහෙත් දෙවියන් පවා සමහර අවස්ථා වලදී හිතන තරම් කාරුණික නැත. කෙනෙක් මේ ජීවිත කාලයේ ගෙවා අවසන් කළ යුතු පවක් වේද එය ඔහු විසින් ගෙවා දැමිය යුතුමය. දෙවියන්ටවත් එය වැළැක්විය නොහැක. බුදු බණේ ඇත්තේ එහෙමය.

කොතරම් දරුණු ලෙස විමුක්තිගේ මොළයේ ශෛල වලට හානි වී තිබුණාද කිවහොත් ඔහුට ඔහුගේ අතීතය පමණක් නොව මේ ගෙවෙන මොහොතේ මතකය පවා මතක තිබුනේ නැත.

කිසිවෙක් නොදන්නා කිසිවෙක් නොහඳුනන අන්ධකාර ලෝකයකට විමුක්ති මොරගොඩ දෑස් ඇරගෙන උන්නේය.

එකවරම කුමක්දෝ දනී මෙන් සක්විති විමුක්ති දෙස බැලුවේය. මල්ලීගේ දෑස් ඇරී තිබෙනු දක ඔහුව වෙව්ලන්නට විය.

'ම.. ම..ල්..ලී... අ..නේ කොල්ලෝ උ..ඹ..ට සිහිව ආවද.. මල්ලී...'

සක්විති වහා පැන ඔහුගේ ඇරුණ දෑස් ඉදිරිපිට ඉඳ කෑ ගැසුවේය. නැත. ඒ ඇස්වල හැඟීමක් නැත. තෙතක් නැත.

'ම..ල්ලී... උ..ඹට දන් සනීපද බං... මල්ලී... කතා කරපං කොල්ලෝ...'

සක්විතිට අඬෙන්නට මෙන් ආවේය.

'මං දිහා බ..ල..ප..න්කෝ බං...'

ඔහු විමුක්තිගේ දෙකම්මුල් අතගාමින් ඇඬුවේය. විමුක්ති අයා ගත් දෙනෙතින් සක්විති දෙස බලා උන්නා පමණි.

'උ.. උ..ඹ..ට මාව අ..ඳු..න..න්..න පුළුවන් නේ..ද කොල්ලෝ...'

සක්විති දෙවියන්ට පවා බැන්නේය.

'ඇයි ඌට මෙහෙම දෙයක් කළේ... අහිංසකයා... කවදවත් ඌ පවක් කරලා නෑ... සතෙක් මරනවා දක්කොත් ඒ බයටත් කන්නෑ... ඇයි ඌට මෙ..හෙම කළේ...'

සක්විති ඇඬුවේ පොඩි දරුවෙකු සේය.

'අ..නේ කොල්ලෝ ක..තා කරපංකෝ...'

තම සොහොයුරාගේ ඇස්වල තිබූ සීතල මළානික බැල්ම සක්විතිගේ ළය අවුළුවා දැම්මේය. එය මෙතෙක් දවසක් දුටු මල්ලීගේ දෑස්වල බැල්ම නොවේ. සීතල මළානික සුදුමැලිව ගිය මැරුණු බැල්මකි.

'ක..ම..ක් නෑ.. ම..ට මේ දුක දරාගන්නම වෙ..නවා... ම..ට උ..ඹ..ව සනීප කරන්න ගො..ඩක් දු..ක් විඳින්න වෙයි... මං ඒ හැම දෙයක්ම කරලා උඹව ගොඩ ගන්නවා...'

සක්විති කීවේ විමුක්තිගේ මළානිකව ගිය දෑස් දෙස බලාගෙනය.

'උ..ඹ..ට බඩගිනියි නේ..ද... තිබහයි නේ..ද... දවස් තුනකින් උ..ඹ නැගිට්ටේ...'

සක්විති විමුක්තිගේ හිස අතගාමින් කතා කළේය. රැවුල් කොට මතු වූ හකු පෑදී තිබූ විමුක්තිගේ මුහුණ දෙස බලා ඉඳිද්දී සක්විතිට වාවා ගන්නට බැරි විය.

ඔහුට සිහි වූයේ වර්ෂාවය. මල්ලීව සනීප කරන්නට කෙල්ලව අවශ්‍යම බව වෛද්‍ය සමරනායක කීවේ ඇයිදැයි සක්විතිට හරියටම තේරුනේ දැන්ය.

'උ..ඹ..ව ගොඩ ගන්න පුළුවන් කෙල්ලට විතරයි... මේ උඹේ සීතල වෙච්ච අත පය වලට රස්නේ දෙන්න පුළුවන් ඒකිට විතරයි...'

සක්විති විමුක්තිගේ සීතල ඇඟිලි කරු අතර ඇඟිලි තුඩු යවමින් තනිවම කතා කළේය. අදින් පසුව තම මල්ලී සෑහෙන කාලයක් යන තුරු කතා නොකරන බව සක්විති දන උන්නේය.

'උ..ඹ මෙහෙම දුක් විඳිනවා කියලා ඒකි දන්නවා නම් ඒකිව පැලිලා මැරෙයි... මොන දුක විඳින්න හරි දුවගෙන එයි... මං ඒකිව කොහොම හරි හොයාගෙන එක්කං එන්නං... එදාට උඹ ආයෙත් කතා කරයි... උඹට දන් අලුත් ජීවිතයක් දෙන්න උඹව වදපු අම්මට වත් බෑ... ඒකිට විතරයි පුළුවන්...'

සක්විති රෝහලේ ප්‍රධාන හෙදිය ළඟට ගියේ කොල්ලාට තේ





වතුර ටිකක් වත් පොවන්නදැයි අසන්නටය.

'ම..ල්..ලිට සිහිය ආ..වා.. ඒ..ත් එයා කතා කරන්නෑ නර්ස්...'

සක්විති කඳුළු පුරවාගෙන කියද්දී හෙදියන්ටද දුක සිතුණි.

'ඩොක්ටර් වේලාසන විස්තර කරලා කිව්වනේ ඒක... හි..මිහිට සනීප වෙයි...'

'ද..වස් තුනක් එයා මොනවත් කාලා බීලා නෑ... මං.. තේ ටි..කක් පොවන්නද...'

'එකපාර ගොඩාක් පොවන්නෙපා... හැන්දකින් පොවන්න... ද..න් එයාගේ තත්වය චූටි බබෙක්ගේ තත්වයේ වගේ... අපි ඩොක්ටර්ට කතා කරලා කියන්නම්...'

'හා.. ඉක්මනට කියන්..න...'

සක්විතිට ජීවිතයේ කෙදිනකවත් ඇති නොවූ තරම් අසරණකමක් දැනුණි. මේ තරම් විපතක් තම පවුලේ කෙනෙකුට වූවා කියාවත් සක්විතිට සිතා ගන්නට නොහැක. ඉනුත් ඒ විපත වූයේ ගෙදර ජීවත් වූ අහිංසකයාටමය.

සක්විති එද්දීත් විමුක්ති උන් ලෙසටම දෑස් ඇරගෙන ඔහේ සිවිලිම දෙස බලාගෙන උන්නේය. ඔහුව මෙහෙම දකිද්දී මේධාට අම්මාට තාත්තාට මොනවා සිතේවී දැයි සිතී සක්විතිට තවත් දුක සිතුණි.

දෛවය සියල්ලගෙන් පළියක් ගත්තා මෙනි.

සක්විති උණු වතුර බෝතලයේ තිබූ තේ ටිකක් කෝප්පයකට ගෙන එය නිවා ගෙන හැන්දක් අතැතිව විමුක්ති අසළට ආවේය.

'උඹට මෙහෙම කවන්න පොවන්න වෙන තත්වයක් එයි කියලා මං කවදාවත් හිතුවේ නෑ...'

සක්විති විමුක්තිගේ ඇඳ මත වාඩි වී ඔහුට තේ වතුර පෙව්වේය. ඔහුගේ තොල් පට හෙලවෙනවා පමණි. සක්විති තේ ටික පොවා විමුක්තිගේ හිස අතගෑවේ ජීවිතයේ එන ඕනම දුකකට මුහුණ දෙමි යැයි සිතාගෙනය.

‘සැපක් නම් උඹයි මායි එකට ඒ සැප විඳින්න ඕන... දුකක් නම් ඒත් එහෙමයි... උඹ මෙහෙම ඉඳිද්දී මම අහක බලන්නෑ...’

හෙදියක් පැමිණ රෑ එකොළහට පමණ එන්නත් විද්දේය.

‘ඩොක්ටර් කිව්වා මේ ඉන්ජෙක්ෂන් එක දෙන්න කියලා... බයවෙන්නෙපා... දැන් එයාට නින්ද යයි... උදේට ඇහැරෙයි...’

සක්විති හිස වැනුවේය. හෙදිය ගිය පසු සක්විති තෙත පැනල් එකක් ගෙන ඔහුගේ මුහුණ පිසදා යළිත් ඔහුට පෙරෙව්වේය. ටිකකින් විමුක්ති යළිත් නිදාගත්තේය.

ඔහුට මහා අසරණ කුරිරු පාළුවක් දැනුණි. සක්විති අත තිබූ ජංගම දුරකථනයෙන් මේධාට ගත්තේ ඒ හැඟීම විඳගන්නට අමාරුම කටුක දුකක් වූ නිසාය.

‘බ..බා...’

‘අ..නේ ම..හ..ත්..ත..යෝ මල්ලිට...’

‘ටි..ක..කට කලින් කො..ල්ලට සිහිය ආවා බබා...’

‘අ..නේ.. දෙයියන්ගේ පිහිටයි.. කොල්ලා සනී..පෙන් නේද මහත්තයෝ... ඇ..යි මට ම..ල්ලිට කතා කරන්න දුන්නැත්තේ...’

සක්විති දිග සුසුමක් හෙළුවේය.

‘ඌ මා..ත් එක්කවත් ක..තා කළේ නෑ බබා...’

‘අ..නේ දෙ..යි..ය..නේ...’

‘මා..ව අ..ඳු..නගත්තෙවත් නෑ... ම..ට හරි දු..ක හිතුණා බබා...’

‘අ..නේ ඉ..තින්...’

‘බබා හිටියනම් මෙතන අඩයි... බලාගත්ත අත බලාගෙන උන්නා...’

‘හි..නා වු..ණේ..වත් නැ..ද්ද...’

‘කො..ල්..ල..ට අපිව මතක නෑ බබා....’

මේධාට ඇඬුණි.





‘අ..ඩ..න්..නෙ..පා බබා... අපි කොල්ලව සනීප කර ගමු...’

‘ම්...’

‘මං.. තේ චු..ට්..ට..ක් පෙ..ව්වා... පොඩි එ..කෙක් වගේ තොල් උලුක් කර කර බිව්වා... බලං ඉන්න බෑ බ..බා...’

‘අ..නේ දැන් මොනාද කරන්නේ...’

‘ආයෙත් නිදි... අපට කෙල්ලව හොයාගන්නම වෙයි බබා... මේකව ගොඩ දන්න පුළුවන් ඒ අත් දෙකට විතරයි...’

‘ම්.. ඒකිට හීනෙන්වත් පෙනිලා එයි... මං උදෙන්ම එන්නද...’

‘එන්න... මං තාත්තලටත් කියන්නම්... අම්මටත් මේකගේ මූණ දිහා බල බල සැහෙන්න විඳවන්න වෙයි...’

මේධා කිසිවක් කීවේ නැත. මේ සියල්ල වූයේ ඇය ගත් එක් තීරණයක් නිසාය. දෙව්දුවක් වන් වූ කෙල්ලෙක්ව ගෙදරින් පන්නා දැමූ පසු එවැනි ගෙදරකට එවැනි විපත් වන බව මේධා දනී.

# 19

සෙනසුරාදා ගෙවදින්නට නියමිතව තිබූ ගෙපැළට සිමෙන්ති දම්මේ මේ රාත්‍රියේදීමය. කපරාරු නොකළ ගඩොල් බිත්ති එහෙමම තිබෙද්දී උළුවහු ටික තබාගෙන බිමට සිමෙන්ති ටිකක් දමාගෙන ගෙවදිමු යැයි වර්ෂාත් ප්‍රියංවදත් තීරණය කළේ පසුගිය දින වලදීය.

වැඩි වැඩ කරන්නට තරම් මහා මුදලක් අතේ තිබ්බේද නැත. අත ඉතිරි වූ මුදල් ටිකද පරිස්සමින් තබාගත යුතුය.

එදින රාත්‍රියේ ලයිට් තුන හතරක් ඇද බාස්ලා දෙතුන් දෙනෙක් මහ රෑ පුරා බිමට සිමෙන්ති දම්මෝය.

'කට්ටිය යමරෙට වැඩ... පාන්දර වෙද්දී දලා ඉවර වෙයි...'

ගේ පැත්තේ සිට ආ ප්‍රියංවද කීවේ කුස්සියේ ඉඳගනිමිනි. වර්ෂාත් ප්‍රියංවදත් අම්මාත් වැඩ කරන පිරිසට රෑ කෑම සූදනම් කරමින් උන්නෝය.

'කෑම පරක්කුද දන්නෑ නේද ප්‍රියා...'

වර්ෂා ඇසුවේ දෙහි ඇඹුල් අල්ලන්නට දමා තිබූ කට්ටා කරවල ටික තෙලට දමමිනි.





'පිස්සුද කෙල්ලේ... ඒකනේ මාමා වේලාසනම කොරලි ටික බැඳගෙන අරන් ගියේ... මේ පැත්තේ මිනිස්සු වැඩ කරන්න කලින් ටිකක් බොනවා...'

කොහොමත් මෙහෙම රෑ වැඩ කරද්දීත් සුන්දරය.

'දීපන් කෙල්ලේ මං ළූණු ටික කපන්නම්...'

'එපා ප්‍රියා... මං කපන්නම්...'

'මේ කෙල්ල දැන් ඕනවට වඩා වැඩ කරලා මහන්සිය හද ගන්නවා...'

ප්‍රියංවදගේ කතාවට අම්මාද ඇය දෙස බලා සිනාසුණාය.

'මාත් කිව්වා... අහන්නෑ... දැන් ගෙවදින දවසට කැකුළු කිලෝ දහයක විතර කිරිබතක් හදන්න ලෑස්තිය...'

'ඒක නම් හදමු අම්මේ... නේද කෙල්ලේ... අපි ඉතින් දැන් මේ දුප්පත් අහිංසක ගම්මුත් එක්ක ජීවත් වෙන්නෙපැයි... වටේටම බෙදන්න ඕන...'

වර්ෂා පොළොස් මැල්ලුමට පොල් ටික අඹරන්නට ගනිද්දී නම් ප්‍රියංවද ඇයව පැත්තකට කළාය.

'හිටපං බං... මං කරන්නම්...'

'ම්.. එහෙනම් හීනියට අඹරන්න ඕන...'

'උඹ තරම් නම් බෑ...'

ප්‍රියංවද සිනාසී කීවාය.

'අම්මා දන්නෑ ඉස්සර නාලිනී නැන්ද හදනවා මේ වගේ පොල් එහෙම අඹරලා දලා කොස් මැල්ලුමක්.. ආයේ කරවල හොදි ටිකක් විතරයි ඕන...'

ප්‍රියංවදගේ කතාවට වර්ෂා බැලුවේ දුක්බරවය.

'අම්මා ඒකට හදන්නේ කරවල කටු හොද්ද... එතකොට තමා රහ...'

"ම්.. ඒක කාපු දවසට ගෙදර යනවා බොරු... මං එහේ නිදි..."

"ගෙදරට ගියාම අපි ඒ වගේ කරවල කටු හොද්දක් හදලා කොස් මලෝමු..."

වර්ෂා කීවාය. අම්මාගේ ඒ කරවල කටු හොද්දේ සුවඳ දනුත් ඇයට ආවේය.

"කරවල කටුම කාලා බෑ කෙල්ලේ... අපි ඒ ගෙදරට ගියාම හොඳට වැව් මාළු ටිකක් ගෙනත් හදමු නේද අම්මේ..."

ප්‍රියංවද කීවාය.

"වැව් මාළු ගුණ තමා... කිරිත් හොඳට වඩනවා..."

"කෙල්ලේ මේ ඇත්ද..."

ප්‍රියංවද පොල් මිශ්‍රනය අඹරා පෙන්නුවාය.

"මදි කෙල්ලේ... මේ අබ ඇට එහෙමමනේ..."

"මාව නම් හදන්නම බෑ නේද බං..."

තිදෙනාම සිනාසුණේ එකටය. ජීවිතයේ දුක අමතක කර මෙහෙම සිනාසීමම කොතරම් දුකද...

"අම්මේ දන් කිරි හොද්ද තියමු නේද..."

වර්ෂා ඒද තිබූ කිරි හොද්ද ප්‍රියංවදගේ අම්මාට දුන්නාය.

"මොනාද කෙල්ලේ තව හදන්නේ ඔය දෙක තුන ඇති..."

"කොස් මැලෙව්වා... කරවල තෙල් දම්මා... කිරි හොදි හැදුවා... ඇඹරුල්ල ටික ඉව්වා... මදිද අම්මේ..."

"ඇති පුතේ..."

"අපි දෙහි ඇඹුලකුත් හදමු නේද අම්මේ... කෙල්ලේ මට ඔය තක්කාලි ටික දීපන්..."

"මේකට නම් තියෙන්නේ නාලිනී නැන්දගේම පපුව තමා... කොච්චර දීලත් මදි..."

"කන දෙයක් හදලා දෙද්දී හොඳට දෙන්නෙපැයි..."

"අර ගෙදරකට අවුරුද්දක විතර හම්බ කරලා දුන්නේ... අන්තිමට මොකද වුණේ..."

ප්‍රියංවද කීවේ සිතා මතා නොවේ. ඇත්තටම නැන්දලාගේ ගෙදර ඉඳිද්දී මේ අත් දෙකින් කොතරම් කෑම හැදුවාද...

"එ..යාලට ඒවා කවදහරි මතක් වෙයි ප්‍රියා... ඒ නැතත් එක්කෙ..නෙක්ව අමතක වෙන්නෑනේ..."

වර්ෂා කීවේ අසරණ හඬිනි.

"දවසක එයාලට අඬන්න වෙයි උඹව මතක් වෙලා... මං නේ දන්නේ නැහුන තරම..."

ප්‍රියංවද කීවේ ක්ෂණිකව මතුවූ කෝපයකින් යුතුවය.

"මං කිරි හොද්ද බාන්නම් පුතේ... ගිහින් ඇඟ සෝදගන්න..."

"යං.. මං උඹට වතුර ටික ඇදලා දෙන්නම්..."

වර්ෂා චීත්තයක් දිය රෙද්දට ඇඳ ප්‍රියංවද සමඟ ළිඳ ළඟට ගියේ දිගින් දිගටම ඔහුව සිහිවෙද්දීය. අද ඔහුව සිහිවෙනවා වැඩිය. "ඉන්න තැනක හොඳට ඉන්නවා නම් ඇති..." කෙල්ල සිතින් කීවාය.

"අපිත් පස්සේ අපේ වත්තේ ළිඳක් කපා ගමු නේද ප්‍රියා..."

"ම්.. අර උඹ කිව්වා වගේ කුඹුක් ගහ යට හොඳයි තමා.."

"එතන ෂෝක්..."

ප්‍රියංවද කෙල්ලට ඇඟ සෝදන්නට වතුර ටික ඇද දුන්නාය. සබන් ගාද්දී වර්ෂා ඇඳි වත එහෙට මෙහෙට කර ප්‍රියංවදට කය පෙන්නුවාය.

"චු..ට්ටක් ඇවිත් නේද කෙල්ලේ..."

"ම්... ඇතුළට වෙලා මොනා කරනවද දන්නෑ නේද ප්‍රියා..."

"අම්මයි තාත්තයි ගැන හිතනවා ඇති..."

"හිත හිතා දුක් වෙනවත් ඇති..."

ප්‍රියංවද කිසිවක් නොකියා සබන් කෑල්ල ගෙන කෙල්ලගේ කුසේ ගෑවාය.

"එහෙම අතගාද්දී සනීපයි..."

අතගාන්නට ඉන්න තිබ්බේ විමුක්තිය. ප්‍රියංවදට එසේ සිතුණද ඇය එය කීවේ නැත.

වැඩ කරන අයට කෑම රැගෙන යද්දී රෑ එකොළහටත් ළංවී තිබුණි. රෑට හමන රජරට සුළඟ විඳිමින් කෑම බඳුන් රැගෙන කෙල්ලෝ දෙන්නා ගියේ සිනාසෙමිනි.

"දනයක් අරන් යනවා වගේ..."

"ම්.. අපිත් එතන ඉඳන්ම කමු හොඳේ..."

කෙල්ලට මේ දිනවල ඇත්තේ ඔවැනි දෙළදුක්ය. දවසක ළඟ ගෙදරකින් කෑම ටිකක් හදවාගෙන දිය යුතුය. දන් ගෙයක් තිබ්බානම් ගොඩාක් හොඳය. කෙල්ලට වැඩියම ආසාවක් පැමිණ ඇත්තේ දනේ බත් කන්නටය.

වර්ෂාත් ප්‍රියංවදත් වැඩ කරන සියල්ලන්ටම කෑම බෙදූ දුන්නෝය.

"මාමට තව කොස් ටිකක්..."

"දුන්න පුතේ... ඔයා මෙහේ කයි බත් උයන ගෑණුන්ට වඩා රහට උයනවා..."

ප්‍රියංවදගේ මාමා කිව්වේ වර්ෂා ගැනය. ප්‍රියංවද කෙල්ල දෙස බලා සිනාසුණාය.

වර්ෂාත් ප්‍රියංවදත් බත් රැගෙන බෙදාගෙන කොහොඹ ගහ යට ගල් තලාවේ වාඩි වූවෝය. ප්‍රියංවද බැදපු කොරලියෙකුත් ගෙන වර්ෂාගේ පිඟානට දැම්මාය.

"අපේ අම්මා හිටියනං උඹට මේ රෑ එළියේ ඉඳන් බැදපු කොරලි කන්න දෙන්නෑ..."

ප්‍රියංවද කීවේ සිනාසෙමිනි.

"බත් රහයි කෙල්ලේ... මං අඹරපු කොස් මැල්ලුමත් මරු නේද..."

"ෂෝක් ෂෝක්..."

"හිටපං ටිකක් තව කිරි හොදි ටිකක් දාගන්න ඕන..."

වර්ෂාද ගොස් කිරි හොදි ටිකක් ද ගත්තාය. මේ සුදු කැකුළු බතට කිරි හොද්ද පුදුමාකාර ලෙස ගැළපේ.

"ප්‍රියා..."

"කෙල්ලේ..."

"මං උඹෙන් අහන්න හිටියේ..."

"මොකක්ද..."

"අර මෝලේ රස්සාව..."

"ඉතින්..."

"උඹ ඒකට යනවද..."

"කීයක් හරි හොයාගන්නත් ඕනනේ බං... පිටි සීනි ටිකවත් අපි ගන්නෙපැයි..."

වර්ෂා හිස වැනුවාය. එහෙත් කෙල්ලව මෝලක රස්සාවකට යවන්නටත් ඇයට ලෝබය.

"අපි ටිකක් ඉවසලා ඉමු ප්‍රියා..."

"ඉඳලා..."

"නෑ මං කිව්වේ..."

"දෙයියෝ මීට වඩා හොඳ දේවල් අපිට දෙන්නෑ කෙල්ලේ... උඹ මං ගැන හිතන්නෙපා..."

වර්ෂා ඉන් පසු කතා කළේ නැත.

"මෙහේ හොඳ බුක් ෂොප් එකක් තිබ්බ නම් මං ගිහින් එහේ රස්සාවක් ඉල්ල ගන්නවා... මට ඒ වැඩ හොඳට කරන්න පුළුවන් ප්‍රියා..."

ඇයට වර්ෂා ගැන මහා දුකක් දැනුණි. සියළු බරට වඩා ජීවන බර විශාලය.

"අපි දරුවා ගැන බලමු කෙල්ලේ... මොනවා හරි කරලා ජීවත්වෙමු... උඹ මේ මාස දහය ටිකක් විවේකෙන් හිටපන්... ගෙවිච්ච

කාලේ ටිකක් කලබල වැඩියි කෙල්ලේ...'

ඇත්තය. හදවතට පුංචි නිවනක්ද අවශ්‍යය. ජීවිතයේ සිදුවූයේ හති අරින්නට වත් කාලයක් නොදුන් දේවල්ය.

'ඇඹරුල්ල ඉස්ම මරු නේද කෙල්ලේ...'

'ම්.. දවසක අඹත් හදමු... පරිප්පු තෙම්පරාදු කරලා කීරමින් තෙල් දලා... එහෙම රහයි...'

'ෂිහ්... මට රහට උයන්න බැනේ... නැත්නම් මං උඹට ෂෝක් එකට හදලා දෙනවා...'

'එහෙම නෑ... උඹ හදන අර හාල්මැස්සෝ හොද්දත් ෂෝක්... රහට ඉඳි ආප්ප කන්න පුළුවන්...'

'මං හෙට හදන්නම්...'

'හා...'

ප්‍රියංවද වර්ෂාගෙන් අහන්නේ නැතුවම ඇයට බත් හැන්දක් බෙදුවේ මේ දවස් ටිකේ කෙල්ලට බත් ටිකක් යහමින් නොවැටුණ නිසාය.

'මට කරවල කෑල්ලකුයි කිරි හොදියි ඇති...'

'එහෙමත් රහයි නේද...'

'ඒ දවස්වල සල්ලි නැතිම උනාම අම්මයි මායි කිරි හොද්දක් හදාගෙන කරවල කෑල්ලක් බැදගෙන කනවා... නැත්නම් කංකුන් තෙල් දලා පොල් සම්බෝල චුට්ටක් හදාගෙන බත් කනවා...'

ජීවිතය පුරාම එහෙම දුක් විඳි ජීවිත වලට දෙවියන් සැනසීම දෙන්නේ ඒ ජීවිත වලට සැපක් දෙන්නට අමතකම වී ඇති නිසාද... දෙවියනුත් පුදුමය. වෙලාවකට එහෙම කෙනෙක් නැද්ද කියාත් සිතෙයි.

එද රාත්‍රියේ වර්ෂාට නින්ද ගියේ නැත. ඇය කෝපි එකක් හදාගෙන ඔහේ ඇඳට වී උන්නාය. අද ඔහුව සිහිවෙනවා වැඩිය. 'ඔයා කෑවද බිව්වද කියලා හිතෙද්දීත් මට දුකයි... මං පැටියා නිසා





කන්න බොන්න ඕන... එයාට මොනවත් වෙන්න දෙන්න බැනේ...' කෙල්ල තනිවම සිතුවේ ඕවාය.

කුසට දැන් මාස තුනත් පැන අවසානය. දැන් පෙරට වඩා මහන්සියක් දැනෙයි. එහෙත් වර්ෂා ඒ මහන්සිය කාටවත්ම පෙන්වන්නේ නැත.

'ඔයා ළඟ හිටියනම් සමහර විට මං ඔයාට කියයි... මට මහන්සියි බඩගිනියි තිබහයි... නිදිමත වගේ... ඔක්කොම කියයි...'

ජීවිතේ හැම දේම කියන්නට උන් කෙනා අහිමි වීමම කොතරම් දුකක්ද... ලෝකයෙන් කෙනෙක්ව තෝරා ගත් පසු ඒ කෙනාවම අහිමි වන ලෙස ලෝ දහම සකසන කෙනා කවුද... වර්ෂා ඇගේ ඇස්වලින් ගලා ආ කඳුළක් කොට්ට උරයේ මල් අතර සැඟෙව්වාය.

# 20

**මේ රාත්‍රියේම** මංජුලා උන්නේ ඇගේ සමීපම මිතුරිය වූ ආශා සමහය. මාරවිල මුහුදු තීරයට සමීපව තනා තිබූ සුන්දරම සංචාරක නිකේතනයක් වූ මාරවිල ක්ලබ් ෆාම් බේ හෝටලයේ අති විශාල පිහිනුම් තටාකයට සමීපව දමා තිබූ සුවපහසු පුටු දෙකක ඔවුන් දෙදෙනා වාඩි වී උන්නෝය.

මංජුලා උන්නේ කෙටි සායට කුඩා ටී ෂර්ට් එකක් ඇඳ තවත් පුටුවකට දෙපා තබාගෙනය. ඇය තද නිලට සුන්දරව දිස්වන පිහිනුම් තටාකය දෙස මොහොතක් බලා උන්නාය. රාත්‍රියට එය දිස්වන්නේ පුදුමාකාර ලස්සනටය.

වේටර්වරයෙක් පැමිණ ඔවුන් අසළ වූ කුඩා කවාකාර මේසයට ගෙනවිත් තැබුවේ විදේශීය මෘදු ෂැම්පේන් බෝතලයකි. පිහිනුම් තටාකය වෙත වූ දෙනෙත් මංජුලා සුන්දර ලෙස අහසට ගෙන ගියාය. අද කරු පිරි රැයකි.

'අහස දකින්නේ අවුරුදු දහයකින් වගේ ආශා...'

මංජුලා කීවේ වෙනස් ලෙසිනි. ඇය ඉන්නේ සැහෙන වේදනාවක් තෙරපාගෙන බව ආශා දන උන්නාය.

'ඉතින්... අපි බොමු කෙල්ලේ... දුකටද සතුටටද...'





මංජුලා ෂැම්පේන් බෝතලය අරිමින් කීවාය. ඇයට පමණක් නොව ඇගේ මිතුරියන්ටත් මේ විදේශීය වයින් ෂැම්පේන් හොඳට පුරුදුය.

'සතුටට කියලා හිතලා බොමු...'

'ෂුව... අපි මොකටද දුක් වෙන්නේ... මට මොනාත් නැති වුණේ නැනේ...'

'දැන් තමයි නියම මංජු ආවේ...'

'මට මේක ටිකක් ෆීල් වුණා මචං... සීරියස්.. දැන් ඒ චැප්ටර් ක්ලෝස්.. චියර්ස්...'

ලා කොළ පැහැගත් ෂැම්පේන් වීදුරු දෙක එකට ගැටිණ. මංජුලා ෂැම්පේන් උගුරු දෙක තුනක් බීගෙන බීගෙන ගියාය.

'අපේ අම්මයි තාත්තයි පව් බං... මං දෙන්නට චයිනීස් රෙස්ටොරන්ට් එකකින් කෑම ඕඩර් කළා...'

මංජුලා කීවේ තවත් ෂැම්පේන් උගුරක් බොමිනි.

'තව ග්ලාස් එකක් බිව්වාම විමුක්ති මොරගොඩ මට දීපු දුක ඉවරයි බං...'

මංජුලා තවත් ෂැම්පේන් වීදුරුවක් වීදුරුවට දමා ගනිමින් කීවාය.

'දවසක විමුක්ති මොරගොඩ උඹ ඉස්සරහ අඬයි...'

'ෂුව... විමුක්තිට කවදාවත් විමුක්තියක් නැතිවෙයි... මං ගොඩක් හිතනවා ආශා... ගොඩක්... අපි කලම්බු ගියාම මොනවා හරි බිස්නස් එකකුත් පටන් ගමු...'

'කරමු...'

'විමුක්තිගේ බුක් ෂොප් එකත් හිතුණොත් මං කරනවා... ඒකත් හොඳයි...'

'ඒක හොඳට ලාබලු...'

'ම්...'

ඇය බටර් වලින් බැදි ඉස්සෝත් සුදු සෝස් තැවරූ මසුත් ඇණවුම් කළාය.

‘උඹ අද බැන්දනම් මංජු...’

‘උඹ අහන්න යන දේ මං දන්නවා...’

මංජුලා කීවේ ඉතාම අසංවර ලෙස ඇගේ නග්න දෙපා එකට පටලවමිනි. සංචාරක හෝටල් වල මේ නග්න කලවා බලන්නට කවුරුවත් නැත.

‘මොකක්ද...’

‘මගෙයි විමුක්තිගෙයි හනිමූන් එක ගැන නේද...’

‘ම්...’

‘ඌත් එක්ක මොන හනිමූන්ද මංජු... විමුක්තිට බෑ මට ප්ලෙෂ එකක් දෙන්න... අනික එයා ඉස්සරහා ෆීලින්ස් එන්නෙත් නෑ... මට පුළුවන්ද ඇඟට වත් අත තිබ්බේ නැති ගොඩේ කෙල්ලෙක්ගේ රෝල් එක කරන්න...’

තම වත පුරුදු වී ඇත්තේ ඊට වඩා වේගවත් සතුටකටය. ඒ සතුට අද රාත්‍රියේදීත් වත ඉල්ලන්නාක් මෙනි.

‘මොනාද කරන්න හිතන් ඉන්නේ මංජු...’

‘අයි හැව් ටු තිංක් අබවුට් දට් ආශා... මට ඕන ඒ සල්ලි ටික ගන්න... මූ මාව බැන්ද නම් ඩිවෝස් එක ඉල්ලුවත් කෝටියක් දෙකක් මං ඉල්ලනවා...’

මංජුලා කීවේ ෂැම්පේන් වීදුරුවේ බැඳී තිබූ සිහින් දිය බිංදු දෙතොලින් පිස දමමිනි.

‘උඹගෙයි විමුක්තිගෙයි කසාදේ රෙජිස්ටර් කරලා තියෙන නිසා...’

‘ඔව්.. මොකක් හරි බලනවා... ඉස්සෙල්ලා මං විමුක්තිගේ දේවල් වල බලය ගන්නවා... එයාගේ කා එක එයාගේ බුක්ෂොප් එක... එයාගේ ක්‍රෙඩිට් කාඩ් එක... ඒවා මට හරි වැදගත්...’

‘දට්ස් රයිට්...’





‘මට ඉස්සෙක් කවපන් කෙල්ලේ...’

ආශා බටර් ඉස්සෙක්ව ගෙන මංජුලාට කැව්වාය.

‘කෙ..ල්ලේ...’

‘ම්...’

‘අපි යන් කාමරේට...’

මංජුලා කාමරයට ගියේ හීන ලා කහ පැහැගත් එළි දැල්වෙන කොරිඩෝව අතරිනි. කාමරයට පිය මනින ඇය ආශාව වැළඳගත්තාය. යුවතියන් දෙදෙනා එකිනෙකාව සිපගනිමින් ඇඳට වැටුනේ මත් වූවන් දෙදෙනෙකු මෙනි.

ඇඳ මත වැතිරුණු මංජුලාගේ ඇඳුම් එකින් එක වේගයෙන් ඉවත් කළ ආශා ඇගේ උණුසුම් දෙතොලින් ඒ ශරීරය සිප ගන්නට වූයේ මත් බවෙනි.

‘ප්ලීස්... ගෝ ඩවුන් බේබි... ගෝ.. ඩ..උ..න්...’

මංජුලා කෙඳිරුවේ දෑස් අඩවන් කරගෙනය. ආශා එහෙමම ඇගේ යටි බඩ දෙසට දැවෙන දෙතොල් තැබුවාය.

එක් රාත්‍රියක එකිනෙකට සම්බන්ධ ජීවිත තුනක ජීවිත ගෙවී ගියේ මෙහෙමය.

මේ කිසිවක් නොදත් විමුක්ති මහ රෑ දෙනෙත් ඇරගෙන හිස් සිවිලිම දෙස බලා උන්නේය.

* * * * * * * * * * *

මේධා ඇඬුවේ විමුක්තිගේ මුහුණ අතගාමිනි. ඇය අසද්දී ඔහු හිස් බැල්මෙන් මේධා දෙස බලා උන්නේය. ඇයට වාවා ගන්නට බැරිම වූයේ ඒ බැල්මය.

‘අ..නේ ව..ස්තුවේ.. ඇයි ඔ..හොම මං දිහා බල..න්..නේ.. මං අක්කනේ පැටියෝ...’

මේධාට ඇත්තටම වාවාගන්නට බැරි විය. උදේ හවා තමාට

කතා කරමින් තමාව එකකුස උපන් සොයුරියක් මෙන් බලා ගත් ඔහු මෙහෙම නන්නාඳුනනා ලෙස බලා ඉදිද්දී කොතරම් දුකක් දනෙනවාද...

'අ..නේ මේ.. බලන්න මහත්තයෝ...'

මේධා කීවේ අඬමිනි. මේධා අඬද්දී සක්විතිට පමණක් නොව මොරගොඩ මහතාටද එය බලා ඉන්නට බැරි විය.

'අඬන්නෙපා දුවේ... අපි කොල්ලව සනීප කර ගමු...'

'ම..ල්ලි පව්.. තා..ත්..තේ...'

'ඔ..ව්.. හරි පව්... මගේ දරුවෙක්ට මෙහෙම වුණා කියලා හිතද්දීත් මට වාවන්නෑ...'

මොරගොඩ මහතා කීවේ කඳුළු පිසිමිනි.

සක්විති විමුක්ති දෙස මොහොතක් බලා ඉඳ බැලුවේ මොරගොඩ මහතා දෙසය.

'තා..ත්..තේ...'

'කියන්න ලොකු පුතා...'

'අපට තාත්තේ කොල්ලව බේර ගන්න ටිකක් දුක් විඳින්න වෙයි තාත්තේ...'

'විඳිමු පුතේ... මේකා නැතුව අපට ජීවිතයක් කොහෙද... මං මගේ ලොරි ටික විකුණලා හරි කොල්ලව බේර ගන්නවා...'

'සනීප වෙන්නේ හරි හිමින් තාත්තේ...'

'මට ඩොක්ටර් කතා කළා ලොකු පුතා...'

'එයා ළඟටම වෙලා අපිට ඉන්න වෙයි...'

'ම්...'

මොරගොඩ මහතාට සිහිවූයේ වර්ෂාවය. ඇය මේ මොහොතේ උන්නා නම් ඔහු ළඟම වැටී ආවතේව කරනා බව ඔහු දනී.

'දුවේ...'

'තා..ත්..තේ...'





'මේ කෙල්ල කොහේ ඉන්නවා ඇත්ද...'

ඔහු අසන්නේ වර්ෂා ගැන බව මේධා දනී.

'කෙල්ලව හොරු අරන් ගියා වගේ තාත්තේ... කොහේ ඉන්නවද කියලා දන්නෑ... ඒත් කොයි වෙලාවක හරි එයි...'

'ඒත් ඒ කෙල්ල මේවා දන්නෑනේ...'

'ඔව්... හිතන් ඇති මල්ලි බැ..න්ඳ කියලා...'

මොරගොඩ මහතා ඇඟිලි තුඩු වලින් නළලත තද කර ගත්තේය.

'මට මේවා මෙහෙමම වෙනවා කියලා ගල්හේන අන්කල් කිව්වා ලොකු පුතා... මල් පැල වගේ දරුවෝ හදලා උන් දුක් විඳිනවා බලන් ඉන්න වෙයි කිව්වා... ඒත් අම්මව නවත්තන්න මට හයියක් තිබ්බේ නෑ...'

'ඒ දේවල් ගැන දන් කතා කරලා වැඩක් නෑ තාත්තේ... අපි මල්ලිව සනීප කරගන්න බලමු... ඩොක්ටර් කිව්වා සමහර විට මල්ලිව රට එක්කං යන්නත් වෙයි කියලා...'

සක්විති කියද්දී මොරගොඩ මහතා බැලුවේ තම ලේලිය දෙසය. ඇගේ කුස මෝරා ඇති හැටි ඔහු දක්කේය.

'මේ දරුවටත් දරුවා හම්බ වෙන්න ඉන්න වෙලාවේ... අනේ මන්ද ඔයාටත්...'

'අ..නේ තාත්තේ... එහෙම හිතන්නෙපා... සක්විති මල්ලි ගැන බලපුවාවේ... මට මේවා කරගන්න පුළුවන්...'

'අර කෙල්ල හිටියනම් ඔයාටත් හයියක්...'

තාත්තා දන් වර්ෂා ගැන කතා කරන්නේ පුදුමාකාර ආදරයකින් බව මේධා දනී. ඒ කැක්කුම මීට ටික කලකට ඉහත ඇති වූවා නම්... එසේ නම් මේ කරදර කිසිවක් නැත.

'කෙල්ලව නවත්තගන්න ඕන තරම් පුළුවන්කම තිබ්බා තාත්තේ... ඒත්.. මා..ත් අම්මට කොහොම...'

මේධා කියන්නට ආ දේ ගිල ගත්තාය.

‘ගෙවල් දෙරවලුත් කුලියට දීලා.. අනේ මන්ද ඒ ළමයත් කොහේ ගිහින්ද කියලා...’

‘කෙල්ලටත් යන්න තැනක් නෑනේ තාත්තේ... ගෙදර ඉන්නත් කෙල්ල බයවෙන්න ඇති... ඒකයි එහෙම ය..න්න ඇත්තේ...’

‘ජීවත් වෙන්නවත් විදිහක් නැතු..ව...’

‘මටත් දුක ඒකයි... කවුරු කියලා බලන්නද... කොහේ හරි පොඩි රස්සාවක් කරනවා ඇති...’

මොරගොඩ මහතා විමුක්ති දෙස බලාගෙනම උන්නේය. ඔහුට වූ මේ දේ ඔහුගේ ආදරයත් සමඟ එකට බැඳී ඇති බව මොරගොඩ මහතා හොඳින්ම දැන උන්නේය.

‘ලොකු පුතා...’

‘තාත්තේ...’

‘මල්ලී කරගෙන ආපු බුක්ෂොප් එක...’

සක්විති බැලුවේ මේධා දෙසය.

‘කොල්ලයි කෙල්ලයි ඒක ලස්සනට කරගෙන ආවා තාත්තේ... මල්ලිටත් වඩා ඒ වැඩ ටික කළේ කෙල්ල...’

ඒ බව ඔහු දැන උන්නේය. ඒ දිනවල තමා මහ රෑ එකොළහට දොළහට ගෙදර එද්දීත් කෙල්ල සාලයේ මේසයේ වාඩි වී පොත් හලේ වැඩ කරමින් උන්නාය.

ඒවා නාස්ති වෙන්න දෙන්නත් එපා...’

‘නෑ තාත්තේ...’

‘පුතාට පුළුවන් නම් ඔය රස්සාවෙන් අස්වෙන්න... දැන් දරුවෙකුත් ලැබෙන එකේ මේ දරුවා ගැනත් බලන්නෙපැයි...’

‘කොහොමත් මං රස්සාවෙන් අස්වෙන්න හිතන් තාත්තේ ඉන්නේ... බිස්නස් කරනවටත් වඩා මේකව සනීප කරගන්න... සමහර විට රට එක්කං යන්නත් වෙනවනේ...’





අඩුම ගණනේ තම දරුවන් එසේ සමගියෙන් සිටීම ගැන මොරගොඩ මහතා සතුටු විය. හැම සහෝදරයෙක්ම තම සහෝදරයන් ගැන මෙහෙම ආදරයේ බලන්නේ නැත.

‘මල්ලිව ගෙදර එක්කං ගියාම මේ ඔක්කොම කරදර ගැන හිතලා පිරිතක් වත් කියමු... දරුවෙකුත් ලැබෙන්න ඉන්න එකේ... මාත් ලබන මාසේ ඉන්දියාවේ යනවා... ගිහින් තිරුපති කෝවිලට බාරයක් වෙනවා... වතාවක් බිස්නස් හොඳටම වැටිලා තියෙද්දී ගිහින් තිරුපති වලට බාර වුණා... ඒක හරි ගියා... මේකත් හොඳ අතට හැරෙයි...’

‘මල්ලි ගැන මං බලාගන්නම් තාත්තේ...’

‘ඔව්.. වෙන කවුරු බලන්නද ලොකු පුතා...’

මොරගොඩ මහතා කීවේ විමුක්තිගේ හිස පිරිමදිමිනි.

* * * * * * * * * * * * *

මංජුලා විමුක්තිව බලන්නට රෝහලට එද්දී සක්විති ඔහු ළඟ ඉඳ  ගියා පමණි. මංජුලා කාමරයට එද්දී එහි උන්නේ හෙදියක් පමණි.

‘මේ කවුද කියනවද... ස්පෙෂල් ට්‍රීට්මන්ට් කරන පේෂන්ට් කෙනෙක් නිසා හැමෝටම බලන්න දෙන්නෑ...’

හෙදිය කාරුණිකව කීවාය.

‘මං පේෂන්ගේ ගර්ල් ෆ්‍රෙන්ඩ්... එයාව මැරි කරන්න ඉන්න කෙනා...’

‘අයිම් සොරි මිස්...’

හෙදිය කාමරයෙන් පිටතට ගියේ සමාව යදිමිනි. මංජුලා දෑස් අයාගෙන බලා උන් විමුක්ති දෙස මොහොතක් බලා උන්නාය. ඒ වෙද්දී ඇය විමුක්තිට ඇතිවී තිබූ කෝමා තත්වය ගැන සියල්ල දැන

උන්නාය.

'ඔයා දක්කම දුකත් හිතෙනවා විමුක්ති... හරි පව්... වෙඩින් එක වෙලා පැය දෙක තුනකට පස්සේ ඔයාට ඔය කොමාව ආවනම් මං කොච්චර සතුටු වෙනවද... ඔයා දන්නවද මේ වෙඩින් එක කැන්සල් උන එක මට කොච්චර බලපෑවද කියලා... ආ... මම එහෙම් පිටින්ම වෙනස් වුණා... ඔයා මෙච්චර දවසක් දක්කේ මංජුලා කියන පිස්සු කෙල්ල විතරයි... ටිකක් වැඩිපුර එන්ජෝයි කරන කෙල්ලෙක් විතරයි.. ඒත් අද ඉඳලා විමුක්ති මොරගොඩ බලාගන්නවා නියම මංජුලා කවුද කියලා... තමුසේ ඔහොම ඇඳට වෙලා බූතයා වගේ බලාගෙන ඉන්නවා... අන්තිමට තමුසෙවයි තමුසෙගේ අර කෙල්ලවයි මරලා දානවා... මහ පාරක... උඹ මගේ ජීවිතේ අපායක් කරන්න හිතුවා නේද... දන් බලපං මං උඹේ ජීවිතේ අපායක් කරන හැටි...'

මංජුලා මේවා කිව්වේ කිසිවක් නොදන ඇය දෙස බලා උන් අහිංසකයාටය. ගෑණු ආත්මයකට වැළඳිය හැකි නපුරුම රෝග සියල්ල දන් මංජුලාට වැළඳී ඇත. ඇය උන්නේ තෘෂ්ණාවෙන් කාමයෙන් අන්ධ වීය.

'කෝ සාලිය කුමාරයගේ ආශෝකමාලාව... හොයා ගන්නවත් නෑ නේද... ඕකිව හම්බ උනොත් මං ඕකිව ඉවර කරන්නේ මිනියවත් හොයා ගන්න බැරි විදිහට... තමුසෙගේ ඔළුව අත ගගා පපුව ලෙව කකා ආදරේ කරන හිහන කුමාරි... කොමා ගැහුවේ එකිව නැතිවෙච්ච දුකටද... පව්... අසරණ ආදරවන්තයා... කෙල්ල නැති වුණාම කොමා ගහනවා... ඔස්ට්‍රේලියාවෙත් ගියාලු... ලව් කරන්නවත් දන්නෑ... මො..නාද බලන්නේ ආ...'

මංජුලා ඇගේ අතින් විමුක්තිගේ කම්මුල් එහෙට මෙහෙට කළේ වියරුවෙන් මෙනි.

'එ..ක දෙයක්... තමුසේ මගේ සටන ඉවර වෙනකල්





මැරෙන්නෙපා... ඊට පස්සේ මමම උඹව මරන්නං...'

මංජුලා විමුක්තිගේ හැඟීමක් නැති දෑස් දෙස මොහොතක් බලා උන්නාය.

'හෙට ඉඳලා මං රහපාන රහපෑමට සමහර විට විමුක්ති මට සරසවි සම්මානත් ලැබෙයි... මොරගොඩ පවුල ඇතුලේ ඉඳගෙන මං ඒ පවුලේ හැමදේම හැපින්නක් වගේ උරනවා... උඹට මොනාත් කරන්න බැරි වේවි... කොමා ගහලා ඉඳපං... බලමු එදට උඹේ අර මහ ලොකු හිහන කුමාරි එයිද කියලා බේරගන්න...'

විමුක්තිගේ මුහුණ දෙස බලාගෙන ඔය ටික කියූ මංජුලා එහෙමම ඇගේ ජංගම දුරකථනය ගෙන ඇමතුමක් ගත්තාය. ඒ සුරම්‍යාටය.

'අ..ම්..මේ මං.. මංජු...'

ඇය ඇඬුවාය.

'අ..නේ මැ..ණික ඔ..යා ආවද...'

'කො..හොම බ..ලාගෙන ඉන්නද.. එයා මා..වත් ද..න්..නෑ... ක..තා කළා කළා... ඒ..ත් ව..චනයක් ක..තා කරන්නෑ...'

'මටත් එ..හෙමම දුකයි පුතේ... කොහොම ඉවසගෙන ඉන්නද...'

'මං.. එ..යාට මෙ..හෙම දු..ක් වි..දින්න දෙ..න්නෑ... අ..ම්මේ ම..ම ම..ම එ..යාට...'

'මට තේරෙනවා පුතේ... අඬන්නෙපා...'

'මං.. මං.. අ..යියට.. පූජාවකුත් තියලා ආ..වේ... හිස හැරුණ අ..තේ ය..න්න හිතෙනවා... ගෙදර ඉන්නත් බෑ... හැමෝම කෝල් කරලා වෙ..ඩින් එක ගැන අහනවා... ම..ට ම..ගේ ජීවිතෙත් නෑ.. එයත් නෑ...'

මංජුලා පුදුමාකාර ලෙස ඇඬුවාය. ඇය ඇඬුවේ විමුක්තිගේ ඇඳ අසළ ඉඳගෙන කකුලක් පිට කකුලක් දමාගෙන සිටිමිනි.

'ම..ට ම..ගේ වි..මු..ක්..තිව සනීප ක..රලා දෙ..න්න අ..ම්මේ...'

'එ..යා සනීප වෙයි මැණික... ඉක්මනට සනීප වෙයි... ඔයා බයවෙන්නෙපා...'

'මං ජීවිතේ බිංදුවටම වැටුණා... අද මට කවුරුවත් නැ.. මං.. මං මහා කාලකණ්ණි කෙල්ලෙක් වු..ණා අ..ම්මේ...'

'එ..හෙම ඔයාට කාලකණ්ණි වෙන්න දෙන්නෑ දුවේ... මං ඔ..යාව බලාගන්නවා... කවුරු නැතත් ඔ..යාට මං ඉන්නවා... ඔයා මගේ ලේලි...'

'ක..වුරුවත් මා..ව තේරුම් ගන්නෑ අ..ම්..මේ.. මට රට දලා යන්නත් හිතුණා... ඒත් මෙ..හෙම අයියා ඉද්දී...'

'අනේ වස්තුවේ ඒ දේ නම් කරන්නෙපා...'

'එයා සනීප වෙනකං ඉන්නවා...' සුරම්‍යාට කතා කර මංජුලා දුරකථනය තැබුවේ සිනාසෙමිනි.

'උඹව විනාශ කරන්න මං පටන් ගන්නේ උඹව හදපු අම්මගෙන්ම තමයි... බලාගෙන ඉඳපං... පිස්සු කොමා...'

මංජුලා කාමරයෙන් පිටතට ආවේ විමුක්තිගේ ලෙඩ මුහුණටද ගසාය. අහිංසකයා එහෙත් ඔහේ බලා උන්නේය.

මේ නපුරු ලෝකය තමාට එහෙම කරනා බවක්වත් ඔහු දන උන්නේ නැත.





# 21

ප්‍රියංවදා වර්ෂාව මාතෘ සායනයට එක්කාගෙන ගියේ මහා පාන්දරය... එතරම් පාන්දර ගොස් තිබියදීත් වර්ෂාත් ප්‍රියංවදත් සිට ගත්තේ දිග පෝළිමක කෙළවරය... බඩවල් උස්සාගත් රජරට ගොවි ගැහැණු සීයක් පමණ පෝළිමේ විය. කෙල්ල පෝළිමේ සිටගෙන සිටිද්දී ප්‍රියංවදට දුක සිතුණි.

'උඹ අරහෙන් ඉඳගෙන ඉඳපන් කෙල්ලේ...'

ප්‍රියංවද වර්ෂාගේ අතකින් අල්ලා කීවාය.

'අ..නේ කමක් නෑ ප්‍රියා... මං ඉන්නම්...'

'දන්නව නම් තව පාන්දර එනවා...'

'ඒකනේ...'

'මෙහේ ගොවි මහත්තුරු කුඹුරු වපුරන තරමටම බබාලත් හදනවා වගේ...'

සැබෑය. සමහර අම්මලාට අවුරුදු හතළිහත් පැන ඇත. ඔවුන් බඩවල් ඔසවාගෙන ඉන්නේ කුළුඳුලේ නොවන බව වර්ෂාට සිතුණි.

'මොරගොඩ පවුලේ එක මුණුපුරෙක් නවලෝකේ උපදියි... අනිත් එකා අනුරාධපුර හොස්පිට්ල් එකේ උපදියි... දෛවයත් මහ

පුදුමයි...'

'එ..යා මේවා දන්නැනේ ප්‍රියා...'

පැයක් පමණ එක දිගට පෝළිමේ සිටිද්දී කකුල් ඇවිලීගෙන යයි.

'තාම එළිය වත් වැටිලා නැනේ ප්‍රියා...'

'ඒකනේ කෙල්ලේ... බලපං අම්මලාට ඉඳගෙන ඉන්න බංකුවක් වත් ගහලා නෑ...'

ඇයට දුක සිතුණි. අම්මලා ඔසවාගෙන උන්නේ ලොකු බඩවල්ය.

'ප්‍රියා...'

'කෙල්ලේ...'

'පැටියට විටමින් ටිකක් එහෙම ලැබුනොත් හොඳයි නේද...'

'දෙයි වස්තුවේ...'

කුසේ ඉන්නේ ඔහුගේ දරුවාය. දරුවා මෙළොව එළිය දකිද්දී ඔහු වාගේම ඉන්නවා දකින්නට ඇය ආශා කළාය.

මාතෘ සායනයෙන් පිටතට එද්දී දවල් එකොළහත් පැන අවසානය. ඒ වන තුරු වර්ෂාගේ කුසට කිසිවක් වැටී තිබුනේ නැත. ඇගේ පමණක් නොව එතන උන් හැම අම්මා කෙනෙක්ම උන්නේ මහා පාන්දර සිට පෝළිමේය.

'පුදුමයි... මේ වලට ආවාම අම්මා කෙනෙක් වෙන එකත් එපා වෙනවා...'

ප්‍රියංවද ආවේ බණිමිනි.

'උඹට බඩගිනියි කෙල්ලේ... වරෙන් යන් අතන පුංචි කඩයක් තියෙනවා...'

ප්‍රියංවද වර්ෂාගේ අතින් අල්ලාගෙනම සාලියපුර හන්දියේ වූ කුඩා හෝටලයකට ඇයව ගෙන ගියාය. හෝටලයේ උණුවෙන් පොල් රොටි දමමින් තිබුණි. රොටිය කද්දීම වර්ෂාට වමනය ආවේය.

'පාන්දර ඉඳලා බඩගින්නේ... යන් කෙල්ලේ ගෙදර... අපි තේ





එකක් හිමීට බීලා ඉඳි ආප්ප මොනා හරි කමු...'

වර්ෂාව එතනින් ත්‍රීවීලරයක දමාගෙන ප්‍රියංවද ආවේ වේදනාවෙනි. මොරගොඩලා මේ කෙල්ලට මෙහෙම කළේ ඇයිදැයි ඇය අනේක වාරයක් දෙවියන්ගෙන් ඇසුවාය.

'අනිත් දවසේ එනකොට මං උඹට තේ ටිකක් හදගෙන එන්නම්...'

'කමක් නෑ ප්‍රියා... ම..ට අමාරුවක් නෑ...'

'ම්.. මෙහෙම ඇලවෙයං...'

ප්‍රියංවද කෙල්ලව ඇගේ උකුලට බර කරගත්තාය.

දුප්පත් කෙල්ලෙකුට ආදරයේ නමින් දුන් දුක මහ පුදුමාකාර යැයි ප්‍රියංවදට සිතුණි. ආදරයේ දුකට අමතරව තව කොතරම් දුකක් දන් මේ කෙල්ල විඳිය යුතුද...

දරුවෙක් බිහි කරන්නට අම්මා කෙනෙක් විඳිය යුතු දුක එහෙමම ඇය දන් විඳිය යුතුය. ඒ දුක බෙදගන්නට උපදින දරුවාගේ තාත්තා නැත.

දරුවා ලැබුණු පසු කොහොමත් ගොස් විමුක්තිව හම්බ වෙනවා යැයි ප්‍රියංවද සිතා ගත්තාය. ඒ මේ කෙල්ල වෙනුවෙනි.

'කෙල්ලේ... යන ගමන් මස් චුට්ටක් අරන් යන්ද...'

ප්‍රියංවද ඇසුවේ දිගටම කෙල්ලගේ බඩට වැටෙන්නේ කරවල කටුම නිසාය. දරුවෙක් ලැබෙන්නට ඉඳිද්දී මසක් මාළුවක් වැටිය යුතුමය.

'ග..මු කෙ..ල්ලේ.. ඒත් මම...'

'උඹ නොකන මස් මොකට ගන්නවද බං... කරවල කෑලිම කාලා හරියන්නැනේ බං...'

'එයා වෙනුවෙන් වෙච්ච බාර වල හැටියට මේ කන කරවල කෑල්ලත් නොකා ඉන්න පුළුවන් නම් හොඳයි ප්‍රියා... මං කොහොමද මස් කන්නේ...'

දෙවියන් ජීවිතයට තුට්ටුවක දෙයක් නොදී තිබෙන තත්වයකදීත් කෙල්ලගේ කැප කිරීම පුදුමාකාර යැයි ප්‍රියංවදට සිතුණි.

'එහෙනම් මාකට් එකේ වැව් මාළු ඇති... ඒ ටිකක්වත් අරන් යන්...'

'ම්...'

මේ තරම් පේවී බාර වී තිබියදීත් ජීවිතයට මෙහෙම වූ එක පුදුමාකාර යැයි වර්ෂාට සිතුණි. ඇත්තටම ජීවිතයට තිවනකට ඇත්තේ මේ කුසේ වැඩෙන දරුවා පමණි.

*   *   *   *   *   *   *   *   *   *   *   *

සක්විති ඔහු සේවය කරන ආයතනයෙන් අද දහවල් පිට වූයේ ඔහුගේ අස්වීමේ ලිපිය ආයතන ප්‍රධානියාට බාර දීය. ඉතා දක්ෂ කළමණාකරුවෙක් වූ සක්විති මොරගොඩ මෙසේ එකවර ආයතනයෙන් අස්වීම ආයතන ප්‍රධානියාට අදහාගන්නනට බැරි දෙයක් විය.

'සක්විති ඔයාගෙම බිස්නස් එකක් පටන් ගන්නවද නැත්නම් වෙන...'

'නෑ සර්... එහෙම දෙයක් නෙමේ... මගේ මල්ලිගේ තත්වේ මං සර්ට කිව්වනේ...'

'ඔව්.. මටත් හරි දුකයි...'

'මල්ලිව කොහොම හරි සනීප කරගන්න ඕන සර්... වයිෆ්ට බබත් ලැබෙන්න ළඟයි...'

'සක්විතිට කොහොමත් තාත්තගේ බිස්නසුත් තියෙනවනේ...'

'බිස්නස් තිබ්බත් මං මේ කම්පනි එකේ හරි ආශාවෙන් වැඩ කළේ... මට මල්ලි වෙනුවෙන් ගොඩක් කැප වෙන්න තියෙනවා සර්... සමහර විට මල්ලිව සිංගප්පූ ගෙනියන්නත් වෙයි...'

'හොඳයි... මං සක්විතිගේ රෙසිග්නේෂන් එක ඩිරෙක්ට බෝඩ් එකට දන්නම්...'





'තැන්කියූ සර්... මම අස්වුණත් අවශ්‍ය වෙලාවක ඇවිත් මගේ පෝස්ට් එකට එන කෙනාට උදව් කරන්නම් සර්...'

සක්විති ආයතනයෙන් පිට වූයේ දරාගන්නට බැරි දුකක්ද සමඟය. ජීවිතයේ නරක කාලය පැමිණි විට නොවෙන දෙයක් නැත. එහෙත් දෛවය කවරක් ජීවිතයට දුන්නද ජීවිතයෙන් පලා යා නොහැක.

සක්විතිට සිහිවූයේ තව ටික දවසකින් උපදින්නට යන දරුවාය. පොඩි එකා උපදින්නේ ටිකක් කරදර වැඩි කාලයක බව ඇත්තය. එහෙත් කරන්නට දෙයක් නැත.

සක්විති වාහනය පාරට දමමින්ම මේධාට කතා කළේය.

'බ..බා...'

සක්විතිගේ හඬේ වූ දුක්බර බව මේධා වචනයෙන්ම තේරුම් ගත්තාය. ඇය ඒ තරමටම ඔහු ගැන දන උන්නාය.

'ඇ..යි මහත්තයෝ... දු..කෙ..න් ව..ගේ...'

'එ..හෙම නෑ...'

'මොකක්ද වුණේ...'

මේධා සක්විති කියූ දේ ගණනකට නොගෙනම ඇසුවාය.

'මං.. අ..ද...'

'ඉතින්...'

'ම..ගේ රෙසිග්නේෂන් එක බාර දුන්නා...'

මේධාට හීල්ලින. සක්විති ඔහු කරන රැකියාවට කොතරම් ආදරයෙන් උන්නාද කියා ඇය දන උන්නාය.

'දු..ක..යි..ද...'

'ම්.. ටි..ක..ක්... චීෆ් හිතුවේ වත් නෑ...'

'මේ කරදර ඉවර වුණාම අපිට අපේම මො..නා හ..රි දෙයක් පටන් ගන්න පුළුවන්නේ මහත්තයෝ...'

'ඔව්.. එහෙම කරමු...'

ඔහුට දුක් විඳ පුරුදු නැත. ඔහුට පමණක් නොව ඔහුගේ මල්ලීටද දුක් විඳ පුරුදු නැත. මේධා ඒ බව හොඳින්ම දන උන්නාය.

'දැ..න් කොහෙද ඉන්නේ...'

'අ..ද වැඩ කරන්න බෑ බබා... හිතට හරි නෑ...'

'ම්.. දන් ගෙදර එනවද... මං කෑම ටිකක් හදන්නද...'

'එපා... කොල්ලා හරි ආසයි බුහාරි එකේ බුරියානි කන්න... මං ඌට ටිකක් කවලා අපිටත් පැකට් දෙකක් අරන් එන්නම්...'

මේධාගේ දෑස් තෙමී ගියේය. මේ අයියා මලෝ දෙන්නාව දෙවියන් බලා ගත යුතුය.

'ම්... ධනේ අයියා මල්ලි ගාව ඉන්නවා... මං දන් කතා කළා...'

'කොල්ලා මොනාද කරන්නේ...'

'කි..ය..න්නත් දුකයි... කොහොම හිටිය කොල්ලෙක්ද..'

'මං ගිහින් කවලා එන්නම්...'

'ම්.. මල්ලි හරි ආසනේ පරිප්පුයි ඉඳි ආප්පයි කන්න... රෑට මං හදන්නම්... අපි ගිහින් කවලා එමු...'

සක්විති මරදන බුහාරි මුස්ලිම් හෝටලය අසළ වාහනය නැවැත්තුවේ අතීතය සිහි කරමිනි. අදින් වසර දහයකට පමණ පෙර ආනන්දයේ ඉගෙන ගනිද්දී ඔහුත් විමුක්තිත් නිතරම දවල්ට කන්නට එන්නේ මේ බුහාරි හෝටලයටය.

එදවස බුහාරියෙන් කා එන බව අයියාවත් මල්ලීවත් ගෙදර පැමිණ කියන්නේ නැත. ගෙදර ආ පසු අම්මාගේ බත්ද කෑ යුතුය. ලොකුම දඬුවම එයය. එහෙත් අනිත් දවසෙත් ඔවුන් දෙන්නා පාසල් නිළ ඇඳුම පිටින්ම දෙක වෙද්දී බුහාරියට රිංගන්නෝය.

සක්විති ධනසිරිටත් එක්කම බුරියානි පැකට් ගත්තේය. බුහාරියේ බුරියානි එකෙන් තවමත් එන්නේ අර ඉස්සර ආනන්දයේ ඉඳිද්දී කද්දී ආ සුවඳමය.

සක්විති කෑමත් රැගෙන රෝහල් කාමරයට එද්දී ධනසිරි





විමුක්ති අසළ හිටගෙන ඔහුගේ හිස මසාජ් කරමින් උන්නේය. ඔහු එහෙම කරන්නේ එසේ කරවත් මල්ලීගේ සිහිය නැවත ඔහුට ලබා දිය හැකි දැයි බලන්නටය.

ධනසිරි හිස මසාජ් කරද්දී විමුක්ති ඔහේ පොඩි එකෙකු සේ දෑස් පියාගෙන උන්නේය.

සක්විති පැමිණ විමුක්ති දෙසත් ධනසිරි දෙසත් බලා උන්නේ දුකෙනි. විමුක්ති නමින් අද ඇත්තේ ශරීරයක් පමණි. හදවතක් නැත.

'අනුලා කෝවිලෙන් තෙලක් ගෙනත් දුන්නා සක්විති මහත්තයා... මං මේ ඒක ගගා හිටියේ...'

ධනසිරි කීවේ දුකෙනි.

'එහෙම දෙයක් වත් කරන එක ලොකු දෙයක් ධනේ අයියේ... හාස්කමකින් වත් කොල්ලට සිහිය එනවනම්...'

'ඉක්මනට සනීප වෙයි සක්විති මහත්තයා... අපල කාලේ ගෙවිලා යනකල් විතරයි...'

ධනසිරි විමුක්තිගේ අවුල් වූ කොණ්ඩය සකසමින් කීවේය. විමුක්ති හැඟීමක් නැති දෑසින් සක්විති දෙස බලා උන්නේය. සක්විති සිනාසුණේ අසරණවය.

'ධනේ අයියා කෑවද...'

'තව නෑ සක්විති මහත්තයා...'

'ආ.. මේ බුරියානි පැකට් එක ගන්න...'

'පුංචි මහත්තයයි සක්විති මහත්තයයි...'

'මං කෙල්ලට කවලා ගිහින් මේධා එක්කම කනවා...'

ධනසිරි සක්විති අත තිබූ බුරියානි පැකට් එක ගෙන එය ලිහා පිඟානක් මත තබා යළි සක්විති අතටම දුන්නේය. ඔහු යන්නේ මල්ලීට කවන්න බව ධනසිරි දනී.

'දහයට විතර මාත් බිස්කට් කවලා තේ පෙව්වා... ඒවා කරද්දී හරියට පිච්චෙනවා සක්විති මහත්තයා...'

'මොනව උනත් කොල්ලා අපිත් එක්ක ඉන්නවනේ ධනේ අයියා...'

ධනසිරි වතුර වීදුරුවක් ගෙනවිත් බෙඩ් කබඩ් එක මතින් තැබුවේය.

'උඹට බඩගිනි නේද මල්ලී...'

සක්විති ඇසුවේ විමුක්තිගේ ඇඳ අසළ වූ පුටුවේ වාඩි වී කොල්ලාගේ බඩ අතගාමිනි. මුහුණ දන් නොතේරෙන වියේ පොඩි එකෙකුගේ මෙනි.

'උඹ මේ බුහාරි එකේ බුරියානි බත් එක කන්න හරි ආසයි... මතකද ඉස්සර උඹයි මමයි ආනන්දේ ළඟ ඉඳලා පයින්ම බුහාරි එකට එනවා... සමහර දවස්වල අපිට බුරියානි දෙකත් මදි... පස්සේ තව එකකුත් අරගෙන අපි බෙදගෙන කනවා... ආ කාපන් කොල්ලෝ...'

සක්විති ඇනූ බුරියානි බත් කටක් විමුක්තිගේ මුව මත තැබුවේ දෙනෙත් කඳුළින් තෙත්ව තිබියදීය. විමුක්ති පොඩි එකෙකු සේ මුව ඇරියේය. ජීවිතයට අද හවස පය තැබූ එකෙක් පවා අම්මාගේ කිරි රස හඳුනයි. විමුක්තිද බුරියානි බත් එකේ රහ වැටීදේ එය කෑවේ තෘප්තිමත් මුහුණිනි.

'ධනේ අයියා... බලපං.. කොල්ලට මොනවත් මතක නෑ... ඒත් මේ බුරියානි එකේ රහ හොඳට මතකයි... කාගෙන කාගෙන යන්නේ...'

'වර්ෂා නංගී ඇවිත් කෑම ටිකක් හදලා දුන්නනම් පුංචි මහත්තයට හැම දේම මතක් වෙයි...'

ධනසිරි කියූ දේට සක්විති හිස වැනුවේ ඕනාකමිනි.

'කෙල්ලයි මල්ලියි අතර මොන තරම් දේවල් වෙන්න ඇත්ද ධනේ අයියා... ගෑණියෙක්ට මහ පුදුම දේවල් කරන්න පුළුවන්...'

'මාත් වර්ෂා නංගිව හැමතැනම බලනවා සක්විති මහත්තයා...'

'ම්.. වතුර ටික බීපන් කොල්ලෝ... රෑට අක්කා උඹට ඉඳි ආප්ප හදනවා කිව්වා... පරිප්පුත් එක්ක... උඹ ආසනේ...'





විමුක්ති කාලයකට පසුව කුස පිරුණු නිසාදෝ තරමක් ප්‍රබෝධමත්ව උන්නේය. සක්විති ඔහු ළඟට වී ටික වේලාවක් උන්නේය.

'කාලා ඉන්න ධනේ අයියා...'

'මං මහත්තයා ගියාම කන්නං...'

'අනුලක්කටයි මේධටයි ළඟ ළඟම බබාලා ලැබෙයි නේද ධනේ අයියා...'

'ඒකනේ සක්විති මහත්තයා... අනුලගේ නංගි කෙනෙක්ව මේ සතියේ ගෙන්න ගන්නවා... ගෙදරත් වැඩ කෙරෙන්නෙපැයි...'

'කෙල්ල හිටියනම් බඩදරු අම්මලා දෙන්නවත් බලාගෙන මේකවත් බලාගෙන බුක් ෂොප් එකත් බලා ගන්නවා... ඒත් ඒකි නෑනේ... මං අද අස්වීමේ ලියුමත් දීලා ආවේ ධනේ අයියා...'

'දෙයියනේ රස්සාවෙන්...'

'ඔව්...'

'මේ කරදර කාලේ ඉක්මනටම යයි සක්විති මහත්තයා...'

සක්විති හිස අතගාමින් සිටිද්දීම විමුක්තිට නින්ද ගොස් තිබුණි.

'මේ බලපං... නිදි.. ඉස්සරත් මෙහෙමයි... බෙහෙත් දෙන්නත් ඕන නේද ධනේ අයියා...'

'මං ඇහැරුණාම දෙන්නම්...'

සක්විති පිටව ගියේ විමුක්තිගේ හිස තවත් ටික වේලාවක් අතගගා ඉඳීමෙන් අනතුරුවය.

# 22

මංජුලා ඇහැ ගහගෙන ඉන්නේ විමුක්තිගේ පොත්හලටය. ඒ ගැන ඇය එහෙන් මෙහෙන් තොරතුරු සෙව්වාය. එහි සෑහෙන මුදලක් ගැවසෙනා බව ඇය දන උන්නාය.

විමුක්තිගේ අසනීප තත්වය නිසා පොත් හල ඔහුට කරගෙන යා නොහැක. කෙසේ හෝ එය තමාගේ අතට ගතහොත් සෑහෙන තරම් මුදලක් ඉන් ඇද්දවිය හැකි බව මංජුලා දන උන්නාය.

මංජුලා සුරම්‍යාව හමුවන්නට ගියේ එයද හිතේ තබාගෙනමය. සුරම්‍යා උන්නේ විමුක්තිට බෝධි පූජාවක් තබන්නට කළමනා සූදනම් කරමිනි.

"ආ... ඔයත් ආපු එක හොඳයි... දෙන්නත් එක්කම රජමහා විහාරෙට යන් පුතේ... අද පොඩි පුතාට තියන බෝධි පූජාවේ දෙවෙනි දවස..."

මංජුලා සුරම්‍යාගේ කතාව ඉවසුවේ අමාරුවෙනි. "මං බෝධි පූජාවක් නෙමේ උඹලට තියන්නේ.. භූතියං පූජාවක්... මොරගොඩලව හැදි ගෑවිලාම යන්න..." මංජුලා සිතින් කීවාය.

"මං.. හවස අයියා ළඟට වෙලා ඉන්න කියලා හිතුවේ අ..ම්..මේ..."





"ඒකත් හොඳයි.. මං දවල් යද්දී නිදි... ලොකු පුතා බුරියානි කවලා ගිහින්..."

සුරම්‍යා කීවේ ලද පස් මල් සකසමිනි.

"එයාට එහෙම වෙලා තියෙද්දී මටත් ගෙදරට වෙලා ඉන්නත් බෑ.. පිස්සු වගේ..."

මංජුලා සෑහෙන තරම් දුකක් පපුවේ උපදවාගෙන කීවාය. මංජුලාගේ මේ ආත්ම වංචාව තේරුම් ගන්නට තරම් ඉවක් සුරම්‍යාට තිබුනේ නැත.

"මං.. ද..න්නවා පුතේ... මොනා කියලා කරන්නද... කරන්න තියෙන හැම දෙයක්ම කරලා සනීප කරගමු..."

"ම්.. කවදද දන්නෑ විමුක්ති අයියව ඩිස්චාජ් කරන්නේ..."

"දවස් දෙක තුනකින් කරයි... ඒකා එහෙම මේ ගෙදර එනවා කියලා හිතද්දීත් වාවන්නෑ..."

සුරම්‍යා දෑසට ඉනු කඳුළක් පිස ගත්තාය.

"එයා වෙනුවෙන් කරන්න පුළුවන් හැම දෙයක්ම මාත් කරන්නම් අම්මේ..."

"ඔව්.. එයාව අයිති ඔයාටනේ මැණික..."

මංජුලා යටැසින් සුරම්‍යා දෙස බැලුවාය.

"අයියා කරගෙන ආපු වැඩ අපරාදේ... එයා හරි ආසාවෙන් බුක්ෂොප් එක කරගෙන ආවේ..."

"මටත් හරි දුකයි... ඒකෙ ළමයි ටිකත් ඊයේ පොඩි පුතාව බලන්න ඇවිත් තැන් තැන්වලට වෙලා ඇඬුවා..."

"බුක්ෂොප් එක වහල නැනේ අම්මේ.. නේද..."

"නෑ... අපේ පවුලට හිතවත්ම ළමයෙක් දනට වැඩ ටික කරගෙන යන්නේ... ශ්වේතා කියලා..."

මංජුලා සෑහෙන වේලාවක් කල්පනා කළාය.

'නුගේගොඩින් යද්දී මමත් ගොඩ වෙන්න හිතුවා... ඒත් මොකක්ද වගේ අම්මා...'

'ඇයි එහෙම කියන්නේ... මහත්තයගේ දේවල් ඔයා නොබලා කොහොමද...'

'ඔය එන්නේ ගැණි මගේ පොටට...' මංජුලා සිතුවේ යටි සිතෙනි.

'උදේ වරුවේ ටිකවත් මං ගිහින් බලන්නම්...'

'මං ඒ ළමයට කියන්නම් ඔයා එනවා කියලා...'

'දනට ඒ ඇති...' මංජුලා සිතුවාය. බඩත් ඔසවාගෙන අනුලා බීම එකක් රැගෙන ආවේ ඒ මොහොතේය. මංජුලා ඇය දෙස බලා මඳ සිනාවක් පෑවාය. 'මෙයා තාමත් එන එක නතර කරලා නෑ වගේ... හිම්හිට බුක්ෂොප් එකට විදින්නද දන්නෑ කල්පනාව...' අනුලා සිතුවාය.

'ගන්න මංජුලා බේබි...'

'ආ...'

'අනුලටත් මේ වෙලාවෙ දුවන්න පනින්න බෑනේ පුතේ...'

සුරම්‍යා කීවේ බඩ ඔසවාගෙන ආ අනුලා දෙස බලාය.

'ඉතින් අම්මා තව සර්වන්ට් කෙනෙක් බැලුවේ නැද්ද...'

මංජුලා ඇසුවේ හිතක් පපුවක් නැති අයෙකු සේය. දුප්පත්කමට අනුන්ගේ ගෙවල් වල බැලමෙහෙවර කළද ඒ අහිංසකයින්ට ඔවුන් ඉදිරියේම වැඩකාරයන් කියන සිරිතක් නැත. මංජුලා එවැනි මිනිස්කම් අඳුනන්නේවත් නැත. දැසට කඳුළු පිරෙද්දී අනුලා හැරුණාය.

'අනුලාගේ නංගී කෙනෙක් එනවා...'

මේ ගෙදරට ආ දවසේ සිට කට පුරා අක්කේ කියූ වර්ෂාව අනුලාට සිහිවිය. ඇය වැනි උතුම් කෙල්ලෙක් ඉදිරියේ මේ වැනි බාල ගෑණියෙක් ගැන සිතීමත් හොඳ නැත.

සුරම්‍යාත් මංජුලාත් නිවසින් පිටව ගිය පසු අනුලා කතා කළේ පොත් හලේ සේවය කරන ශ්වේතාටය. අනුලාත් ශ්වේතාත් හමුවී





ඇත්තේ වතාවකදී දෙවතාවකදී පමණි.

'ම..ට ශ්වේතා මිස්ට කතා කරන්න පුළුවන්ද...'

අනුලා කතා කළේ එසේය.

'ඔව්... ශ්වේතා තමා කතා කරන්නේ... මේ කවුද කතා කරන්නේ...'

'ශ්වේතා මිස්ට මතකද දන්නෑ මාව... මං අනුලා.. පුංචි මහත්තයලගේ ගෙදර...'

'හරි හරි අනුලක්කේ... ඔච්චර විස්තර මොකටද... මං දන්නැද්ද අනුලක්කව...'

ශ්වේතා කතා කළේ සුහද බවිනි. අනුලාට සතුටක් දැනුණි.

'අ..නේ මං හිතුවා ශ්වේතා මිස්ට මා..ව...'

'ඔන්න අනුලක්කා මගෙන් බැණුම් අහනවා... වර්ෂා අක්කා මගේ බොස්... එයාට ඔයා කට පුරා ආදරෙන් නංගියේ කියනවා... මට මිස් කියනවා...'

'සමාවෙන්න නංගියේ...'

'ඉතින් අනුලක්කේ බබා කවදද ලැබෙන්නේ...'

'අ..නේ නංගී ඒවත් දන්නවා...'

'මට වර්ෂා අක්කා ඔයා ගැන කොච්චර කියලා තියේද...'

දෙදෙනාටම ඇයව සිහි විය.

'මතක් වෙනකොටත් දුකයි නේද අක්කේ...'

'ඒකනේ නංගියේ...'

'මෙහෙත් එහෙමයි... අමාවක වගේ...'

'ඉතින් නංගියේ... පුංචි මහත්තයා බලන්න ඊයේ ගියා නේද... මට ධනේ කිව්වා බුක් ෂොප් එකේ කට්ටිය ආවා කියලා...'

'බැලුවා තමයි... ඊයේ මහ රෑ වෙනකල් නින්දක් නෑ... යද්දී මං බස් එකෙන් බැහැලා කළුතර බෝධියට බාරෙකුත් වෙලා ගියේ...'



Hemantha007
For free distribution

කෙල්ල කතා කළේ අවංක දුකකිනි.

‘අනේ නංගියේ මම මේ කතා කළේ නංගිට පොඩි දෙයක් කියන්න...’

‘කියන්න අක්කේ...’

‘මේවා කියන්නෙත් නෑ... ඒත් මට වර්ෂා නංගි ඔයා ගැන ගොඩක් හොඳ කියලා තියෙනවා ඒකමයි මේ කියන්නේ... ඇරත් ඔයා වගේම මාත් පුංචි මහත්තයටයි වර්ෂා නංගිටයි හරිම ආදරෙයි...’

‘අ..නේ මං දන්නවා අක්කේ... ධනේ අයියයි මායි ගොඩක් වෙලාවට කතා කර කර ඉන්නවා...’

‘මේකයි නංගි... මංජුලා මිස් ඉන්නේ...’

‘එයා ඉන්නේ නැත්නම් තමා හොඳ...’

ශ්වේතාට ගත් කටටම කියවිණ.

‘ඒකනම් ඇත්ත... ඒත් එයා අපි වගේ නෙමේ... එහෙම ලේසියෙන් පෙනේ හකුල ගන්න හැපින්නියක් නෙමේ...’

‘ඒක මාත් දන්නවා අක්කේ...’

‘මං කියන්න ගියේ නංගී දන් ගෑණි බුක් ෂොප් එකට ඇහැ ගහගෙන ඉන්නේ...’

‘මේකට...’

‘ඔව්... මට දුක අර කෙල්ල මැරිගෙන දියුණු කරපු තැන... එතනට එයා එන්නයි හදන්නේ...’

‘මෙතන ආදායමත් හොඳනේ...’

‘ඒකම තමයි... සල්ලි පේන්න බෑ...’

‘ඒකත් එහෙමද.. විමුක්ති අයියට මේ කරදරේ වෙන දවසේ උදේ අයියා මාව ගෙනත් කතා කළා අක්කේ... ඒ වෙලාවේ අයියා මගෙන් දෙයක් ඉල්ලුවා... ඒ මේ බුක් ෂොප් එක අක්කා බලා ගත්ත වගේ බලාගන්න කියලා... මං ඒක අයියට පොරොන්දු වුණා...’





‘එහෙම වෙච්ච එක ලොකු දෙයක් නංගී... කවදහරි වර්ෂා නංගියි පුංචි මහත්තයයි එකතු වෙනවා... ඒක මට විශ්වාසයි...’

‘මටත්.. ඒක එහෙමම වෙන්න ඕන අක්කේ... ඒත්.. මෙයා දන් ආවොත්...’

‘පොත් ගැන නම් බලන එකක් නෑ... ආපු ගමන් කැෂියර් එකට කිට්ටු වෙයි...’

‘ම්.. මම එහෙම වුණොත් සක්විති අයියා එක්ක කතා කරන්නම්...’

‘ඒක තමා හොඳම දේ...’

‘අක්කා මේක මට කියපු එක හොඳයි... මං අද යන්නම් මේධක්කලගේ ගෙදර...’

‘ඔයා පරිස්සමින් නංගී...’

‘ඇත්ත අක්කේ.. ජීවිතේ දුකක් හරි කියන්න හිටියේ දෙන්නයි... අක්කා ආගිය අතක් නෑ... අයියට...’

ශ්වේතා කියන්නට ආ දේ එහෙමම ගිල ගත්තාය.

‘මොනා හරි ඕන වුණොත් කතා කරන්න අක්කේ... හොඳේ.. මං එනවා...’

‘අනේ වස්තුවේ ඒ වචනේ ඇති... බුදු සරණයි.. මං කියන්නම්...’

‘ම්... බුදු සරණයි...’

දුරකථනය තබා ශ්වේතා සෑහෙන වේලාවක් කල්පනා කළාය. මංජුලා පොත්හලට පැමිණියහොත් මෙතන තව දුරටත් ඉදීම පවා ප්‍රශ්නයකි. ශ්වේතාට දුක සිතුනේ විමුක්තිට වූ පොරොන්දුව ගැනය. ජීවිතයේ පතුලටම වැටුණ මොහොතේ තමාට පිහිට වූයේ වර්ෂාත් විමුක්තිත් බව කිසි දිනයක අමතකව යන්නේ නැත. ඔවුන් දෙදෙනා වෙනුවෙන් කළ හැකි උපරිම දේ කරනවා යැයි ඇය දැඩිව සිතා ගත්තාය.

ඇය එහෙමම මේධාට ගත්තේ තීරණක් ගෙනය.

"අක්කේ... මං ශ්වේතා..."

"අ..නේ කෙල්ලේ... උඹට එහෙනම් මාව මතක් වුණා..."

"ඔන්න අක්කා මං ගැන හිතන විදිහ... එක්කෙනෙක් ගැන මතක් වුණාම මට එක දිගට වැල වගේ ඔයාලා ඔක්කොමල්ලව මතක් වෙනවා..."

"එක්කෙනා කෙල්ලද..."

"ම්... වර්ෂා අක්කව කොහොම අමතක කරන්නද... යද්දී ඔළුව අතගාලා මාව යැව්වේ..."

ශ්වේතා කීවේ කඳුළු පිසිමිනි.

"මටත් ඒකිව මතක් නොවෙන වෙලාවක් නෑ..."

"අක්කා හවසට ගෙදර ඉන්නවද... අයියයි අක්කයි දෙන්නම..."

"ඇයි කෙල්ලේ..."

"වූ..ට්ටකට ඇවිත් හම්බවෙන්න... පොඩ්ඩක් කතා කරන්න දේවල් ටිකක් තියෙනවා..."

"හවස කොල්ලව බලන්න නවලෝකෙට යන්නනෙ ඉන්නෙ කෙල්ලේ..."

"අයියටයි අක්කටයි පුළුවන්ද යද්දී මාවත් දගෙනම යන්න..."

"ම්.. එහෙනම් පහමාරට විතර ලෑස්ති වෙලා ඉඳපන්..."

ශ්වේතාට සැනසීමක් දැනුණි. එද වර්ෂා නුගේගොඩට ආ මොහොතේ කෙසේ හෝ ඇය ඉන්නා තැනක් දැනගන්නට තිබුණා යැයි ශ්වේතාට සිතුණි. අද මේ සිදුවන බොහෝ දේ වලට පිළිතුරු ඇය ළඟ ඇත.





# 23

ඔහු ළඟ නැති දුක පපුව අල්ලා බලන්නට හැකි තරම්ය. වෙලාවකට ඉහිලුම් නොදෙන සේ මහා දුකක් දනෙයි. දරුවා ගැන සිතා ඒ දුක වාවා ගන්නවා මිසක කොහොමටවත් ඒ දුක ඉවසාගෙන ඉන්නට පුළුවන් දුකක් නම් නොවේ.

හිතට මහා දුකක් දනෙද්දී හිතෙන්නේ දුවගෙන ගොස් අනුරාධපුරෙන් කොළඹ බලා යන බසයක එල්ලෙන්නටය. එහෙත් කොහේ හෝ මුල්ලකට වී ඔහුගේ මුහුණ බලා ආවද ඒ දුක පහව යන්නේ නැත. මේ දුක තුනී වන්නට නම් දුවගොස් ඒ පපුවට හිස තබාගෙන කල්පයක් වත් සිටිය යුතුය.

දෛවය ජීවිතය මැද මේ තරම් වියෝගයක් තැනුවේ මේ ආදරය මේ තරම් උතුම් බව හදවතට කියා දෙන්නටද... ඒ රුව වත් නොතහට ලක් නොවන මායිමකට ජීවිතය ගෙනවිත් ඇරලුවේ ආදරය නාමයෙන් හදවතේ දුක් විඳින තරම ගැන ඔප්පු කර පෙන්වන්නටද...

හදවත දුකින් මිරිකෙන වාරයක් වාරයක් පාසා තව තවත් ඔහු නමින් ළය තෙත් වෙයි. ජීවිතය මෙහෙම දුක් දිදී වත් අවසන සහන් එළියක් පෙන්වනවා නම් කොතරම් දෙයක්ද...

පැයක් තිස්සේ වර්ෂා කැඩූ කහ කනේරු මල් සුදු මල් මිටක්ද තබා වට්ටිය සුන්දර ලෙස සකස් කළාය. අද බෝධි පූජාවට කඨින චීවරයක් පූජා කරන්නට වර්ෂා බාර ගත්තේ ආශාවෙනි. කුඩාහේන පන්සලේ භවස බෝධි පූජාවේදී ඒ කඨිනය පූජා කරන්නට යන්නට ඇය බලා උන්නාය.

මේ හිතට දනෙන දුක නම් කෙසේ හෝ පපුව මිරිකාගෙන විඳ ගත හැක. වාවාගන්නට බැරි වන්නේ අනාගතය ගැන සිතෙද්දීය. ඔහු දෙවියන් දුන් පඩුරක් වැනිය. ඒ සෙනෙහස නැති ජීවිතය කොතරම් අන්ධකාරද... දුක වාවාගන්නට බැරි වෙන්නේ ඒ අන්ධකාර අනාගතය සිහිවෙද්දීය. තමා පමණක් නොව ඒ අන්ධකාරයේ තම දරුවාත් කෙදිනක හෝ තනි වන්නේය.

දවසක මේ සියල්ල විසඳේ නම්... ජීවිතය කොතරම් සුන්දරද... එහෙත් ඒ සිහිනයේ ජීවත් වෙනවා ඇරෙන්නට අන් සැනසීමක් ජීවිතයට පෙනෙන මානයේ වත් නැත.

වර්ෂා ළිඳෙන් ගත් වතුර ටික පෙරා මල් ටික දේන කළාය. කනේරු මල් වලින් එන සුවඳ සැන්දෑවේ තිබූ පාළුව වැඩි කළා යැයි ඇයට සිතුණි.

ජීවිතය ගැන සිතන්නට බොහෝ දේ ඉතිරිව ඇත. දරුවෙක් ජීවිතයට එද්දී හිතන්නට කොතරම් දේ ඇත්ද... ඒ සියල්ල අද සිතන්නට වී ඇත්තේ තනිවමය. තට්ට තනිවමය.

ඔහු ළඟ උන්නා නම් අද වැනි දවසක් කොතරම් සුන්දරද... නරකම දවස්වල ජීවිතයේ ලස්සනම දවස් උදා වෙන්නේ ඇයි...

*       *       *       *       *       *       *       *       *       *

මංජුලා පොත් හලට ආවේ ශ්වේතා පිටව යන්නට පෙරය. මංජුලාව දකිද්දීම ශ්වේතාට සිහිවූයේ අනුලා කියූ දේය. එහෙත් විමුක්ති රෝහලේ සිටින අතරවාරයේදීම මංජුලා පොත්හලට ඒයැයි ශ්වේතා සිතුවේ නැත. ˙කොල්ලට ආදරයක් තියෙනවා නම් කොල්ලා ළඟට වෙලා ඉන්න ඕන... මෙතනට දුවගෙන එන්නේ වෙන දේකට...˙





ශ්වේතා සිතුවේ පොත් හලේ පොත් රාක්ක අතරින් ඉදිරියට එමිනි.

එහෙත් මංජුලාට පොත් හලට එන්නට එපා යැයි කියන්නට තමාට බැරි බව ශ්වේතා දනී. එතනදී ඇය අසරණය.

පොත් හල අතරින් ඉදිරියට ආ මංජුලා නැවතුනේ විමුක්තිගේ කාමරය අසළය. එය තිබුනේ වසා දමාය. එහි යතුරු දෙකක් තිබුණි. එක යතුරක් තිබුනේ වර්ෂා ළඟය. අනිත් යතුර තිබුනේ විමුක්ති ළඟය. විමුක්ති එද යද්දී මේ කාමරයේ යතුර ශ්වේතා අත තබා ගියාය. එහෙත් මොනම හේතුවක් නිසා වත් ඒ යතුර මංජුලාට නොදෙමි යැයි ශ්වේතා සිතා ගත්තාය.

˙ගු..ඩ් ඊව්නිං මිස්...˙

ශ්වේතා අමාරුවෙන් සිනහවක් නගාගෙන ඇය හා සිනාසුණාය. නවීන පන්නයේ අත් බෑගයක් දමාගෙන උන් මංජුලා එය තුළට වාහනයේ යතුර දමා ශ්වේතා දෙස බැලුවාය.

˙ඔයාද ශ්වේතා කියන්නේ...˙

ශ්වේතා ගැස්සුණාය. ˙ගැණි ඇවිත් තියෙන්නේ සෑහෙන්න හොයලා බලලා වගේ.. බලමු...˙ ශ්වේතා සිතුවාය.

˙ඔ..ව් මිස්...˙

˙මි.. මේ කාමරේ අරින්න...˙

එය ඇය කියන බව ශ්වේතා දන උන්නාය.

˙අ..නේ මිස්.. යතුර සර් ගාව...˙

˙විමුක්ති අයියා ගාව...˙

˙ඔව්.. අපි මේ කාමරේ පාවිච්චි කළේ නෑනේ...˙

˙එක යතුරක් නෙමේ නේද තියෙන්නේ...˙

˙දෙකක් තිබ්බා... අනිත් එක වර්ෂා මිස් ගාව...˙

ශ්වේතා ඇයට ගරුත්වයක් දී කතා කළාය. වර්ෂා ගැන සිහි කරත්ම මංජුලාගේ මුහුණ අඳුරු වී ගිය අයුරු ශ්වේතා දුටුවාය.

˙අස්වෙනකොට එයා දීලා යන්න ඇතිනේ...˙

˙දෙන්න ඇති.. සර්ට...˙

ඉන් පසු මංජුලා පොත්හල තුළ එහෙට මෙහෙට වට තුන හතරක් ගියාය. ඇය යද්දී පොත් හලේ සේවකයින් ඇස්වලින් දහසක් දේවල් හුවමාරු කර ගත්තෝය.

'මේ දවස්වල කලෙක්ෂන් කොහොමද...'

'වරදක් නෑ මිස්...'

'එ..ත..කො..ට...'

ඇය අසන්නට යන්නේ පොත් හලේ දිනපතා මුදල්වලට කුමක් කරන්නේද කියා බව ශ්වේතා ඉවෙන් මෙන් වටහා ගත්තාය.

'ඩේලි කලෙක්ෂන්ස් වලට මොකද කරන්නේ...'

ශ්වේතා යටි සිතෙන් මේ කුණු ගැහැණු ආත්මයට සිනාසුණාය. තම ජීවන සහකරුවාට මෙහෙම විපතක් වී තිබියදී ඔහුගේ මුදල් එකවුන්ට් ගැන සොයන්නේ ඒ මිනිහාට ආදරේ ගෑණියෙක් නොවේ.

'කලෙක්ෂන් එක නම් මිස් මම එකවුන්ට් එකට දනවා...'

'ඩේලි...'

'ඔ..ව්...'

'ම්.. ඊයේ කීයක් දැම්මද...'

'අසූදහක් මිස්...'

ලැජ්ජය. මෙහෙම අහද්දීත් ලැජ්ජය. ශ්වේතාට සිහිවූයේ වර්ෂාය. ඇය මෙසේ මේ මුදලට පෙරේත වූ කෙල්ලෙක් නොවේ. සමහර දවසකදී ඇය සල්ලි අතේ නැතිවූ විට විමුක්තිගෙන් රුපියල් සීයක් ඉල්ලා ගත් අයුරු ශ්වේතාට සිහිවිය.

'මේකේ යතුර හොයලා තියන්න... මං හෙට එනවා...'

'මං ගාව නම් නෑ මිස්...'

'කොහොමත් එකවුන්ට්ස් ලෑස්ති කරලා තියන්න... මං දෙර ඇරගන්නම්... තව දෙයක්... අවශ්‍ය දේවල් වලට සල්ලි දෙන්නේ කොහොමද...'

'සර්ගේ එකවුන්ට්ස් වලින් අපට සල්ලි ගන්න බැනේ මිස්...





එහෙම අවශ්‍ය වෙන්නෑ... අනික...'

'ඇයි...'

'සර්ට ඉක්මනට සනීප වෙයිනේ... එතකල් අපිට මැනේජ් කරගන්න පුළුවන්... කොහොමත් සර් අපට කියලා තියෙන්නේ දිගටම සල්ලි එකවුන්ට් එකට දන්න කියලා... ඒක එහෙමම කරනවා මිස්...'

ශ්වේතා කීවේ මංජුලා දෙසම බලාගෙනය. මංජුලාට ටික වේලාවකට කතා කරගන්නට පවා බැරි විය.

'මේ මගේ මොබයිල් නම්බර් එක... මොනාහරි තිබ්බොත් මට කතා කරන්න...'

මංජුලා ඇගේ ජංගම දුරකථන අංකය ශ්වේතා අත තැබුවාය. 'අවශ්‍ය වෙන්නෑ... ශ්වේතාට කියන්නට සිතුනේ එහෙමය. එහෙත් ඇය කරබාගෙන දුරකථන අංකය ගත්තාය.

මංජුලා පොත් හලෙන් පිටව ගියේ එතරම් සතුටකින් නොවේ. මෙතනට ඔළුව දමා ගැනීම හිතනා තරම් පහසු නොවන බව ඇයට ඉවෙන් මෙන් දැනුණි. 'බලමු... ළඟදිම මම ඇවිත් ඔය පුටුවේ වාඩි වෙන්නම්කෝ...' මංජුලා සිතුවේ කේන්තියෙනි.

* * * * * * * * * * *

මේධා විමුක්තිට තේ පෙව්වේ ඔහුගේ හිස අතගාමිනි. තම ජීවිතයේ ආදරණීයම දෙතුන් දෙනෙක් ඉදිරියේ නන්නාඳුනන ලෙස දෑස් අයාගෙන ඉන්නා විමුක්ති ගැන මේධාටත් සක්විතිටත් ශ්වේතාටත් පුදුමය.

'අයියා මෙහෙම ඉඳිද්දී අරයා ඇවිත් බුක් ෂොප් එකේ එකවුන්ට් ගැන අහන්නේ...'

ශ්වේතා කීවේ බොඳවී ගිය දෑස් මිරිකමිනි.

'ම..ට ඇත්තටම අයියේ ඒ වෙලාවේ පුදුම තරහක් ආවේ...'

මේධා කෙල්ලගේ හිස අතගෑවේ ආදරයෙනි.

'උඹ ඕවා ගණන් ගන්නෙපා... මේ කොල්ල අද මෙහෙම දුක් විඳින්නේ එයා නිසානේ...'

'ඇත්තටම ඔව් අක්කේ... වර්ෂා අක්කයි විමුක්ති අයියයි උන්නු හැටි මං නේ දන්නේ...'

සක්විති විමුක්තිගේ දෙපා ඔහුගේ උකුලට ගෙන පිරිමැද්දේය. ශ්වේතාත් මේධාත් එදෙස බලා උන්නේ බොඳව ගිය දෑසිනි.

'වර්ෂාට පස්සේ බුක්ෂොප් එකේ වැඩ ගැන දන්නේ ඔයා නංගී...'

'අ..ක්කා ඒ ටික කියලා දුන්නා අයියේ...'

'කොල්ලා සනීප වෙනකල් අර කෙල්ලව අපි හොයා ගන්නකල් නංගී ඔය වැඩ ටික බලාගන්න... මං දවස් දෙකකට වතාවක් හරි එන්න බලන්නම්...'

මේවා කතා කරද්දීවත් විමුක්ති කාගේවත් මුහුණක්වත් බලන්නේ නැත. මේධා ඔහුගේ හිස අතගා ඒ අද්දරටම වී උන්නාය.

'අයියේ එයා සල්ලි ගැන අහනවා...'

'ඔයා කරගෙන ආපු විදිහට බැංකු එකවුන්ට් එකට දන්න... කාට හරි සල්ලි දෙන්න තියෙනවා නම් මට කියන්න... මංජුලා ඇවිත් ඇහුවොත් කියන්න ඒවා මං හැඩිල් කරන්නේ කියලා...'

'ඒක හොඳයි... අයියට පුළුවන් හැම වෙලාවටම පොඩ්ඩක් බුක් ෂොප් එකට ගොඩවෙන්න... ඒක ස්ටාෆ් එකටත් හොඳයිනේ...'

ශ්වේතා කීවේ මංජුලා දිගටම පොත් හලට ඒ යැයි බියෙනි. කවර හේතුවක් නිසාවත් විමුක්තිත් වර්ෂාත් ගොඩනැඟූ පොත් හල මංජුලාට අපිරිසිදු කරන්නට දිය නොහැක.

'ඔක්කොටම වඩා මට ඕන මේ කෙල්ලව හොයා ගන්න නංගී...'

'කොයි වෙලාවක හරි අක්කා එයි... ඒක මට විශ්වාසයි...





එයාටත් විමුක්ති අයියා නැතුව ඉන්න බෑ... නේ..ද...'

ශ්වේතා අවසන් වචනය කීවේ විමුක්ති දෙසම බලාගෙනය. ඔහු පොඩි දරුවෙකු සාංකාවෙන් වැටී ඉන්නාක් මෙන් ගෙළ හරවාගෙන ඉඳියි.

'ඒත් එහෙම හොයා ගත්තත් අයියේ... අක්කා කො..හො..ම..ද...'

ශ්වේතා අසද්දී මේධාද අසරණව බැලුවේ සක්විති දෙසය.

'බලමු... කොහොමත් කෙල්ලව ඕන...'

'අපි අයියේ තව ටිකක් හොයමු... මම ආයෙත් දවසක රත්නපුරේ හරි යන්නම්...'

'පුළුවන් නම් ලොකු දෙයක් කෙල්ලේ... මේ ජීවිතේ ගොඩ ගන්නම ඕන...'

මේධා පැවසුවේ විමුක්ති දෙස බලාය.

'අක්කා හිතන් ඇති මහුල උනා කියලා...'

'එහෙම කෙල්ල හිතන්නෑ නංගී...'

'මටත් අන්තිම දවසේ කිව්වා... ඒ මහුල වෙන්නෙම නෑ කියලා...'

'උන් දෙන්නා ආදරේ කරපු තරම දන්නේ ඒ දෙන්නනේ...'

'ම්.. අයියට දෙයියෙක්ට වගේ අක්කා සැළකුවේ...'

ඒ දෙව්යා අද මෙසේ ජීවිතයෙන් ඈත්වී දුක් විඳින බව ඇය දන්නවානම්... කොයි ලෝකයක හිටියත් ඇය එන බව මේධා දනී.

# 24

මංජුලා පසුද පොත් හලට ආවේ සුරම්‍යාද සමඟය. පොත් හලට ඔළුව දගන්නට නම් ඇගේ සහය අවශ්‍යම බව මංජුලා තේරුම් ගත්තාය.

'අම්මා බලලා ඒ කට්ටියට කියන්න... එතකොට මම මට පුළුවන් වෙලාවට ෂොප් එකේ වැඩ ගැන බලන්නම්...'

මංජුලා කීවේ කපටි ලෙසිනි. සුරම්‍යාට සතුටක් දනුණේ ඇය විමුක්තිගේ අසනීපයත් සමඟම ඔහුගේ ජීවිතයෙන් ඈත් නොවී සිටීම නිසාය. එහෙත් මංජුලා මේ අත තබන්නේ විමුක්තිට නොව ඔහුගේ දේපළ වලට බව ඇයට තේරුම් ගියේ නැත.

මංජුලා සුරම්‍යා සමඟ එද්දී ශ්වේතාට කර ගන්නට දෙයක් තිබුනේ නැත.

'කාමරේ ඇරගන්න විදිහක් නැද්ද දරුවෝ...'

'නෑ ඇන්ටි... අයියා ගාව තමයි යතුර තිබ්බේ...'

'අපි මේක කඩලා අලුත් ලොක් එකක් දගමු අම්මා...'

මංජුලා කියද්දී ශ්වේතා හැඟීම් මැඩගෙන බිම බලාගත්තාය.





'ඔව් එහෙමවත් කරමු... පුතේ විමුක්ති අයියා නෑ කියාල මේවා වැටෙන්න දෙන්නෙපා...'

'එහෙම වෙන්න දෙන්නෑ ඇන්ටි...'

'ඔයා මෙතන ඉන්න එක හොඳයි... හෙට ඉඳලා මංජුලා මිසුත් ඇවිත් බලයි...'

මංජුලා ඇයව එක්කාගෙන ආවේ එය තමා ඉදිරිපිට කියන්නට බව ශ්වේතා දන ගත්තාය.

'සක්විති අයියත් එනවා කිව්වා ඇන්ටි...'

'ලොකු පුතා...'

'ඔව්... චෙක් වලට අත්සන් කරන්නත් එපැයි... අයියා බැංකුවේ මැනේජර් එක්ක කතා කරනවා කිව්වා... විමුක්ති අයියගේ තත්වේ කියලා අයියා වෙනුවට සක්විති අයියා අත්සන් කරයි...'

මංජුලාට ඇතිවූයේ දරාගත නොහැකි කෝපයකි. 'එහෙනම් අර ගෑණි මට කලින් මේකට තදට ගහලා.. බලමු...' මංජුලා සිතුවේ වියරුවෙන් මෙනි.

'ලොකු පුතත් මේවා බලන එක හොඳයි... මල්ලිගේ දේවල්නේ...'

'අයියා රස්සාවෙනුත් රස්වෙලානේ ඇන්ටි...'

'ලොකු පුතා...'

'ඔව්.. ඊයේ කිව්වා.. විමුක්ති අයියා ළඟම ඉන්න ඕන නිසා ජොබ් එකෙන් අයින් වෙලා...'

'ලොකු පුතා මට කිව්වෙවත් නෑ...'

'ඊයේ හවස තමා දීලා තියෙන්නේ... අයියා බුක් ෂොප් එක කරනවා කිව්වා...'

මංජුලාව දවාගෙන ගියේය. එය පුදුමාකාර ගින්දරකි.

'හෙට ස්ටාෆ් එකට කතා කරන්නත් අයියා එනවා කිව්වා... මේ කට්ටියත් හරි දෙගිඩියාවෙන් ඇන්ටි ඉන්නේ රස්සාව ගැන...'

˙හිතපු දෙයක් නෙමේනේ දරුවෝ වුණේ...˙

˙අයියා ඉක්මනට සනීප වෙයි ඇන්ටි... එච්චර පින්වන්ත කෙනෙක්ට එහෙම වෙන්නෑ...˙

සුරම්‍යා හිස වැනුවේ එය අනුමත කරමිනි. ˙එහෙනම් ගෑණි ඒකිගේ මිනිහව මෙතනට එවනවා... තව රස්සාවෙනුත් අස් කරවගෙන... හොඳට සල්ලි ටික අදී...˙ මංජුලා සිතුවේ එහෙමය.

එහෙත් සක්විතිට තම මල්ලිගේ ජීවිතය මිසක මේ කිසිවක් වැඩක් නැත. ඔහු කවදාවත් මුදල් පසුපස හඹා ගිය කෙනෙක් වූයේ නැත.

˙අයියා හිටියට කමක් නෑ... ඔයත් ඇවිත් මේවා බලන්න... ලොකු පුතා මේවා කරන්නේ මල්ලිගේ දේවල් නිසා...˙

ශ්වේතා මංජුලාගේ මුහුණ පරිස්සමින් බැලුවාය. ඒ මුහුණ අඹ ඇට පුපුරන රත්වූ තාච්චියක් මෙනි.

˙අපි ඉන්නේ ඇන්ටි මේ සෙනසුරාද අයියට කළුතර බෝධිය ගාව බෝධි පූජාවක් තියන්න... උදේට බුක්ෂොප් එක පැය තුනකට විතර වහනවා... මං සක්විති අයියට ඊයේ කිව්වා...˙

˙එ..හෙම කරන එක කොච්චර දෙයක්ද...˙

මංජුලාට කතාවත් කර ගන්නට බැරි වී ඇත.

˙අපිව ජීවත් කළේ අයියනේ ඇන්ටි... එයාට මෙහෙම දෙයක් වෙලා තියෙද්දී කොහොම දරාගෙන ඉන්නද... අපේ පඩියෙන් ටික ටික දලා අපි ඒ පූජාව කරන්නේ...˙

˙පුළුවන් ඉක්මනට සනීප වෙන්න කියලා ප්‍රාර්ථනා කරන්න...˙

˙මේඩක්කයි සක්විති අයියාත් පුළුවන් උනොත් එන්නම් කිව්වා... අක්කගේ ලැබෙන්න ඉන්න බබාටත් හොඳයිනේ...˙

˙ඒකනේ...˙

˙අර ගිය පර බැල්ලියි මේ ගෑණියි එකතු වෙලා හොඳ සෙල්ලමක් නටන්න යන්නේ... බලමු මේවා උඹලා අයිති කරගන්න හැටි...





මංජුලාගේ හැටි තවම දන්නෑ...˙ මංජුලා එතනින් මෑත්වී සිතුවේ දැන් කුමක් කරන්නේදැයි සිතා ගත නොහැකිවය.

* * * * * * * * * * * *

වර්ෂා ප්‍රියංවදගේ අසළට පැමිණ ඉඳගත්තේ ඇය හදගෙන ආ තේ දෙකෙන් එකක් ද ප්‍රියංවදට දෙමිනි.

˙ඉතින් බලපන්... උඹ මේ අමාරු තියාගෙන තේත් හදනවා... මට කිව්වනම් මං හදලා දෙන්නැද්ද...˙

˙මට අමාරුවක් නෑ කෙල්ලේ... බබෙක් ලැබෙන පළවෙනි ගෑණි මම නෙමේනේ කෙල්ලේ...˙

කෙල්ලගේ තේ එක රසය. ගාණට කහට තම්බා ඉඟුරු කෑල්ලක්ද දමා ඇය හදන තේ එක මෙහෙම වෙලාවකට අමෘතය වාගේය.

˙ප්‍රියා...˙

˙කෙල්ලේ...˙

˙දැන් අපි ගෙට ගෙවදිනවනේ...˙

˙ඉතින් කෙල්ලේ...˙

˙ඊට පස්සේ...˙

˙ම්...˙

˙උඹ රස්සාවකට ගියෝතින්.. අ..නේ ඉන්නේ කොහොමද කෙල්ලේ... පාළුයිනේ...˙

ප්‍රියා වර්ෂා දෙස බැලුවේ තුනී තෙතමනයක් සහිත දෑසිනි.

˙මොනාම හරි කරන්නත් එපැයි බං...˙

˙අපි මොනාහරි බලලා කරමු... අපි ගෑණු තුන්දෙනෙක් ඉන්නවනේ...˙

˙මොනා කියලා කරන්නද... ගොවිතැන් කරන්නද බං...˙

"මොනව හරි කරමු... ඔය බිල් ලියන එකෙන් හාරදස් පන්සීයනේ බං හම්බවෙනවා කියන්නේ... අපිට ඊට වඩා කීයක් හරි හොයා ගන්න පුළුවන්..."

"මංද..."

"සල්ලි ටිකකුත් අපිට තියෙනවනේ... මා..ව ද..ලා ය..න්..නෙපා කෙ..ල්ලේ..."

වර්ෂා කීවේ ප්‍රියංවදගේ උරතලයට බරවීය. ඇය කෙල්ලගේ හිස පිරිමැද්දේ ආදරයෙනි.

"ජීවිතේට කොහොම හරි මුහුණ දෙමු බං.. නේද... බැරිම වුණොත් අපි ඉදි ආප්ප ටිකක් තම්බගෙන හාල් මැස්සෝ හොදි ටිකකුත් හදගෙන ගිහින් මහමෙවුනාව පැත්තේ විකුණමු... මට බැරියැ විකුණන්න..."

වර්ෂාගේ පපුව දගෙන මෙන් ගියේය.

"උඹට එහෙම දුක් විඳින්න තියන්නෑ..."

"දුක තියෙන්නේ ඒවල නෙමේ කෙල්ලේ..."

"ම්..."

රජරට කෙත් වතු අතරින් හිරු බැස යමින් තිබුණි. වර්ෂා ප්‍රියංවදගේ උරතලයට බරවීගෙනම ඈත යාය දෙස බලා උන්නාය.

"ප්‍රියා..."

"ම්..."

"අපි දුප්පත් කෙල්ලෝ නොවුණනම් නේද..."

"එහෙනම් අපි ළඟ අද මේ තියෙන ආදරේ මනුස්සකම නෑ කෙල්ලේ..."

"ම්.. දුප්පත් කම හොඳයි... ඒත්..."

"ඒ නිසා නැතිවෙච්ච දේවල් අපට ලැබෙයි... උඹ දුක් වෙන්නෙපා..."





"එයා ගැන විතරයි මටත් දුක..."

ප්‍රියංවද කිසිවක් කීවේ නැත. දන් යාය දෙසින් හිරු සම්පූර්ණයෙන් බැස ගොස් ඇත.

වර්ෂා දිග සුසුමක් හෙලා නැගිට්ටාය. අද බඩ ටිකක් අමුතුය.

*  *  *  *  *  *  *  *  *  *  *

විමුක්ති මොරගොඩ නිවසට එක්කාගෙන විත් මාසයක් ගෙවුණි. එහෙත් ඒ ගෙවුණ මාසය තුළ විමුක්තිගේ රෝගී තත්වයේ කිසිදු වෙනසක් වූයේ නැත. ඔහු දවස පුරාම කාමරයේ වූ ඇඳේ වැතිරී බලාගත් අත බලාගෙන උන්නේය.

සක්විති උදෙන්ම එන්නේ විමුක්තිව ශරීර කටයුතු සඳහා එක්කාගෙන ගොස් ඔහුව නාවා පිරිසිදු කර එළියට එක්කාගෙන යන්නටය. පාන්දර හයට පමණ මහ ගෙදරට එන සක්විති පැය තුනක් පමණ තම එකකුස උපන් සහෝදරයාව ජීවත් කරන්නට අසීමිත දුකක් විඳියි.

සක්විති නාන කාමරයේ විමුක්තිව තබාගෙන නාවද්දී මොරගොඩ මහතාත් සුරම්‍යාත් පැමිණ දුකෙන් බලා සිටී.

"පුං..චි කාලෙවත් නාවද්දි ඔහොම උන්නෑ... බාත් රූම් එකම දෙවනත් කරනවා..."

සුරම්‍යා කියන්නේ නාන කාමරයේ බංකුව උඩ වාඩිවී ගෙන ඔහේ ඉන්නා විමුක්ති දෙස බලාය.

"අර දරුවව දන් තනියම දාලා එන එක හොඳ නෑ ලොකු පුතා... කොයි වෙලේද දන්නෑ..."

"ඩො..ක්..ටර් දින දීලා තියෙන්නේ ලබන සතියට තාත්තේ..."

"කියන වෙලාවට කලින් අමාරු වෙනවා..."

එසේ වුවද මේ යුතුකම් කරන්නේ කවුද... මේවා තමා කරන්නේ නැත්නම් එක බඩවැල කඩාගෙන ආ එකේ තේරුම කුමක්ද...

'මේකා සනීප වෙනකංනේ තාත්තේ...'

'ඇස් තද කර ගනිං කොල්ලෝ... කෝ... මෙ..හෙ..ම මේ...'

සක්විති විමුක්තිට ඇස් තද කර ගෙන පෙන්නයි. සක්විති ඒ මුහුණේ සබන් ගාන්නේ ඉන් පසුය. සුරම්‍යා එතනින් යන්නේ දෑස් තද කරගෙනය.

දවස් තුනෙන් තුනට සක්විති විමුක්තිව වෛද්‍ය සරමනායකගේ සායනයට එක්කාගෙන යයි.

'අපි ලබන සතියේ ඉඳලා ස්පෙෂල් ට්‍රීට්මන්ට් එකක් පටන් ගන්නවා... මං සිංගප්පූ හොස්පිට්ල් එකටත් විමුක්තිගේ රිපෝට්ස් යැව්වා... ඉක්මනට එයාලගෙන් පිළිතුරක් එයි...'

වෛද්‍ය සමරනායක කීවේ විමුක්තිව පරීක්ෂා කරන අතරතුරය.

'ක..තා..ව..ත් කරනවනම් ඩොක්ටර්...'

'අතක පයක දෙයක් වුණා නම් ඉක්මනට සනීප වෙනවා... ඒත මොළේ එහෙම නෙමේ...'

'මං.. ක..ර..ද..ර කරනවා නෙමේ ඩොක්ටර්.. ඒත්...'

'ම..ට තේරෙනවා අපි උත්සාහ කරමු... දන් කෑම බීම හොඳට ගන්නවා නේද...'

'ඔ..ව් ඩොක්ටර්...'

'එළවළු පලා හොඳට දෙන්න...'

එවන් දවසක සක්විති විමුක්තිව සායනයේ සිට එක්කාගෙන එන්නේ තම නිවසටය. සක්විති විමුක්තිව අතින් අල්ලාගෙන එද්දී මේධාගේ පපුව ඇවිලීගෙන යයි.

'ලබන සතියේ උඹ මාමා කෙනෙකුත් වෙනවා.. බලපං... උඹට මේ දවස්වලම අසනීප වුණානේ...'

සක්විති කියන්නේ විමුක්තිව මේධාට පෙන්වමිනි. බඩත් ඔසවාගෙන ඉදිරියට එන මේධා විමුක්තිව නිවසට එක්කාගෙන එන්නේ මහා දුකක් සමඟ කවලම් වූ සෙනෙහසකිනි.





'ඩො..ක්..ටර් මොනාද කිව්වේ මහත්තයෝ...'

'සිංගප්පූ ගෙනියන්න ඉක්මනට හදලා දෙන්නම් කිව්වා... හිම්හිටලුනේ බබා සනීප වෙන්නේ...'

මේධා විමුක්තිව සැටියේ ඉන්දවා ඔහුගේ හිස අතගෑවාය.

'අ..පි..ව..ත් ඔයාට මතක නැති වුණානේ...'

ඒ දුක පපුව පසාරු කරගෙන යන වේදනාවකි. ඔහුගේ මුහුණ දකිද්දී පපුවේ ලේ දිය උතුරන්නාක් මෙනි.

'කොල්ලා උදේ ඉඳලා බඩගින්නේ බබා...'

'මං කැකුළු බත් හැදුවා... පොල් සම්බෝලයි කරවල බැදුමුයි එක්ක... අයියයි මල්ලියි එහෙම ආසනේ...'

මේධා බත් බෙදුවේ පිඟාන් දෙකකටය.

'කෙල්ල දවසක් මෙහේ ඇවිත් කට්ටා බැදුමක් හැදුවා සම්බෝල එක්ක... ඒ හදලා විනාඩි දහයක් ගියේ නෑ මේකත් ආවා ඒක කන්න... ඔතන තියාගෙනමයි කැව්වේ...'

මේධා අතීතයේ වූ දෙයක් සිහි කළාය.

'ඒවා මේකට කොහොම අමතක වුණාද කියලා මට නම් හිතාගන්නවත් බෑ මහත්තයෝ...'

'මතක නැතුව නෙමේ බබා... කොල්ලගේ ඔළුව හිරවෙලා...'

'දවසක ඔක්කොම මතක් වෙයි... එදාට ඇවිත් අඬයි.. ම්.. කන්න...'

මේධා කරවල බැදුමත් සම්බෝලත් සමඟ කැකුළු බත් කටක් අනා විමුක්තිට කැව්වාය. ආශාවෙන් බත් එක කන විමුක්ති දෙස මේධා බලා උන්නේ ඇතුළතින් දවෙමිනි.

'එක්කෙනෙක් එයාගේ දරුදඬු හිත ටිකක් වෙනස් කරනවනම් කොල්ලා කවදා සනීප වුණත් අපිට පපුව පුච්ච ගන්නේ නැතුව ඉන්න පුළුවන්... ඒ හිත වෙනස් කර ගත්ත නම් දවසක් හරි වේලාසන මල්ලී සනීප වෙයි...'

මේධා කීවේ දඩි හැඟීමකිනි.

'කාගෙද...'

'අම්මගේ... ඕනකමක් තියෙනවනම් කෙල්ලව සතියකින් හොයා ගන්න පුළුවන්... ඒත් කෙල්ලව ගෙනත් මේකා ළඟින් තියන්න පුළුවන්නම් විතරක්...'

මේධා තවත් බත් කටක් විමුක්තිට කවමින් කීවාය. ඇය වතුර ටිකක් ඔහුට පෙව්වේ කැකුළු බත් කද්දී හිරවෙන නිසාය.

'අම්මා හිත වෙනස් කර ගන්නෑ බබා...'

'එහෙනම් කෙල්ලව හොයා ගන්න කතා කියන්නත් එපා... ආයේ ගෙනත් අපි කෙල්ලව මරන්නද... ඇත්තටම ඒකි සිය දිවි නසා ගනී... මොකක්ද ජීවිතේ තේරුම.. හිස්නේ...'

තම බිරිඳ කියන කතාවද වැරදි නැතැයි සක්විතිට සිතුණි.

'එහෙම වෙන්නේ නැත්නම් කෙල්ලට ඔය ඉන්න තැනක හිත හදගෙන ජීවත් වෙන්න දෙන එක නේද කරන්න ඕන... තමන්ට අයිති නැති මිනිහෙක් වෙනුවෙන් ජීවිත කාලෙම දුක් විඳින්න ගෑණියෙක්ට බැනේ මහත්තයෝ...'

සක්විති කතා කළේ නැත. මේ කතාව මේ තරම් දුක්ඛර ලෙස අවසන් විය යුතුද...

'දෛවය කියලා දේකුත් ඇතිනේ බබා...'

'මේ උදවෙලා තියෙන්නේ ඒ දෛවය තමයි... ආදරේ කරන දෙන්නා අද දෙපැත්තක දුක් විඳිනවා... ඔයා හිතනවද වර්ෂා සතුටින් ඇති කියලා... මේකට නම් දුක මතක් වෙන්නෑ... ඒත් අර කෙල්ල... විඳව විඳව ඇති...'

සක්විතිට හීල්ලින.

'මං කියන්නේ එහෙම වෙන්න දෙන්නෙපා කියලා... මේක මෙහෙම ඉවර වෙන්න දෙන්න බෑ...'





'අම්මත් එක්ක කොහොම කතා කරන්නද බබා...'

'දවසක කතා කරන්නම වෙයි.. මං දන්නවා කෙල්ල කවදවත් මේකව නැතුව කසාදයක් බඳින්නෑ... ඒ ජීවිතේ ගැන චුට්ටක් හිතන්න...'

සක්විති කිසිවක් නොකියා ඉතිරි වූ බත් කට විමුක්තිට කවා අත සෝද ගත්තේය.

# 25

**සෙනසුරාදා** උදෑසන මොරගොඩ නිවසට විශේෂ අමුත්තන් දෙදෙනෙක් පැමිණියෝය. ඔවුන් පැමිණියේ නුවර හීරස්සගල සිටය. හීරස්සගල යනු සුරම්‍යාගේ උපන් ගමය. ඇගේ නෑදෑයින් සියල්ලන්ම සිටියේ එහේය. මොරගොඩ මහතා සමඟ විවාහ වී කොළඹ ආ පසු සුරම්‍යාව නුවර හැදුනේ ඉතාමත් අඩුවෙනි. එහෙත් නුවර නෑයින් ඉඩක් තිබෙන වෙලාවට මොරගොඩ නිවසට ඇවිත් ගියෝය.

නන්දනී එසේ ආ ගිය කෙනෙකි. ඇය සුරම්‍යාට වඩා බාලය. නෑදෑ වෙන්නේ සුරම්‍යාගේ මව් පාර්ශවයෙනි.

නන්දනී කාලයකට පසුව මොරගොඩ නිවසට ආවේ සුරම්‍යාගෙන් උදව්වක් බලාපොරොත්තුවෙනි. ඇය ආවේ ඇගේ එකම දියණිය වූ හිමාලිද සමඟය.

හිමාලිව දුටුවනම සුරම්‍යාට ඇයව හඳුනා ගන්නට පවා අමාරු විය. ඇය දණ ඔබා සුරම්‍යාට වඳිද්දී සුරම්‍යා බැලුවේ නන්දනී දෙසය.

'මේ චූටි දුව අක්කේ...'





සුරම්‍යා කෙල්ලව හඳුනාගත්තේ නැති බව දන නන්දනී කීවාය.

'අ..නේ... කොහොම අඳුර ගන්නද නංගී... මේ අන්තිම පාරට දකිද්දී චූට්ටං කෙල්ලනේ...'

හිමාලි බිම බලාගෙන සිනාසුණාය.

'එයා ලොකු වෙනවා මං වත් දන්නෑ අක්කේ...'

'පහුගිය කාලේ අම්මා ආවා මිසක් ඔයා අපේ ගෙවල් පැත්තේ ආවේ නෑනේ පුතේ...'

'විමුක්ති අයියගේ වෙඩින් එකට එන්න උන්නේ ලොකු නැන්දේ...'

'ඒකනේ... බලන්නකෝ නන්දනී කොල්ලටත් වෙච්ච දේ...'

සුරම්‍යා කීවේ කඳුලින් දෑස් තෙත් වෙද්දීය.

'අපිත් ඒක අහලා හරියට දුක් වුණා අක්කේ...'

'දරුවට මොන අපලයක් පල දුන්නද කියල හිතාගන්න බෑ නංගී...'

'කෝ අක්කේ දන් පුතා...'

'උඩ ඉන්නවා... අපි යන් උඩට... එන්න පුතේ...'

සුරම්‍යා හිමාලිගේ අතකින් අල්ලාගෙන කීවාය. කෙල්ල දන් හැඩය. ඇය ඇඳගෙන විත් තිබුනේ ලා රෝස පැහැගත් ඔසරියකි. ඇයව දකිද්දී සුරම්‍යාට සිහිවූයේ මහනුවර ගෙවී ගිය ඇගේ තරුණ කාලයය.

'කෙල්ල ඔසරිය ලස්සනට ඇඳලා තියෙනවා නන්දනී...'

'ඔය ඇන්දේ දෙවෙනි වතාවට... ඒත් මං කිව්වේ දිගටම ඔසරිය අඳින්න කියලා...'

'යද්දී මං ලස්සන සාරි දෙකක් දෙන්නම්... මාමා ඉන්දියාවෙන් ගෙනත් දුන්න ඒවා... දන් මං ඕවා කොහෙට අඳින්නද...'

විමුක්ති උන්නේ ඔහුගේ ඇඳ මත නිදගෙනය. නන්දනීත් හිමාලිත් ඔහු දෙස බලා උන්නේ සංවේගයෙනි. හිමාලි අවසන් වතාවට විමුක්තිව දක්කේ මීට වසර දෙකකට පෙරය. එද ඔහුව දකිද්දී ඇති

නොවූ තරම් හැඟීමක් ඇයට මේ මොහොතේදී විමුක්ති ගැන දනුණි.

"අ..යියා ක..තා කරන්නෙවත් නැද්ද නැ..න්දේ..."

"ඒකනේ මැණික... ලොකු අයියා උදේට ඇවිත් ටොයිලට් එක්කගෙන ගිහින් නාවලා කවල පොවලා බෙහෙත් පොවලා යන්නේ..."

"අ..නේ මෙච්චර දෙයක් කියලා දන්නවා නම් අපි ගැටඹේ බෝධි පූජාවක් හරි තියනවා.. කොච්චර අගේට හිටපු දරුවද... ඇ..යි මෙ..හෙම දෙයක් වුණේ අක්කේ..."

"කොඩිවිනයක් වගේ මූසල කෙල්ලෙක් මෙහෙට ආපු දවසේ ඉඳලා තමයි මේ ඔක්කොම..."

සුරම්‍යා කීවේ කේන්තියෙනි. නන්දනී මේ කතාව කණින් කොනින් අසා තිබුණි.

"දැන් ඉතින් දරුවගේ ජීවිතේ එහෙම් පිටින්ම ගොඩ ගන්න ඕන.. අයියටත් වඩා එයා ගැනයි බලාපොරොත්තු තියාගෙන උන්නේ... රට රාජ්‍යවල යවලා ඉගැන්නුවත් එක්කනේ..."

"දරුවට එහෙම විපතක් වෙන්නෑ අක්කේ... ඉ..ක්..ම..න..ට සනීප වෙයි..."

"ඇස් දෙක පියවෙන්න කලින් මෙයා සතුටින් ඉන්නවා දකින්න ඇත්නම් මට ඇති..."

සුරම්‍යා කීවේ කඳුළු පිරි දෙනෙතිනි.

"ය..න් පුතේ... අපි ගිහින් මොනා හරි බොමු.. අයියට සිහියක් තිබ්බනම් ඔයාව දකලා පුදුම වෙයි..."

සුරම්‍යා කීවේ හිමාලිගේ හිස අතගාය. කාමරයෙන් යන්නට පෙර හිමාලි තවත් වතාවක් විමුක්ති දෙස බලා උන්නාය.

"අක්කගෙන් පොඩි උදව්වක් ඉල්ල ගන්නත් එක්ක ආවේ..."

පහළට එද්දී නන්දනී කීවාය.

"මොකක්ද නංගී..."

අනුලා බඩත් ඔසවාගෙන පැමිණ කේකුත් කෙසෙල් ගෙඩිත් තේත් ඇල්ලුවාය.

"අනුලා මේ නන්දනී නෝනගේ දුව..."

අනුලා ඇයට කේක් අල්ලද්දී සුරම්‍යා කීවාය. කෙල්ල ලස්සනය.

"ගන්න පුංචි නෝනා..."

"ම්..."

"අනුලට මෙහෙන් බබා ලැබෙන්න... අරහේ මේඩට බබා ලැබෙන්න... එයාලා ගැනවත් මට බලන්න සිහියක් නෑ නංගී..."

"ඒකනේ.. පුතාගේ කේන්දරේ බැලුවේ නැද්ද අක්කේ..."

"එයාට දිගටම සෙනසුරු... හරියට අපල... මගේ වැඩෙත් බෝධි පූජා තියන එක තමයි... අද හවසත් බෙල්ලන්විල යනවා..." සුරම්‍යා කීවේ හූල්ලමිනි.

"ඉතින් නංගී මොනාද කෙරෙන්න ඕන..."

සුරම්‍යා තේ බොද්දී ඇසුවාය. නන්දනී බැලුවේ හිමාලි දෙසය.

"චූටි දුවව සෞන්දර්ය විශ්ව විද්‍යාලෙට තේරුනාණේ අක්කේ..."

"අනේ කොච්චර දෙයක්ද..."

"නංගි තනියම මේවා කොහොම කළාද මන්ද... ගෑණු දරුවෙක් හදන්න ඕන මෙහෙම තමා නංගී... අයාලේ යන විදිහට හැදුවාම පරම්පරාවකට අපලයි..."

සුරම්‍යා මේ කියන්නේ වර්ෂා ගැන බව එය අසාගෙන උන් අනුලාට සිතුණි. "ලෝකෙම කෙල්ලෝ රත්තරන් ඒ කෙල්ල නැතුව... පුදුම වෛරයක් තියෙන්නේ..." අනුලා සිතුවාය.

"ඉතින් කොළඹ මණ්ඩපේට තේරිලා තියෙන්නේ... ඒ ගමන් හොඳ ජොබ් එකකුත් ලැබුණොත් කරන්න ආසාවෙන් ඉන්නේ..."

හිමාලි ඔසරි පට ගෙන උකුලට දමාගෙන සුරම්‍යා හා සිනාසුණාය.

"ඉතින් දුවේ... මගෙන් මොනවද කෙරෙන්න ඕන..."

හිමාලි අම්මා දෙස බැලුවාය.

'චූටි දුවට හොස්ටල් නම් ලැබුණා අක්කේ... ඒත්.. මං.. හ..රි පරස්සමින් එයාව හැදුවේ... අක්කා දන්නවනේ... හීරස්සගල ඉඳලා මං බස් එකේ නුවරට එයත් එක්කම දවස ගානේ බඩ ගෑවා ක්ලාස් එන්න...'

'අම්ම කෙනෙක් ඒක කරන්නම එපැයි... එහෙම නැති කෙල්ලෝ හදනවට වඩා හොඳයි කුකුල් පැටව් ටිකක් හදන එක...'

'අක්කට කරදරයක් නැත්නම් විතරක් මුල් අවුරුද්ද වත් දුවට මෙ..හේ...'

නන්දනී ඒ ටික කීවේ අමාරුවෙනි.

'ඉතින් ඇවිත් මෙහේ ඉඳලා කැම්පස් යන්න... මේ සාගරේ වගේ ගෙදර දැන් පාළුවට ගිහින් තියෙන්නේ... මට පුළුවන් විදිහට මං කෙල්ලව බලාගන්නම්... පාළුවට පන්සලකටවත් මාත් එක්ක යන්න කෙනෙක් දැන් නෑ...'

'ඇයි පන්සල් ගානේ ගිහින් වතුර කළ දස් ගණන් නාවපු කෙල්ලව පන්න ගත්තනේ...' අනුලා කීවේ කුස්සියේ සිටය.

'ලො..කු දෙයක් අ..ක්..කේ... ලො..කු..ම දෙය..ක්...'

සුරම්‍යා බැලුවේ හිමාලි දෙසය. මොන හේතුවකටදේ කෙල්ලව දුටු මොහොතේ සිට ඇයට කෙල්ල ගැන පැහැදීමක් ඇති විය. ඒ නුවර ගතිය නිසාද කියා ඇය දන්නේ නැත. එහෙත් එයද හේතුවකි. 'නාලනී වගේ නන්නත්තාරේ ගිහින් හද ගත්ත දරුවෙක් නෙමේනේ...' ඇය යටි සිතින් සිතුවාය.

'මං කෙල්ල ගැන බලාගන්නම්.. නංගී ඒ ගැන හිතන්නෙපා...'

හිමාලි සුරම්‍යා දෙස බලා කෘතගුණ පූර්වක ලෙස සිනාසුණාය.

මේ සියල්ල අසා උන් අනුලා කුස්සියේ බිත්තියට බරවී දැස් පියා ගත්තාය. 'දහක් එයි... ඒත් නංගියේ උඹ තරම් කෙනෙක් මේ ගෙදරට ලැබෙන්නෑ...' ඇය කීවේ සිතෙනි.

යන්නට සූදානම් වී හිමාලි සුරම්‍යාට යළිත් දණ ඔබා වැන්දය.





'නෑ..න්..දට පිං මාව තියාගන්නවට...'

'ඇය කීවේ දෑස්වල කඳුළු තිබියදීය.

'ඔයාගේ අම්මයි මායි එකට හැදුනේ... අපි නුවර මහමායාවට ගියෙත් එකට... එහෙම එකේ මං ඔයාට උදව් කරන්නැද්ද...'

'මං.. අ..යියටත් වැඳලා එන්නම් අම්මේ...'

හිමාලි උඩට යද්දී නන්දනීත් සුරම්‍යාත් බලා උන්නේ දුක්බර දෑසිනි.

'කෙල්ල සිරියාවයි නංගී...'

සුරම්‍යා උඩට යන හිමාලි දෙස බලා කීවාය.

උඩු මහලට යද්දීත් විමුක්ති නිදිය. හිමාලි සෑහෙන වේලාවක් ඔහු දෙස බලා උන්නාය. ඇය වැන්දේ නැත. ඇඳට බරවී ඔහුගේ නළලතට හාදුවක් දුන් ඇය තවත් මොහොතක් ඔහු දෙස බලා හිඳ පහළට ආවාය.

හිමාලිත් නන්දනීත් මොරගොඩ නිවසින් පිට වූයේ සතුටිනි. වෑන් රියට නඟිද්දීත් හිමාලි මොරගොඩ නිවස දෙස ආශාවෙන් බලා උන්නාය. ලබන සතියේ සිට තමාද මේ ගෙදර ඉන්නා බව සිහිවෙත්ම ඇගේ සිතට කුමක්දේ රසබර හැඟීමක් දැනුණි. ඒ දැනෙන හැඟීම කුමක්දැයි හරියටම ඇයට සිතා ගත නොහැක.

'ඔයාගේ වාසනාවට නැන්දලගේ ගෙදර නවතින්න ලැබුණා චූටි දුව...'

නන්දනී කීවේ සැනසීමෙනි.

'ම්.. නැන්ද හරි හොඳයි නේද අම්මේ...'

'නුවර වැඩිය ආවේ ගියේ නැති වුණාට අපට හරි හිතයි... ඇරත් ඔයාව දැක්කම නැන්දට ආස හිතෙන්න ඇති...'

හිමාලි අම්මා දෙස බලා සිනාසුණාය.

'එහේ තව කවුද ඉන්නේ... නැන්දයි මාමයි විමුක්ති අයියයි තව...'

'වෙන කවුරුවත් නෑ... වැඩට ඉන්න අය විතරයි...'

'සක්විති අයියලා...'

'එයාලා වෙනමම ඉන්නේ...'

'එහෙනම් හොඳයි...'

හිමාලි සෑහෙන දුරක් යනතෙක් කල්පනාබරව ගියාය. විමුක්තිව සිහිවී ඇගේ දෙතොල් පට අතර තුනී මදහසක් ඇඳුණි.

'අම්මේ... ඇයි විමුක්ති අයියට මෙහෙම වුණේ... මොකක්ද එතන සිද්ධ වුණේ...'

'නැන්දලා හරියට කියන්නේ නෑ... ඒත් පුංචි අම්මා මට කිව්වා ඔක්කොම...'

'ම්..'

'විමුක්ති පුතා ඔය මංජුලා එක්ක එන්ගේජ් වුණානේ... ඒ රට යන්න කලින්...'

'පස්සේ....'

'විමුක්ති එද්දී මෙහේ ඇවිත් උන්නා මාමගේ නංගිගේ දුව... විමුක්තිගේ නෑනා... ලස්සන කෙල්ලෙක්... මං එක වතාවක් දැකලා තියෙනවා... එයාගේ අම්මා නැති වුණා...'

'ම්...'

'පස්සේ විමුක්ති පුතා රට ඉඳලා ආවම ඔය දෙන්නා අතර සම්බන්ධයක් ඇතිවෙලා තියෙනවා... ටිකක් බරපතල සම්බන්ධයක්...'

'එතකොට මේ කසාදේ... මංජුලා...'

'ඉ..න්..නකෝ කියනකල්... ඔය අම්මා තාත්තා නැති කෙල්ලට අනුකම්පා කරල තමයි මාමයි නැන්දයි කොළඹ ගෙදරට එක්කගෙන ඇවිත් තියෙන්නේ... ගෙදර වැඩටත් එක්ක... පස්සේ කාට හරි බන්දලා දෙනවා කියලා හිතාගෙන...'

'ඒත් දෙන්නා යාළුවුණා...'

'නැතයි මස්සිනයිනේ... ගින්දරයි පුළුනුයි එකට තිබ්බාම





ඇවිලෙන එක අහන්නත් දෙයක්ද... ඔය සම්බන්ධේ නිසා විමුක්ති කසාදෙටත් ටිකක් අදිමදි කරලා...'

'එතකොට...'

හිමාලි ඇසුවේ උනන්දුවෙනි.

'පස්සේ සුරම්‍යාට මේක අහුවුණා... ගෑණි පරල වුණා වගේ උනාලු... එදම කෙල්ලව ගෙදරින් එලෙව්වලු... ඇයි අම්මා තාත්ත නැති හිඟන කෙල්ලෙක්නේ... සුරම්‍යා පුතාව දෙයිද එහෙම කෙනෙක්ට...'

'එයා ගියා...'

'ඔව්.. ඊට පස්සේ තමයි විමුක්තිගෙයි මංජුලාගෙයි කසාදේ ඉක්මන් කරලා තියෙන්නේ... ඕක විමුත්තිට ලොකුවට බලපාල තියෙනවා... විමුක්ති කෙල්ලට පණ වගේ ආදරේ කරලා තියෙන්නේ... ඇඟ හැදුනට මොළේ පොඩි එකෙක්ගේ වගේනේ... ඒක දරාගන්න බැරි වුණා... කසාදෙට ඔක්කොම ලෑස්ති කරලා තියෙද්දී මේක වුණා...'

'පව්... විමුක්ති අයියා ඒ ගර්ල්ට හරියට ආදරෙන් ඉන්න ඇති... මෙහෙම වෙන්න.. නේද අම්මා...'

'ඒකනේ පුදුමේ කියන්නේ... දැන් ඉතින් ඔක්කොම ඉවරයි...'

හිමාලි සිතුවේ විමුක්ති ආදරය කළ වර්ෂා ගැනය. ඇය කොහොම යුවතියක්ද කියා බලාගන්නට ඇත්නම් යැයි හිමාලිට සිතුණි. මේ තරම් වටිනා කොල්ලෙක්ට මෙසේ වූයේ ඇය ඒ තරම්ම වටිනා කෙල්ලෙක් නිසාද...

'ඉගෙන ගත්ත ගර්ල් කෙනෙක්ද අම්මේ...'

'එච්චරම නෑ... හැබැයි වැඩට දක්ෂයිලු... ඔය බුක්ෂොප් එක එහෙමත් බලල තියෙන්නේ එයා...'

'දැ..න් එ..යා කෝ...'

'කොහේ ඉන්නවද දන්නෑ... අම්මයි තාත්තයිත් නැනේ...'

'ඉතින් ක..ව..ද හරි විමුක්ති අයියව හොයාගෙන එයිනේ... එච්චරම ආදරේ කළානම්...'

'ආවත් එයාට එන්න දෙන්නෑනේ...'

'විමුක්ති අයියගේ ජීවිතේ අපරාදේ... නේද අම්මේ.. කොච්චර වටින කෙනෙක්ද...'

'ආදරේ කරන්න ගියාම එහෙමනේ... රජවරුන්ට සිංහාසනෙත් නැතිවෙනවා...'

'ඒත් ඔයා නොදන්න දෙයක් තියෙනවා අම්මේ... කවදහරි ඒ රාජව සිංහාසනේ තියන්නෙත් ගෑණියෙක්ම තමා...' හිමාලි එසේ සිතුවා පමණි. කීවේ නැත.

'ටිකක් දුක් වින්දෙත් විමුක්ති අයියව ගොඩ ගන්නත් පුළුවන් නේද අම්මේ...'

හිමාලි වෑන් රියේ පිටුපස අසුනේ පැත්තකට බරවී ඇසුවාය.

'ඔයිට වඩා අයව ගොඩ අරගෙන තියෙනවා... ඒත් චුට්ටි දුව ටිකක් දුක් විඳින්න ඕන...'

'එ..තකොට දන් අයියා මැරි කරන්න හිටපු මංජුලා දන් කෝ...'

'ඒක නම් දන්නෑ...'

'විමුක්ති අයියට අසනීප වුණාට පස්සේ එයත් එන්නේ නැතුව ඇති...'

'ආවත් දිගටම එන එකක් නෑ... ජයසිරි ඔය හරියෙන් ටිකක් ස්ලෝ කරලා යන්...'

නන්දනී කීවේ විමුක්ති බුක් සිටි පසු වෙද්දීය.

'මේ තමා විමුක්ති පුතාගේ බුක් ෂොප් එක...'

හිමාලි හැරී ඒ දෙස බලාගෙනම ගියාය.





'ලස්සනයි නේද අම්මේ...'

'ම්...'

'අයියා හරි ලස්සනට ජීවිතේ පටන් ගන්න ගිහින් තියෙන්නේ...'

'වැරදි කෙනෙක් එක්ක...'

නන්දනී හිමාලිගේ කතාවට දෙයක් එකතු කළාය.

'කැම්පස් පටන් ගන්න කලින් ටිකක් මං ආවා නම් අම්මේ මට ලේසියි... නැත්නම් අද ඇවිත් හෙට ඉඳන් කැම්පස් යන්නත් බෑනේ... මං මේ කොළඹ පාරවල් දන්නෙත් නෑ...'

'පළවෙනිද කිරිබත් කටක් කාලම එමු.. ම්...'

'ම්...'

'නැන්දා ඔයාව බස්වල යවන එකක් නෑ...'

'එ..හෙම වුණත් කමක් නෑ අම්මේ... වැඩිය කරදර කරන්න ඕන නෑ...'

හිමාලි මොහොතකට ආසනයේ ඇලවුණාය. ඇය දෙනෙත් පියාගෙන මොහොතක් උන්නාය. කුමක්දෝ සතුටකට යළිත් ඇයට විමුක්තිව සිහි විය. 'මටත් මොනවා වෙලාද මන්ද...' හිමාලි සිතුවේ පුදුමයෙනි.

# 26

දරුවා ලැබෙන්නට පෙර පිල්ලැව බෝ සමිඳුට බාරයක් වන්නට කියා අනුලාත් ධනසිරිත් එමින් ගමන් සක්විතිගේ නිවසටත් ගියේ මේධාව බලා යන්නටය. අනුලා ඇයට බැන්ද පිරිත් නූලක් මේධාටද ගෙනාවාය.

'අ..නු..ලක්කයි ධනේ අයියයි..නේ.. එන්න එන්න...'

මේධා තාරාවෙකු මෙන් ඇවිදගෙන විත් ඔවුන්ව පිළිගත්තාය.

'අද දෙන්නත් එක්කම...'

'පැටියට බාරයක් වෙන්න ගියා මේධා නෝනා... කරදර අස්සේ එහෙම දෙයක් වත් කරන්න බැරි වුණා...'

'අනේ ඒක ඇත්ත අනුලක්කේ... මොනා කරන්නද...'

'දැන් තමා හිතට සැනසීමක් ආවේ... ලොකු සාදුට පිරිකරකුත් පූජ කරලා පිරිත් ටිකකුත් කියවගත්තා... මං මේධා නෝනටත් පිරිත් නූලක් ගෙනාවා...'

අනුලා මේධාගේ අත ගෙන පිරිත් නූල බැන්දය.





'සක්විති මහත්තයා කෝ මේධා නෝනා..'

ධනසිරි ඇසුවේය.

'දැන් ඇහ සෝදගෙන එයි... හිටියට ඉන්නේ සතුටකින් නෙමේ... මල්ලි ගැනම තමා හිතන්නේ...'

'කොච්චර ආදරේකින්ද දෙන්නා හිටියේ... සක්විති මහත්තයා ඇවිත් චූටි මහත්තයව නාවද්දී බලන් ඉන්න බෑ.. කඳුළු පිරෙනවා...'

'ජීවිතේ මේ දුක විඳවන්නම එපැයි අනුලක්කේ...'

'විඳින දුක අපි එකට විඳිමු නේද මේධා නෝනා...'

'නැතුව අනුලක්කේ... ඔන්න අද දෙන්නත් එක්ක කෑම ටිකක් කාලම යන් හොඳේ...'

'එහෙනම් මං උයන්නම්...'

'උයන්න බෑ බං... කෑම ටිකක් ගෙන්න ගමු... මෙතන රෙස්ටුරන්ට් එකට කෝල් කළාම කෑම ගේනවා...'

මේධා කීවේ සිනාසෙමිනි.

'ආ... අනිත් බන්ඩි ගෙඩියත් ඇවිත්...'

සක්විති ආවේ එහෙම කියාගෙනය.

'දෙන්නත් එක්ක පැටියට බාර වෙන්න පන්සල් ගිහින්...'

'අපිත් යන්න ඕන ධනේ අයියා.... හෙටද කියලා ෂුවර් නෑ... රෑට මාර බොක්සිං ගහන්නේ බඩ ඇතුලේ...'

'මං හිතන්නේ මේධා නෝනට දුවෙක්...'

අනුලා කීවාය.

'දුවෙක්... කොහොමද හරියට කියන්නේ...'

'දුවලා ලැබෙන්න ඉඳිද්දී අම්මා ලස්සන වෙනවලු...'

අනුලා කියද්දී සක්විති මේධා දෙස ආශාවෙන් බැලුවාය.

'මගේ ගෑණිගේ ලස්සනවත් බලන්න දැන් මට සිහියක් නෑ අනුලක්කේ... වෙන ගෑණියෙක් නම් දික්කසාද වෙලා...'

සක්විති කීවේ දුකෙනි.

˙ඔන්න බලන්න....˙

˙ප්‍රශ්න දරාගෙන ජීවිතේට මූණ දෙමු සක්විති මහත්තයා...˙

˙බබා අපි කෑම ඕඩර් කරමු...˙

˙මං කරන්නම්...˙

මේධා අසළ අවන්හලට කෑම ඇණවුමක් දුන්නාය.

˙මං මස් ඕඩර් කළේ නෑ හොඳේ... මේ දවස්වල මස් කන්නම හොඳ නෑ... එච්චරටම කරදර...˙

˙අනුලක්කගේ නංගී ආපු නිසා හොඳයි... කෙල්ල මට හොඳට උදව් කරනවා...˙

සක්විති කීවේය. ගෙදරට ආ අමුත්තන් අනුලාට සිහිවූයේ එවිටය.

˙සක්විති මහත්තයගේ තව නංගි කෙනෙක් ළඟදිම මහ ගෙදරට එනවා...˙

˙අර සක බඹරෙද... ඒකි මගේ නංගි වෙන්නේ කොහොමද අනුලක්කේ... පට්ට...˙

˙නෑ මංජුලා මිස් නෙමේ...˙

˙එහෙනම්...˙

අනුලා මේධා දෙස බලා අසරණව සිනාසුණාය.

˙නුවර නන්දනී නෝනා ඉන්නේ...˙

˙ඔ..ව්...˙

˙එයාලා අද ආවා... නන්දනී නෝනගේ දුවත් ආවා...˙

˙හිමාලි...˙

˙ආ... සක්විති මහත්තයා දන්නවනේ...˙

˙ඉතින්...˙

අනුලා උදේ සිදුවූ සියල්ල විස්තර කළාය.





˙ලො..කු නෝනා කෙල්ලව අත ගගා හරි වර්ණනාව... ඔසරියක් ඇඳගෙන ආවේ...˙

˙ලස්සනයි...˙

මේධා ඇසුවාය.

˙ඔ..ව් ලස්සනයි... වර්ෂා නංගිගේ වයසෙම වගේ... කොහොම හරි එයා ලබන සතියේ විතර එහේ නවතින්න එනවා...˙

මේධාට හීල්ලින. කියන්න දහසක් දේ මුවට ආවද ඇය කිසිවක් කීවේ නැත.

˙අපේ කෙල්ල තමා පව්...˙

˙මටත් උදේ ඉඳලා මතක් වෙනවා... මට ලොකු නෝනා කිව්වා වර්ෂා නංගි හිටපු කාමරේ ලෑස්ති කරලා තියන්න කියලා... ඒ කාමරෙන් තාම කෙල්ලගේ සුවඳ එනවා...˙

මහගෙදරට එන හිමාලි කවර ආකාරයේ කෙල්ලෙක්දැයි මේධා සිතන්නට වූවාය.

* * * * * * * * * * *

හිමාලි කොළඹ එන්නට ප්‍රථම ඇගේ යෙහෙළියක් සමඟ ගොස් දළඳා සමිඳු වැඳ පුද ගත්තාය. කොළඹ යන ජීවිතය ගැන විශේෂයෙන් සිතන්නට දෙයක් නැතත් ඒ යන ගමන තම ජීවිතයේ ඉතාම වැදගත් ගමනක් යැයි හිමාලිට ඉවෙන් මෙන් දැනුණි.

දළාඳා වඳිද්දී හිමාලි විමුක්තිවද සිහි කළාය. මේ ජීවිතයේ මෙහෙම කා ගැනවත් කවදාවත් මතක් වී නැත. එහෙත් ඔහුව දුටු මොහොතේ සිට මේ දක්වා සිය දහස් වතාවක් ඒ රුව සිහි විය.

දළඳා සමිඳු වැඳ මාළිගාවේ ගල් පිය ගැට පෙළ බසිද්දී හිමාලිගේ මිතුරිය ඇය දෙස ඕනෑකමින් බලා උන්නාය. කෙල්ලව අද වෙනදට වඩා ලස්සනට පේන්නේ ඇය ඇඳගෙන ඉන්නා සිවුරු කහ පැහැ ගත් ගවුම නිසාද නොවේනම් වෙනත් දෙයක් නිසාද

කියා නිෂාදි සිතුවාය.

'ඇ..යි...'

හිමාලි ඇසුවේ ඇස් වලිනි.

'උඹ සැලොන් එක පැත්තේ ගියාද....'

'මිහ්... යන්න කලින් නම් යන්න ඕන.. ඇයි...'

'එහෙනම්.. ගෙදරදී මොනා හරි පේෂල් එකක් කළාද...'

'නෑ බං... මට ඊට වඩා වැඩ තියෙනවා කෙල්ලේ... තාම ඇඳුම් ටිකවත් හරියට ලැස්ති කර ගත්තේ නෑ...'

'එහෙනම්.. උඹ ලස්සන වෙලා...'

නිෂාදි කීවේ හිමාලිගේ අත අල්ලාගෙනය. හිමාලි ගල් පඩි දෙස බලාගෙන සිනාසුණාය.

'උඹට පේන හැටි...'

'පේන හැටි තමා... මේ දවස්වල උඹේ ජීවිතේ මොනා හරි වෙනවද හිමා...'

එයටද කෙල්ල සිනාසුණාය. 'ජීවිතේ මොනවා හරි වෙනවද කියලා නම් දන්නෑ... ඒත් පපුවේ මොනාද වෙනවා කියලා නම් තේරෙනවා...' හිමාලි සිතුවාය.

'නුවර දලා යන්නත් දුකයි...'

වැව රවුමේ වළාකුළු බැම්මට බරවී හිමාලි කීවාය. මේ මහනුවර යටි නුවර වීදියත් දළදා වීදියත් වැව රවුමත් අතරින් කාලය කොහොම ගෙවී ගියාදයි හිමාලි සිතුවාය.

'දලා යන්න බැරි විශේෂ කෙනෙක් උඹට ඉතින් නුවර නැනේ හිමා...'

හිමාලි වැව දෙස බලා සිනාසුණාය.

'හිත පිරිසිදුව තියා ගත්ත එක කොච්චර හොඳද කියලා හිතෙන්නේ දැන් නිෂා...'

'ඇ..යි.. පිරිසිදු හදවත කාට හරි දෙන්නද යන්නේ...'





'උ..ඹ..ට පිස්..සු...'

හිමාලි නිෂාදිගේ උරතලයට බරවී කීවාය. බෝගම්බර වැව දෙසින් හමා ආ සුළං පොදකින් යුවතියන් දෙදෙනාගේ මුහුණු සීතල වීගෙන ගියේය.

'හිටියනම් අද දලා යද්දී දුකයි... මේ කොහෙට හරි වෙලා අඩ අඩා ඉන්න වෙයි...'

'නුවරදී කුඩු හැදුවේ නැති වුණාට කොළඹදි හැදෙයි වගේ...'

'හැදෙයි හැදෙයි... මාත් ඉතින් කොහේ හරි කුඩුවක් හද ගන්නත් එපැයි...'

'කෙල්ල හිතලා තියෙන දුර...'

හිමාලිත් නිෂාදිත් ඇවිදගෙන ආවේ කතා බහකින් තොරවය.

'ඉතින් කොළඹ ගිහින් මොනාද කරන්න හිතාගෙන ඉන්නේ...'

'ම්... කැම්පස් යනවා.. එනවා...'

'ඒක මං දන්නවා බං... මං කියන්නේ...'

'ම්.. විශේෂ දෙයක් නෑ... ඒත්...'

'ඇයි...'

'මං ගිහින් කොළඹ නවතින්නේ නැන්දලගේ ගෙදර... මං එහේ වැඩිය ගිහිනුත් නෑ... නැන්දට පුතාලා දෙන්නෙක් ඉන්නවා... ලොකු අයියා නම් බැඳලා... පොඩි අයියා බඳින්න ගිහින් ප්‍රශ්න වගයක් වුණා...'

'ම්...'

'දැන් පොඩි අයියා ඉන්නේ එක්තැන් වෙලා... කොමා තත්වයක් කියන්නේ නිෂා...'

'ම්.. අන්කොන්ෂස්...'

'එහෙම තමා... දක්කම ගොඩක් දුක හිතුණා... එයා ගර්ල් කෙනෙකුට පණ වගේ ආදරේ කළා... එයා අයියට නැති වුණා...

ආදරේ කරන්නේ නැති කෙනෙක්ව බඳින්න වුණා... වෙඩින් එකට කලින් මේ දේ වුණේ...'

'පු..දුමයි නේද...'

'ආ..දරේ කියන්නේ මහ පුදුම දෙයක් වෙන්න ඇති නේද නිෂා...'

'මාත් හිතන්නේ... ලෝකේ පුදුම හතටත් වඩා පුදුමේ...'

'වෙලාවකට හිතෙනවා තිකමට ආදරේ කරලා බලන්න... පපුවට මොනාද වෙන්නේ කියලා බලන්න...'

හිමාලි කියද්දී නිෂාදි හිමාලි අතින් මෑදුව අල්ලා ගත්තාය.

'ආදරේ කරනව නම් එකපාරක් මැරෙන්න හරි බලාගෙන ආදරේ කරනවා... නැත්..න..ම් එපා...'

'ආදරේ දෙතුන් පාර ඇති වෙන්නෑ නිෂා... එකපාරයි... ඒක ජීවිත කාලෙටමයි...'

'ම්... මාත් එක්ක යන් නෝලිමිට් එකට...'

'ඇයි දන්...'

'අ..නේ කෙල්ලේ.. මට උඹට බඩුවක් අරන් දෙන්න ඕන...'

හිමාලි නිෂාදි දෙස බැලුවේ ආදරය පිරුණු දෙනෙතිනි.

'එ..හෙ..නම් චූටි දෙයක්...'

'උඹට මට කොච්චර අරන් දීලා තියෙනවද... අල්මාරිය අරිද්දී මට උඹව හරියට මතක් වෙනවා...'

'එහෙනම් මාව මතක් කර ගන්න ඕන නම් ගිහින් අල්මාරිය ඇරපන්...'

කෙල්ලෝ දෙන්නා සිනාසුණේ අත්වැල් පටලාගෙනමය.





# 27

**කොළඹ** සිදුවෙන මේ කිසිවක් වර්ෂා දන උන්නේ නැත. ඇය ඇගේ ආදරයත් විශ්වාසයත් අනාගතයත් සියල්ල කුසේ හද වඩා ගනිමින් උන්නාය. මේ ආදරය මේ වැදෑමහෙන් ජීවිතය කවා රකිනු ඇර අන් යමක් කරන්නට ඇය දන උන්නේ නැත.

මේ කුසේ වැඩෙන්නේ මේ ආදරය වෙනුවෙන් කළ උත්තරීතරම කැප කිරීමය. කුස යංතම් මෝරාගෙන එද්දී වර්ෂාට පුදුම සතුටක් දනෙයි. 'මේ බඩේ ලොකු වෙන්නේ අපේ ආදරේ රත්තරන්...' හැම රෑකම වර්ෂා විමුක්තිට සිහිනෙන් මෙන් කීවාය.

අනුරාධපුර ඉඩමේ හද ගත් ගෙපැළ ඇත්තටම සුන්දර අහිංසක ගෙපැළකි. කපරාරු නොකළ බිත්තිත් උළු වහළත් සුදු සිමෙන්ති දමූ බිමත් අසරණ අහිංසක ගෑණු තුන්දෙනාට සෙවණ සැදුවේය.

මේ ගෙට ගෙවදුනද කෙල්ලෝ දෙන්නා මුළු රෑක්ම ගෙයි සීතල සිමෙන්ති බිම ඉඳගෙන කතා කරමින් උන්නෝය. දෛවය නරකම ලෙස සැළකූ මොහොතක ඊට එරෙහිව හද ගත් මේ පුංචි ගෙපැළ මේ තරම් සැනසිලිදයක තැනක් වේ යැයි දෙන්නාට සිතුනේ නැත.

රත්නපුරයෙන් ගෙනා බඩු මුට්ටු තබා වර්ෂාත් ප්‍රියංවදත් නිවස

හැඩ කර ගත්තෝය. වර්ෂා සුදු තිර රෙදි ටිකක් මස්සවාගෙන ජනෙල් වලට දමුවාය.

හැම හැන්දෑවකම වර්ෂා නිවස ඉදිරිපිට වූ කොහොඹ ගස යට ඇති ගල් තලාවේ ඉඳගෙන මේ පුංචි දූප්පත් නිවහන දෙස බලා සිටී. එහෙම බලා සිටිද්දී කෙල්ලට සිහි වෙන්නේ තමාට ලේ එන්නට පහර දී එළියට දමූ මොරගොඩ නිවසය. කොහොඹ බඳට බරවී කෙල්ල ඇගේ සුදු දෙපා ඒ මත විහිද ගන්නේ කකුල් කකියන නිසාය.

තවම ඒ සුන්දර දෙපා ඉදිමෙන්නට පටන් ගෙන නැත. ඒ දෙපා දකිද්දී වර්ෂාට සිහි වෙන්නේ අවසන් දවසේ කළුතරදී ඔහු මේ නිරුවත් දෙපා මත මුහුණ තබාගෙන උන් අයුරුය.

අම්මා කෙනෙක් වෙන්නට යන නිසාදේ කෙල්ල තවත් ලස්සන වී ඇතැයි ඇය දෙස බලා උන් ප්‍රියංවදට සිතුණි. ඒ මුහුණ දැන් පෙරටත් වඩා මලක් වැනිය. තිබුණාට වඩා කොපුල් තල පිම්බී ඇත. එකම දුක ඒ ඇස්වල අර පරණ දුක්බර බව තිබීමය.

'උඹ තවත් සුදු වෙලාද කොහෙද...'

ගල් පොත්තට පැමිණ ඉඳගෙන වර්ෂාගේ දෙපා මත සුරත තබා ප්‍රියංවද කීවාය.

'ඉතින් හරිනේ කෙල්ලේ... මැල්ලුම්මනේ කන්නේ...'

'ඒකත් හරි.. අන්න අම්මා අදත් කවලම් මැල්ලුමකට කොළ හොයාගෙන ඇවිත්...'

'කරවල හොදි ටිකක් දගත්තම ඒ මැල්ලුම් ටික හරිම රහයි ප්‍රියා...'

ප්‍රියංවද කෙළ ගිල්ලාය. වර්ෂා ඇය දෙස බලා සිනාසුණෝ ඒ දකය.

'ගොඩක් හිර ඇඳුම් අඳින්නෙපා කෙල්ලේ...'

ප්‍රියංවද කීවේ වර්ෂා ඇඳගෙන උන් ගවුම ඇයට ටිකක් හිරයි සේ පෙණුන නිසාය.





'මා..ත් හිතුවා...'

'හැබැයි ඔය දම්පාට ගවුමට උඹ හරිම ලස්සනයි... ඒලෙවල් කාලේ වගේ...'

'ඒලෙවල් කරලා ගෙවුණේ අවුරුදු දෙකයි තුනයි... නේද ප්‍රියා...'

'ඒකනේ... අවුරුදු දහයක දේවල් ජීවිතේට වෙලා...'

'ම්...'

ලබන්නේ විසි තුනටය.

'අයියට කීයද...'

'අයියට මේ ලබන්නේ විසි හත...'

'එ..හෙ..න..ම් කමක් නෑ...'

'ඇයි...'

'දෙන්නටම තව වයස තියෙනවා...'

'අවුරුදු විසි අටේදී එයා තාත්තා කෙනෙක්...'

ප්‍රියංවද සිනාසුණාය. දෛවය මේ ජීවිත තුන එකට තැබුවා නම් කොපමණ ලස්සනද...

* * * * * * * * * *

හිමාලි කොළඹ මොරගොඩ නිවසේ නැවතීමට යන්නට යොද ගත්තේ පෝය දිනයය. නන්දනී ඇයව ඇරලවන්නට යද්දී ගෙනියන්නට ලොකු බටු මෝජු බෝතලයකුත් සීනි සම්බෝල බෝතලයකුත් හීරස්සගල හිමාලිගේ පියාට අයත්ව තිබූ ඉඩම් වලින් හිම්වූ සහල් ගෝනියකුත් සූදනම් කළාය. කෙල්ලෙක්ව ගෙදරකට යවද්දී පිරුවට යැවිය යුතුය. ඒ නිසාම නන්දනී ඇයට අලුත්ම ඇඳුම් රැගෙන දුන්නාය.

'මේ බෑග් එකේ තියෙන ඔක්කොම ඇඳුම් ගෙදරට...'

හිමාලි බිම වාඩි වී ගෙන සිනාසුණාය. ලා කහ පැහැයට හුරු රැ ඇඳුමක් ඇඳ උන් ඇය උන්නේ ඇගේ පිට මැදට පමණ වන්නට තිබූ වරළස ඉදිරියට ගෙන පීරමිනි.

නන්දනී එතෙක් වෙලා අල්මාරියේ දමාගෙන උන් සුදු ගල් ඇල්లූ රන් අත් වේන් පට අතට ගත්තාය. එය ඇය ගත්තේ කෙල්ලට හොරෙනි. එය රැගෙන නන්දනී කෙල්ලව ළඟට ගත්තාය.

'කෝ දකුණු අත දෙන්න...'

අම්මා අත් වේන් පට ගනිද්දී හිමාලිගේ දෑස්වල කඳුළු පිරුණි. අම්මා මේ සියල්ල කරන්නේ තමාව ලස්සනට තබන්නට බව ඇය දනී.

'අ..නේ අම්..මා...'

'හොඳද...'

'මි.. හ..රි..ම ලස්සනයි...'

කෙල්ල කීවේ කඳුළු වැටෙද්දීය.

'ඔ..යා පව්...'

'දැන් මං ගැන නෙමේ ඔයාගේ ජීවිතේ ගැන හිතන්න...'

'තව කල් තියෙනවා...'

'ඔයා දැන් ලොකුයි පුතේ...'

හිමාලි කතා කළේ නැත. ඇය අම්මා අත් වේන් පටක් පැළඳි දකුණත දෙස බලාගෙනම උන්නාය. දැන් ඒ අතට නැති ලස්සනක් පැමිණ ඇත.

මේ අත ගන්නේ කවුද... හිමාලි සිතුවේ නන්දනීගේ උකුලට හිස තබමිනි.

පුදුමයකට මෙන් ඇයට හදිස්සියේම විමුක්තිව සිහිවිය... ඒ ජීවිතය ගැන පපුව පසාරු කරගෙන යන කැක්කුමක් එන්නේ ඇයිදැයි හිමාලිටම තේරෙන්නේ නැත.

'අ..ම්..මේ...'





'ම්...'

'විමුක්ති අයියා කවදහරි සනීප උනාම...'

'ඉතින්...'

'ආයෙත් අර ගර්ල්ව හොයාගෙන යයි නේද...'

'මං හිතන්නෑ... ඒක කවදාවත් වෙන දෙයක් නෙමේ...'

'ඒ..ත් එ..ච්..චරටම ආදරේ නම්...'

'කාලයත් එක්ක ඕවා ඔහොමම වැළලිලා යයි... ඒ කෙල්ලත් බඳී... කාත් කවුරුත් නැති කෙල්ලෙක්නේ...'

'එ..ය..ත් අයියවම පතාගෙන හිටියොත්...'

'ඒත් විමුක්ති පුතා නැන්දලට පිටින් යන්නෑ... ඕනනම් තිබ්බනේ ඕවා වෙන්න කලින් බඳින්නත්...'

'ම්... අ..ප..රා..දේ එ..හෙ..ම කරන්න තිබ්බේ...'

'දෛවය කියලා දේකුත් තියෙනවනේ...'

දෛදවය... හිමාලි ඒ වදන යළි යළිත් මැතුරුවාය. හැම කෙනෙකුටම දෛවයක් තියෙනවාද... එසේනම් තමාගේ දෛවය ලියවී ඇත්තේ කෙසේද...

'අ..ම්මේ...'

'ම්...'

'මාත් පුළුවන් විදිහට විමුක්ති අයියට ඇප උපස්ථාන කරන්නම්...'

'කරනව නම් ලොකු පිනක් පුතේ... ඒත් ජීවිතයක්නේ...'

'ම්...'

ඇත්තටම අම්මා කියූවාක් සේ ඒත් ජීවිතයක් නොවේද...

'ඔහොම තත්වෙකට වැටුණ කෙනෙක් පොඩි දරුවෙකුටත් අන්තයි... දරුවෙක් බලා ගන්නවා වගේ බලා ගන්න ඕන...'

˚සමහර විට මං එයාව මගේ දරුවෙක් වගේ බලාගනී...˚ හිමාලිට සිතුණි.

˚බෙහෙත් ඉන්ජෙක්ෂන් ලක්ෂ ගාණකට කරන්න බැරි දෙයක් පොඩි ආදර කරුණාවකට කරන්න පුළුවන්...˚

අම්මා මේ රැල් එල්ලන්නේ තමාගේ හිතේ ඇති සිතුවිල්ල දනගෙනදේයි හිමාලිට සිතුණි.

˚මට එකපාරටම ජොබ් එකකුත් ලැබෙන්නැති වෙයි... නේද අම්මේ...˚

˚ජොබ් මොකටද පුතේ... මේ තියෙන ආදයම් ඇති... මාත් කිව්වේ ඔයත් ආසාවෙන් හිටපු නිසා...˚

˚ඒත් දැන් හිතෙනවා රස්සාවක් නොකළොත් හොඳයි කියලා...˚ එහෙම හිතෙන්නේ ඔහු ළඟට වී ඉන්නට හිතට ආසාවක් එන නිසාද... හිමාලිට තේරෙන්නේ නැත.

˚මට හරි ආසයි විමුක්ති අයියා ඔය තරම් ආදරේ කරපු ඒ ගර්ල්ව දකින්න... ල..ස්..සන ගර්ල් කෙනෙක් වෙන්නැති නේද අම්මේ...˚

˚ම්.. ල..ස්..ස..නයිලු...˚

˚විමුක්ති අයියා වගේ ඉගෙන ගත්ත කෙනෙක් මේ තරම් කඩා වැටෙන්න ඒ කෙල්ල පුදුම ආදරයක් දෙන්න ඇති...˚

හිමාලි හිතුවා හරියට හරිය. විමුක්තිට මෙහෙම වූයේ වර්ෂාගේ ආදරය ඔහුගේ ලේ තුළට වැද ඇට මස් නහර තුළත් කැවී තිබූ නිසාය.

*   *   *   *   *   *   *   *   *   *   *   *

මේධාට දරුවා ලැබෙන්නට අමාරු වූයේ හිමාලි මොරගොඩ නිවසට පැමිණ ගතවූ දෙවන දිනයේය. ඇයට අමාරු වූයේ මහා පාන්දරය. මොකක්දෝ හේතුවක් නිසා මේධාට අමාරු වෙද්දී ඇයට





සිහිවූයේ වර්ෂාවය. මේධාගේ දෙනෙත් එහෙමම තෙත්වී ගියාය. අද ඇය තමා අසළ උන්නා නම් තම සැමියට පසු සතුටු වන්නේ ඇය බව මේධා දනී.

˚අ..මා..රුද බ..බා...˚

˚ම්.. ටි..ක..ක්...˚

සක්විති උන්නේ වෙව්ලමිනි. ඔහු මේධාව වාහනයට වත්තං කරගෙන ගියේ වඩාගෙන මෙනි.

˚මං ඉ..ක්..ම..න..ට ය..න්..න..ම්...˚

˚ප.. ප.. පරි..ස්..සමින් යන්... ත..ව වෙලා ය..යි...˚

මේධා ආසනයේ දිගාවී මෙන් කීවාය. සක්විති වාහනය පැදවූයේ වමතින් ඇගේ හිස පිරිමදිමිනි. මේධා තම සැමියාගේ හද තුළ තමාට ඇති ආදරය ඇඳිනගත්තේ මේ අතේ දෙදරීමෙනි.

˚බ..ය..වෙ..න්..නෙ..පා ර..ත්..ත..ර..න්... ම..ට මු..කු..ත් වෙ..න්..නෑ...˚

ඇය කීවේ දුක්බර ලෙස හිනැහීය. එහෙත් යටි බඩ දෙසින් එන වේදනාව පුදුමාකාරය.

ඇය ඒ වේදනාව දරා ගත්තේ විවාහ වී අවුරුදු දෙකකටත් වඩා දුක් වින්දේ මේ වේදනාව ලබා ගන්නට නොවේදැයි සිතමිනි.

මහා පාන්දර රෝහල කරා යද්දී සක්විති වැල්ලවත්තේ මයුරපති කෝවිල ළඟ වාහනය නවත්වා දේවාලයට පඬුරක්ද දමා ආවේය. යළි වාහනයට ගොඩ වූ සක්විති දෙස මේධා බැලුවේ ආදරයෙනි.

˚ආ.. අ..ම්..මේ...˚

මේධාගේ මුවින් කෙඳිරිලි හඬක් පිටවූයේ ඇයට වේදනාව දරාගෙන ඉන්නටම බැරි නිසාය.

˚මං.. ටි..ක..ක් අ..ත..ගා..න්..නද බබා...˚

˚එ..පා අ..පි ය..න්...˚

තමා ජීවිතයේ තනිවී ඇති බවක් සක්විතිට දැනුණි. ඔහුගේ හිතට බියමුසු තනිකමක් දැනුණේ පුදුමාකාර ලෙසිනි. අද මල්ලී

එක්තැන් විය. වර්ෂා අතුරුදහන් වී ඇත. ඇත්තටම මේ ජීවිතයට පිහිටකට උන්නේ උන් දෙන්නාය.

'ඇ..යි ම..හ..ත්..ත..යෝ...'

සක්විතිගේ මුහුණේ වූ දුක දක මේධා අමාරුවෙන් ඇසුවාය.

'මු..කු..ත් නෑ බබා...'

'ඇ..යි කියන්..න...'

'ම..ට.. මල්ලිවයි කෙ..ල්ලවයි මතක් වු..ණා...'

'ම..ටත් පා..න්..දර ඉඳන් කෙල්ලව ම..ත..ක් වෙනවා... හි..ටි..ය නම් කියල හිතෙනවා...'

ඒත් දෛවය මේ සියල්ලටම වඩා නපුරුය. මේ බරපතල වියෝගයන් ඉදිරියේ හිත හද ගනු ඇරෙන්නට වෙන කුමක් කරන්නද...

සක්විති රෝහලට යන අතරවාරයේ මේධාගේ වෛද්‍යවරයාටද කතා කළේය. ඔහු කීවේ හදිස්සියකින් තොරව මේධාව රෝහලට ඇතුල් කරන ලෙසිනි.

'ද..ව..ල් වෙ..ද්..දී තා..ත්..තා කෙනෙක්...'

මේධා සක්විතිගේ අත අල්ලාගෙන පපුවේ තබා ගනිමින් කීවේ වේදනාව මොහොතකට අඩු වූ මොහොතකය. එහෙත් ඇගේ මුහුණ පුරා දහදිය පිපී තිබුණි. හුස්ම ගන්නා වේගයද වැඩි වී තිබුණි.

සක්විති සිනාසුණේ අහිංසක ලෙසිනි. දරුවා එන්නේ ජීවිතයට කරදර වැඩි මොහොතකය. උපදින දරුවා වත් ජීවිතයේ කරදර ටික අඩු කරාවි යැයි ඔහුට සිතුණි.

'ගො..ඩ..ක් හිතන්නෙපා... හැ..ම දෙ..ය..ක්..ම විසඳෙයි.. අපි ඉන්නවනේ මහත්තයෝ...'

'ම්...'

සක්විතිට පුදුම පසුගිය කාලයේ සිදුවූ සිදුවීම් ටිකටය. ඒවා මේ ජීවිතයේ නොඋනා නම් කොතරම් හොඳද... එහෙත් දෙවියන් ජීවිතය මත මේ තරම් වියෝගයන් මවන්නේ මේ දුප්පත් අසරණ





ජීවිත තව තවත් මේ ජීවිතයට බන්ද තබන්නටද...

ඔහු මේධාව රෝහලට ඇතුල් කළේ හිතින් දෙවියන් යදිමිනි. සියල්ලටම වඩා ඔහුට බය ඔහුගේ බිරිඳ ගැනය. ඇය ගැන මේ තරම් දුක හිතුන... මේ තරම් ආදරේ හිතුන අන් දවසක් නැත.

ඇය පව් යැයි ඔහුට සිතුණි. මේධාව පරීක්ෂණ සඳහා ඇතුළට රැගෙන යද්දී සක්විතිගේ දෑස් තෙමී ගියේය.

මේ පුවත කතා කර කියන්නටත් කෙනෙක් නැත. සක්විති එහෙමම මහා අසරණකමකින් දරකාගාරය අසළ තිබූ පුටුවකට බර විය.

# 28

**පුදුමයකට** මෙන් වර්ෂාට උදේ ඇහැරුණ මොහොතේ සිට මේධාව සිහිවෙමින් තිබුණි. වර්ෂා කුඩා යහන මත ඉඳගෙන මේ ගෙවෙන දින කවදදැයි සිහි කළාය. මේධාට දරුවා ලැබෙන්නට දින දී තිබුණේ මේ දිනවලට බව සිහිවෙද්දී ඇගේ පපුව කැවෙන්නට විය.

එක්කෝ දැන් ඇයට දරුවා ලැබී අවසානය. නැතහොත් මේ දිනවලදී ඇගේ දරුවා ලැබෙන්නට රෝහල් ගත කර සිටිය යුතුය.

ප්‍රියංවද කෙල්ලගේ තේ එකද ගෙන ඇඳ මතට විත් ඉඳගත්තාය.

'ඇයි කෙල්ලේ...'

'නෑ ප්‍රියා... මේධක්කව මතක් වුණා... අක්කට බබා ලැබෙන්න දින දීලා තියෙන්නේ මේ දවස්වල...'

'අ..නේ...'

'සමහර විට බබා ලැබිලත් ඇති... නැත්නම් හොස්පිට්ල් එක්කන් ගිහින් ඇති... පව්.. තනියම කොහොම කර ගන්නවද දන්නෑ...'

'මේධක්කටත් උඹව මතක් වෙනවා ඇති...'





'ම්.. අක්කා අයියට වේලාසනම කියලා තිබ්බේ බබා ලැබුණාම කෙල්ලව මට ඕන කියලා... මාත් හිතුවේ ඒ දවස් ටිකේම බුක් ෂොප් එකෙන් නිවාඩු අරන් එයා ළඟට වෙලා ඉන්න...'

'උඹටත් මෙහෙම දරුවෙක් ලැබෙන්න කියලා මේධක්කා දන්නවනම් නේද...'

ප්‍රියංවද කීවේ වර්ෂාගේ කුස දෙස බලාය. වර්ෂාද එහෙමම ඇගේ කුසට සුරත තබා ගත්තාය.

'පු..දු..ම වෙයි...'

'වෙච්ච දේවලට කාටද පුදුම නැත්තේ කෙල්ලේ...'

'බබා ලැබිලනම් එයත් දන් බාප්පා කෙනෙක්... යන්නැති බලන්න... බබාලට හරි ආසයි...'

විමුක්ත ගැන හිතද්දීත් කෙල්ලගේ දෑස් තෙමී යන අයුරු ප්‍රියංවද බලා උන්නාය.

'පුතෙක්ද දුවෙක්ද දන්නෑ... මං නම් හිතන්නේ දුවෙක්...'

'ඇයි...'

'බබා ලැබෙන්න බඩට ආවාම අක්කයි මායි ගියා අක්කගෙයි අයියගෙයි කේන්දර අරගෙන තැනකට... එතනදී කිව්වේ පින්බර දූ කුමරියක් ලැබෙනවයි කියලා...'

'උඹට කවුරු ලැබෙයිද...'

'පුතෙක් ලැබෙනවනම් මං ආසයි...'

'ඇයි...'

'කෙල්ලන්ට මේ ලෝකෙ දුක වැඩියි ප්‍රියා...'

'ඇත්ත.. මේ අපිට ජෙන්නැද්ද... අඩාගත්ත ගමන්...'

'එයත් ආස වෙයි පුතෙක්ට...'

ආසා වෙන්නටත් ඔහු ළඟපාතක වත් නැත. ගැණුන්ගේ ජීවිත වල ඇත්තේ මෙසේ අවුරුද්දක් හඬන්නට හිතෙනා තරම් දුක්බර



Hemantha007
For free distribution

දේවල්ය.

'මේධක්කගේ පැටියට මොනාහරි යවන්නවත් තිබ්බ නම්...'

වර්ෂා කීවේ අසරණවය.

'උඹට එහෙම හිතෙනවද...'

'මේ ප්‍රශ්න මොනවත් උපදින පැටියා දන්නැනෙ ප්‍රියා... පව්.. මං හිටියේ පැටියව මං අරගෙන නාවන්න...'

ප්‍රියංවද වර්ෂාගේ හිස පිරිමැද්දය.

'ඒත්.. අ..පි කොහොමද හරියට දනගන්නේ...'

'ඒක කොහොම කරන්නද ප්‍රියා...'

'ම්...'

වර්ෂාගෙන් වෙන්වී ගිය ප්‍රියංවද වර්ෂාටත් හොරෙන් වර්ෂාගේ දුරකථන අංක ලියා ඇති පොතේ වූ මේධාගේ නිවසේ අංකය ලියා ගත්තාය.

'ඒ..ත් ක..තා ක..ළොත් මේධක්කා මගෙන් මොනවා අහයිද... කමක් නෑ.. ඇහුවොත් කියනවා කෙල්ල ඉන්න තැනක් මං දන්නෑ කියලා...'

වර්ෂාටත් නොකියා ප්‍රියංවද උදේ හන්දියට ගියේ තිකමටය. ඇය විවෘත කර තිබූ දුරකථන කුටියකට ගොස් මේධාගේ නිවසේ අංකයට ඇමතුමක් ගත්තාය.

දුරකථනය එසවූයේ සෑහෙන වේලාවකට පසුය.

'හෙ..ලෝ...'

'මා..ත්..තයයි සු..දු නෝ..නයි නෑ නෝනා...'

කතා කරන්නේ ගෙදර වැඩට ඉන්නා පිරිමි ළමයකු බව ප්‍රියංවදට තේරුණි.

'මහත්තයයි සුදු නෝනයි කොහෙද ගිහින් තියෙන්නේ... මේ කතා කරන්නේ නෝනගේ යාළුවෙක්...'

'සු..දු නෝ..නට බේබි හ..ම්බ වෙන්න ගියා...'





ප්‍රියංවදට පුදුම සිතුණි. මේ දේවල් කෙල්ලට කොහොම හිතට එනවාදයි ඇයටම පුදුමය.

'නෝනට බේබිව ලැබිලද...'

'ද..න්..නෑ.. උදේ තමා ගියා...'

'ආ.. සුදු නෝනට ගො..ඩක් අමාරු වුණාද...'

'ඔ..ව් ඇඩුවා... මාත්තයා පස්සේ එක්කගෙන ගියා...'

'හා.. මං නෝනා ආවම ගන්නම්...'

ප්‍රියංවද දුරකථනය තබා දිග සුසුමක් හෙළුවාය. ඔක්කොටම වඩා පුදුම කෙල්ලට මේවා හිතට එන එකය. ඕනවට වඩා ආදර කැක්කුමෙන් ජීවිත සමඟ බැඳී ඉන්නා විට එහෙම වෙනවා විය යුතුය.

ප්‍රියංවද වන්දනා නඩ වලට ආප්ප දමා දෙන තැනකට ගොස් උණු ආප්ප ටිකකුත් රැගෙන ගෙදර ගියේ ඉක්මනිනි.

යද්දී වර්ෂා ප්‍රියංවද එන තුරු දෙරකඩ බලා උන්නාය. ප්‍රියංවද ආවේ ඈත සිට සිනාසෙමිනි.

'කො..හෙද කෙ..ල්ලේ ගියේ... මං කුඹුර පැත්තෙත් බැලුවා...'

'ගියා ආ..ප්ප ගේන්න...'

'ඒකටමද ගියේ...'

'ඇයි...'

'මොකද හිනාවෙවී ආවේ...'

ප්‍රියංවද යළිත් සිනාසුණාය. කෙල්ලට ඉව ඇත.

'ඉඳගනිංකෝ ඔහොම... අ..ම්මේ... කට්ට සම්බෝල හදමුද ආප්ප ගෙනාවා...'

ප්‍රියංවද ආප්ප ටික කුස්සියේ තබා කුඩා කාමර කැල්ලට ආවාය. වර්ෂා ඇය දෙස බලා උන්නේ පුදුමයෙනි.

'උඹට හිතෙන දේවල් නම් පුදුමයි කෙල්ලේ...'

'ඇයි.. මො..නා..ද මට හි..තු..නේ...'

'උදේ කිව්වේ... මේධක්කට බබා ලැබෙන්න ඇවිත් කියලා...'

'ඔ..ව්...'

'මං මේධක්කලගෙ ගෙදරට කතා කළා...'

'උ..ඹ...'

'ම්.. නැත්නම් උඹ මෙහේ දුක් විඳිනවා...'

වර්ෂාගේ දෙනෙත් කඳුළින් තෙත් විය. ඇය ප්‍රියංවද දෙස බැලුවේ අක්කා කෙනෙකු දෙස බලාන්නාක් බඳු ආදර සෙනෙහසිනි.

'මේධක්කයි සක්විති අයියයි ගෙදර නෑ...'

'ඇ..යි...'

'අද උදේ මේධක්කට අමාරුවෙලා... හොස්පිට්ල් එක්ක ගිහින්... ගෙදර ඉන්න කෙනෙක් කිව්වේ...'

'අ..නේ අ..ද උ..දේ...'

මේ බැඳීම් මහා පුදුමාකාර යැයි වර්ෂාට සිතුණි. අද මේධාව සිහිවන්නේ පාන්දර හතරේ සිටය. ඇයට දරුවා ලැබෙන්නට අමාරු වූයේ ඒ පාන්දරමද...

'බ..බා ලැබෙන්..නේ නා..ව ලෝක හොස්පිට්ල් එ..කේ...'

'ම්.. තාම ලැබිලා නැතුව ඇති කෙල්ලේ... අමාරු වෙච්ච ගමන් ලැබෙන්නෑනේ...'

'පව්..'

වර්ෂාට හීල්ලී මෙන් කියවිණ.

'කෙ..ල්ලේ...'

'ප්‍රියා..'

'ය..න්..න නම් හිතන්නෙපා වස්තුවේ...'

ප්‍රියංවද කීවේ බියෙනි. ගියවර ගොස් කෙල්ලට විඳින්නට වූ ප්‍රශංසා ඇයට සිහිවිය. දන් ඇය ඉන්නේ එදා උන්නාටත් වඩා බරපතල තත්වයකය.





'නෑ ප්‍රියා... ය..න්..නෑ... ය..න්..නේ කො..හො..ම..ද බ..ඩ..ත් එ..ක්ක...'

'ම්.. මං කිව්වේ උඹට තියෙන ආදරේ නිසා කෙල්ලේ...'

'කොහොමත් ය..න්..නෑ ප්‍රියා...'

එහෙත් උපදින දරුවාව අමතක කරන්නේ කෙසේද.. වර්ෂාගේ නෙතින් කඳුළු වැටුණි.

'උඹට මොනාද කෙරෙන්න ඕන... කියපන්...'

'අ..නේ මං පැටියට පංචායුධයක් දෙන්න හිතන් හිටියා කෙල්ලේ... සල්ලිත් එකතු කරන් හිටියේ... නුගේගොඩ තැනකින් මං දවසක් බැලුවත් එක්ක... ලස්සන පංචායුධ එතන තිබ්බා... ඒත්.. ද..න් කො..හො..ම කරන්..න..ද...'

ජීවිතයේ ප්‍රශ්න එන බව සැබෑය. එහෙත් මිනිස්කම්... බැඳීම් අමතක කර දමන්නේ කෙසේද...

'ඒක කීයක් විතර වුණාද කෙල්ලේ...'

'පන්දහක් විතර වුණා... මං සල්ලි ඒකට එකතු කරලා තියෙ..න්..නෙත්... නැතිවෙයි කියලා මං ඒ සල්ලි වෙන දේකට ග..ත්තෙත් නෑ...'

වර්ෂා නැගිට ඇගේ ඇඳුම් අතර වූ ඇගේ බෑග් එක ගෙන එහි වූ කුඩා පොතක් දිග හැර ප්‍රියංවදට පෙන්නුවාය. ඇත්තටම එහි රුපියල් සීයේ පන්සීයේ කොළ එකතුවක් විය. කෙල්ල ඒවා කොතරම් ආශාවෙන් එකතු කරන්නට ඇත්දැයි ප්‍රියංවද සිතා ගත්තාය.

'පො..ඩ්..ඩ..ක් හිටපන් මං දුවලා එනකම්...'

'කොහෙද ප්‍රියා යන්නේ...'

'උඹ ආප්පයක් කාපන්... මං ෆෝන් කාඩ් එකක් අරන් එන්නම්...'

ප්‍රියංවද මොනවා කරන්නට යනවාදැයි වර්ෂා සිතුවාය.

ටික වේලාවකින් ප්‍රියංවද ආවේ ජංගම දුරකථනයට දුරකථන කාඩ් පතක්ද රැගෙනය.

˙අ..ක්..කටයි අයියටයි කතා කරන්න බෑ ප්‍රියා...˙

˙කතා කරන්නත් එපා.. එහෙනම් ඊට කලින් විමුක්ති අයියට කතා කරන්නෙපැයි...˙

˙ම්.. මං ෆෝන් කාඩ් එකක් දන් ආවේ ඒකට නෙමේ... අපේ අම්මගේ මල්ලිගේ පුතාට කතා කරන්න... කොල්ලා වැල්ලවත්තේ රෙස්ටුරන්ට් එකක වැඩ කරනවනේ කෙල්ලේ.. පව් හොඳ එකා... මට හරි ආදරෙයි...˙

˙ඉතින්...˙

˙උඹට ඕන අර පංචායුධයත් අරගෙන අක්කට යවන්නනේ... නේද.. පැටියට දන්න...˙

˙ම්...˙

˙බයවෙන්නෙපා... අද දෙළහට කලින් මම ඒක කරලා දෙන්නම්...˙

˙ඒත් ප්‍රියා ඒ මල්ලිගෙන් අක්කලා තොරතුරු ඇහුවොත්...˙

˙මල්ලී කියන්නෑ.. මං ඒක කරන්නම්...˙

වර්ෂාට දුක ප්‍රියංවද මේ කරන දේටය. ඇය මේ සියල්ල කරන්නේ තමාව  සතුටින් තියන්නට බව වර්ෂා දනී.

ප්‍රියංවද ටික වේලාවකින් වැල්ලවත්තේ මල්ලිට ගත්තාය.

˙චූටි මල්ලී... මං ප්‍රියා අක්කා...˙

˙අක්කලා කොහෙද ගියේ... මං පෝය දවසේ ආවත් එක්ක...˙

˙ප්‍රශ්න ගොඩක් වුණා පැටියෝ... මොනා කරන්නද...˙

˙දැ..න් කොහෙද අක්කේ... අම්මා කිව්වා අක්කලා අනුරාධපුරේ මාමලගේ ගෙදර කියලා... කතා කරන්න වත් විදිහක් නෑ...˙

˙කියලා වැඩක් නෑ චූටි මල්ලී... ඉතින් ඔයාගේ තොරතුරු කොහොමද...˙

˙එහෙත් කියලා වැඩක් නෑ අක්කේ... හිතුවේ රට යන්න.. පාස්පෝට් එකත් හදන් උන්නා...˙





˙අ..නේ...˙

˙මේ ඉලව් රටේ ඉඳලා අපට සුගතියක් නෑ අක්කේ...˙

˙කමක් නෑ... නාස්ති නොවී හැදියන්... මං පැටියෝ කතා කළේ පොඩි උදව්වක් ගන්න... අද වැඩද...˙

˙තුනට වැඩ... දවල් තුනේ ඉඳලා රෑ දෙළහ වෙනකල්... ඇයි අක්කේ...˙

˙අනේ.. එච්චර වැඩද...˙

කාගෙත් ජීවිත වල දුකය.

˙මං වෙනුවෙන් පොඩි වැඩක්...˙

ප්‍රියංවද සියල්ල විස්තර කළාය.

˙මං ඔයාගේ එකවුන්ට් එකට අද නමයාමාර වෙද්දී සල්ලි දන්නම් මහත්තයෝ...˙

˙එපා... මං අක්කා බලන්න ආවම ගමු... මම සෙනසුරාද නිවාඩු... මම එන්නම්... කොහෙන්ද මං ඒක ගන්නේ...˙

වර්ෂා එය ගන්නා තැන කීවාය. ප්‍රියංවද එය ජානකට කීවාය.

˙මල්ලී දන්නවා නේද නවලෝකේ...˙

˙ඔව්...˙

˙ඒකේ බබාලා ලැබෙන්න ඉන්න අම්මලා ඉන්න වාට්ටුවට යන්න...˙

˙පුළුවන් අක්කේ... මගේ යාළුවෝ නවලෝකෙ වැඩ...˙

˙හරි.. එහෙනම් හොඳයි...˙

ප්‍රියංවද මේධාගේත් සක්විතිගේත් නමුත් ඔහුට දුන්නාය.

˙දීලා අක්කේ...˙

˙මොනවත් කියන්නෙපා... මේක වර්ෂා අක්කා පැටියට දුන්නා කියලා විතරක් දෙන්න...˙

˙මං කවුද කියලා ඇහුවොත්...˙

'වැඩිය කතා කරන්නෙපා... ඔයා දන්නෑ කියන්න... තේරුණාද... අනේ මහත්තයෝ අදම කරන්න ඕන...'

'හරි අක්කේ... දෙළහට කළින් මම නවලෝකේ... මං සෙනසුරාද එහෙනම් එන්නම්...'

'ම්.. දවසක් දෙකක් ඉඳලා යන්න එන්න... වැවෙන් එහෙම නාලා ලොකු අම්මගේ බතුත් කාලා යන්න පුළුවන්... මං දවල් වෙලා ගන්නම්...'

'හා...'

ප්‍රියංවද දුරකථනය තැබුවේ සැනසීමෙනි. වර්ෂාගේ ඇස්වල කඳුළුය.

'උ..ඹ පව්...'

'මං නෙමේ කෙල්ලේ පව්.. ඇත්තටම පව් උඹ... මෙ..ච්චර හොඳ උඹට මෙ..හෙම වු..ණ එ..කටයි මට දුක...'

'ම..ට මු..කු..ත් වු..ණේ නෑ ප්‍රියා...'

'ම්.. වෙ..න්..න..ත් එපා... දැන් ටිකක් හිනාවෙලා ඉඳපන්කෝ... පංචායුධේ දැකලා අක්කට පුදුම හිතෙයි...'

'එ..යා පැටියට දයි... අක්කා එහෙමයි...'

සක්විතිගේත් මේධාගේත් දරුවාව මවා ගන්නට වර්ෂා උත්සාහ කළාය. ඇයට මැවුනේ හුරතල් දඟකාර දූ පැටියෙකි.

'මං එ..හෙ..ම එ..ච්චා කියලා දැනගත්තහම ඔයාට හරියට දුක හිතෙයි...'

වර්ෂා සිතුවේ විමුක්ති ගැනය.

'ඔයා පැටියට මොනා දෙයිද දන්නෑ... මගේ පංචායුධේ දන්න ලස්සන චූටි චේන් පටක් ඔයා අරන් දෙන්න...'

වර්ෂා සිතින් ඔහුට කීවාය.





# 29

වර්ෂා මෙසේ සිතන මොහොතේ විමුක්ති උන්නේ මේ කිසිවක් නොදන ඇඳ මත හිහන්නකු සේ වැතිරීය. උදෑසන අවදි වී පැයක් පමණ යන තුරු විමුක්ති උන්නේ මෙසේ අන්ද මන්ද වූ ස්වභාවයෙනි.

සුරම්‍යා සාලය හරහා ආවේ විමුක්තිගේ කිරි තේ එක රැගෙනය. හිමාලි කාමයේ සිට ආවේ ඒ මොහොතේය. හිමාලිව දකිද්දී ගෙදරට සිරියාවයි කියා සුරම්‍යාට සිතුණි.

'මෙහේ හොඳට නින්ද ගියාද පුතේ...'

සුරම්‍යා හිමාලිගෙන් ඇසුවේ ආදරයෙනි. තවමත් රෑ නිදන ඇඳුමින් උන් ඇය ඊට උඩින් ඕවර් කෝට් එක දමාගෙන උන්නාය.

'චු..ට්ටක් රෑ වෙනකල් නින්ද ගියේ නෑ වෙනදට අම්මා නින්ද යනකල් කියෝ කියෝ ඔළුව අතගගා ඉන්නවනේ...'

හිමාලි කීවාය.

'ගිහින් තේ බොන්න මැණික... අනුලා නැති නිසා වැඩ ටිකක් වැඩියි... තව අලුත් කෙල්ලට වැඩ තේරෙනවා මදි...'

'තේ අයියටද නැන්දේ...'

'ඔව්.. ඉස්සර අසනීප වෙන්න කලින් උදේම තේක ඕන... උදේට අනුලක්කේ තේ කියලා කෑ ගහනවා...'

සුරම්‍යා කියද්දී ඇගේ දෑස් තෙමී තිබුණි.

'ඉන්න නැන්දේ මං අයියට පොවන්නම්... නැන්ද තේ බොන්න...'

'ආ.. ටිකක් උණුයි.. නිවිලා බොන්න ආස නෑ...'

'හා.. මං ටික ටික පොවන්නම්...'

සුරම්‍යා හිමාලිගේ අතට තේක දුන්නේ ආශාවෙනි. ඇය තේ එකද රැගෙන උඩු මහලට යන අයුරු දෙස සුරම්‍යා පහල සිට බලා උන්නේ මොකක්දේ ආශාවකිනි.

කොහොමත් හිමාලි ගෙදර ආ ද සිට ගෙදරට මොකක්දෝ එළියක් වැටී ඇතැයි සුරම්‍යාට සිතෙයි.

හිමාලි කාමරයට එද්දී විමුක්ති උන්නේ ඇහැරීය. වෙලාවකට ඔහු ඉන්නේ ඇහැරීද නැද්ද කියා සිතා ගන්නට නොහැක. හිමාලි තේ එකද රැගෙන විත් මොහොතක් විමුක්ති දෙස බලා උන්නාය.

ජීවිතයේ තිබූ හීනයක් අද සැබෑවන්නට පටන් ගත්තා යැයි ඇයට සිතුණි.

හිමාලි ඉඳගත්තේ විමුක්තිගේ වත අද්දරමය. විමුක්ති ඇය දෙස ඔහේ බලා උන්නාය.

'මා..ව අ..ඳු..ර..න්..නෑ.. ම්.. අර ඔයා කැන්ඩි එද්දී චූ..ටි..යට හිටියේ.. හිමාලි නංගී... මේ එයා.. චූට්ටක් ලොකු වෙලා නේ..ද...'

හිමාලි කතා කළේ ඔහුගේ දෙනෙත් දෙස බලාගෙනමය.

'ඇයි මං දිහා ඔහොම බලාගෙන ඉන්නේ.. ම්.. ඔයාගේ ගර්ලුත් මං වගේද... මාව දකිද්දී එයාව ඔයාට මතක් වෙනවද... ආ අයියේ...'

නැත. ඔහුගෙන් කිසිදු ප්‍රතිචාරයක් නැත.

'ම්.. චූට්ටක් නැඟිටින්න...'

හිමාලි ඔහුගේ වතට අත තිබ්බේ පුදුමාකාර හැඟීමකිනි. විමුක්තිගේ වතින් ආ රස්නය ඇයව මොහොතකට අවුල් කළේය.





විමුක්තිගේ නිරුවත් උඩු කයෙන් අල්ලා ඇය ඔහුව ඇඳ විට්ටමට බර කරද්දී ඇගේ පපුව එහෙමම ඔහුගේ මුහුණ මත රැඳවිණ. හිමාලිගේ මුවින් එකවර දිග සුසුමක් පිට විය.

'අ..පි තේ බොමු...'

හිමාලි ඔහුට තේ පෙව්වේ අවුල්ව තිබූ ඒ හිසකේද අතින් සකසමිනි.

'බො..න්..න උණු වැඩිද.. ම්...'

කුඩා දරුවෙකු සේ කෝප්පයට කටම තබාගෙන තේ බොන විමුක්ති දෙස හිමාලි බලා උන්නේ පුදුමාකාර හැඟීමකිනි.

'ඇති.. ත..ව ටි..කක් බොමු...'

විමුක්ති තේ ටිකක් ඉතුරු කර තිබුණි. හිමාලි ඔහුගේ ඇඳ මතටම වී ඒ තේ එක බිව්වාය.

'අද ඔයාට කවන්නෙත් ම..ම.. ඔක්කොම කන්නෝන... කාටවත් කටක්වත් කවලා නම් නෑ... ඔයාට තමා ඉස්සෙල්ලා කවන්නේ...'

හිමාලි තව මොහොතක් ඔහු ළඟ ඉඳ පහළට ආවේ පපුවේ මොනවාදේ කැවෙන්නාක් මෙන් වූ නිසාය.

'බි..ව්වද මැණික...'

සුරම්‍යා පහළදී ඇසුවාය.

'බිව්වා නැන්දේ... අයියට උදේ කවන්නේ මොනාද...'

'තාම හිතුවේ නෑ මැණික... බලන්න ඕන.. මං මේ බැලුවේ ලොකු පුතා අද තාම පරක්කු ඇයි කියලා...'

'ලොකු අයියා අද එන්නැත්නම් හොඳයි...' හිමාලි පැතුවාය. එහෙම හිතෙන්නේ ඇයිදැයි ඇයට තේරෙන්නේ නැත.

* * * * * * * * * *

'අනේ ධ..නේ.. අද සක්විති මහත්තයත් පරක්කුයි.. මේධා නෝනට අමාරු ඇති... ඔයා බලලා පුංචි මහත්තයගේ වැඩ ටික

කරනවද... මට අර ඇවිත් ඉන්න අම්මණ්ඩි ගැන බයයි...'

අනුලා කීවේ ඇඳෙන් අමාරුවෙන් නැගිටිමිනි. ඇයද උන්නේ දරු ප්‍රසූතියට ආසන්නවය. ඇයට විවේක ගන්න යැයි ඊයේ මොරගොඩ මහතා කීවේ බඩත් ඔසවාගෙන වැඩ කරද්දීය.

'මං කරන්නම් අනුලා... ආ මේ තේක බොන්න...'

'මගේ වැඩ හිතන්නෙපා... ය..න්..න..කෝ...'

මොකක්දෝ හේතුවක් නිසා අනුලාට මහා බියක් දනුණි. ඊයේ රාත්‍රියේදී හිමාලි පැයක් පමණ විමුක්තිගේ කාමරයට වී උන්නාය.

'අද සක්විති මහත්තයා පරක්කුයි නේද ලොකු නෝනා... මං පුංචි මහත්තයගේ වැඩ ටික බලලා කරන්නම්...'

ධනසිරි පැමිණ කියද්දී හිමාලි කාමරයේය.

'කෑම ටික මං බලලා කවන්නම් නැන්දේ...'

හිමාලි පැමිණ සුරම්‍යාට කීවාය. ඇයගේ පපුව උණු වී ගියේය.

'අයියා කරන අනිත් වැඩ ඔයාට කරන්න බෑ පුතේ... ධනසිරි බලලා කරයි... එහෙනම් කෑම ටික කවන්න... අනේ මන්ද ඔයාටත් කරදරේ...'

'අ..නේ.. අයියා වෙනුවෙන් කරන දෙයක් කරදරයක් වෙන්නේ කොහොමද...'

හිමාලි කීවේ අහිංසක හඬිනි. ධනසිරි උඩට ගියේ මේ මොරගොඩ ගෙදරට ආ අලුත් චරිතය තේරුම් ගන්නට උත්සාහ ගනිමිනි. 'දෙවිදුවක් වගේ හිටපු කෙල්ලව එලවලා දලා කවුරු ගෙනාවත් වැඩක් නෑ... ගේ මූසලයි...' ඔහු සිතුවේය.

සක්විති ගෙදරට කතා කළේ ඒ මොහොතේදීය. සුරම්‍යා ගොස් දූරකථනය ගත්තාය.

'අ..ම්මේ...'

'ලොකු පුතා.. ඇයි...'

'නෑ අම්මේ.. මේ මේධව හොස්පිට්ල් ඇඩ්මිට් කළා...'





'අනේ කෙල්ලට අමාරු ආවද...'

'ඔ..ව් අම්මේ... රෑ ඉඳන් තිබ්බා... උදේ අමාරු වුණා.. දැන් මේ නවලෝක එකේ...'

'අනේ.. තුණුරුවන් සරණයි... මෙහේ වැඩ ඔයා හිතන්නෙපා... දරුවා ගාව ඉන්න ධනේ බලාල ඒවා කරයි... මට කියන්නත් අමතක වුණා.. නන්දනී නැන්දගේ දුව හිමාලිත් ආවනේ...'

සක්විති කතා කළේ නැත.

'අපි දන්මම එන්නම් ලොකු පුතා...'

'දන්ම එපා අම්මේ... මං කතා කරලා කියන්නම්... තාත්තටත් කියන්න...'

'ඔයා බයවෙන්නෙපා.. තුණුරුවන් සරණින් දරුවා හොඳින් ලැබෙයි...'

'මං තියන්නම් අම්මේ...'

තමා ආච්චි කෙනෙක් වෙන්නට යනවා නොවේදැයි සුරම්‍යාට සිතුණි. ඇගේ දෑස් තෙමී ගියේ ඒ නිසාය. කරදර දහසක් මැද්දේ ආ මේ සතුට ඇයව ඇඬෙව්වාය.

ආරංචිය ඇසූ මොරගොඩ මහතාටද පුදුමාකාර සතුටක් ඇතිවිය. පසුගිය කාලයම ගෙවී ගියේ කරදර ගොඩවල් මතිනි.

'ඒ දරුවා වත් මේ කරදර නැති කරයි...'

මොරගොඩ මහතා කීවේ සැනසීමෙනි.

'නන්දනීගේ කෙල්ලත් ගෙදරට ආපු වෙලාවේ ඉඳලා සිරියාවයි... පොඩි පුතාගේ වැඩත් බලලා කරනවා...'

මොරගොඩ මහතා කිසිවක් කීවේ නැත. නන්දනීගේ දුව සිරියාවයි කියන සුරම්‍යා තම නැගණිය වූ නාලිනීගේ දුප්පත් කෙල්ලව මේ ගෙදරින් එලවා දම්මාය. මේ ගෙදරට ගසා ඇති ශාපය එය බව මොරගොඩ මහතා දනී.

'පව් ලොක්කා තනියම මේවා කොහොම කරගන්නවද දන්නෑ...'

මොරගොඩ මහතා කීවේ දුකෙනි. ඔහුට තම දරුවන් දෙදෙනා ගැනම මහා දුකක් ඇති විය. ඔවුන් සතුටින් නැත. මොරගොඩ මහතා එය හොඳින්ම දනී.

'ඕ..වි... ඉතින් ලොකු පුතාට තනියට හිටියේ පොඩි පුතා... ඒකටත් මෙහෙම එක්තැන් වෙන්න වුණේ කොහෙද යන මූසලියෝ ගෙදරට ගෙනාව නිසා...'

සූරම්‍යා ඔය ටික කියා කාමරයෙන් ගියාය. ඇය මේ පිට කළේ හිමාලි ගැන මොරගොඩ මහතා කිසිවක් නොකී එකේ කෝපයය. 'මේ නුවර වැදගත් කෙල්ලට වඩා අවජාතක බැල්ලියෙක්ගේ හිඟන කෙල්ලෙක් එයාට ලොකුයි...' සූරම්‍යා තමාටම කියා ගත්තාය.

* * * * * * * * * * *

මේධා උදේ දහයකුත් ගාණකට මලක් වැනි ලස්සන දුවක් බිහි කළාය. දියණිය බිහි කරන්නට ඇය විඳි දහසකුත් දුක් ඒ මුහුණ දකිත්ම ඇයට නැති විය. මේධා දහදිය වැකුනු මුහුණ ඇල කරගෙන හෙදියගේ දෑත් මත උන් ලේ වැකි බිළිඳිය දෙස බලා උන්නාය. ඇගේ නෙතින් ගැලූ කඳුළක් එහෙමම දෙනෙත් අද්දරින් පෙරළීගෙන ගියේය.

'අනේ ඔයාව මට බඩට අරන් දෙන්න දුක් වින්ද ඔයාගේ අර දුප්පත් පොඩි නැන්දි හිටියනම් අද... එයා එහෙනම් අද අඩයි...'

මේධාට සිහිවූයේ වර්ෂාවය. ඇගේ නෙතින් ගැලූ දෙවන කඳුළ ගලා ගියේ වර්ෂා වෙනුවෙනි. තමාව ආයුර්වේද වෛද්‍යවරයා ළඟට කෙල්ල එක්කාගෙන ගිය දවස මේධාට සිහිවිය. එද සිට ඇඟ නිවන කෑම හදගෙන ගෙනත් තබමින් තමාට සත්කාර කළ කෙල්ලව ඇයට සිහිවිය.

මේ දරුවා බඩට ආ බව දනගත් ද තමා වැළඳගෙන ඇඩුවේ කෙල්ලය. එද හවස කෙල්ල ආවේ කෝවිලට බාරයක් වී ඒ පූජාවද රැගෙනය.





නවලෝක රෝහලේ සූතිකාගාරය අසළ බිත්තියට බරවී නොඉවසිල්ලෙන් උන් සක්විති හෙදියක් කතා කරද්දී පොඩි එකෙකු සේ දුවගෙන ආවේය.

'නා..ර්ස් ම..ගේ නෝ..නට...'

ඔහු ඇසුවේ ගොත ගසමිනි.

'ඔයාගේ නෝනට ලස්සන දුවෙක් ලැබුණා...'

සක්විතිගේ දෙනෙත් තෙත් විය. ඔහු ලෝක පාලන හැම දෙවියෙකුටම පින් දුන්නේය.

'ම..ගේ නෝ..නට කොහොමද නර්ස්...'

'එ..යා ස..නී..පෙ..න්... දෙන්නවම තව චුට්ටකින් අපි රූම් එකට දනවා... චුට්ටක් ඉන්න අපි බබාව පෙන්නනන්නම්... තාම වොෂ් කරනවා...'

මේ සතුට කියන්නේ කාටද... සක්විතිට පුදුමාකාර තනිකමක් දැනුණි.

අද වර්ෂා උන්නා නම් අද මෙතන තමා සමඟ ඉන්නේ කෙල්ල බව සක්විති දනී. මේධාට මේ ජීවිතයේ උන් එකම හිතවතිය සොයුරිය ඇයය. මේධා කෙදිනකවත් ඇය තරම් වෙන කෙනෙකුට සමීප වී ඉන්නවා සක්විති දැක නැත.

අද වැනි දවසක මේධාට ඇයව දස දහස් වාරයක් සිහි වීම පුදුම නැතැයි සක්විතිට සිතුණි.

මොහොතකින් රෝස පැහැයෙන් රේන්ද දමූ කුඩා වේවැල් කූඩයක දමාගෙන හෙදිය මල් කුමාරිය රැගෙන ආවාය. කෙල්ල රෝස පාට ලේ කඳුළක් වැනිය.

හෙදිය සක්විතිට කතා කර බිළිඳියව පෑවාය.

'ඔයාගේ දුව...'

සක්විතිට ජීවිතය ගැන පුදුමාකාර ලෝබකමක් දැනුණි. ඔහු ඔහුගේ දියණිය දෙස බලා උන්නේ දෑස් තෙත්ව යද්දීය. පුංචි ඇස් නාරං බික් තරමට ඇරී තිබුණි. සක්විති ඔහුගේ ඇඟිල්ලෙන් දයාබරව දියණියගේ ශරීරය ස්පර්ෂ කළේය. තම බිරිඳව මුල් වරට සිපගත්

ද ඇතිවූ ආදරයට සමාන ආදරයකින් ඔහුගේ පපුව පිරී ගියේය.

'අ..පි එ..හෙ..නම් ගෙනියන්නද...'

හෙදිය ඇසුවේ කරුණාවෙනි.

'ඉක්මනට අම්මවයි දුවවයි දෙන්නවම රූම් එකට දනවා...'

සක්විති එහෙමම මොහොතකට දෑස් පියාගෙන සැහැල්ලු සුසුමක් පිට කළේය. දුව අම්මා වාගේමයි ඔහුට සිතුණි. කාන්තාරයක සරද්දී දිය බිඳක් හමුවූ අයෙකු මෙන් ඔහුගේ මුහුණට කාලාන්තරයකට පසු ලස්සන සිනහවක් ආවේය.





# 30

මේධා සක්විතිගේ අත අල්ලාගෙන ඇඬුවාය. ඒ ඇඬුමේ දහසක් දුක් වේදනා මෙන්ම අනන්ත වූ සතුටක්ද තිබුණි.

'ම.. ම..හ..ත්..ත..යෝ දු..වෙක් ගෙනාවේ.. ක..මක් නැද්ද...'

ඇය ඇසුවේ පොඩි දරියක මෙනි. තවම බිළිඳිය කාමරයට දම්මේ නැත.

'දුවෙක් නෙමේ ගෙනාවේ බබා... සුරංගනාවියක්...'

මේධාගේ කඳුළු ඇස් අග්ගිස්සෙන් පෙරළින.

'ම..ට ස..තු..ට වාවගන්න බෑ.. මහත්තයෝ...'

'මටත් බෑ... දුව මං දිහා බැලුවත් එ..ක්ක...'

'තාත්තා පව් කියලා හිතන්නැති...'

මේධා කීවේ සක්විතිගේ අත සිඹිමිනි.

'බබාට අමාරුද...'

ඔහු ඇසුවේ සුදු රෙද්දකින් වැසූ ඇගේ නැබ මතට මෑදුව සුරත තබාය.

'දූගේ මූණ දැක්කාම ඒ අමාරුව ගියා... මලක් වගේ නේ...'

'මී.. එයාගේ අම්මා වගේමයි...'

'තාත්තගේ කට...'

මේධා උන්නේ පුදුමාකාර සතුටකිනි. දරුවෙක් නැතුව දුක් විඳි අතීතය ඇයට සිහිවිය. ඒ නිසා ඇය රූපවාහිනිය වත් බැලුවේ නැත. එහි දරුවන් සඳහා වූ කිරිපිටි දැන්වීමක් ගියත් බේබි ක්‍රීම් දැන්වීමක් ගියත් මේධාට වේල් දෙක තුනක් කෑමවත් කන්නට නොහැකි විය.

ඒ දුක්බර සමය නිමා කරන්නට දුක් වින්දේ කෙල්ලය.

'පව්.. අ..ද කෙල්ල උන්නනම්... ඒකි පැලෙයි...'

'ම..ටත් මතක් වුණා... ඒකි උන්නත් කෙල්ලට එන්න බෑ...'

'දන්නවා නම් අඩයි... අපි ළඟටවත් එන්න බැරි තරමට කෙල්ල අසරණ වුණා...'

ඒ අසරණකම මොන තරම් කටුකදැයි මේධා දනී.

'මං වෙනුවෙන් කොච්චර දේවාල වලට ගියාද...'

ඒ කළ මිනිස්කමට කවදක හෝ දෙයක් කළ යුතුය. එහෙත් කෙල්ලව මහ ගෙදරින් පන්නා දමද්දීත් තමාට කෙල්ල වෙනුවෙන් අබැටක දෙයක් කරන්නට බැරි විය.

'දූ ගේ..නවා මහත්තයෝ...'

හෙදියන් දෙදෙනෙකු දියණිය ගෙන ආවෝය. මේධාගේ පපුව පිපිරෙන්නට තරම්ය. ඇය කඳුළු පිරි දෙනෙතින් දූව තම පපුව අද්දරට ගත්තාය.

'බඩගිනි වෙලා... දත් ඉඳලා ෆීඩ් කරන්න... කිරි එනවා නේද...'

'ඔ..ව් නර්ස්... මේ...'

මේධා ඇගේ තෙත්වූ බෙඩ් ජැකට් එක පෙන්නුවාය. ඇගේ පියයුරු තුඩු අගින් ගැලූ කිරෙන් එය තෙත්ව තිබුණි.

'හිමින් හිමින් කිරි බොන්න ගනී...'

මේධා පුදුමාකාර ආදරයකින් කෙල්ලව නිරුවත් පියයුරු වලට තබා ගත්තාය. කිරි එරෙන සුවඳින් පිරී තිබූ සුදු පියයුරු මතට





බිළිඳිය මුහුණ තැබුවේ සංසාර පුරුද්දක් ඇතුවාක් මෙනි.

'අ..නේ ම..හ..ත්..තයෝ දූවා කුක්කු බො..නවා මේ...'

මේධා කීවේ සතුටිනි. සක්විති ළං ළංව ඒ දසුන දෙස බලා උන්නේය. ඔහු වරකට මේධාගේත් වරකට දූවගේත් හිස පිරිමැද්දේය.

'අපේ කෙල්ල අපට වාසනාව ගෙනෙයි... දුක්වෙන්නෙපා...'

මේධා කීවේ සියල්ල දරා ගනිමිනි.

කිරි බී අවසානයේ බිළිඳිය අම්මාගේ උණුසුමට තුරුළුව නිදගත්තාය. මේධා කෙල්ලගේ අත කකුල් ඉඹිමින් අතගාමින් මව් පදවියේ කුළුඳුල් පැය කිහිපය වින්දය.

එකවරම කිසිවෙක් දෙරට තට්ටු කළේය. සක්විති ගොස් රෝහල් කාමරයේ දෙර ඇරියේය.

දෙරකඩ උන්නේ අවුරුදු විස්සක පමණ පිරිමි ළමයෙකි.

'මේ.. ස..ක්..විති ස..ර්..ද...'

ඔහු ඇසුවේ ගෞරවයෙනි.

'ඔ..ව්.. මේ මල්ලී කවුද...'

සක්විති ඇසුවේය.

'මා..ව සක්විති සර් දන්නෑ... මේක දෙන්න කියලා වර්ෂා අක්කා කිව්වා...'

සක්විති ඔහු දෙස බැලුවේ පුදුමයෙනි.

'මේ.. ම..ල්..ලි.. කවුද... කෝ වර්ෂා නංගී...'

'ද..න්..නෑ... මේක අක්කගේ බබාට දෙන්න කිව්වා... මම එච්චරයි දන්නේ...'

'නංගී මොනවද කිව්වේ...'

'එ..න්න පුළුවන් කමක් නෑ කිව්වා... කවදහරි බබාව බලන්න එනවා කිව්වා... ආ සර්...'

සක්විති ඔහු දුන් කුඩා බෑගය අතට ගත්තේය.

'කොහෙද කෙල්ල ඉන්නේ...'

‘ද..න්..නෑ සර්.. ඇත්තටම දන්නෑ...’

එහෙමම ඔහු ගියේය. සක්විති ටික දුරක් ඔහු යන දෙසද බලා උන්නේය. මොහොතකින් ඔහු පහතට බැස ගියේය.

‘බ..බා මේ.. කෙ..ල්ල එ..ව..ලා...’

සක්විති එය මේධා අතට දුන්නේ වෙව්ලමිනි.

‘කෙ..ල්ල එ..වලා... කෙ..ල්ල කොහොමද දන්නේ අ..ද ම..ට...’

‘දන්නෑ බබා...’

මේධා එය විවර කළේ දියණියව පපුවේ තබාගෙනය. කෙල්ල එවා තිබූ දේ දකිද්දී ඇයට ඇඬෙන්නට වාගේ ආවේය.

‘අනේ දෙයියනේ... ඇයි කෙ..ල්ල මෙ..හෙ..ම දෙ..ය..ක් කළේ...’

‘ඒ ආපු මල්ලි දන්නෙත් නෑ කෙල්ල ගැන...’

‘කෙල්ලට අපි ළඟට එන්න පුළුවන් නම් එනවා රත්තරන්... ඒකි මේ කොහේ හරි ඇති.. පව්... විඳව විඳව දුක් විඳ විඳ ඇති.. ම..ගේ කෙල්ලට ලැබිච්ච පළවෙනි තෑග්ග... ල..ස්සන පංචායුධයක්... පව්.. සල්លිත් නැති හිඟන්නී...’

මේධාගේ පපුව ඇත්තටම ඇවිළිණි.

‘ම..ට ක..ට්ටක් දෙන්න මහත්තයෝ.. ඔය බෑග් එකේ ඇති...’

සක්විති කුඩා බේබි කර්නල් කට්ටක් මේධා අතට දුන්නේය. මේධා වර්ෂා එවූ පංචායුධය දූගේ කුඩා කමිස පොඩ්ඩේ ගැසුවාය.

‘ජීවිතේ හරි පුදුමයි... හරිම පුදුමයි... අද නෙමේ මහත්තයෝ.. කවදහරි කෙල්ලට හරියන්න ඕන... නැත්නම් මේ ලෝකේ දෙවියෝ කියලා කෙනෙක් නෑ...’

මේධා කීවේ පංචායුධයේ හැඩ බලමිනි. ඇය මේ ළඟ පාතක ඉන්නාක් වැනි හැඟීමක් මේධාට දනුණි.

තමාට මේ තරම් උදව් කළ කෙල්ලගේ ජීවිතයට කිසිදු පිළිසරණක් වන්නට තමාට නොලැබුණු හැටි පුදුමාකාර යැයි මේධාට සිතුණි. කාත් කවුරුත් නැති හිඟන්නිය ගුටි කාගෙන මහ





ගෙදරින් යද්දී යළි යළිත් හිඟන්නියක් සේ මහගෙදරට එද්දීත් කෙල්ලගේ ජීවිතයේ උන් එකම කෙනාත් නැති වෙද්දීත් කිසිවක් කරගන්නට තමාට බැරි විය. එහෙම තිබියදීත් කෙල්ල මිනිස්කම් අමතක නොකරයි.

‘ඇ..යි බ..බා...’

මේධාගේ ඇස්වල වූ කඳුළු දක සක්විති ඇසුවේය. නොකිව්වද ඇය තැවෙන්නේ වර්ෂා ගැන බව සක්විති දනී.

‘කෙල්ල පව්... අද හිටියනම් මං වගේම සතුටුවෙයි... දුව ළඟින් හෙළවෙන එකක් නෑ...’

මේධා කීවේ බිළිඳියගේ හිස මෑදුව අතගාමිනි. කෙල්ල ඇගේ ජීවිතයේ ප්‍රථම මව් කිරි වඩිය බී සැපට නිදිය.

‘මටත් හරි තනිකමක් දනෙනවා බබා... මල්ලිත් නෑ... කෙල්ලත් නෑ..’

‘සමහර විට කෙල්ල එහෙමම හැංගිලා යයි...’

සක්විති කිසිවක් කීවේ නැත.

‘ඒකි කොහේ ජීවත් වෙනවද දන්නෑ... ඒත් කොහේ ජීවත් උනත් කෙල්ලට අපිව දනෙනවා... නැත්නම් කොහොමද මෙහෙම අද පැටියා ලැබෙනවා කියලා දන්නේ...’

‘ම්...’

සක්විතිටත් එය පුදුමය.

* * * * * * * * * * * *

හිමාලි විමුක්තිගේ කාමරයට ගියේ සුරම්‍යාත් මොරගොඩ මහතාත් නවලෝක රෝහලට පිටත්ව ගිය පසුය. ධනසිරි විමුක්තිව උදේ ඇඟ සෝදා අලුත් සරමක් ඇන්දවා යළිත් ඇඳ මතට තබා තිබුණි. ඔහු විමුක්තිගේ උදෑසන වැඩ ටික නිමවා පැමිණියේ බර වූ හදවතිනි.

'ඇයි බ..නේ...'

'අර අලුතින් ආපු කෙනා පුංචි මහත්තයගේ කාමරේමයි... මට ඇවිත් කියනවා ඇඟ සෝදලා තියන්නලු ඉතුරු වැඩ ටික එයා කරන්නම් කියලා...'

අනුලාට හීල්ලින.

'එයාව දකපු දවසෙම මටත් හිතුණා...'

'එයාගෙත් මස්සිනානේ... නේද...'

'ම්... මොනවා වෙන්න යනවද කියලා තේරෙන්නැ බනේ...'

'ලොකු නෝනා හරි සතුටින් ඉන්නේ එයා ආපු එකට...'

'ගෙදර හිටපු කෙල්ලව එලෙව්වා... දන් ඇවිත් තියෙන්නේ එයාගේ පැත්තේ කෙනෙක්නේ...'

'හතර පැත්තෙන් ආවත් වර්ෂා නංගී වගේ පුංචි මහත්තයට ආදරේ කෙනෙක් එන එකක් නෑ...'

'දෙයියනේ මේවා බල බල ඉන්නවනේ... අනේ බනේ හවස් වෙලා හරි මේධා නෝනවයි කෙල්ලවයි බලන්න යං හොඳේ...'

'අපිටත් දුවෙක්ද දන්නෑ...'

අනුලා සිනාසුණා මිසක කිසිවක් කීවේ නැත.

'මේධා නෝනටත් අද වර්ෂා නංගීව මතක් වෙනවා ඇති... කෙල්ල නැත්නම් ඔය බඩ නෑ...'

'මේ ඔක්කොම කවදහරි විසඳෙයි කියලත් හිතෙනවා අනුලා...'

'ම්.. ම..ට..ත් හිතෙනවා...'

අනුලා කීවේ දිග සුසුමක් හෙළමිනි. ඇය බඩත් ඔසවාගෙනම මුළුතැන්ගෙට ගියේ මේ ගෙදර වෙන අලුත් දේ කුමක්දයි බලන්නටය.

'ආ.. මං මේ අක්කට ඉඳි ආප්ප ටික අරන් එන්න ගියේ...'

අනුලා එද්දී කීවේ ඇගේ නැගණිය වූ තනුජාටය.

'කෝ...'





අනුලා අසන්නේ කා ගැනදැයි තනුජා දනී.

'දන් ආවා... මං කිව්වා පුංචි නෝනා කෑම කන්න මං පුංචි මහත්තයට ගිහින් කවන්නම් කියලා...'

'එතකොට...'

'මං කිව්ව එක ඇහුණේ නෑ වගේ බෙදගෙන උඩට ගියා...'

'සිහියක් නැති හින්ද කවුරු කැව්වත් කයි... ඒත් පුංචි මහත්තයට කැව්වේ එක්කෙනයි...'

අනුලා කීවේ අමාරුවට කොන්දට අතක් තබාගෙනය. අනුලා සාලයට ගොස් උඩු මහල දෙස බැලුවාය. විමුක්තිගේ කාමරයේ දොර අඩවල් කර ඇත. ඇයට හීල්ලින.

හිමාලි විමුක්තිට කෑම කවන්නට ආවේ උදේ නාගෙන අලුත් සායකුත් බ්ලවුසයකුත් ඇඳගෙනය. තද රතු පැහැගත් සායත් රතු මල් වැටුණු බ්ලවුසයත් ඇයට ගෙන ආවේ සුන්දර පෙනුමකි. තවමත් තෙත්ව තිබූ කොණ්ඩය ඔහේ උරතලය දිගේ වැටෙන්නට දමා උන් හිමාලි කෑම ටික මේසය මත තබා මොහොතක් විමුක්ති දෙස බලා උන්නාය. ඊටත් පසු ඔහුගේ මුහුණට සීතල සුරත තබා ධනසිරි ටිකක් වැඩියෙන් දමා තිබූ පුයර ටික පිස දම්මාය. එසේ පිසදමූ දෑත ඇය ඔහුගේ මුහුණින් ගත්තේ නැත.

'ඇ..යි ම්... මෙහෙම ත..ව කවුරුහරි අතගාල තියෙනවද... ම්... මම නම් කාගෙවත් ඇඟකට අතක් වත් තියලා නෑ... ඇත්තමයි...'

හිමාලි එසේ කීවේ විමුක්තිගේ දෙනෙත් දෙස බලාගෙනමය. ඊටත් පසු ඇය ඔහුගේ සුරත ගෙන ඇගේ උකුල මතින් තබා ගත්තාය.

'ඉඳි ආප්ප කමු... ම්.. මේවා රහද දන්නෑ... දවසක මං හදන්නම්...'

හිමාලි ඔහුට කැව්වේ සර්වියට් එකක් ගෙන ඔහුගේ ගෙළ පාමුලට දමාය. පළමු ඉඳි ආප්ප කට ඔහුට කවා ඇය ඔහු දෙස බලාගෙනම උන්නාය.

'ජීවිතේ කාටවත් කවලා නෑ... ඔන්න ඔයාට තමා ඉස්ඉස්සෙල්ලම කැව්වේ...'

ඇය සිනාසෙද්දී විමුක්ති වරක් සිනාසුණේය. හිමාලිගේ පපුව ලෝබකමින් පිරී ගියේය.

'ඔන්න දැන් අපි දෙන්න යාළුයි හොඳද... මං තමා ඔයාගේ හොඳම යාළුවා... හරි...'

ඇය කවන අතර තුර මොහොතක් ඔහුගේ සුරත ගෙන ඇගේ වමතින් තදකර ගත්තාය. කෙනෙකුට දෙවියන් හිමිකර දුන් සුරතක් තවත් කෙනෙක් අල්ලා ගත්තාට කිසිවක් නොවන බව හිමාලි දන්නේ නැත.

මංජුලා මහ ගෙදරට ආවේ මේ මොහොතේදීය. ඇය එන බව දකිද්දී අනුලාට යටි සිතෙන් සිනා නැඟිණ. 'ගෑණිව නවත්තන්න නරකයි... අරයා ඉන්න බව නොකියම උඩට යවන්න ඕන...' අනුලා සිතාගත්තාය.

'ගුඩ් මෝනිං මංජුලා බේබි...'

අනුලා වෙනදටත් වඩා සුහද ලෙස මංජුලා හා කතා කළාය.

'මෝනිං අනුලා... කෝ ඇන්ටිලා...'

'අපේ මේඩා නෝනට උදේ දුවෙක් ලැබුණානේ... උදෙන්ම ගියා...'

'ආ.. ලැබිලද... පුංචි මහත්තයා උඩ ඉන්නවා නේද...'

'ඔ.. ඔ..ව්...'

අනුලා මංජුලා උඩට යන අයුරු බලා උන්නාය. අද කිසිම වැඩකට නැති ගෑණු දෙන්නෙක් විමුක්තිගේ ජීවිතයේ කැරකෙන අයුරු අනුලා බලා උන්නේ උපහාසයෙනි.

මංජුලා විමුක්තිගේ කාමරයට එද්දී හිමාලි උන්නේ ඔහුට කවමිනි. ඇගේ එක් අතක් තිබුණේ විමුක්තිගේ උරතලය මතය. ඔහුගේ වතටම බරවී ඒ වතේ උණුසුම අනාරාධිතවම විඳිමින් හිමාලි වින්දේ වෙනස්ම රසයකි.





එකවරම දුටු දෙයින් මංජුලාට කිසිවක් සිතා ගන්නට බැරි විය. ඇය අදහාගත නොහැකිවාක් මෙන් හිමාලි දෙස බලා උන්නාය. විමුක්තිගේ එක් අතක් හිමාලි තබාගෙන උන්නේ ඇගේ කළවා මතය.

මේ දසුන මංජුලාට කොහෙත්ම ඉවසාගෙන ඉන්නට පුළුවන් දසුනක් නොවීය. මංජුලාව දැක හිමාලි තරමක් ගැස්සුණාය. ඇය නිරාවරණය වී තිබූ ඇගේ දෙපා හද ගත්තේ වැයමෙනි. විමුක්තිගේ වතටම බරව තිබූ ඇගේ වත පිටුපසට ගෙන හිමාලි මංජුලා දෙස බැලුවේ තරමක නොසන්සුන් බවකිනි.

'ඔ..යා ක..වු..ද...'

මංජුලා ඇසුවේ හිමාලි දෙස බලාගෙනමය. හිමාලිව දකිද්දී මංජුලාට සිහිවූයේ වර්ෂාවය. හිමාලිට පිහිටා තිබුණේ වර්ෂාට වැනිම වූ සුන්දර රූසපුවකි.

'ම.. ම..ම හිමාලි...'

හිමාලි පිළිතුරු දුන්නේ මේ මංජුලා බව දැනගෙනමය. මංජුලා විමුක්ති දෙස බැලුවේ වෙනස්ම ලෙසිනි. ඔහු මේ කිසිවක් නොදැන දෙදෙනා දෙසම බලා උන්නේය.

'ඒ..හෙම කෙනෙක් මෙහේ උන්නෑනේ...'

'මම විමුක්ති අයියයගේ නංගි කෙනෙක්... දැන් මෙහේ ඉන්නේ...'

එවර නම් හිමාලි පිළිතුරු දුන්නේ තරමක වෙනස් හඬකිනි.

'එක ගෑණියෙක්ව කොහොම හරි පන්න ගත්තා... දැන් තව ගෑණියෙක් ඇවිත්... මේක අරකට වඩා ටිකක් අමාරුයි වගේ...' මංජුලා හිතුවේ හිමාලිගේ මුහුණින් පෙනෙන්නට තිබූ තරමක් ආඩම්බර පෙනුම දෙසද බලාය.

'ඕක කරලා ඉවර නම් යනවද එළියට...'

හිමාලි මංජුලාගේ කීම ගණනකට ගත්තේ නැත.

'අයියා බඩගින්නේ ඉන්නේ... ඉන්න ටිකක්.. තවම කටවල් තුන හතරයි කැව්වේ...'

හිමාලි කිසිදු බියක් නොමැතිව මංජුලා ඉදිරිපිටදීම විමුක්තිට

කවමින් කීවාය. මංජුලාව ඇතුලාන්තයෙන් වෙව්ලන්නට විය.

ඇය වේගයෙන් පහළට ගියේ වෙව්ලමින් මෙනි. 'මොනව හරි දෙයක් කරන්න හිතාගෙන ප්ලෑන් කරගෙන ආවාම මෙතන තව මරාලයක් පාත් වෙනවා...' මංජුලා පහළට ගියේ මෙසේ සිතමිනි.

මංජුලා ගිය පසු හිමාලි තමා සමහම සිනාසෙමින් විමුක්ති දෙස බැලුවාය. 'ඔයා වෙන ගර්ල් කෙනෙක්ට ආදරේ කරපු එක අහන්නත් දෙයක් නෑ... ඔයාට මේ වගේ ප්ලාස්ටික් මලක් ගැළපෙන්නෑ... ඔයා ඇත්තටම ආදරේ කරපු ගර්ල්ව දක්ක නම් මං උනත් ටිකක් බයවෙයි... එයා මං වගේද...' හිමාලි විමුක්තිට අවසන් ඉදි ආප්ප කටද කවමින් සිතෙන් ඇසුවාය.

'කවුද අනුලා මේ කේස් එක...'

මංජුලා අසද්දී අනුලාට සිනා ගියේය. 'ඔයා වගේම කේස් එකක් තමයි...' කියන්නට කටට ආවේ එයය.

'ලොකු නෝනගේ නුවර නංගි කෙනෙක්ගේ දුවෙක්... පුංචි නෝනා මෙහේ ඉඳලා ඉගෙන ගන්න යන්නේ...'

'ආ.. නුවර කුමාරිහාමි කෙනෙක්ද...'

'ම්.. මංජුලා බේබි කතා කළාද...'

අනුලා ඇසුවේ හිමාලි ගැන මංජුලාගේ අදහස දැන ගන්නටය.

'මං මොකටද කොහෙවත් යන අය එක්ක කතා කරන්නේ...'

අනුලා යටි සිතෙන් සිනාසුණාය. මේ ඇවිලිල්ල ඇතිවන බව අනුලා දැන උන්නාය.

'විමුක්තිට මොකටද එයා කවන්නේ පොවන්නේ...'

'කවුද දන්නේ එයාටත් කැක්කුමක් ඇවිත්ද කියලා...' අනුලා එසේ සිතුවා මිසක කීවේ නැත.

'වෙනදට කවලා පොවලා ඔක්කොම වැඩ කරන්නේ සක්විති මහත්තයා... අද මේධා නෝනට බබා ලැබුණනේ... සක්විති මහත්තයා ආවේ නෑ...'

අනුලා මේ ටික කියද්දී හිමාලි ඔවුන් පිටුපසය.





'ලොකු අයියා හිටියත් නැතත් මගේ අයියට මට කවන්න බැරිද...'

ඇගේ හඬින් අනුලා පමණක් නොව මංජුලාද ගැස්සී ගියේය.

'කෙල්ල වගේ අහිංසකම නෑ... හොඳ කට...' අනුලා සිතුවාය.

'ආවනම් තමන්ගේ වැඩක් කරගෙන ඉන්න එකයි තියෙන්නේ... මගේ මහත්තයගේ සත්කාර මං බලාගන්නම්...'

මංජුලාගේ හඬේ වූයේ පරාජිත බවකි.

'ඔච්චර ආදරේ නෝනා කෙනෙක් ඉඳිද්දී සක්විති අයියට මෙහෙම උනේ ඇයි දන්නෑ...'

හිමාලි වේගයෙන් පිඟාන මේසය මතට දමා කියාගෙන ගියේ හොඳට ඇහෙන්නටය. අනුලාට පුදුම සිතුණි. මංජුලාට කිසිවක් කියා ගන්නට බැරි විය.

'මා..ර බ..ඩුවක්නේ ඇවිත් තියෙන්නේ... එයාගේ මිනිහ වගේ කතාව...'

මංජුලා කීවේ පුපුරමිනි. අනුලා මේ දෙවයේ විහිළුවට සිනාසුණාය.

'මංජුලා බේබි මෙහේ නතර වෙලා පුංචි මහත්තයව බලා ගත්ත නම් හරි... එතකොට කාටවත් කවන්න පොවන්න ඕනේ නෑනේ...'

අනුලා කීවේ උපහාසයට මෙනි. මංජුලා කිසිවක් කීවේ නැත. කාමරයට ගිය හිමාලි යළිත් කුස්සියට ආවාය. මංජුලා ඇය එන අයුරු බලා බිම බලාගත්තාය.

'අනුලා ධනසිරි ඉන්නවද...'

මේ ගෙදර කොල්ලෝ දෙන්නා පවා ලේලිය පවා අනුලාටත් ධනසිරිටත් කතා කරන්නේ කටපුරා අයියේ අක්කේ කියාය. එලෙස කතා කරන්නේ ඔවුන් අතර ඒ තරම් බැඳීමක් ඇති නිසාය. වර්ෂා අනුලක්කේ ධනේ අයියේ කියා කතා කරද්දී බඩ පපුව දන්නට ගන්නේය. එහෙත් මංජුලා පමණක් නොව අලුත ආ හිමාලිත් කතා

කරන්නේ තව දුරටත් ඔවුන්ව ඒ වැඩකාර මට්ටමේ තබාය. අනුලාට ඒ ගැන දුකක් නැත. හැමෝම දෙවිවරු නොවේ.

'ඉ..න්නවා පුංචි නෝනා...'

'යද්දි මට ටිකක් කතා කරන්න කියන්න...'

'මං කියන්නම්...'

හිමාලි යළිත් ගියේ මංජුලා දෙසවත් නොබලාය. මංජුලා මොරගොඩ නිවසින් ගියේ විමුක්තිගේ කාමරයට වත් නොගොසිනි. 'එයා ආදරේ කරන්න දන්න ගෑණියෙක් නෙමේ...' මංජුලා පිටව යන දෙස බලා උන් හිමාලි තමාටම කියාගත්තාය.





# 31

දවාලට උයා තිබුණේ කීරමින් කරවල හොද්දකුත් පොළොස් මැල්ලුමකුත් බණ්ඩක්කා සම්බෝලයකුත්ය. කන්නට ගනිද්දීම වර්ෂාට විමුක්තිව සිහිවිය. මෙහෙම සිහිවෙද්දී කෙල්ලගේ බඩ පපුව පිච්චීගෙන යයි. 'ඔයා මොනවා කරනවද කනවද බොනවද මොනවත් මං දන්නෑ... මෙහෙම මං හරි බත් කටක් කන්නේ ඔයාගේ පැටියා බඩේ නිසා... ආසාවෙන් කනවා නෙමේ... මට සමාවෙන්න...' හැමදමත් වර්ෂා බත් කට බඩට දගන්නේ සිතින් ඔහුට එසේ කියාය.

'බත් ටික ඔක්කොම කන්න ඕන ර්යෙත් ඉතුරු කරලා තිබ්බා...'

ප්‍රියංවදගේ මව පැමිණ කීවේ වර්ෂාට තව පොළොස් මැල්ලුම් ටිකක් දමමිනි.

'කිච්චට මස් ටිකක් වත් කන්නෑනේ අම්මේ...'

'ම..ස් ක..න්..නේ කොහොමද ප්‍රියා...'

'මං මාමටත් කිව්වා කයි බතක් හදන තැනක් තියෙනව නම් බත් එකක් ගෙනත් දෙන්න කියලා...'

වර්ෂා අහිංසකව සිනාසුණාය.

'ප්‍රියා...'

වර්ෂා කතා කළේ බත් කන අතරතුරය.

'ඇයි කෙල්ලේ...'

'හෙ..ට...'

'ඉතින්...'

'ජො..බ් එ..කට යනවද...'

ප්‍රියංවද වර්ෂා දෙස බැලුවේ දුක්බරවය.

'වෙන මොනවා කරන්නද කෙල්ලේ...'

'ත..ව චුට්ටක් හිතමු...'

'ම්.. බලමු...'

ජීවත් වන්නට දෙයක් කළ යුතුමය. අමාරුකම් එන්නේ කාටත් නොකියාය.

'අදත් බස් දෙකක්ම අපේ වත්ත ඉස්සරහ නවත්තලා වගේ...'

ප්‍රියංවද දෙරින් පාර දෙස බලා කීවාය.

'ඊයේ වතුර දීලම අම්මගෙයි මගෙයි පණ එපාවුණා...'

'මෙතන ගහකොළ තියෙන නිස්කලංක තැනක් ප්‍රියා... ඒකයි...'

'ඊයේ අම්මයි මායි කතා වුණේ ඔතන කළයක් තියන්න...'

'ඒකත් හොඳයි තමා... වතුර පොදක් පිපාසෙට දෙන එකත් පිනක්නේ...'

'ම්.. අපිට නම් මේ සමාජේ වතුර පොදක් වත් දුන්නේ නෑ...'

ප්‍රියංවද කියනා කතාව බොරුවක් නොවේ. එහෙත් ලෝකයට දෙයක් දිය යුත්තේ ලෝකයෙන් දෙයක් බලාපොරොත්තුවෙන් නොවේ.

* * * * * * * * * * * * * * * *

වර්ෂා හවස් වරුවේ නිවස ඉදිරිපිට වැව අද්දර වූ කොහොඹ





ගස් අවට ඇවිදිමින් කොළඹ අනුරාධපුර පාර දෙස බලා උන්නේ බර කල්පනාවකිනි. ඇතැම් විටක ඇය ලී කඩුල්ල පැන පාරටද ගොස් එහි සිට නිවස දෙස බලා උන්නාය.

'අ..ම්මේ...'

කෙල්ලව දක ප්‍රියංවද කතා කළේ අම්මාටය.

'ඇයි පුතේ...'

'අ..ර බලන්නකෝ අම්මේ කෙල්ල...'

'දන් වරුවක ඉඳලා ඔතන...'

'ඒක තමයි... පාරට යනවා... එහෙට ඇවිදිනවා... මෙහෙට ඇවිදිනවා... මොනාද ඔය බලන්නේ...'

'කම්මැලිකමට වෙන්න ඇති පුතේ... ඔළුවත් හෝන්තු වෙලානේ...'

වර්ෂා යළිත් කොහොඹ ගස් යටට පැමිණ පාර දෙස බලා උන්නාය. කොළඹ අනුරාධපුර පාරේ යන වන්දනා බස් රථයක් කෑගසමින් ඇයට අත වනාගෙන ගියෝය. වර්ෂාද ඔවුන්ට අත වැනුවාය.

වර්ෂා යළිත් පාරට ආවාය. පාරේ එහෙට මෙහෙට යමින් ඇය බලා උන්නේ නිවසේ වත්ත දෙසය.

'මේකිට නම් අද මොනවා හරි වෙලා අම්මේ...'

ප්‍රියංවද වත්තට බැස්සේ රබර් සෙරෙප්පු දෙකද දමාගෙනය. පාරේ උන් වර්ෂා ප්‍රියංවද දක සිනාසුණාය. පරිස්සමින් බැලූ කල ඇයට දරුවෙක් ලැබෙන්නට ඉන්නා බව හඳුනාගත හැක. තව ටිකක් බඩ ආ විට ඇයට පරණ ඇඳුම් අඳින්නට නොහැක.

'කවුරු එනකල්ද පාර බලන්නේ... ආ කෙල්ලේ...'

ප්‍රියංවද වත්තේ සිට කෑ ගසා ඇසුවාය.

'මට බලන් ඉන්නේ තියෙන්නේ මගේ දෙයියෝ එනකල් විතරනේ...'

ප්‍රියාට දුකය. ඇය කඩුල්ල පැන පාරට ආවාය.

'ඇයි කෙල්ලේ...'

'නිකං... පොඩි වැඩකට බැලුවා...'

'පාරේ... මොන වැඩක්ද...'

'මං කෙල්ලේ අද උදේ හතේ ඉඳන් ගණන් කළා...'

'මොනාද...'

'නිකං බස් වෑන් කාර් එහෙම... අනුරාධපුර වඩින්න ආපු අය...'

'ඉතින්...'

'හත් අට සීයක් යනවා...'

'ඉතින්...'

'නෑ නිකං...'

'නිකං වෙන්න බෑ...'

'පොඩි අදහසක් ආවා ප්‍රියා...'

'මොකක්ද...'

'මේ.. ඉනි වැට අපි අයින් කරනවා කියමු...'

'ම්...'

'මෙතන පාර පළලයි... මේ කොහොඹ ගස් තුන හතරත් හරි හෙවණයි... මෙතනට ආවාම දිගටම එක යායට කුඹා යාය පේනවා...'

'ඔව්...'

'ඒ පැත්තෙ ඉඳලා හොඳට හුළඟත් එනවා...'

'ම්...'

'අපේ වත්තත් පළලයි... අඩි සීයක් විතර තියෙනවා...'

'හරි බං ඉතින්...'

ප්‍රියංවදට වර්ෂා කියන්නට යන දේ තේරුම් ගන්නට බැරි විය.

'අපි කෙල්ලේ කොහෙවත් මෝල් වල බිල් ලියන්න යන්න ඕන නෑ... තුන් හාර දහේ පඩියට...'





'නෑතුව...'

ප්‍රියංවද වර්ෂා දෙස බලා උන්නේ පුදුමයෙනි. කෙල්ලගේ මුහුණ අද කොහොමත් අමුතුය.

'අපි කෙල්ලේ මෙතන හොඳට එළි කරලා පාරත් පාදලා...'

'ම්...'

'මේ කොහොඹ හෙවණ යට දමුද පොඩි හෝටලයක්...'

ප්‍රියංවද වර්ෂා දෙස බලා උන්නේ පුදුමයෙනි. ඇයට පුදුම මෙතන හෝටලයක් දමන එක ගැන නොවේ. එහෙම දෙයක් කෙල්ල සිතූ එකටය.

'හෝ..ට..ල..යක් ද..න්..න...'

'ඔ..ව් පොල් අතු හෝටලයක්... බස් එකකටම කන්න දෙන්න පුළුවන් විදිහට...'

ප්‍රියංවද වර්ෂා දෙස බලාගෙනම උන්නාය.

'හඳන්න වැඩි වියදමක් යන්නෑ... පිරිසිදුව ලස්සනට මැටි බිත්ති ගහලා පොල් අතු වහළට දලා හද ගමු... මේස දහයක් පහළොවක් ලස්සනට පැත්තක හදමු... අනිත් පැත්තේ කෑම තියමු... තේ එහෙම දන්න වෙනමම තැනක්... ම්... උයන්න පිටිපස්සේ අපට හදගන්න පුළුවන්...'

'මේ..ත..න එ..හෙ..ම හෝ..ට..ලයක් ද..නවා උඹයි මායි...'

'ම්... අපිට පුළුවන් ප්‍රියා... පුළුවන්... මැ..රෙ..න්න බැරි නම් අ..පි මේ දුප්පත් ජීවිතෙත් එක්ක සටන් කරමු... අපි දගමු...'

'කො..හො..ම..ද කෙ..ල්..ලේ උඹ එ..හෙම හිතුවේ...'

'මා..ත් ද..න්..නෑ ප්‍රියා... ඇත්තටම දන්නෑ... ඒත් උදේ එහෙම හිතුණා...'

ප්‍රියංවද කෙල්ලගේ අත තදින් අල්ලා ගත්තාය.

'අපි දමු... මං බිල් ලියන්න යන්නෑ...'

වර්ෂා ලස්සනට සිනාසුණාය. ඒ සිනහවේ ජීවිතයේ විඳි අනන්ත දුක් කන්දරාව මෙන්ම ඊට එරෙහිව නැගෙන දුප්පත් කෙල්ලෙකුගේ ආත්ම විශ්වාසයද විය.

*   *   *   *   *   *   *   *   *   *   *

වර්ෂා කළ යෝජනාව නිසා ප්‍රියංවද පමණක් නොව අම්මාද සතුටු විය.

‘උඹට නම් තියෙන්නේ කෙල්ලේ පුදුම මොළයක්... මෙච්චර පාර දිහා බලන් ඉන්නවා අපිට මෙහෙම අදහසක් එන්නෑ... ඒකනේ අනුන්ගේ මෝල් වල බිල් ලියන්න යන්න යන්නේ...’

ප්‍රියංවද කීවේ රෑ මිදුලේ වාඩිවී කතා කරද්දීය.

‘උඹ හරි වටින කෙල්ලෙක්... මොරගොඩලා ඒක දන්නෑ... ඇත්තනේ අර බුක් ෂොප් එක තනියම උඹනේ කළේ...’

‘එයත් ඒක කියනවා... දවසක් එහෙම කියලා මගේ අත් දෙක ඉම්බා...’ වර්ෂා සිහි කළාය.

‘අම්මටත් හරි ආසයි... නේද අම්මේ...’

‘ඒකනේ... මාත් දහ අතේ කල්පනා කර කර හිටියේ මොනා කරන්නද කියලා...’

‘අපි තුන්දෙනාට හොඳට දියුණු කරගතැකි... නේද කෙල්ලේ...’

‘කෑම ටික හොඳට දෙනකොට කට්ටිය එයි ප්‍රියා...’

‘නැතුව... කෑම දෙනවා කියලා මිනිස්සු දෙන්නේ ජරාවනේ කෙල්ලේ... වතුර වලට මිරිස් කහදිය කරලා දන්නේ...’

‘අපි එහෙම කරන්න නරකයි... නේද අම්මේ...’

‘කන බොන දේට බොරුවක් කරන්න නරකයි... එතකොට යා දෙන්නෑ...’

‘අමේ හොඳ තේකක් බොමුකෝ...’





ප්‍රියංවද කීවේ සතුටිනි. වර්ෂා සිනාසුණාය. අම්මාගේ ඉඟුරු තේ එක තිබ්බානම් හොඳය.

‘අතේ සල්ලි ටිකක් තියෙනවනේ ප්‍රියා... ඒ ඇතිවෙයි... මදි වුණොත් රත්තරන් බඩුවක් තියමු...’

‘අ..නේ තියෙන එකෙන් කොහොමහරි පිරිමහ ගමු... රත්තරන් බඩු තියන්න ඕන නෑ...’

‘දැන් කවුරු බලන්නද ප්‍රියා... බලපු කෙනත් නැති කොට...’

වර්ෂා කීවේ පපුවම බිඳී යද්දීය.

‘එ..හෙම කියන්නෙපා කෙල්ලේ...’

වර්ෂා අයාසයෙන් සිනාවක් නහා ගත්තාය.

‘පුළුවන් හැටියට අපි පිරිමහ ගමු...’

අම්මා ඉඟුරු තේ හදගෙන ආවාය. වර්ෂා උණුවෙන්ම උගුරු දෙක තුනක් බිව්වාය.

‘මොකක්ද අම්මේ ඒ සුවඳ...’

වර්ෂා ඇසුවේ කුස්සිය පැත්තෙන් හොඳ සුවඳක් එද්දීය.

‘දවල් පොඩි නැන්ද හොඳ කෙහෙල් මුහක් දුන්නා... ඒක කුනිස්සෝ ටිකක් එක්ක තෙල් දැම්මා... තාම ලිපේ...’

‘අපේ හෝටලේටත් එහෙම කෑම දැම්ම නම් හරි... අපේ අම්මගේ හොඳ හොඳ කෑමත් මං ටික ටික දන්නවා...’

‘අපි උදේට හොඳට පාන් පිටි ඉඳි ආප්ප ටිකක් එහෙම වැඩිපුර හදමු නේද අම්මේ... හාල් මැස්සෝ හොද්දක් කිරි හොද්දක් එක්ක එහෙම... පොල් රොටි ටිකකුත් දලා...’

‘පැත්තකින් පොඩි ආප්ප පාරකුත් දලා සීනි සම්බෝලයක් එක්ක...’

ප්‍රියංවද වර්ෂා කියන දෙයට තවත් එකතු කළාය.

‘උදේට එළකිරි ටිකකුත් හොයා ගන්න පුළුවන්නේ... එළකිරි

තේ බොන්න කට්ටිය ආසයි...'

'අනේ උඹටනම් එන්නේ පුදුම අදහස් කෙල්ලේ... මගේ කටටත් කෙළ උනනවා...'

'දවාලට හොඳට අපි වැව් මාළු එහෙම හදලා පොළොස් මාළුවක් දෙල් මැල්ලුමක් හොඳ කරවිල සම්බෝලයක් අහුණ කොළ මැල්ලුමක් එක්ක බත් දෙමු...'

ප්‍රියංවද වර්ෂා කියද්දී ආශාවෙන් කෙළ ගිල්ලාය.

'අපි කවදද කෙල්ලේ පටන් ගන්නේ...'

'ඉක්මනටම පටන් ගමු.. නේද අම්මේ...'

'ඔයාලා දෙන්නගේ කේන්දරේට හොඳ නැකතකුත් හදවගෙනම පටන් ගමු...'

'ම්...'

'අපි අම්මේ ප්‍රියාව කැෂියර් එකේ තියමු...'

'ගෑණිට උයන්නත් බැනේ නේද...'

ප්‍රියංවද කීවාය. වර්ෂා සිනාසුනේ කලකට පසුය.

'අපි මාමටත් කියමු නේද අම්මේ...'

'ඔව්.. මාමත් උදව් කරයි...'

'ළිඳට පොඩි වතුර මෝටරයක් දගන්න ඕන...'

'අනේ ඔව්... උඹට ඒවා කරන්න කොහොමත් දෙන්නෑ මම...' ප්‍රියංවද කීවේ ආදරයෙනි.

රෑ කෙල්ලෝ දෙන්නා වැව ළඟ ඇවිදිමින් සෑහෙන වේලාවක් කතා කරමින් උන්නෝය.

'විමුක්ති අයියා දන්නවනම් උඹ මේ බඩකුත් උස්සගෙන අනුරාධපුරේ පාර අයිනේ පොල් අතු හෝටලයක් කරන්න යනවා කියලා...'

'එ..යාට දුක හිතෙයි...'





'උඹටත් දුකද...'

'ඇයි ප්‍රියා...'

'අපි ජීවිතේ මෙහෙම තැනකට වැටුණාට...'

ප්‍රියංවද කෙල්ලගේ අතක් අල්ලගෙන ඇසුවේ ආදරයෙනි.

'වෙලාවකට ප්‍රියා ජීවිතේ දෙන දේට එරෙහිව සටන් කරන්න වෙනවා... ත..වත් වෙලාවකට ඒක බාර ගන්න වෙනවා... මේ දුප්පත් අත් වලින් අපිත් ජීවිතේ හූර හූර හරි ජීවත් වෙන්නෙපැයි...'

වර්ෂාගේ කතාව ජීවිතයේ පතුලටම වැටුණු අසරණ කෙල්ලෙකුගේ ආත්ම ප්‍රකාශනයක් බඳු විය.

'උඹට කවදහරි හරියයි කෙල්ලේ...'

'ම..ට නැ..ත..ත් ක..ම..ක් නෑ ප්‍රියා... මගේ පැටියට වත් හරියනව නම්...'

වර්ෂා කීවේ බඩට සුරත තබාය.

'අපි ඒකට දුක් විඳින්න තියන්නෑ... මේ පැලේ හරි අපි ඒකව සතුටින් තියමු...'

'ම්...'

'සමහර විට ප්‍රියා.. ජීවිතේ මෙහෙමම යයි... ඒත් මට මගේ දරුවා ඉන්නවනේ... ඒකා අපිට ඇති...'

'ම්.. මේ හැම දෙයක්ම ඒකා වෙනුවෙන් කියලා හිතලා කරමු... ඒ මගෙත් පැටියා කෙල්ලේ...'

වර්ෂා ප්‍රියංවද දෙස බැලුවේ අසීමිත ආදරයකිනි.

'කෙල්ලේ...'

'ප්‍රියා...'

'අපි කුලියක් දෙන්න මිනිස්සු දෙන්නෙක් හොයාගෙන හෙටම මේක සුද්ද කරමු...'

'ඒක හොඳයි... මාමටත් කියලම ඉමු නේද... හොඳ නැනේ...'

'ඒක ඇත්ත.. මාමට කියලම පටන් ගමු... අපට හයියකට ඉන්නේ මාමනේ...'

'පෙරේද ඇවිත් යන්න යද්දී මගේ ඔළුව අතගාලා කියනවා...'

'ම්.. දුව බයවෙන්නෙපාලු... ශ්‍රී මහ බෝ සමිඳු පිහිටෙන් දරුවා බිහි කරන්නලු...'

'නැන්ද කියන්න ඇති...'

'ම්.. ම..ගේ මා..ම..ටත් කවද හරි මං ගැන දුක හිතෙයි...'

'දැනටමත් දුක හිතිලත් ඇති කෙල්ලේ...'

වර්ෂාට සියල්ල් සිහි විය. ඇය කළුවරේම ඇස් තද කර ගත්තාය.

'බස් තුන හතරක් නැවැත්තුවොත් ඇති.. නේද ප්‍රියා...'

'ම්.. අපි හොඳට දෙමු... එතකොට කතාව යනවා...'

'එහෙනම් හෙට රස්සාවට යන්නෑ හරි...'

'හරි.. හරි.. උඹ පහුගිය ටිකේ දගෙන කල්පනා කළේ ඕක ගැනමද...'

'ම්.. විඳිනව නම් එක දුක දෙකට බෙදගෙන විඳිමු... උඹට තනියෙන් දුක් විඳින්න දෙන්නෑ...'

ප්‍රියංවද වර්ෂා දෙස බැලුවේ තෙත්වූ දෙනෙතිනි. දුප්පත් කෙල්ලෝ දෙන්නා අත්වැල් පටලාගෙන කළුවරේම නිවසට ආවේ හිතේ සැනසීමකිනි.





# 32

සුරම්‍යා දරුවා ලැබුණු දිනට පසුද දරුවාවත් මේධාවත් බලන්නට ගියේ හිමාලිවත් එක්කාගෙනමය. හිමාලි රෝහලට යන්නට ඇන්දේ ඇය නුවරින් ගෙනා බටර් පාට සාරියකි. පැයක් පමණ වෙලා ගෙන සාරිය ඇන්ද හිමාලි පිටතට ආවේ ලා පැහැගත් තොල් ආලේපනයකින් තොල් සහලද හැඩ කරගෙනය.

හිමාලිව දකිද්දී සුරම්‍යාට ලෝබ සිතුණි.

'වෙලාවක යන් වැල්ලවත්තට... මං ඔයාට තව ලස්සන සාරි ටිකක් අරන් දෙන්නම්...'

සුරම්‍යා කීවේ හිමාලිගේ හැඩ බලමිනි.

'හොඳද නැන්දේ...'

'හරිම ලස්සනයි...'

හිමාලි යටි සිතෙන් කුමක්දෝ රහසිගත ආඩම්බරයක් වින්දය.

'මං උඩට ගිහින් අයියව ටිකක් බලලා එන්නම් නැන්දේ... මං කාටූන් එකක් දලා දීලා ආවේ... සමහර විට නිදිද දන්නෑ...'

සුරම්‍යාට පුදුමය. 'කෙල්ලව මං ළඟට එවන්න ඇත්තේ

දෙයියෝ...' ඇය සිතුවාය.

හිමාලි යද්දී විමුක්ති උන්නේ ඇය රූපවාහිනියේ දමා දුන් කාටූන් වැඩසටහන දෙසම බලාගෙනය. ඇය මොහොතකට ඔහුගේ හිස අද්දර ඉඳ ගත්තාය. විමුක්ති හිස හරවා ඇය දෙස බැලුවාය. ඔහුට දැන් ඇයව ටිකක් හුරුය.

'ම්.. ඇ..යි... චූ..ටි නංගි ලස්සනද... ම්.. ඔයාගේ අයියට දුවෙක් ලැබිලනේ අපි යනවා එයාව බලන්න... මං ඉක්මනට එන්නම්.. හොඳේ.. රෑට කන්න මොනවා හරි අරගෙනම එන්නම්... අද අපි රෑට ෆිල්ම් එකක් බල බල කමු... හොඳද... ය..න්නම්...'

හිමාලි නැගිට්ටේ විමුක්තිගේ නළලතට මෘදු හාදුවක් දීය. ඔහුගේ නළලතේ සටහන් වූ ඇගේ තොල් ආලේපන සටහන දැක මොහොතක් සිනාසුණු ඇය එය අතින් පිස දැම්මාය.

'ය..න්..නම් බුදු සරණයි...'

හිමාලි යන්නට පෙරද හැරී ඔහු දෙස බැලුවාය. ඇතුලාන්තයේ ඇවිලෙන යමක් ඇයට දැනෙයි. එහෙත් ඒ කුමක්ද...

'පව්.. කාටූන් එක දිහාම බලාගෙන ඉන්නවා... ද..ලා ය..න්..න..ත් දුකයි...'

හිමාලිගේ දුක්බර වචන සුරම්‍යාගේ පපුව විදගෙන මෙන් ගියේය.

'ඉක්මනට එමු අපි... මං තනූජට කිව්වා බලන්නයි කියලා...'

'අයියව එහෙම තනියම තියන්න බයයි නැන්දේ...'

'ම්.. ඔයත් දැන් බලනවනේ මැණික...'

හිමාලි ගොස් වාහනයේ ඉඳගත්තේ දිග සුසුමක් හෙළමිනි. විශ්ව විද්‍යාලයේ දේශන පටන් ගත් පසුව කොහොම ඔහු දමා යන්නදැයි ඇයි සිතුවාය.

'ඔයාට හිමාලිව හම්බවුණේ නැතේ... මේ නන්දනී නැන්දගේ දුව... පෙන්නන්නත් එක්ක එක්කං ආවේ...'





සුරම්‍යාගේ කතාවේ මේධා බොහෝ දේ වටහා ගත්තාය. 'නුවර නෑ පරපුරේ කෙනෙක්නේ හරි අගේ කරලා කතා කරන්නේ...' මේධා සිතුවාය.

'කො..හොමද නංගි...'

මේධා වෙනසක් නොපෙන්නා කතා කළාය.

'හොඳයි අක්කේ... බබී දෙයි නේද...'

'මේ දැන් පැයක් විතර කිරි බිව්වා... පස්සේ තාත්තා එක්ක මොනාද කර කර ඉඳලා මහන්සියට නිදි...'

'මං තාම බබාට මොනවත් ගත්තෙත් නෑ...'

හිමාලි කීවේ දරුවා දෙස බලාගෙනය. 'මගේ දරුවට දෙන්න ඕන කෙනා දරුවා ඉපදෙනකොට දුන්නා... වෙන කාගෙවත් ඒවා ඕන නෑ...' මේධාගේ කටට ආවේ ඔය කතාවය.

'අ..ම්..මේ... ම..ල්ලිට කොහොමද... මට පැයෙන් පැය මතක් වෙනවා...'

විමුක්ති ගැන කතා කරද්දී හිමාලි නිහඬව බිම බලාගෙන ඊට සවන් දුන්නාය.

'මල්ලි ගැන නම් මට බරක් නෑ දුවේ... හිමාලි මල්ලිගේ ඔක්කොම බලලා කරනවා... එයා දරුවෙක් වගේ මල්ලිව බලාගන්නේ...'

හිමාලි මේධා දෙස බලා සිනාසුණාය. එහෙත් ඒ කතාවට මේධාගේ පපුව උණුවිය. 'කවුරු බලා ගත්තත් කෙල්ල වගේ බලාගන්න බෑ...' මේධා සිතුවාය.

'පැටියයි මායි ගෙදර ගිය ගමන් සක්විති උදේට එයි අම්මේ... එයා හරි දුකෙන් ඉන්නේ...'

'ඔයාව දාලා ලොකු පුතාව එවන්න බෑ දුවේ... උදේට ඇඟ සෝදන වැඩ ටික ධනසිරි කළාට පස්සේ ඉතුරු ඔක්කොම හිමාලි කරනවා...'

මහ ගෙදර මේ සිද්ධ වෙන දේ ගැන මේධාට එතරම් පැහැදීමක් නැත.

'ඊයේ රෑම සක්විති මල්ලී ගැන කියෝ කියෝ හිටියේ...'

'ගෑණි මම ඉන්නවට එච්චර කැමති නෑ වගේ... පෙන්නන්නේ නෑ... හිත ඇතුලේ තියෙනවා...' හිමාලි සිතුවාය. මේධා හිමාලි දෙස එහෙන් මෙහෙන් බැලුවාය. මේ හදිස්සියේ රෝහලට එන ගමනට සාරි අඳින්නට අවශ්‍ය නැත. ඇය මේ මහ ගෙදර රහපාන චරිතය කුමක් විය හැකිද...

'ඔයාට මොනාද දුවේ ගේන්න ඕනේ...'

'මොනාත් නෑ අම්මේ... හෙට ටිකටුත් කපයි... දුවා සනීපෙන් නිසා අපට ගෙදර යන්න පුළුවන්...'

'වෙලාවක් බලලා එහෙටත් ගේමු...'

'අ..නේ ගේනවා අම්මේ... එයාගේ බාප්පිට පෙන්නන්නත් එපැයි... බඩේ ඉන්නකල් පැයෙන් පැය කතා කර කර අහනවනේ... ම..ටත් හ..රි දු..කයි...'

හිමාලි මේධාගේ බොඳවූ දෙනෙත් දෙස බලා බිම බලාගත්තාය.

* * * * * * * * * * *

සක්විති මහ ගෙදරට ආවේ මහ රෑය. ඔහු හදිස්සියේම ආවේ විමුක්තිගේ මුහුණ ටිකක් බලාගන්නටය.

සක්විති නිවසට එද්දී සුරම්‍යා නින්දට ගොස් උන්නාය. සාලයේ අතු ගාමින් උන් තනූජා සක්විතිව දක සිනාසුණාය.

'ලොකු මහත්තයා තාම ආවේ නැද්ද කෙල්ලේ...'

'තව නෑ සක්විති මහත්තයා... නෝනත් දන් නිදගත්තේ...'

'කෝ අනුලක්කා...'

'අද අක්කටත් ටිකක් අමාරුයි...'





'ආ.. ඇත්තද... ධනේ අයියා නැද්ද තාම...'

'තව නෑ...'

'මං පුංචි මහත්තයව බලලා අනුලක්කව බලන්න එන්නම් කියන්න...'

'හා...'

හිමාලි උඩ විමුක්තිගේ කාමරයේ ඉන්නා බව කියන්නට තනූජාට අමතක විය. ඒ නිසා සක්විති එහෙමම උඩට ගියේය. කාමරයට එද්දී දුටු දසුනින් සක්විතිට පුදුම සිතුණි.

හිමාලි විමුක්තිගේ කකුල් දෙකම ඇගේ උකුලේ තබාගෙන ඔහුගේ නියපොතු කපමින් උන්නාය. සක්විති ආ බවක්වත් හිමාලි දක්කේ නැත. රෑ ඇඳුම පමණක් ඇඳ උන් ඇය ඔහුගේ දෙපා ඇගේ වතටම ළං කරගෙන උන්නාය.

ඒ දුටු දසුන දෙස සාමාන්‍ය ඇසකින් දකින්නට බැරිකමක් ඔහුට දැනුණි. කෙල්ලෙකුට ඒ තරම් සමීප ලෙස තමා ළඟට පිරිමියෙක්ව ගත නොහැක.

'නං..ගී...'

සක්විති කතා කරද්දී හිමාලි තරමක් කලබලව විමුක්තිගේ දෙපා ඇඳේ තබා ඔහු දෙස බැලුවාය.

'ආ.. ලො..කු අයියා... මං මේ අයියගේ නියපොතු වැවිලා තිබිලා කැපුවා...'

සක්විති වෙනසක් නොපෙන්නා සිනාසුණාය.

'ම..ල්ලි දන්ද නිදගත්තෙ නංගී...'

'අද බත් ටික ඔක්කොම කෑවා... කිරි තේ එකකුත් බිව්වා... බට පිරිච්ච නිසා එහෙමම නිදි...'

'පව්...'

සක්විති කොල්ලාගේ හිස අතගා කීවේය. ඊටත් පසු ඇය දෙස බැලුවාය.

'ඉතින් නංගී... කවදද කැම්පස් පටන් ගන්නේ...'

'ටික දවසක් යයි අයියේ...'

'මේ දවස් ටිකේ නංගී මල්ලිව බලා ගත්තා කියලා අම්මා කිව්වා...'

'ම්.. මං.. ඒ..ක කරන්නම් අයියේ...'

'දිගටම නංගිට බැනේ...'

'ඒක හිතන්නෙපා...'

හිමාලි කීවේ උගුරෙන් මෙනි.

'අයියට තේ එකක් හදන් එන්නද...'

'එපා නංගී... දන් එපා...'

'අයියා පොඩි අයියා ගැන හිතන්නෙපා... මං හරි ආසාවෙන් අයියගේ වැඩ ටික කරන්නේ..'

හිමාලි කීවේ අවස්ථාවක් ලද සැනිනි. සක්විති සිනාසුණේය.

'මටත් මේකව නැතුව බෑ නංගී... මං එයා නිසා රස්සාවෙනුත් අස් වුණේ... මෙහෙම වෙන්න කලින් මල්ලී ගොඩක් දුක් වින්ද... ඔයා දන්නවද දන්නෑ... එයා ඔයා වගේම හොඳ ළමයෙක්ට ආදරේ කළා... එයත් අපේ නංගි කෙනෙක්... ඇස් දෙක වගේ කොල්ලව බලා ගත්තේ... තාමත් විශ්වාස කරන්න බෑ එච්චර ආදරයක් කොහොමද කළේ කියලා...'

හිමාලිගේ පපුව කුමක්දෝ ගින්දරකින් ඇවිලී ගියේය.

'එ..යා නිසාම නේද අයියට මෙහෙම වුණේ...'

'එච්චර හොඳ ආදරයක් නිසා මිනිහෙක්ගේ ජීවිතේට මෙහෙම වෙන්නෑ නංගී... තාමත් මේ පපුවේ ඒ ආදරේ ඇති...'

හිමාලි කෙළ පොදක් ගිල්ලාය.

'අද නැතත් කවදහරි දෙන්නා එකතු වෙයි... අම්මා අපට ඉඩ





දෙන්නෑ... වර්ෂා ආවනම් මේකා මෙහෙම දුක් විඳින්නෑ... කෙල්ලගේ රස්සෙ වැදුනත් ඇති...'

හිමාලි කතා කළේ නැත.

'අද මල්ලිට වඩා වර්ෂා දුක් විඳිනවා... දෙන්නා මැරෙන්න මොහොතකට කලින් හරි එකතු වෙයි... එතකල් තමා අපිට ඉතින් මේකව බලාගන්න තියෙන්නේ...'

සක්විති කීවේ විමුක්තිගේ හිස අතගාය. 'ඒක එහෙම වෙන්න දෙන්නෑ මම... ඒකිගේ රස්නෙට නෙමේ... මම දන් මගේ පපුවේ රස්නෙට විමුක්තිව පුරුදු කරනවා...' හිමාලි සිතුවේ දැඩි ගින්දරෙනි.

'නිදගත්තාවේ... මං පාන්දර එන්නම්...'

සක්විති පහළට ආවේ සැහෙන දේවල් හිතේ තෙරපාගෙනය. හිමාලි බිත්තියට බරවී එහෙමම දිග සුසුමක් හෙළුවේ දැස් තෙත්ව යද්දීය.

'අනුලක්කේ...'

සක්විති පැමිණ එහෙමම ඉඳ ගත්තේ අනුලාගේ ඇඳේය. ඇයට ලෝබ සිතුණි.

'අ..නේ සුදු මහත්තයෝ... දෙන්න මට පුළුවන් ගේන්න...'

'ඉන්න අනුලක්කේ... අමාරුද...'

'ටිකක්.. මටත් ඉක්මනට ලැබෙයි...'

'ඒක හොඳයි... මට කතා කරන්න... මං එන්නම්...'

'අ..නේ...'

අනුලා තේ එකක් හද ඔහුට දුන්නාය.

'අනුලක්කේ...'

'සුදු මහත්තයෝ...'

'හිමාලි මල්ලිගේ කාමරේමයි...'

'වෙන දේවල් හරි පුදුමයි... අනේ මන්ද... මට නම් කෙල්ලවමයි

මතක් වෙන්නේ...’

‘මාත් දන් එයාට කිව්වා...’

සක්විති හිමාලිට කියූ සියල්ල අනුලාට කීවාය.

‘ඒක හොඳයි... මගෙනුත් දවල් ඇහුවා වර්ෂා නංගිගේ ෆොටෝ එකක් තියේද කියලා...’

‘ඉතින්...’

‘තිබ්බා... මං ඒක පෙන්නුවේ නෑ... ඔහොම හිටියට කට... මංජුලාත් හොඳ දෙකක් අහගත්තා...’

අනුලා මංජුලා ආ වෙලේ ඇතිවූ සිදුවීම පැහැදිලි කළාය.

‘මං කොල්ලව බලාගන්නම්...’

‘ඔව් සුදු මහත්තයා... කවදහරි මේ දෙන්නා එකතුවෙයි... නැතුව මෙහෙම දේවල් වෙන්න බෑ...’

අනුලා කීවේ කඳුළක් පිටවෙද්දීය.

‘කෙල්ල මේ ඔක්කොම දිහා බලා ඉන්නේ... දරුවා ඉපදිලා පැයක් යද්දී කෙල්ල පංචායුධයක් එව්වා...’

‘වර්ෂා නංගී...’

‘ඔ..ව්...’

‘අනේ දෙයියනේ... පෙනිලාවත් යනව නම්...’

‘මෙහෙම දේවල් වෙද්දී එන්නෑ ඒකි...’

‘ඔව්...’

අනුලා කීවේ හුල්ලමිනි.

‘මං යනවා අනුලක්කේ... ටිකක් බලන්න... හෙට මේධා ගෙදර ගෙනාපුවම මං එන්නම්...’

‘හොඳයි... මං දූවාව ගෙදර ගෙනාවාම බලන්න එන්නම්...’

‘ඔව්... බලන්නම ඕන... ඒක බෝලයක් වගේ...’





සක්විති අනුලාගේ හිස අතගාගෙනම පිට විය. හිමාලි ගැන තව ටිකක් සිතිය යුතුයැයි ඔහුට සිතුණි.

විමුක්තිගේ අල්මාරිය අස් කරන්නට හිමාලි ගත්තේ හවස් වරුවේය. දන් ඔහුගෙන් තොර ලෝකයක් ගැන ඇයට සිතාගන්නට වත් නොහැක. පිරිමියෙක්ට ආදරේ කරන්නට මේ හිත පුරුදු කරන්නට සෑහෙන කාලයක් යාවි යැයි හිමාලි කලින් සිතාගෙන උන්නාය. මේ පසුවට පිරිමියෙක් ගන්නට ජීවිතේ සෑහෙන කාලයක් යාවි යැයි ඇය සිතා උන්නාය.

එහෙත් මොරගොඩ නිවසට ආ දම ඒ හැඟීම තුරන් විය. විමුක්තිව දකිත්ම කාන්තාරයක තිබූ ගහකට දිය පොදක් වැටුණාක් මෙන් ඇගේ සිත පිබිදෙන්නට විය. විමුක්තිට කවද්දී පොවද්දී ඔහු ළඟට වී සිටිද්දී ඇයට දනෙන්නේ තම සැමියාට කවනවා පොවනවා කියාය. මේ තරම් ආදරයක් තම හදවතේ හැංගී තිබුණා යැයි හිමාලිට සිතාගන්නටවත් නොහැකි විය. කෙල්ලෙකුගේ හදවත ආදරයෙන් ආතුර වූ විට පුදුමාකාරය. ඉන් එහා ජීවිතයක් ගැන හිතාගන්නටවත් නොහැක.

විමුක්තිගේ ඇඳුම් අස් කරද්දී හිමාලිට සිහිවූයේ ඊයේ රෑ සක්විති කියූ දේවල්ය. ඒ වචන පෙරද රාත්‍රිය පුරාම හිමාලිට වරින් වර සිහිවිය. ‘දෙන්නා මැරෙන්න මොහොතකට කලින් හරි එකතු වෙයි.. එතකල් තමා අපිට ඉතින් මේකව බලාගන්න තියෙන්නේ...’ සක්විති වර්ෂා ගැන කියූ මේ වදන් හිමාලිට මහා වදයක් විය.

ආදරය කරනා වස්තුවක් වෙන කාට හෝ අයිති දෙයක් බව කියද්දී පසුවට දනෙන කකියන වේදනාව හිමාලිට දනෙන්නට විය. තාමත් ඉන්නේ ඒ ඇවිලීමෙනි. ඒ වචන ඇසීමෙන් පසු හිමාලිගේ සිතේ වර්ෂා ගැන නොතිබූ වෛරයක් ඊර්ෂ්‍යාවක් ඇති විය.

හිමාලි ඇඳුම් අස්කිරීම නවත්වා ඇඳ මත උන් විමුක්ති දෙස මොහොතකට බැලුවාය. ඔහු උන්නේ අඩ නින්දකය. ‘මම තරම් ඔයාට කවුරුවත් ආදරේ කරලා නැතුව ඇති... ඒ ආදරේ දවසක මම ඔප්පු කරලම පෙන්නන්නම්...’ හිමාලි කීවේ දිග සුසුමක් හෙළාය.

මේ පපුවෙන් බැඳි කුළුඳුල් ආදරය එසේ සිහිනයක් වෙන්නට ඉඩ දෙන්නේ නැත. 'එක ගෑණියෙක්ට පුරුදු වුණාම පිරිමියෙක්ට අමාරුයි.. මම දවසක ඔයාගේ ඇඟ පුරාම මගේ රස්නේ තියනවා... එදාට ඔයාගේ ඔය සීතල වෙලා තියෙන හිතත් ගිනි ගනී විමුක්ති...' හිමාලි ඇකිළීගෙන යද්දී සිතුවාය.

විශ්ව විද්‍යාලය පටන් ගත් පසුව හැකි තරම් දේශන පිටපත් ලබාගෙන රෑ පුරා ඔහු ළඟට වී පාඩම් කරනවා යැයි හිමාලි සිතා ගත්තාය. 'මොන දේ ආවත් මම ඔයාව දලා යන්නෑ... කාගෙවත් පපුවක රස්නේ ඔයාට වදින්න මම ඉඩ තියන්නෙත් නෑ...' හිමාලි සිතුවේ එලෙසිනි.

විමුක්තිගේ අල්මාරියේ ලාච්චුවක තිබූ ඡායාරූප ඇල්බමයක් දැක හිමාලි එය අතට ගත්තාය. එහි විවිධාකාර ඡායාරූප සිය ගණනක් විය. හිමාලි එය අතට ගෙන එහෙමම අස් කරමින් උන් අල්මාරිය වසා දැම්මාය. ඉන් පසු කාමරයේ වූ මේසයේ ඉඳගෙන ඇය ඡායාරූප ඇල්බමය දිග හැරියාය.

එහි මුල් ඡායාරූප ගොන්නේ තිබුනේ විමුක්ති ඔස්ට්‍රේලියාවේදී ගත් ඡායාරූපය. ඔහු විවිධ විදේශීය මිතුරන් සමඟ එරට විශ්ව විද්‍යාලයේදී ගත් ඡායාරූප එහි විය. ඒ ඡායාරූප බලන අතරතුර ඇය මොහොතක් ඇඳේ නිදා ඉන්නා විමුක්ති දෙස බැලුවාය.

'ඒ දවස්වල ඔයා ලස්සනයි... චුට්ටක් විතර මහතයි... ගෑණු දෙන්නෙක් එකතු වෙලා ඔයාව කැත කරලා... දරුවෙක් වගේලු ඔයාව බලාගත්තේ... එහෙම බලා ගත්තා නම් ඔයාට කවදාවත් එහෙම වෙන්නෑ...'

හිමාලි සිතින් කීවාය. ඡායාරූප ඇල්බමයේ පිටු හත අටකට පසුව වූයේ විමුක්තිගේ 'විමුක්ති බුක් සිටි' පොත් හල විවෘත කිරීමේ පින්තූරය.

හිමාලි ඒ පින්තූර දෙස උවමනාවෙන් බැලුවාය. ඇගේ නෙත සෙව්වේ වර්ෂාවය. 'දුප්පත් උනාට හරි දක්ෂ කෙල්ලෙක්ලු... ඔය පොත් සාප්පුව එහෙම බලාගෙන තියෙන්නේ එයා...' අම්මා





නුගේගොඩට ආ ප්‍රථම දවසේ කියූ කතාව හිමාලිට සිහිවිය.

පොත් හල විවෘත කිරීමේදී ගෙන තිබූ හැම පින්තූරයකම විමුක්ති ළඟම උන්නේ වර්ෂාය. එද ඇය කවරදාටත් වඩා ලස්සනට උන්නාය. තැඹිලි පැහැගත් සාරියක් ඇඳ උන් කෙල්ල ඒ හැම පින්තූරයකම ඔහු ළඟ උන්නාය.

හැම පින්තූරයකම විමුක්ති ළඟ උන්නේ වර්ෂා බව හඳුනාගන්නට හිමාලිට වැඩි වෙලාවක් ගියේ නැත. පින්තූර ඇල්බමයේ තව පිටුවක් පෙරළද්දී දුටු ඡායාරූපයෙන් හිමාලිගේ පපුව මොහොතකට ගල් ගැසී ගියේය. එද විවෘත කිරීමේ උත්සවයේදී වර්ෂාත් විමුක්තිත් එකට ඉඳ ගත් ඡායාරූපයක් ඔහු ඡායාරූප ශිල්පියා ලවා විශාල කරගෙන ඇල්බමයේ දමාගෙන උන්නේය.

එහි වර්ෂාගේ සුන්දර අහිංසක සිනහව පුදුමාකාර තරම් චමත්කාරජනක ලෙස ඡායාරූප ශිල්පියා සටහන් කරගෙන තිබුණි. හිමාලි ගැහෙන දෙනෙතින් වර්ෂා දෙස මොහොතක් බලාගෙන උන්නාය. කෙල්ලගේ අවිහිංසක සුන්දරත්වයෙන් හිමාලි ගල් ගැහුණාය. හීන් රන් චේන් පටක් මිසක අන් විලාසිතාවක් ඇය පැළඳගෙන උන්නේ නැත. එහෙත් තැඹිලි පැහැගත් සාරියට කෙල්ලගේ ලස්සන කපා පෙන්වා තිබුණි.

ඇගේ උරතලය මත ඇති සුරත විමුක්තිගේය. ඔහු වර්ෂාව ළං කරගෙන ඡායාරූපයට මුහුණ දී ඇත්තේ කැමරාව දෙස බලාගෙන නොවේ. ඇය දෙස බලාගෙන.

හිමාලිගේ සියොළඟම දැවෙන්නට විය. ඇගේ පපුවෙන් ගලා ගිය දහදිය එහෙමම පපුවෙන් පහළට බේරෙමින් තිබුණි. සියල්ලටම වඩා හිමාලිව ගිනි තැබුවේ කෙල්ලගේ ලස්සනය. ඔහු ආදරයෙන් බලා උන්නේ ඒ ලස්සන මුහුණ දෙසය. ඇගේ උරතලය මත වැටී ඇති ඔහුගේ දකුණතින් ඔහු කෙල්ලව තමාගේ ළයට තද කරගෙන ඇත. හරියට මේ තමාගේ රෝස මල යැයි ලෝකයට කියන්නාක් ලෙසිනි.

ඉන් පසුව දිගටම වූ ඡායාරූපවල වර්ෂා උන්නාය. එක ඡායාරූපයක වර්ෂා ඔහුට කිරිබත් කවමින් උන්නාය.

පපුවේ පැහැවන්නට ගත් වෛරයටදේ ඊර්ෂ්‍යාවටදේ හිමාලිගේ දෙනෙත් තෙත් විය. ඇය ඡායාරූපවල සිනාබරව උන් වර්ෂා දෙස බලා උන්නේ ජීවමාන වර්ෂා දෙස බලාන්නාක් බඳු ගිනිගත් දෙනෙතිනි.

'එහෙනම් උඹයි විමුක්තිව පිස්සු වැට්ටුව ගෑණි...'

ඇය කියාගත්තේ උමතුවෙන් මෙනි. වර්ෂා දෙස බලද්දී විමුක්ති මංජුලාව ප්‍රතික්ෂේප කළ හේතුව සිතාගන්නට හිමාලිට පුළුවන් විය. ලා මෙරූන් පැහැගත් තොල් ආලේපනයක් ගල්වා තිබූ වර්ෂාගේ දෙතොල් දෙස හිමාලි බලා උන්නාය. 'මේ තොල් වලට නිවනක් තියෙන්නැතුව ඇති...' හිමාලි සිතුවේ ළය අකුලාගෙන යන තරමේ වූ ඊර්ෂ්‍යාවකිනි. සාරියට වර්ෂාගේ පිරිපුන් සිරුරේ හැඩ ලස්සනට බේරී තිබුණි.

හිමාලි මොහොතකට තම වතත් වර්ෂාගේ වතත් සංසන්දනය කළාය. 'මං වගේම උසයි... සුදුයි...' හිමාලි සිතුවේ බොළඳ ලෙසිනි.

විමුක්තිගේ ආත්මය සසල කළේ වර්ෂාගේ මේ බාහිර ලස්සන පමණක්ම නොවන බව හිමාලි දන උන්නාය. විමුක්ති ඒ තරම් මෝඩයෙක් නොවන බවද ඇය දන උන්නාය. 'පිස්සුවෙන් වගේ ආදරේ කරන්න ඇති... එහෙම ආදරේ කරද්දී පිරිමියෙක් පිස්සු වැටෙන එක අහන්නත් දෙයක්ද...' හිමාලි එකවර නොසිතූ ලෙස වර්ෂාත් විමුක්තිත් එකට උන් ඡායාරූපය ඇල්බමයෙන් පිටතට ගත්තාය.

'පින්තූරෙකටත් විමුක්ති ළඟ මෙහෙම උඹ ඉන්නවට මං ආස නෑ...'

ඇය එහෙමම වර්ෂාත් විමුක්තිත් අතරින් පින්තූරය ඉරුවාය. විමුක්තිගේ පින්තූරය පරිස්සමින් පොතක් තුළ රුඳවූ හිමාලි වර්ෂාගේ පින්තූරය කීතු කීතු වලට ඉරුවාය. ඊට පසු ඒ පින්තූර කැබලි ටික එහෙමම නාන කාමරයට රැගෙන ගිය ඇය එය කොමඩ් එකට දමා වතුර ඇරියාය. ඡායාරූප කැබලි සියල්ල ගසාගෙන ගියේය.

හිමාලි සිනාසුණේ කුරිරු ලෙසිනි.

'විමුක්ති මගේ... මගේ... එයාගේ ජීවිතේට ආයේ එක එක





වර්ෂා ඕන නෑ...'

හිමාලි එසේ කීවද ඇය උන්නේ දහදියෙන් වත තෙමාගෙන වියපත් ලෙසිනි. ආගන්තුක බියක් ඇගේ පපුවේ දැවෙන්නට විය.

ඇය මංජුලා විමුක්ති ළඟට ආ විට බිය වූයේ නැත. එහෙත් විමුක්ති ළඟට එන්නටත් බැරි වර්ෂාට බිය වී උන්නාය. 'තාමත් ඒ ආදරේ මේ පපුවේ ඇති...' ඊයේ සක්විති කිය ගිය වදන් යළිත් හිමාලිට ඇහෙන්නට විය.

'ඔ..ව් ඇති... ඒත් මං ටිකෙන් ටික ඒකිව විමුක්තිගේ පපුවෙන් අතුගාල දනවා... ආයේ කා දිහාවත් බලන්නවත් බැරි විදිහට එයාව මේ ඇස්වල එල්ලනවා... මං ඒක කරනවා...' හිමාලි තමාටම පවසා ගත්තේ පපුව ඇවිලෙමින් තිබියදීය.

'ආයේ ඒ දෙන්නට එකතු වෙන්න මං ඉඩ තියන්නෑ... විමුක්තිට කවද හරි මතකේ එද්දී එයා ළඟ ඉන්නේ මම...'

හිමාලි විමුක්තිගේ මුහුණ දෙස බලාගෙනම ඒ වදන් කීවාය.

*වර්ෂා - විමුක්ති පෙම් කතාවේ*

*7 වෙනි දිග හැරුම මින් නිමාවේ.*

## *"වර්ෂා-8"*

*දැන් පිටවී ඇත.*



# වර්ෂා 7

You are the only releaving shower on my parched soul

ඔබ මගේ දැවී ඉරිතැලුණු ආත්මයට වට එකම අහෝරා වර්ෂාවයි...

සුජීව ප්‍රසන්න ආරච්චි

Hemantha007
For free distribution

ආදරේ මහ දුක් කන්දරාවක්...
ඒ දුක මහකනදරා වැවටත් වැඩියි...
ඔබ නිසා... ඒ දුකත් මං විඳින්නම්...
රත්තරන් ඔබ දවසක...
ආදර කන්දක් වෙලා මා ළඟ
සමනල පව්වක් සේ ඉඳිනම්...
වර්ෂා

Lake House Bookshop
9010819
Rs.350.00
021357
0192L25GR1101CHM2100/LO

Rs: 350/=

Cover Photo: Indika Mallawaarichchi Design: Naweendra Weerasakara
Author Photograph:Waruna Sooriyaarchchi
MADHARA BOOKS